# ලොව දිනූ චරිත 4



"මහජන මුදලින් අධ්‍යාපනය ලැබූ අප
ලත් දැනුමෙන් රට දැය පෝෂණය කරමු"

ජාත්‍යන්තර අධ්‍යයනය විෂය ශිෂ්‍ය සංගමය
ජාත්‍යන්තර අධ්‍යයනය අධ්‍යනාංශය
කැලණිය විශ්වවිද්‍යාලය

වෙළුම 4 මුද්‍රණය 1 සැප්තැම්බර් 2022

# ලොව දිනූ චරිත

ජාත්‍යන්තර අධ්‍යයනය විෂය ශිෂ්‍ය සංගමය

ජාත්‍යන්තර අධ්‍යයනය අධ්‍යයනාංශය

කැලණිය විශ්වවිද්‍යාලය

ශ්‍රී ලංකාව

# හැඳින්වීම

ජාත්‍යන්තර දේශපාලනය නව මානයකට යොමු කළ රාජ්‍ය නායකයින් සහ සමාජ ක්‍රියාකාරකයින් රාශියක් බිහිවූ දකුණු ඇමරිකානු කලාපය වර්තමාන ජාත්‍යන්තර සබඳතා තුළ කොතරම් දුරට සාකච්ඡාවට ලක්වනවාද යන්න ගැටලුවකි. ලෝක ඉතිහාසය සලකා බලන කල්හි, නව සමාජ මතවාදයන් ඉදිරිපත් කරමින් එම මතවාදයන් ජයග්‍රහණය කිරීමෙහිලා සුවිශේෂී කාර්යභාරයක් ඉටුකළ රාජ්‍ය නායකයින් බොහෝ සංඛ්‍යාවක් මෙම කලාපයෙන් බිහිවී තිබීම මෙම කලාපය තුළ ඇති දේශපාලනික, ආර්ථික හා සමාජීය ගතිකත්වය පැහැදිලි කරයි. භූ දේශපාලනික වශයෙන් සැලකීමේදී ලොව සිව්වන විශාලතම මහද්වීපය වන දකුණු ඇමරිකාව, ස්වාධීන රාජ්‍යයන් දහයකට අධික සංඛ්‍යාවකින් සමන්විත වේ. සියවස් කිහිපයක්ම යුරෝපීය රාජ්‍යයන්ගේ යටත්විජිත ලෙස පැවති මෙම රාජ්‍යයන් දහනවවන සියවසේදී ස්වාධීන රාජ්‍යයක් බවට පත්විය.

කෙසේවෙතත්, පසුකාලීනව මෙම රාජ්‍යයන් බටහිර ආධිපත්‍යය තුළින් ක්‍රියාත්මක කරන ලද බල ක්‍රීඩාවේ ඉත්තන් බවට පත්විය. එවැනි පසුබිමක් තුළ තම රාජ්‍යයන්ගේ ස්වාධීනත්වය වෙනුවෙන් සහ කලාපීය ස්ථාවරත්වය වෙනුවෙන් අධිෂ්ඨානශීලීව කටයුතු කළ රාජ්‍ය නායකයින් මෙම කලාපය තුළින් බිහිවීමට හේතු වූ අතරම, ඔවුන් තමන්ට ආවේණික දේශපාලනික, ආර්ථික හා සමාජීය අනන්‍යතාවයක් ගොඩනගා ගැනීමටද සමත් වූහ. සැබැවින්ම මෙම කෘතියේ ඇතුළත් චරිත ලොව දිනූ චරිත බවට පත්වන්නේ එකල සමාජයේ පැවති දුර්වලතා හා විෂමතාවලට විරුද්ධව ඍජුව හා නොබියව හඬ නගමින් තම සමාජය නව චින්තනයකට යොමු කිරීමට ඔවුන්ට තිබූ හැකියාව හේතුවෙනි. මෙවැනි චරිත තුළින් වර්තමාන සමාජයටද උගත හැකි දේ බොහෝය.

මෙම කෘතිය තුළින් ගෙටලියෝ වර්ගාස්, බෙනීටෝ හු'ආරේ, හුආන් පෙරෝන්, හුආන් මැනුඑල් සැන්ටෝස්, මිෂෙල් බැච්ලේ, රෆායෙල් කොරයා, හියුගෝ රෆායෙල් චාවේස්, ඊවෝ මොරාලෙස්, ෆිදෙල් කැස්ත්‍රෝ සහ ජොසේ මුජිකා යන රාජ්‍ය නායකයන් ගේ ළමා කාලය හා අධ්‍යාපනය, දේශපාලනයට පිවිසීම හා බලයට පත් වීම, රට තුළ ඔවුන් විසින් ක්‍රියාත්මක කරන ලද ප්‍රතිපත්තීන් හා විදේශ ප්‍රතිපත්තීන් මෙන්ම ඔවුන්ගේ චරිත තුළින් උගත හැකි ආදර්ශ පිළිබඳව සාකච්ඡා කෙරේ.



## කැලණිය විශ්වවිද්‍යාලයීය උපකුලපතිතුමියගේ පණිවිඩය

ශ්‍රී ලාංකීය අධ්‍යයන ක්ෂේත්‍රය තුළ පර්යේෂණ, ගවේෂණ හා විශ්ලේෂණය තුළින් සිය අධ්‍යයන කටයුතු සාධනීය ඉලක්ක කරා මෙහෙයවීමට විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන් ගන්නා වෑයම ප්‍රශංසනීයයි. කැලණිය විශ්වවිද්‍යාලයේ ජාත්‍යන්තර අධ්‍යයන අධ්‍යයනාංශය මගින් සිවුවැනි වරටත් මහත් අභිමානයෙන් කරලියට ගෙන එන "ලොව දිනූ චරිත" නැමැති මෙම නිර්මාණාත්මක හා විශ්ලේෂණාත්මක ග්‍රන්ථය තුළින් ගෝලීය ඉතිහාසයේ ශ්‍රේෂ්ඨ පුද්ගල චරිත පිළිබඳ මනා විවරණයක් සපයන බව පෙනෙයි.

මෙය විද්‍යාර්ථීන්ගේ ආකල්ප, කුසලතා, නිර්මාණාත්මක හැකියාවන් පෝෂණය කරමින් සමාජයීය ප්‍රගමනයට ඉවහල් වන පරිපූර්ණ මිනිසෙකු නිර්මාණයට ඉමහත් පිටිවහලක් වන බව මගේ විශ්වාසයයි.

ඒ සඳහා සිය කාලය, ශ්‍රමය කැප කරමින් නිසි මඟ පෙන්වූ අපගේ ආචාර්ය මණ්ඩලයටත්, ග්‍රන්ථය සඳහා පත් ඉරු සකසමින් දායකත්වය ලබාදුන් සැමටත්, මෙම කර්තව්‍ය සාර්ථක කරගැනීමට නන් අයුරින් සහාය ලබාදුන් සැමටත් ස්තුතිය පළ කරමි. මෙම කාර්යය වසරක් පාසා අඛණ්ඩව ඉටුකරගෙන යාමට හැකිවේවා යි සුභාශිංසන පිරිනමමි.

**ජ්‍යෙෂ්ඨ මහාචාර්ය නිලන්ති ද සිල්වා**
**උපකුලපති**
**කැලණිය විශ්වවිද්‍යාලය**



**කැලණිය විශ්වවිද්‍යාලයීය සමාජීය විද්‍යා පීඨයේ පීඨාධිපතිතුමන්ගේ පණිවිඩය**

කැලණිය විශ්වවිද්‍යාලයේ ජාත්‍යන්තර අධ්‍යයන අධ්‍යනාංශය විසින් වාර්ෂිකව එළිදක්වනු ලබන, ජාත්‍යන්තර දේශපාලනය තුළ කැපීපෙනෙන නායකත්වයන් හා පුද්ගල චරිත අලලා සැකසුනු නිර්මාණශීලී ලිපි වලින් සැදුම්ලත් "ලොව දිනූ චරිත" ග්‍රන්ථ මාලාවේ සිව්වැනි වෙළුම ජාත්‍යන්තර අධ්‍යයන අධ්‍යනාංශයේ සිසු කැළ මඟින් මෙසේ සාර්ථකව ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම ඉතාමත් අගනා ප්‍රයත්නයක් ලෙස සැලකිය හැකිය.

ලොව බිහිවූ ශ්‍රේෂ්ඨ චරිත පිළිබඳ විමර්ශනයන් සිදු කොට ඔවුන්ගේ අද්විතීය මෙහෙවර පිළිබඳ අනාගත පරපුරට අවබෝධයක් ලබා දීමටත්, සිය අධ්‍යයන කටයුතු මෙන්ම ජීවන අත්දැකීම් පරිපූර්ණත්වයට මෙහෙයවමින් මෙම ග්‍රන්ථය සඳහා ලිපි සම්පාදනය කර දුන් විද්‍යාර්ථීන්ගේ බුද්ධිමය කුසලතා සහ හැකියාවන් පිළිබඳව මා අතිශය සතුටට පත්වෙමි. එමෙන්ම ඔවුන්ගේ එම දක්ෂතා ප්‍රදර්ශනය කිරීමට මෙවැනි අවස්ථාවක් උදාකර එහි ප්‍රතිඵල භුක්ති විඳීමට ඔවුන්ට ඉඩහසර උදාකර දුන් ජාත්‍යන්තර අධ්‍යයන අධ්‍යනාංශයටත්, එහි ආචාර්ය මණ්ඩලයටත් ජාත්‍යන්තර අධ්‍යයන විෂය ශිෂ්‍ය සංසදයටත් මාගේ හදපිරි ප්‍රණාමය පුදකරමි.

**මහාචාර්ය එම්. එම්. ගුණතිලක**
**පීඨාධිපති**
**සමාජීය විද්‍යා පීඨය**
**කැලණිය විශ්වවිද්‍යාලය**



## කැලණිය විශ්වවිද්‍යාලයීය ජාත්‍යන්තර අධ්‍යයනය අධ්‍යයනාංශයේ අංශාධිපතිතුමාගේ පණිවිඩය

කැළණිය විශ්ව විද්‍යාලයේ ජාත්‍යන්තර අධ්‍යයන අධ්‍යයනාංශයේ විද්‍යාර්ථීන් මගින් වාර්ෂිකව එළි දක්වන "ලොව දිනූ චරිත " සංවාදාත්මක ලිපි එකතුව ග්‍රන්ථයක් ලෙස සිවුවැනි වරටත් එළි දැක්වීමට හැකිවීම පිළිබඳව මම මාගේ හදපිරි ප්‍රණාමය පුද කරමි.

පසුගිය වර්ෂවලදී ද අප විසින් ලෝකප්‍රකට නායකයින් පිළිබඳව ග්‍රන්ථ ඉදිරිපත් කළ අතර, මෙවරත් අප ලතින් ඇමරිකානු රටවල නායකයින්ගේ චරිතාපදාන එකතුවක් එළිදැක්වීමට බලාපොරොත්තු වෙමු. විෂය පථයට සීමා නොවී ලොව ශ්‍රේෂ්ඨ චරිත පිළිබඳව විශ්ලේෂණය කරමින් නිර්මාණාත්මක කතිකාවක් ගොඩ නැගීමටත්, එමගින් පුද්ගල චරිත අනාගත අභිවෘද්ධිය කරා මෙහෙයවීමටත් ගන්නා ලද මෙම වෑයම ප්‍රශංසා කළ යුතුය. අධ්‍යතන යුගයේ විශ්ව විද්‍යාල විද්‍යාර්ථීන් වශයෙන් ගෝලීය දැනුම් සම්භාරයක් සොයායාමේ තවත් එක් මාවතක් ලෙස මෙම කර්තව්‍යය සාර්ථකත්වයට ළඟා වනු දැකීම ඉමහත් සතුටකි.

මෙම වෑයමට සිය ශක්තිය එක් කරමින් මේ සඳහා ලිපි සැකසීම්, සෝදුපත් කියවීම්, පිටු සැකසීම් පෙරටුකරගත් සියලුම කාර්යයන් සඳහා සිය කාලය, ශ්‍රමය කැප කරමින් නොයෙක් අයුරින් දායක වූ අපගේ ආචාර්ය මණ්ඩලයටත්, ජාත්‍යන්තර අධ්‍යයන විෂය ශිෂ්‍ය සංසදයේ සාමාජික සාමාජිකාවන්ටත්, අප අධ්‍යනාංශයේ විද්‍යාර්ථීන්ටත් විශේෂ ස්තුතියක් පිරිනමමි. මෙය සාර්ථකත්වය කරා මෙහෙය වූ සියලු දෙනාටම ස්තුතිවන්ත වන අතර ඉදිරි කටයුතු සාර්ථක වේවායි ප්‍රාර්ථනා කරමි.

**ආචාර්ය චාමින්ද අබේසිංහ**
**අංශ ප්‍රධාන**
**ජාත්‍යන්තර අධ්‍යයනය අධ්‍යයනාංශය**
**කැලණිය විශ්වවිද්‍යාලය**

ප්‍රධාන සංස්කාරක

- ආචාර්ය චාමින්ද අබේසිංහ
- කථිකාචාර්ය හෂාන් විරාජ් විජේසිංහ
- සහය කථිකාචාර්ය නිසයුරු ආරියවර්ධන

සංස්කාරක

- මදාරා ජයලත්
- හිමේෂ රන්දිල්

සහය සංස්කාරක

- නිසලි එදිරිසිංහ
- මන්දාකිණි අත්තනායක
- කුළුණි විතානගේ
- අංජනා සන්දීපනී
- ශෂිණි විජේතිලක
- ජනිත් මධුෂාන්
- චාමික ගුණවර්ධන
- සත්‍යා තත්සරණි
- සඳනි විතානගේ
- විශ්මි ප්‍රනාන්දු

ජාත්‍යන්තර අධ්‍යයනය විෂය ශිෂ්‍ය සංසදයේ නිලධාරී මණ්ඩලය

- සභාපති :- මන්දාකිණි අත්තනායක
- ලේකම් :- නිසලි එදිරිසිංහ
- සංස්කාරක :- මදාරා ජයලත්
- කණිෂ්ඨ භාණ්ඩාගාරික :- දසුනි හපුගොඩ
- උප සභාපති :- පුබුදු මාලිංග
- උප ලේකම් :- අමල්කා අංජලී

- කණිෂ්ඨ සංස්කාරක :- හිමේෂ රන්දිල්
- සගරා සංස්කාරක :- විශ්මි ප්‍රනාන්දු
  රුචිකා කිෂොරේ

නිර්මාණ සංකල්පය හා මෙහෙයවීම

- ලක්ෂ්මන් ප්‍රනාන්දු (බාහිර කථිකාචාර්ය)

පිට කවර නිර්මාණය

- සුභානි වික්‍රමසිංහ

# පටුන

1. ගෙටලියෝ වර්ගාස්

2. බෙනිටෝ හු’ආරේ

3. හුආන් පෙරෝන්

4. හුආන් මැනුඑල් සැන්ටෝස්

5. මිෂෙල් බැචලේ

6. රෆායෙල් කොරයා

7. හියුගෝ රෆායෙල් චාවේස්

8. ඒවෝ මොරාලෙස්

9. ෆිදෙල් කැස්ත්‍රෝ

10. ජොසේ මුජිකා


‘

# පෙළගැස්ම

මෙම කෘතියේ ඇතුළත් සියලුම ලිපි පොදු ආකෘතියක් යටතේ පෙළගස්වා ඇත. එම ආකෘතිය පහත පරිදි වේ:

- හැඳින්වීම
- ළමා කාලය
- අධ්‍යාපනය හා දේශපාලනයට පිවිසීම
- නායකත්වය කරා ගිය ගමන් මඟ
- නායකත්වයට පැමිණීමෙන් පසු සිදු කළ සේවාව
- විදේශ ප්‍රතිපත්තිය
- ගත හැකි ආදර්ශ
- සාරාංශය

# ගෙටලියෝ වර්ගාස්



**කණ්ඩායම් සාමාජිකයින් ඃ**

- නවෝදා බණ්ඩාර
- දෙව්තිලිණි විජේමාන්න
- ශානිකා ගිම්හානි
- චමෝදි ලක්ෂිකා
- මල්කි පෙරේරා

# හැඳින්වීම

අතීත බ්‍රසීල ජන හදවත් තුළ විටෙක තමා පිළිබඳව ආකර්ෂණයකුත් තවත් විටෙක ජනතා අප්‍රසාදයකුත් ඇති කරලමින් පුරාවසර 15ක් (1930-1945) නොකඩවා දේශපාලන ලෝකයෙහි ඉතා බලවත්ව සිටීමට ද නැවත වසර 4ක් (1951-1954) බලයේ සිටීමට ද තරම් ප්‍රවීණයෙකු වූ "ගෙටලියෝ වර්ගාස් " (Gautilio Vargas) සැබවින්ම කැප කිරීම් හමුවේ තම බලය ලබා ගත් පුද්ගලයෙකු විය. උපතින්ම දේශපාලන බලයෙන් යුතු පවුලක උපත ලැබූ "වර්ගාස්" තම දේශපාලන දිවිය ඉතා තරුණ වියේදීම ඇරඹූ අතර විසිවන සියවස තුළ දී බ්‍රසීලයෙහි වැඩිම කාලයක් දේශපාලන ආධිපත්‍යක් සහිතව නායකත්වය දැරූ නායකයා ද විය. අතීත බ්‍රසීල දේශපාලන නායකත්වයන් දෙස බැලීමේදී වර්ගාස්ගේ නායකත්ව ධූර කාලයන් ලෙස 1930-1945, 1951-1954 යන කාලයන් අපට පෙන්වාදිය හැකිය. මෙහිදී 1930-1945 කාල සීමා ඉතා වැදගත් අවධීන් වන්නේ මෙම 15 වසර වර්ගාස්ගේ බලවත්ම දේශපාලන කාල සීමාව වූ නිසාය.

එමෙන්ම මනා තීක්ෂණ ඥානයක් සතු වූ ඔහු බ්‍රසීල කම්කරුවන්ගේ සමාජ පන්තිය තම දේශපාලනයේ පදනම බවට පත් කරගත් අතර මෙම පන්තීන් හට යම් ශක්තියක් ලබා දෙමින් ඔහුගේ දේශපාලන දිවිය ගෙන යාමට තීරණය කර තිබුණි. ඒ අනුව "වර්ගාස්" ග්‍රාමීය සමාජ හා කම්කරු පන්තිය සමඟ මනා සබඳතාවයක් පවත්වාගනිමින් බලය අඛණ්ඩව පවත්වාගෙන යන්නට විය. මේ හේතූන් නිසාම ඔහු "දුප්පතුන්ගේ පියා" යන අන්වර්ථ නාමයෙන් ජනයා අතර ප්‍රචලිත විය.

මෙලෙස තම තරුණ වියේදීම දේශපාලනයට පිවිසීමට ඔහු නිර්භීත වුව ද එම ගමන් මාර්ගය එතරම් පහසු නොවී ය. අනේක බාධක, තර්ජන, අහිමිවීම් මෙන්ම හිමිවීම් යටතේ තම දේශපාලන දිවිය තමන්ට හැකි අයුරින් පවත්වාගෙන යන්නට ඔහු උත්සාහ කළේ ය. ඇතැම් විට අත්තනෝමතිකව තම බලය ඒකාධිකාරීව භාවිතා කරන්නට වූ අතර තවත් විටෙක ඔහු තම බලය සීමා කළේ ය.

ඒ අනුව මෙලෙස ආර්ථික, සමාජීය දේශපාලන යන විවිධ ක්ෂේත්‍රයන් ඔස්සේ එතුමාගේ සේවයන් රටට ලබා දුන් අතර එහි ප්‍රතිඵල වර්තමානය වන විටද බ්‍රසීල ජනයා භුක්ති විඳිනු නොඅනුමාන ය.

මෙවන් අමරණීය නමක් සහිත මිනිසෙකුගේ,

- ළමා කාලය අධ්‍යාපනය හා දේශපාලනයට පිවිසීම
- නායකත්වය කරා ගිය ගමන් මග
- නායකත්වයට පැමිණීමෙන් පසු සිදු කළ සේවාව
- විදේශ ප්‍රතිපත්තිය
- ගත හැකි ආදර්ශ

යනාදිය පිළිබඳව ගැඹුරු විශ්ලේෂණයක මෙමගින් යෙදේ.

## ළමා කාලය අධ්‍යාපනය සහ දේශපාලනයට පිවිසීම.

ගෙටලියෝ නෝර්නල්ස් වර්ගාස් (Getulio Dornelles Vargas) උපත ලබන්නේ 1882 වසරේ අප්‍රේල් මස 19 වන දිනයි. මදුරියෝ ග්‍රෑන්ඩ් ඩු සුල් හි සාඕ බෝර්ජා (Sao Borja, Rio Grande do sul) උපත ලැබීය. මනෝයෙල් ඩො නැන්සිමෙන්ටෝ වර්ගාස් (Manuel do Nascimento Vargas) සහ කැන්ඩිඩා ඩොර්නෙල්ස් වර්ගාස්ට (Candida Dornelles Vargas) දාව උපන් පුතුන් පස් දෙනාගෙන් තෙවැන්නා ලෙස ඔහු මෙලොව එළිය දුටුවේ ය.

කාම්බෝර්ජා පිහිටා තිබුණේ ආජන්ටිනා සහ බ්‍රසීල දේශසීමාවට සමීපව ය. දේශපාලන, සන්නද්ධ ගැටුම් සහ ජාවාරම් යනාදී හේතූන් නිසා රියො ග්‍රෑන්ඩ් ඩු සුල් හි පැවතියේ සාමාකාමී වටපිටාවක් නොවේ. වර්ගාස්ගේ සහෝදරයෙකුට ඝාතන දෙකක් සම්බන්ධයෙන් චෝදනා එල්ල වීම මේ සඳහා නිදසුන් සපයයි. වර්ගාස්ගේ ළමා කාලය හැඩ ගැසෙන්නේ මෙවන් හැලහැප්පීම් මධ්‍යයේ ය. මෙවැනි සංසිද්ධීන් පසුකාලීනව ඔහුගේ දේශපාලන ගමන් මගට හා නායකත්ව භූමිකාවට බලපෑමක් නොකළා යැයි කාට නම් කිව හැකිද? වර්ගාස්ගේ පියා වන මනෝයෙල් හා මව වන කැන්ඩිඩා එකල ප්‍රබල දේශපාලන කණ්ඩායම් දෙකක් නියෝජනය කරන ලද අතර මෙම කණ්ඩායම් දෙක අතර සහයෝගය හේතුවෙන් වර්ගාස්ගේ මවට හා පියාට මිනිසුන්ගේ ගෞරවය නොඅඩුව ලැබුණි.


වයස අවු: 07 දී වර්ගාස්

විශේෂයෙන් ම වර්ගාස්ගේ පියා වූ මනෝයොල් පැරගුවේ යුද්ධයේදී සුවිශේෂී මෙහෙයක් ඉටුකළ චරිතයක් වූ අතර එය ඔහුට ගෞරවනීය හමුදා ජෙනරාල්වරයෙකු ලෙස ප්‍රාදේශීය රියෝග්‍රැන්ඩෙන්ස් රිපබ්ලිකන් පක්ෂයේ (Riograndense Republican Party) නායකයා ලෙස ඉහළට ඒමට හේතු විය. එහිදී ඔහුගේ දේශපාලන කණ්ඩායම රිපබ්ලිකන් පක්ෂය (Republican Party) සමඟ සටන් කරන ලදි. ෆෙඩරල්වාදී රියෝග්‍රැන්ඩෙන්ස් විප්ලවය අතරතුර කැන්ඩිඩා නියෝජනය කරන ලද දේශපාලන පක්ෂය ෆෙඩරල්වාදීන් බවට පත්වන ලදි. කෙසේ වෙතත් කැන්ඩිඩා මනෝයෙල් විවාහය කලාපයේ සටන් කණ්ඩායම් දෙකක් එක් කිරීමට හේතු විය. මෙවැනි දේශපාලන පසුබිමක් තුළ වර්ගාස්ගේ ළමා කාලය ගත විය. මෙම පසුබිම තුළ ඔහුට තම ළමා කාලය සතුටින් ගත කිරීමට හැකි විය.

වර්ගාස් තම ප්‍රාථමික අධ්‍යාපනය ලබන්නේ සාම් බෝර්ජා හි පෞද්ගලික ප්‍රාථමික පාසලක ය. නමුත් ඔහුට ප්‍රාථමික අධ්‍යාපනය නිම කිරීමට නොලැබෙන්නේ ඔහුව මිනාස් ජෙරෙයිස් හි යුරෝ ප්‍රිටෝ (Minas Gerais, Ouro preto) නම් පුහුණු පාසලකට යවන හෙයිනි.

තරුණ වියට එළඹීමෙන් පසු රියෝ පර්ඩෝහි (Rio pardo) හමුදා වෘත්තියේ නිරත වූවත් ඔහුගේ සිහිනය වූයේ නීති විද්‍යාලය යි. නමුත් සිදු කළ වෛද්‍ය පරීක්ෂණයක ප්‍රතිඵලයක් හේතුවෙන් වර්ගාස්ට හමුදා සේවයෙන් ඉවත්වීම ප්‍රමාද විය.

ව්‍යාජ ලේඛන සකසා ගනිමින් හමුදා වෘත්තියෙන් ඉවත් වූ ඔහු පෝටෝ ඇලග්‍රේ හි (Porto Alegre) නීති විද්‍යාලය තුළ ශිෂ්‍ය ජනරජ කණ්ඩායමේ (Students republican faction) ක්‍රියාකාරී සාමාජිකයෙකු වූ අතර නීති විදුහලේ පුවත් පත වන "ඕ

විවාදය"(O Debate) හි කතෘ සහ පැතිකඩ ලේඛකයෙකු ලෙස සේවය කළේ ය. නීති විද්‍යාලයේ ඉගෙනුම ලබන කාලය තුළ  වර්ගාස් සහ ඔහුගේ මිතුරන් එවකට දේශපාලකයෙකු වූ "ජෙලියෝ ඩි කැස්ටිල්හෝස්" ගේ (Julio de castilhos) අදහස් වැළඳ ගන්නා ලදි. මෙය වර්ගාස්ගේ දේශපාලන දිවියේ පදනමෙහි මුල්ගල තැබීම ලෙස සැලකිය හැකිය. කැස්ටිල්හෝස්ගේ මරණයෙන් පසු ඔහුගේ අදහස්වලට ජීවය ලබා දීම සඳහා වර්ගාස් ඇතුළු මිතුරන් බ්ලෝකෝ ඇකනමික්තෝ කැස්ටිල්හිස්ටා (Castilhista Academic Block) නිර්මාණය කරන ලදි. ඔහු දක්ෂ කථිකයෙකු ලෙසද කැපී පෙනුණු අතර 1907 දී තම උපාධිය ලබා ගන්නා ලදි. නීති විද්‍යාලයෙන් උපාධිය ලබා ගැනීමෙන් අනතුරුව ඔහුට නීතිඥයෙකු ලෙස කටයුතු කිරීමට අවස්ථාව තිබුන ද ඔහු තෝරා ගත් මාවත දේශපාලනය යි. උපාධිය ලැබීමෙන් පසු රියෝ ග්‍රෑන්ඩ් සුල්ගේ රිපබ්ලිකන් පක්ෂයට බැඳීම හරහා ඔහු දේශපාලනයට පිවිසියේ ය. ඔහුගේ පක්ෂය විසින් ඔහුව රියෝ ග්‍රෑන්ඩ් ඩු සුල් රජයේ නීතිපති ලෙස පත් කරන ලදි.

කුඩා කල සිට වර්ගාස් විසින් ලැබූ මිල කළ නොහැකි අත්දැකීම් 1909 දී ඔහුව රාජ්‍ය නියෝජිත මණ්ඩලය වෙත ගෙන යන ලදි. 1916 දී රජයේ පොලිස් ප්‍රධානියා වීම ප්‍රතික්ෂේප කළ ඔහු නැවතත් රාජ්‍ය නියෝජිතයෙකු ලෙස තේරී පත් විය. පසුව ඔහුව පක්ෂ නායකයා ලෙස නම් කරන ලදි. ෆෙඩරල් දේශපාලනයේ රියෝ ග්‍රෑන්ඩ් ඩු සුල්ගේ බලය යථා තත්ත්වයට පත් කිරීමට කටයුතු කිරීම ද ඔහුගේ දේශපාලන ගමන්මග හැඩගැන්වීමට බලපාන ලදි.

1923දී වර්ගාස් ජාතික නියෝජිතයෙකු බවට පත් වීම, ගවුචෝ නියෝජිතයන්ගේ කණ්ඩායමට නායකත්වය ලබා දීම, 1924 දී රියෝ ග්‍රෑන්ඩ් ඩු සුල් කොන්ග්‍රස් නියෝජිත කණ්ඩායමේ නිල නායකයා බවට පත් වීම, 1925 දී ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අධ්‍යනය කරන කොමිසමක සාමාජිකයෙකු ලෙස රජයේ වැඩි අධිකාරියක් වර්ගාස්ට හිමිවීමට හේතු වූ අතර එය දේශපාලනයට පිවිසීමට මංපෙත් විවර කරන ලදි.

# නායකත්වය කරා ගිය ගමන් මග



*ජනාධිපති වර්ගාස්*

බ්‍රසීල ඉතිහාසයේ අතීත දේශපාලනය තුළ සංවාද විවාද වලට නිරතුරුවම කතා බහට ලක්වන චරිතයක් ලෙස "ගෙටලියෝ වර්ගාස්" පෙන්වාදිය හැකිය. සැබවින්ම ඔහු නිරතුරුව ම බ්‍රසීල ජනතාවටම යහපතක් සැලසීමට උත්සාහ කළේ ය. එම නිසා ඔහු නායකත්වය කරා ගිය ගමන් මග අධ්‍යයනය කිරීමේ දී ඒ තුළ ඔහුගේ ජයග්‍රහණ අභියෝග වැනි දේ දක්නට ලැබේ.

බ්‍රසීල ඉතිහාසය තුළ ශ්‍රේෂ්ඨ චරිතයක් වූ ගෙටලියෝ වර්ගාස් අවධි කිහිපයක් ඔස්සේ දේශපාලන දිවියට පිවිසීමටත්, ඔහුගේ නායකත්ව අරමුණු සඵල කර ගැනීමටත් සමත් වූයේ ඔහු  තුළ පැවති නොමඳ උත්සහවන්ත හා අධිෂ්ඨානශීලී බව නිසාවෙනි. නමුත් "වර්ගාස්" හට ඔහුගේ නායකත්වය කරා පැමිණි ගමන් මග අභියෝගවලින් සමන්විත විය.

දේශපාලනයට පිවිසීමට ප්‍රථම ඔහු නායකත්වය කරා ගිය ගමන් මග පිළිබඳව අප සොයා බැලීමේදී අපට පෙනී යන්නේ ඔහුගේ වෘත්තිමය නීතිඥ ජීවිතයට හා

රාජ්‍යමය ප්‍රතිපත්ති සැකැස්මට ඔහු වැඩි උනන්දුවක් දැක් වූ බවය. සැබවින්ම එම හැකියාවන් ඔහුගේ නායකත්ව ගමනට උදව් විය.

වර්ගාස් උපතින්ම ලද දේශපාලන පසුබිම නොතකා සිය උත්සාහයෙන්ම නීති විද්‍යාලය තුළින් ලද පන්නරය තුළින් රියෝ ග්‍රෑන්ඩ් සුල්හි රිපබ්ලිකන් පක්ෂයෙන් දේශපාලනයට පිවිසියේ ය. මෙම කාලවකවානුවේදී නීති විද්‍යාලයෙන් පිට වූ ඔහුව තෝරාගනු ලැබූයේ  රියෝ ගෑන්ඩ් සුල්හි නීතිපති ලෙසයි. සැබවින්ම මෙය දේශපාලන දිවියෙහි මූලාරම්භය බවට පත් වූ  අවලාදවලට පවා හේතු විය. එයට හේතුව වූයේ වර්ගාස්ට මෙම තනතුර හිතමිත්‍රාදීන් නිසා ලැබුණු බව ප්‍රචාරය වීම ය. විහිළු කාටූන් පවා මෙයට නිර්මාණය වූ අතර අපහාස, උපහාස ප්‍රකාශන නිතැතින්ම ලැබුණි.

ඒ අනුව ආරම්භයේදී ඔහුගේ දේශපාලනයට බාධක හා අභියෝග මධ්‍යයයේ සිදු වූ බව පෙනේ. නමුදු ඔහු මෙය ඉතා වටිනා අත්දැකීමක් ලෙස සලකමින් තම පක්ෂයේ කීර්තිය හා පක්ෂපාතීත්වය තව තවත් ගොඩනගා ගනිමින් 1907 දී රාජ්‍ය නියෝජ්‍ය මණ්ඩලයට තේරී පත් විය. ඒ අනුව ඔහුගේ කීර්තිමත් දේශපාලන දිවිය මෙයින් ඇරඹීමට හැකි විය. එමෙන්ම ඔහු "ගෞචෝ" (Gaucho) ඉඩම් අධිකාරියෙහිද සාමාජිකයෙකු වූ අතර එහි අනුග්‍රහය ඔහුගේ නායකත්වය කරා ගිය ගමන් මගට පන්නරයක් විය.

ඔහු ඉතා ලාබාල තරුණයෙකු වුවද අවස්ථා කළමනාකරණයෙහි දක්ෂයෙකු විය. එමෙන්ම ටික කලකින් මෙම තනතුරට අමතරව "පොර්ටෝ ඇලග්‍රේනි" (ඉඩම් අධිකාරියෙහි සාමාජික) ප්‍රවර්ධයෙකු හා කනිෂ්ඨ මහජන පරීක්ෂකයෙකු ලෙස ද සිය නීති ජීවිතය ආරම්භ කළේ ය. එමගින් ඔහු නිරන්තරයෙන් ජාතික ගැටළු විසඳීමේ සාමාජිකයෙකු වූ අතර කම්කරු පන්තිය තුළ ජනප්‍රිය චරිතයක් විය.

කෙසේ නමුදු වර්ගාස්ගේ දේශපාලන දිවිය 1912 පමණ වන විට බිඳ වැටීම ආරම්භ වූ අතර 1913 - 1917 අතර කාලය වන විට බිඳ වැටුණි. නැවත ඔහු දේශපාලනයට පිවිසීමට තීරණය කළ අතර 1916 වර්ෂයෙහි අග භාගය වන විට රාජ්‍ය උප නියෝජිත වරයෙකු ලෙස නැවත තේරී පත් වූ අතර මෙම සේවා කාලය තුළ ඔහු පක්ෂයේ නායකයා ලෙස නම් කෙරිණි.

එමෙන්ම ඔහුගේ මෙම නායකත්වය කරා ගිය මගෙහි මෙඩිරෝස් (Medeiros) මෙම කාල සීමාවේ සිට බ්‍රසීල ජනාධිපතිවරයා විසින් නැවත බලය තහවුරු කිරීමේ වගකීම වර්ගාස්ට පවරණ ලද අතර රාජ්‍ය මැතිවරණ ප්‍රතිඵල සත්‍යාපනය කිරීමේ මැතිවරණ කොමිසමේ සභාපතිවරයා ද විය. තවද ඔහු විසින් සවින් 1923 රියෝ ගාන්ඩ් සුල්හි පැවති දෙවන සිවිල් යුධ සමයේදී රජය සමග එක්ව හමුදාවන්ට නායකත්වය ලබාදෙනු ලැබීය. ඔහු මෙම කාලවකවානුවේදී පැවති යුද්ධයේ තර්ජනවලට එරෙහිව හමුදාවනට නායකත්වය ලබා දුන්නේ ය. මෙවැනි කරදරකාරී කාලවකවානුවක් තුළදී ඔහු මැඩිරෝසේ විශ්වාසවන්තම පුද්ගලයා බවට පත් වූ අතර 1923 ජාතික නියෝජිතවරයෙකු විය. එහිදී ඔහුගේ මූලික පරමාර්ථය වූයේ සිවිල් යුද්ධ අතරතුර ප්‍රාන්ත රජයට එය පාලනය කිරීමට උදව් කිරීම ය.

තවද ඔහු 1924 දී වර්ගාස් රියෝ ගැන්ඩ් සුල්හි කොන්ග්‍රස් නියෝජිත කණ්ඩායමෙහි නිල නායකයා ලෙස තේරීපත් විය. මෙම කාල වකවානුවේදී ඔහු විසින් බලය ඉලක්ක කරගත් කැරලි කෝලාහල ඇති කරන ලදි. එහිදී වර්ගාස් කොන්ග්‍රස් සභිකයෙකු ලෙස වඩාත්ම කැපී පෙනුණි. 1925 දී ඔහු වර්ගාස් ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ කොමිසමේ සාමාජිකයෙකු ලෙස තේරී පත්විය. ඔහු 1928 දී මුදල් ඇමතිවරයා ද විය. එමෙන්ම වර්ගාස් එවකට තිබූ මැතිවරණයෙ ජූලියෝට හට පරාද වීම හේතුවෙන් 1930 බ්‍රසීල ජනාධිපතිවරණයට තරග කිරීමට අවස්ථාව ඔහුට අහිමි විය. නමුත් වාසනාවන්ත ලෙස වර්ගාස්ට සීමාවාසික ජනාධිපතිවරයා බවට පත් වීමට හැකි වූයේ 1930 දී පැවැත් වූ මැතිවරණය දූෂිත මැතිවරණයක් වූ හෙයින් ඔක්තෝම්බර් මස පාලන රජය බලයෙන් නෙරපා දැමීම හේතුවෙනි.

වර්ගාස් සීමාවාසික ජනාධිපතිවරණයට පත් වීමෙන් පසු 1932 සාම් පව්ලෝගේ නායකත්වයෙන් යුත් කැරැල්ලක් දියත් කරන ලදි. එකල ඔහුගේ රජයට විරුද්ධව ගෙන ගිය විවිධ කැරලිවලින් දිවි ගලවා ගැනීමට වර්ගාස් සමත් විය. ඒ අනුව 1934 වන තෙක් ඔහු මෙලෙස වියවුල්කාරී පාලනයක් ගෙන ගිය අතර අවසානයේ දී ජනාධිපති වීමට නීත්‍යානුකූල මැතිවරණයක් තුළින් වර්ගාස් ජනාධිපති බවට පත්විය.

නමුදු 1935 දී ඇති වූ කොමියුනිස්ට් විප්ලවයකින් දිවි ගලවා ගැනීමට සමත් වූ වර්ගාස් මෙම තත්වය හමුවේ කුමන්ත්‍රණ දියත් කිරීමට පෙළඹුණි. ඒ අනුව 1937 නොවම්බර් මස ඔහු විසින් ම කුමන්ත්‍රණයකට නායකත්වය ලබා දෙන ලදි. 1945 ඔක්තෝබර් වන තෙක් ඔහු බලයේ සිටි අතර නැවත කුමන්ත්‍රණයක් මගින් ඔහුගේ රජය නෙරපා

හරින ලදි. නමුදු ඔහුට සහය ලබාදෙන සැලකිය යුතු පිරිසක් බ්‍රසීලයේ සිටි අතර ඔවුන්ගේ සහයෝගය ලබාගෙන 1945 දී දෙසැම්බර් මස රියෝ ගෑන්ඩ් සුල් වෙතින් සෙනට් සභිකයෙකු ලෙස තරඟ කර මැතිවරණය ජය ගත්තේ ය. ඔහු එම වසරේදී ම බ්‍රසීලියානු කම්කරු පක්ෂයෙන් ද තරඟ කර ජයගත් අතර 1951 ජනවාරි සිය ජනාධිපතිධූරයේ වැඩ භාරගන්නා ලදි.

## නායකත්වයට පැමිණීමෙන් පසු සිදු කළ සේවාව

"දුප්පතුන්ගේ හිතවතා" යන අන්වර්ථ නාමයෙන් හැඳින්වූ ගෙටලියෝ වර්ගාස් තම නායකත්ව කාලසීමාව තුළ දී කළ සේවය ඉමහත් ය. මොහු බ්‍රසීල ජාතික නීතිඥයකු, දේශපාලකයකු මෙන්ම 14 වන හා 17 වන බ්‍රසීල ජනාධිපතිවරයා ලෙස ද සේවය කරනු ලැබීය. එපමණක් ද නොව මොහු විසින් රජයේ නියෝජ්‍ය නිලධාරියෙකු, ප්‍රාන්ත ව්‍යවසායකයකු, ජාතික නීති සම්පාදකයෙකු මෙන්ම ජනාධිපති කැබිනට් සාමාජිකයකු වශයෙන් ද මහඟු කාර්යභාරයක් ඉටු කරනු ලැබීය. ජනාධිපති ධූර කාල දෙකක (1930-1945, 1951-1954) බ්‍රසීලය පාලනය කළ මොහු 20 වන සියවස තුළ රටේ වැදගත් දේශපාලන චරිතයක් බවට පත් විය.

ඔහු විසින් ආර්ථික සංවර්ධනය සඳහා මෙන්ම කම්කරුවන් නගා සිටුවීම සඳහා කළ සේවය වඩාත් කැපී පෙනේ. මහා අවපාතයට (Grear Depression) පෙර 1926 සිට 1928 දක්වා වූ කාලය තුළ බ්‍රසීලයේ කෝපි මත පදනම් වූ යම් ආර්ථික සමෘද්ධියක් පැවතුණි. ඒ අනුව බ්‍රසීලයානු මුදලේ වටිනාකම ස්ථාවර කිරීමේ අරමුණින් වර්ගාස් විසින් ජාතික ප්‍රතිසංස්කරණ පනත් කෙටුම්පතක් ජාතික කොන්ග්‍රසයට ඉදිරිපත් කරනු ලැබීය. එසේම 1928 දී රියෝ ග්‍රෑන්ඩ් ඩූ සුල් හි සභාපති නොහොත් ආණ්ඩුකාරවරයා බවට පත්වීමට පෙර වර්ගාස් මුදල් ලේකම් ලෙස ද වසර දෙකක් පමණ සේවය කළේ ය.

1929 ඔක්තෝබර් 29 දින එක්සත් ජනපදයෙන් ආරම්භ වූ මහා අවපාතය (Grear Depression) බ්‍රසීල ආර්ථිකයට ද ප්‍රබල ලෙස බලපාන ලදි. ඒ අනුව, කෘෂිකාර්මික නිෂ්පාදන පහත වැටීම, විරැකියාව වර්ධනය වීම, විදේශ ආදායම අඩු වීම මෙන්ම රජයේ වියදම් ආදායමට වඩා වැඩි වීම නිසා බ්‍රසීලයට බරපතල ආර්ථික ගැටලුවලට

මුහුණ දීමට සිදු විය. නිදසුනක් ලෙස 1929 සිට 1931 දක්වා කාලය තුළ බ්‍රසීලයේ කෝපි මිල ශීඝ්‍රයෙන් පහත වැටුණි. මේ හේතුවෙන් 1933 පෙබරවාරි 20 දින වර්ගාස්ගේ රජය විසින් "ජාතික කෝපි දෙපාර්තමේන්තුව" පිහිටවනු ලැබීය. එසේම, 1929 වෝල් වීදියේ කඩා වැටීමත් සමඟ රේගු ආදායම මත රට රඳා පැවතීම වලක්වා ගැනීමේ අරමුණින් පාරිභෝගිකයන් සඳහා බද්දක් හඳුන්වාදෙනු ලැබීය. එසේම මොහු කෘෂිකාර්මික අංශය විවිධාංගීකරණයට ලක් කිරීමට කටයුතු කළ අතර කපු වගාව එහි විශේෂයෙන් කැපී පෙනෙන්නට විය. තවද මොහු විසින් දේශීය නිෂ්පාදන දිරිමත් කරමින් ආනයනය සීමා කිරීම සඳහා විවිධ ප්‍රතිපත්තීන් අනුගමනය කරනු ලැබීය. එසේම 1953 දී බ්‍රසීලයේ ඛනිජ තෙල් සංස්ථාව පිහිටුවීම සඳහා මූලිකත්වය දැරුවේ ද මොහු විසිනි. එසේම වාසිදායකවන ආකාරයේ කොන්දේසි නිර්මාණය කරන ලදි.

වර්ගාස් ආර්ථිකය නගාසිටුවීම සඳහා කළ සේවය මෙන්ම කම්කරු ප්‍රජාව උදෙසා කළ සේවයද කැපී පෙනේ. මොහු ප්‍රතිපත්ති විරෝධී ඒකාධිපතියෙකු ලෙස ඇතමුන් හෙළා දුටුවද විශාල ව්‍යාපාරිකයන්ට හා විශාල ඉඩම් හිමියන්ට එරෙහිව කළ සටනේදී ඔහුගේ අනුගාමිකයන් විසින් "දුප්පතුන්ගේ හිතවතා" ලෙස ගෞරවාදරයට පාත්‍ර කරන ලදි. 1930 සිට 1945 දක්වා කාල පරිච්ඡේදය තුළ වර්ගාස්ගේ පරිපාලනයේ වඩාත් වැදගත් අංගයක් වූයේ කම්කරු ප්‍රතිපත්තිය යි. එහි මූලික පරමාර්ථය වූයේ නාගරික කම්කරු පන්තිය රාජ්‍යයෙන් පිටත සංවිධානය වීම මර්දනය කිරීම හා කම්කරු පන්තිය ආණ්ඩුවේ ආධාරකරුවන් බවට පත් කිරීම යි. මේ අනුව ඔහු 1930 නොවැම්බර් මාසයේදී කම්කරු, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයක් පිහිටුවනු ලැබීය. එසේම මොහු කම්කරුවන් ආරක්ෂා කිරීම සඳහා නීති සම්පාදනය කළ අතර කම්කරු නිවාස ඉදිකිරීම ද ආරම්භ කරනු ලැබීය. තවද, 1931 දී කම්කරු කටයුතු සඳහා සංහිඳියා හා බේරුම්කරණ කාර්යාංශයක් ද පිහිටුවනු ලැබීය.

මීට අමතරව, වර්ගාස් විසින් ආගමික හා අධ්‍යාපනික කටයුතු කෙරෙහි ද මහත් සේවයක් ඉටු කරනු ලැබීය. වර්ගාස් බලයට පත්වන විට බ්‍රසීල රජයත් පල්ලියත් අතර සමීප සම්බන්ධතාවක් පැවතුණි. එසේම වර්ගාස්ගේ රජය විසින් ද පල්ලියට පක්ෂව විශේෂ පියවර ගනු ලැබීය. ඒ අනුව, ඔහු 1931 අප්‍රේල් මාසයේදී රජයේ පාසල්වල කිතුනු දහම ඉගැන්වීම සඳහා නියෝගයක් නිකුත් කරනු ලැබූ අතර බ්‍රසීලයේ ආගමික මෙන්ම අධ්‍යාපනික ගැටලු විසඳීමට ද මොහු පියවර ගනු ලැබීය.

ඒ අනුව මොහු 1930 නොවැම්බර් මස අධ්‍යාපන හා සෞඛ්‍ය අමාත්‍යාංශය පිහිටවනු ලැබූ අතර එමගින් අධ්‍යාපනය කේන්ද්‍රගත කිරීමට උත්සාහ කරනු ලැබීය.



*විවිධ ආගමික නායකයන් සමග වර්ගාස්*

තවද, මොහු විසින් විවිධ මැතිවරණ ප්‍රතිසංස්කරණයන් ද සිදු කරනු ලැබීය. ඒ යටතේ මැතිවරණ රහස් ඡන්ද ආරක්ෂා කිරීම, මැතිවරණ යුක්තිය ස්ථාපිත කිරීම, කාන්තාවන්ගේ ඡන්ද අයිතිය තහවුරු කිරීම, මැතිවරණවල සිදුවන වංචා අවම කිරීම ආදිය සිදුකරන ලදි. තවද, මැතිවරණ සංවිධානය, මැතිවරණ අධීක්ෂණය, අභියාචනා පිළිබඳ විනිශ්චය වැනි කාර්යයන් මැතිවරණ නිලධාරීන් වෙත පැවරීමට ද කටයුතු කරන ලදි.

වර්ගාස් විසින් සිදු කරනු ලැබූ මෙකී සේවාවාන්ට අමතරව මොහුගේ විදේශ ප්‍රතිපත්තිය ද පුළුල්ව සාකච්ඡාවට බඳුන් කළ යුතු වේ.

## විදේශ ප්‍රතිපත්තිය

ගෙටලියො වර්ගාස්ගේ පාලන සමය තුළ දී ආර්ථික හා සමාජීය වශයෙන් විශාල වෙනස්කම් රැසක් සිදුවිය. විශේෂයෙන්ම බ්‍රසීලයට අසාධාරණයක් සිදු නොවන අයුරින් ආර්ථික අධිරාජ්‍යවාදී සංකල්පය බිඳ දැමීය. එසේම මොහු ජාත්‍යන්තර

සබඳතාවලදී ආර්ථික ලිබරල්වාදී සංකල්පය හා පුද්ගලවාදය ප්‍රතික්ෂේප කළේ ය. මොහු බ්‍රසීලයේ සාමුහික අවශ්‍යතා සහ බ්‍රසීලයේ ඉරිදි දැක්ම වෙනුවෙන් සිතාබලා ආර්ථිකයට හිතකර විදේශ ප්‍රතිපත්තියක් අනුගමනය කළ බුද්ධිමත් හා දක්ෂ පාලකයකු වුයේ ය. වර්ගාස්ට අවශ්‍ය කර තිබුණේ කර්මාන්ත මත පදනම්ව තිබූ ආර්ථිකයක් ගොඩනැගීමට ය. එසේම පරිපූර්ණ සමානාත්මතාවයක් ඇති කිරීම තුළින් ජනතාවට ප්‍රතිලාභයක් සැලසීමට ය. මොහුගේ විදේශ ප්‍රතිපත්තිය පිළිබඳ සලකා බැලිමේ දී , විශේෂයෙන්ම ජර්මනිය සහ එක්සත් ජනපදය සමඟ ඉතාමත් සමීප සබඳතා පවත්වා ඇත.



*1930 නොවෙම්බර් 3 වන දින ඔහුගේ කැබිනට් මණ්ඩලයේ සාමාජිකයන් සමඟ වර්ගාස්*

ජර්මනිය සමඟ මොහුගේ පාලන සමයේ දී එනම් 1930 මුල් කාල වකවානුව වන විට ආර්ථිකමය වශයෙන් ඉතාමත් මිත්‍රශීලි විදේශ ප්‍රතිපත්තියක් අනුගමනය කළේ ය. ජර්මනියේ ප්‍රධාන නිෂ්පාදන බෝගයක්ව තිබූ කපු කර්මාන්තයේ ප්‍රධාන ආයෝජකයා වුයේ ජර්මනිය යි. එබැවින් බ්‍රසීලය තුළ වාණිජ බැංකු ශාඛා 300ක් පමණ තිබුණි. එසේම ජර්මනියට අවි සැපයූ ප්‍රධානම රට වුයේ බ්‍රසීලයි.

එමෙන්ම ජර්මනියට අවශ්‍ය තාක්ෂණික දැනුම ද ලබා දුන්නේ ය. එනම් 1934 අග භාගය වන විට ජර්මනිය සහ බ්‍රසීලය අතර ඉතාමත් මිත්‍රශිලී විදේශ ප්‍රතිපත්තියක් දක්නට ලැබුණද 1940 පමණ වන විට දෙපාර්ශවය අතර එතරම් හොඳ සබඳතාවයක් දක්නට ලැබුනේ නැත.

1941 පමණ වන විට එක්සත් ජනපදය සහ බ්‍රසීලය සමඟ සබඳතාවයක් දක්නට ලැබුණි. එයට උදාහරණයක් ලෙස දෙවන ලෝක යුද සමයේ දී බ්‍රසීලය මිත්‍ර පාර්ශවයට සහය දැක්වීම සැලකිය හැකිය. එමෙන්ම තවත් නිදසුනක් ලෙස බ්‍රසීලය එක්සත් ජනපදයට අඟල් 96 අතිරික්ත තුවක්කු ලබාදීම පෙන්වා දිය හැකිය. එමෙන්ම බ්‍රසීලය විවිධ අවස්ථාවල එක්සත් ජනපදය සමඟ සිදු කළ සංචාරයන් හේතුවෙන් දෙපාර්ශවය අතර විදේශ ප්‍රතිපත්තිය ශක්තිමත් විය.

ගෙටලියො වර්ගාස් ඉතාලිය සමඟ එතරම් හොඳ සබඳතාවයක් පවත්වාගෙන නොගියද ලතින් ඇමරිකාව සමඟ ආර්ථික වශයෙන් ඉතා හොඳ සබඳතාවයක් පවත්වාගෙන ගියේ ය. එයට නිදසුන් වශයෙන් බ්‍රසීලය වානේ බලාගාරයක් ඉදිකිරීම සඳහන් කළ හැක.

## ගත හැකි ආදර්ශ

ගෙටලියෝ වර්ගාස් බ්‍රසීලියානු ජාතික දේශපාලනඥයෙකු වශයෙන් සිය රට උදෙසා අනගි මෙහෙවරක් ඉටු කළ නායකයෙකු ලෙස ඉතිහාසගත වී ඇත. ඔහු ජනාධිපතිවරයෙකු ලෙස සේවය කළ 1930-1945 සහ 1951-1954 කාල පරිච්ඡේදයන් තුළ බ්‍රසීලියේ දේශපාලන, ආර්ථික සහ සමාජයීය ක්ෂේත්‍රයන්හි වෙනස්කම් රැසක් සිදු කොට තිබේ. එම ප්‍රතිපත්තීන් තුළින් බ්‍රසීලය නව මානයකට යොමු කිරීමට ඔහු සමත් වී ඇත. බොහෝ ඉතිහාසඥයින් ගෙටලියෝ වර්ගාස් හඳුන්වනුයේ 20වන සියවස තුළ බ්‍රසීලයේ දක්නට ලැබෙන වඩාත්ම බලගතු දේශපාලඥයෙකු ලෙසට ය. එමෙන්ම ඔහුගේ ක්‍රියා කලාපය පාදක කොටගෙන ජනතා ප්‍රසාදය නොමදව දිනා ඇති අතර ඔහු "දුප්පතුන්ගේ පියා" නමින් විරුදාවලි ලබයි.

ගෙටලියෝ වර්ගාස් ඒකාධිපති පාලකයකු ලෙස ඇතැමුන් විසින් විවේචනය කළ නමුත් තවත් පිරිසක් විසින් මොහුව ජනතා හිතවාදී පාලකයෙකු ලෙස සලකනු ලබයි. මන්දයත් ඔහුගේ පාලන සමය තුළ මහා පරිමාණ ව්‍යාපාරිකයින්ට සහ ඉඩම් හිමියන්ට එරෙහිව සටන් කිරීමත්, කම්කරු අයිතීන් සුරක්ෂිත කිරීමට පියවර ගැනීමත් හේතුවෙනි. ඊට අමතරව පුළුල් වශයෙන් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හඳුන්වා දීමත් සමාජ ආරක්ෂණ නීති සම්පාදනය කිරීමත් සහ කාන්තාවන්ට ඡන්ද බලය ලබා දීමත් නිසා ඔහු රට වෙනුවෙන් කාර්යක්ෂමව ක්‍රියා කරන හා සමානාත්මතාවය අගය කරන පාලකයකු වූ බව පසක් වේ.

එමෙන්ම ඔහුගේ දූරදක්නා නුවණ ද බ්‍රසීලය නගා සිටුවීමට මහඟු පිටුවහලක් විය. එනම් බ්‍රසීලිය කාර්මික යුගයක් කරා රැගෙන යාමටත්, බ්‍රසීලය තුළ සුභසාධක රාජ්‍යයක් ස්ථාපිත කිරීමටත් මූලික අඩිතාලම දමනු ලැබුවේ ගෙටලියෝ වර්ගාස් විසිනි. ඒ සඳහා ඔහු වැදගත් නීති රීති කිහිපයක් අනුගමනය කළේ ය. ඔහු බ්‍රසීලය ග්‍රාමීය තත්ත්වයේ සිට කාර්මීකරණය දෙසට ගමන් කරවීම සඳහා වේගවත් කාර්මික වැඩ පිළිවෙළක් මගින් ව්‍යාපාර උත්තේජනය කිරීමට පියවර ගත්තේ ය.

ගෙටලියෝ වර්ගාස් කෙතරම් සිය රටට, ජාතියට ඇලුම් කළේ ද කිවහොත් ඔහු ජාතිකවාදය පිළිබඳව නව සංකල්ප දිරිගන්වමින් බ්‍රසීලය ජාත්‍යන්තර තලයේ ශක්තිමත් රාජ්‍යයක් ලෙසට නගාසිටුවීමට ඔහු විසින් පියවර ගන්නා ලදි. එම ගමනේදී 1930 දශකය අගභාගයේ දී ජර්මනිය සමග සන්ධානගත වූ ඔහු දෙවන ලෝක යුධ සමයේ දී මිත්‍ර පාර්ශවය සමඟ සමීප වෙමින් යුද්ධයට අවතීර්ණ වූයේ ය. මෙහිදී දේශපාලන, සමාජීය වශයෙන් සිදුවන සුසංයෝගය පාදක කොටගෙන නව ආර්ථික සහ සමාජ ප්‍රතිපත්ති සකස් කිරීමට පියවර ගන්නා ලදි. එහි දී රාජ්‍යයේ කාර්යභාරය සැලකිය යුතු අයුරින් ශක්තිමත් කරන ලදි.

1930 - 1945 වසර 15ක පාලන සමය අවසන් කරමින් 1945 දී ගෙටලියෝ වර්ගාස් බලයෙන් ඉවත් විය. අනතුරුව නැවතත් 1950 දී ප්‍රජාතන්ත්‍රවාදී මැතිවරණයක් හරහා බලයට පැමිණෙන්නේ සිය රට උදෙසා විශිෂ්ට ගණයේ සේවාවක් ඉටු කිරීම අරමුණු කරගනිමිනි. එනම් වැඩකරන පන්තියේ සහ නාගරික මධ්‍යම පන්තියේ සහයෝගය මත පහළ පන්තිය නගාසිටුවීම උදෙසා වූ සමාජ වැඩපිළිවෙළක් පෙරදැරි කර ගනිමිනි. එහිදී තෙල් නිෂ්පාදනය සහ අනෙකුත් අත්‍යවශ්‍ය කර්මාන්ත ජනසතු කිරීම ඔහුගේ අපේක්ෂාව විය. මේ ආකාරයෙන් සිය රටේ සාමාන්‍ය ජනතාව උදෙසා

වැඩි අවධානයක් යොමු කරමින් සිය පුරවැසියන් ආර්ථික සහ සමාජයීය වශයෙන් නගා සිටුවීමට කටයුතු කිරීම විශිෂ්ට ගණයේ නායකයෙකු තුළ තිබිය යුතුම ගුණාංගයකි.

මෙලෙස දේශපාලන දිවියේ සාර්ථක ගමනක් කරා ළඟා වීමට ඔහුට උපතින් ලද දේශපාලන පවුල් පසුබිම අභිබවා ගිය ඔහු තුළ දක්නට ලැබුණු නායකයකු තුළ තිබිය යුතු සැබෑ ගුණාංග වන කාර්යශූරභාවය, කැපවීම, දැඩි අධිෂ්ඨානය මහඟු පිටුවහලක් වී ඇතිබව නොඅනුමාන ය.

## සාරාංශය

ගෙටලියෝ වර්ගාස් නාමය ග්‍රන්ථ තුළ හෝ විද්‍යුත් මාධ්‍ය තුළ අප නිතර දකින හෝ ඇසෙන නාමයක් නොවේ. බ්‍රසීල ජාතිකයෙකු ලෙස ඉපදී දේශපාලනය වශයෙන් මෙන්ම සමාජීය සහ ආර්ථික වශයෙන්ද සුවිශාල මෙහෙයක් සිදුකල සැබෑ මිනිසෙකු වූ වර්ගාස් උපාධිධාරියෙකු, නීතිඥයෙකු මෙන්ම දක්ෂ කථිකයෙකු ද විය. අනතුරුව වර්ගාස් ජාතික නියෝජිතයෙකු දක්වා පැමිණි අතර 14 සහ 17 වන බ්‍රසීල ජනාධිපතිවරයා බවටද පත් විය. ජාතික නීති සම්පාදකයෙකු හා ප්‍රාන්ත ව්‍යවසායකයෙකු වූ වර්ගාස් 20 වන සියවසේ රටේ වැදගත් දේශපාලන චරිතයක් බවට ක්‍රමක්‍රමයෙන් පත් වූ අතර 1929 ඔක්තෝම්බර් මාසයේ දී එක්සත් ජනපදයෙන් ඇරඹි ආර්ථික අවපාතයට මුහුණ දීමට බ්‍රසීලය මෙහෙය වූ අසහාය නායකයා විය. කම්කරු ප්‍රතිපත්තිය දියත් කිරීම හරහා "දුප්පතුන්ගේ හිතවතා" බවට පත් වූ වර්ගාස් ආගමික, අධ්‍යාපනික සහ මැතිවරණ ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීමට තම දායකත්වය සැපයූ අතර විදේශ ප්‍රතිපත්තියේ දී ද ඔහුගේ ක්‍රියාකාරීත්වය කැපී පෙනේ. විශේෂයෙන්ම දෙවන ලෝක යුධ සමයේ දී වඩාත් සූක්ෂම ලෙස තම විදේශ ප්‍රතිපත්තිය මෙහෙය වූ නායකයෙකි. සමස්ථයක් ලෙස ගත් කල වර්ගාස් බ්‍රසීලියානු ඉතිහාසයේ මෙන්ම ලෝක දේශපාලනයේ ද කැපී පෙනෙන නායකයෙකි.

## මූලාශ්‍ර නාමාවලිය

Blackley, J. A. C. K. M. d. r. C., 2018. *Encyclopedia of Latin American Religion.* Washington: Spring publishing.

J.D, 1982. *the populist Gamble Getulio Vargas in 1945 political and ideological Transition in Brazil.* French: UC press E-books collection, university of California.

Levin, R., 1998. *Father of the Poor.* s.l.:cambridge university press.

MichaelnConniff and eds, J. C. C. a. J. A. w., 2005. *A consummate Speechwriter, In problems in modern Latin American.* s.l.: SR Books.

Pinto, A. C., 2009. Brazil in the Era of Fascism: the "new State" of Getulio Vargas. In: *beyond the Fascist Century.* Portugal: Institute of Social Sciences, University of Lisbon, Portugal, p. 22.

Skidmore, T., 1999. project museum. *journal of interdisciplinary,* Volume 30.

Weinstein, D. W. a. B., 2004. The Death and Life of a Brazilian Statesman. *politics of the Body in Latin America,* p. 52.

Wolfe, 1994. Radical history review "father of the poor" or "mother of the rich?.

Cliff Welch, 2005. *Getúlio Vargas and the Transformation of Rural Social Relations,* s.l.: s.n.

Daryle Williams, B. W., 2004. *Vargas Morto:,* s.l.: University of New Mexico Press.

Poppino, R. E., n.d. *britannica.* [Online] Available at: https://www.britannica.com/biography/Getulio-Vargas [Accessed 12 November 2021].

Anon., 2015. *Brown Library*. [Online] Available at: https://library.brown.edu/create/brazilundervargas/ [Accessed 2021].


Poppino, R. E., n.d. *Britannica*. [Online] Available at: https://www.britannica.com/biography/Getulio-Vargas [Accessed 2021].

Putnam, S., n.d. *jstor*. [Online] Available at: https://www.jstor.org/stable/40399679?read-now=1&refreqid=excelsior%3Afa9e25feee40140523071a0999e50d24&seq=1#page_scan_tab_contents
[Accessed 2021].

Weinstein, D. W. a. B., 2004. *Historia Politia*. [Online] Available at: https://historiapolitica.com/datos/biblioteca/muerte%20y%20politica_weinstein.pdf
[Accessed 2021].

Wolfe, J., n.d. *jstor*. [Online] Available at: https://www.jstor.org/stable/3514098?read-now=1&refreqid=excelsior%3Ab15a8ace36fb2ea6c8a358f677d77f4b&seq=1#page_scan_tab_contents
[Accessed 2021].

# බෙනිටෝ හු'ආරේ



**කණ්ඩායම් සාමාජිකයන් :**

- බී. පී. එන්. කේ. වික්‍රමවංශ
- කේ. ජී. එස්. එච්. ගිම්හානි
- කේ. එන්. විතානගේ
- ආර්. ඒ. එස්. ඒ. රණසිංහ
- ටී. එම්. වයි. එච්. තෙන්නකෝන්

# හැඳින්වීම

"අන් අයගේ අයිතීන්ට ගරු කිරීම යනු සාමය යි."

- බෙනිටෝ පැබ්ලෝ හු'ආරේ ගාෂියා -

සෑම ජාතියකට ම එම ජාතියේ පුරවැසියෙකු වීම යන්නෙන් අදහස් කරනු ලබන දෙයට මූලික වශයෙන් පදනම් වනු ලබන වැදගත් පුද්ගලයෙක් සිටියි. මෙක්සිකෝව සම්බන්ධයෙන් සිටින එවැනි ආදර්ශමත් පුද්ගලයන්ගෙන් එක් අයෙකු නම් බෙනිටෝ හු'ආරේ ය. ඔහු මෙක්සිකානු ඉතිහාසයේ ඉතා වැදගත් චරිතයකි.

බෙනිටෝ පැබ්ලෝ හු'ආරේ ගාෂියා (Benito Pablo Juárez García) ඔහුගේ ශිෂ්‍ය කාලය තුළ දී, දේශපාලනය කෙරෙහි ද උනන්දුවක් දැක් වූ අතර දේශපාලන තනතුරු ගණනාවක් ද දැරී ය. ඔහු සතු ව තිබූ ඉමහත් වූ අධිෂ්ඨාන ශක්තිය නිසා ම ඔහු නීතිඥයෙක් බවට පත් වූ අතර ඉන්පසු, මෙක්සිකෝවේ 26 වන ජනාධිපතිවරයා ලෙස සේවය කර තිබේ. එසේම ඔහු ස්වදේශික සම්භවයක් සහිත මෙක්සිකෝවේ ප්‍රථම ජනාධිපති ලෙස ද වැදගත්කමක් උසුලයි. සාමාන්‍ය ජනතාවගේ මානව හිමිකම් සහ යුක්තිය උදෙසා සිදු කරන ලද අඛණ්ඩ අරගලය හේතුවෙන් බෙනිටෝ හු'ආරේ "මෙක්සිකෝවේ ඒබ්‍රහම් ලින්කන්" ලෙස ඉතාමත් ආදරයෙන් සහ ගෞරවයෙන් අදටත් හඳුන්වනු ලැබේ.

එකල මෙක්සිකානු දේශපාලනයේ කැපී පෙනුණු ක්‍රෙයෝල් (Creole) සහ මෙස්ටිසෝ (Mestizo) හමුදා දේශපාලනඥයින් අතර හු'ආරේ සිවිල් වැසියෙකු සහ ස්වදේශීය සම්භවයක් සහිත පුද්ගලයෙකු ලෙස විශේෂයෙන් ඉස්මතු වේ. ඇස්ටෙක් සම්මේලනය (Aztec Confederation) පෙරලා දැමීමෙන් පසු මෙක්සිකෝ රාජ්‍යය පාලනය කරනු ලැබූ ස්වදේශීය සම්භවයක් සහිත පළමු පුද්ගලයා වන්නේ ද, බෙනිටෝ හු'ආරේ ය.

හු'ආරේගේ නායකත්ව කාලය හැඳින්වෙන්නේ "ලා රෙෆෝමා ඩෙල් නෝර්ටේ" (La Reforma Del Norte) හෙවත් "උතුරේ ප්‍රතිසංස්කරණය" ලෙස ය. බෙනිටෝ හු'ආරේගේ පාලන සමයට පෙර සිට ම මෙක්සිකානු දේශපාලනය කෙරෙහි කතෝලික පල්ලියේ බලය දැඩි ලෙස බලපැවැත්වුණු අතර බෙනිටෝ හු'ආරේ

ඔහුගේ පාලන සමය තුළ දී, පල්ලිය සතු ව තිබූ ඉඩම් විශාල ප්‍රමාණයක් දුප්පතුන් අතර බෙදා දී මෙක්සිකෝ රාජ්‍යය මත බලපැවැත්වූ පල්ලියේ බලය ක්‍රම ක්‍රමයෙන් සහ සම්පූර්ණයෙන් ම ඉවත් කර දැමීමට සමත් විය.

ප්‍රංශය විසින් මෙක්සිකෝවට එරෙහිව සිදු කරන ලද විදේශීය මැදිහත් වීමට එරෙහිව මෙක්සිකානු රාජ්‍ය තාන්ත්‍රිකයෙකු වූ බෙනිටෝ හු'ආරේ ගත් ක්‍රියාදාමයන් හේතු කොටගෙන ලතින් ඇමෙරිකානු ජාතිකයන් විසින් ඔහුව බොහෝ සේ අගය කොට සලකනු ලැබීය. මේ හේතුව නිසා ඔවුන් බෙනිටෝ හු'ආරේව "ඇමෙරිකාවේ ප්‍රශංසාත්මක" (Benemérito de las Américas) යන අන්වර්ථ නාමයෙන් හඳුන්වනු ලැබීය. 1867 දී පේරු රාජ්‍යයේ සැන් ෆර්නැන්ඩෝ වෛද්‍ය විද්‍යාලය (Facultad de Medicina San Fernando) විසින් ඔහුට ගෞරව පිණිස රන් පදක්කමක් ද ප්‍රදානය කළේ ය.

මෙක්සිකෝවේ බොහෝ නගර සහ වීදි හු'ආරේගේ නමින් නම් කර ඇත. මෙක්සිකෝ සිටි ජාත්‍යන්තර ගුවන් තොටුපළ (Mexico City International Airport) ප්‍රථමයෙන් ම හැඳින්වුණේ බෙනිටෝ හු'ආරේ ජාත්‍යන්තර ගුවන් තොටුපළ හෙවත් "Aeropuerto Internacional Benito Juárez" ලෙස ය. ආජන්ටිනාවේ බුවනෝස් අයර්ස් (Buenos Aires) පළාතේ බෙනිටෝ හු'ආරේ ලෙස නගරයක් නම් කර තිබේ. ආර්ජන්ටිනාව සහ මෙක්සිකෝව අතර ඇති මිත්‍රත්වය පෙන්නුම් කිරීම සඳහා ආජන්ටිනාව විසින් ජනපති හු'ආරේගේ නාමය එම නගරයට ලබා දී ඇත. මේ අනුව බලන කල පෙනී යන්නේ, බෙනිටෝ හු'ආරේ යනු සමස්ත ලෝකයේ ම ආදරයට හා ගෞරවයට පාත්‍ර වූ රාජ්‍ය නායකයෙකු බව යි.



*චිකාගෝ හි පිහිටි බෙනිටෝ හු'ආරේගේ ප්‍රතිමාව*

## ළමා කාලය, අධ්‍යාපනය හා දේශපාලනයට පිවිසීම

කීර්තිමත් මෙක්සිකානු දේශපාලනඥයෙක් වූ බෙනිටෝ හු'ආරේ, නොබිඳිය හැකි පෞරුෂයකින් යුක්ත වූ අදටත් මෙක්සිකානු ජනතාව ජාතික වීරයෙකු ලෙස බුහුමන් දක්වන නායකයෙකි. බෙනිටෝ හු'ආරේ නම් ඒ කීර්තිමත් චරිතය පසුපස ඇති ළමා කාලය අභියෝග පිරුණු කටුක අවධියක් වූ අතර ඔහුගේ__අධ්‍යාපනය හා දේශපාලනයට පිවිසීම දක්වා වූ ගමන් මග පහසුවෙන් ළඟා වූවක් නොව නොපසුබට උත්සාහයෙන් හා අප්‍රතිහත ධෛර්යයෙන් සාක්ෂාත් කර ගනු ලැබූවකි.

බෙනිටෝ පැබ්ලෝ හු'ආරේ ගාසියා (Benito Pablo Juarez Garcia) හෙවත් බෙනිටෝ හු'ආරේ (Benito Juarez) 1806 වසරේ මාර්තු මස විසිඑක් වන දින මෙක්සිකෝවේ (Mexico) ඕවාසාකා හි (Oaxaca) සපොතෙක්වාසීන්ගේ (Zapotec) කුඩා ඉන්දියානු ගම්මානයක් වූ සැන් පැබ්ලෝ ගෙලටාවෝ (San Pablo Guelatao) හිදී උපත ලැබීය. මාර්සෙලිනෝ හු'ආරේ (Marcelino Juarez) වූ ඔහුගේ පියා සහ බ්‍රිගිදා ගාර්සියා හු'ආරේ (Brigida Garcia Juarez) නම් ඔහුගේ මව දිළිඳු සපොතෙක් ජාතික ගොවියන් වූ අතර ඔහුට වැඩිමහල් සොයුරියක් ද විය. බෙනිටෝ හු'ආරේ තෙවැනි වියට පා තබද්දී දියවැඩියා සංකූලතාවන් හේතුකොටගෙන ඔහුගේ දෙමව්පියන් මෙලොව හැර ගියහ. "රටේ ප්‍රාථමික/සුළු ජන කොට්ඨාසයකින් පැවත ආ ඉන්දියානුවන්" ලෙස බෙනිටෝ විසින් පසුව සිය දෙමාපියන් හඳුන්වනු ලැබීය. ඉතා කුඩා අවධියේ දී ම අනාථභාවයට පත් වූ ඔහු සිය මුත්තණුවන් සහ මිත්තණිය මිය යන තුරු ඔවුන් විසින් ඇති දැඩි කරනු ලැබූ අතර පසුව සිය මාමා කෙනෙකු විසින් හදා වඩා ගනු ලැබීය. දොළොස් විය සපිරෙන තුරු ම එඬේරෙකු ලෙස සහ ඉරිඟු වගාවන් හි කටයුතු සඳහා සිය මාමා හට සහාය වූ කුඩා බෙනිටෝ පසුව සැතපුම් හතළිහක් පමණ දුර ගෙවා සිය සොයුරිය විසූ ඕවාසාකා නගරයට පිවිසියේ ය. මේ වන විට අධ්‍යාපනයක් නොමැති වූ බෙනිටෝ කථනයට දැන සිටියේ ද ඕවාසාකා හි සපොතෙක්වාසීන්ගේ ආවේණික භාෂාව පමණි.

ඕවාසාකා හිදී බෙනිටෝ හු'ආරේ සිය සොයුරිය කෝකිවරියක ලෙස සේවය කළ අන්තෝනියෝ මාසා (Antonio Maza) නම් ධනවතෙකුගේ නිවසේ ගෘහ සේවකයෙකු ලෙස සේවය කළේ ය. පසුව දොන් අන්තෝනියෝ සලානෙවුවා (Don Antonio Salanueva) නම් පොත් බඳින්නෙකු යටතේ සේවය කළ අතර ඔහුගේ

සහ ගම්බද ගුරුවරයෙකුගේ උපකාර මත ලිවීමට සහ කියවීමට උගත්තේ ය. 1827 දී ඕවාසාකා හි පල්ලි පාසලට ඇතුළු වූ මොහු පූජක පදවිය උදෙසා ඉගෙනීම ඇරැඹී ය. 1829 දී එහි අධ්‍යාපනය නිමා කළ ඔහු පූජකයෙකු වීම අතහැර දමා ඕවාසාකා කලා සහ විද්‍යා ආයතනයට ඇතුළත්ව නීතිය හා විද්‍යාව පිළිබඳව අධ්‍යයනය ඇරඹී ය. 1834 දී ඔහු නීති උපාධිය ලබා ගත්තේ ය.

බෙනිටෝ හු'ආරේගේ පරිපාලන කටයුතු හා දේශපාලනයට අවතීර්ණ වීම පිළිබඳ සලකා බලන විට ප්‍රාදේශීය දේශපාලනයට සුවිශේෂ ස්ථානයක් හිමි වේ. ඕවාසාකා හි නගර සභාවේ නිලධාරියෙකු ලෙස 1831 දී ප්‍රාදේශීය දේශපාලනයට ක්‍රියාකාරී ලෙස පිවිසි බෙනිටෝ හු'ආරේ දිළිඳු ඉන්දීය සම්භවයක් සහිත ජන කොට්ඨාස සහ අසාධාරණයට ලක් වූ ජන වර්ගයන්ගේ අයිතීන් වෙනුවෙන් පෙනී සිටියේ ය. සිය දක්ෂතාවයෙන් සහ අවංකත්වයෙන් ඕවාසාකා හි ප්‍රමුඛ පෙළේ නීතිඥයකු බවට පත් වූ ඔහු 1835 දී ෆෙඩරල් ව්‍යවස්ථාදායකයේ ලිබරල් නියෝජිතයෙකු ලෙස පත්විය.

මෙම අවධිය වන විට මෙක්සිකෝවේ දේශපාලන හා ආර්ථික තත්ත්වය දරුණු වූ අතර රට අගාධයක් කරා ගමන් කරමින් තිබුණි. දශක තුනක ප්‍රචණ්ඩත්වය රටේ ආර්ථිකය බංකොලොත්භාවයට ඇද දමා තිබූ අතර සන්නිවේදනය බිඳ වැටී ජනතාව බිඳුණු විශ්වාසයකින් පසු වූහ. කොන්සවෙටිව්වාදීන් සහ ලිබරල්වාදීන් ලෙස ගැටුම් පාර්ශ්ව දෙකක් නිර්මාණය වී පැවති අතර මෙක්සිකෝවේ පාලන බලය තමන් සතු කරගැනීම ඔවුන්ගේ අරමුණ විය. කොන්සවෙටිව්වාදීන් මහා පරිමාණ ඉඩම් හිමියන් පල්ලිය හමුදාව සහ විශාල නගර මගින් ද ලිබරල්වාදීන් කුඩා වෙළෙන්දන් බුද්ධිමතුන් ග්‍රාමීය දේශපාලන නායකයන් සහ ගොවියන් මගින් ද නියෝජනය වූ අතර ඔවුන් මෙක්සිකෝව නව්‍යකරණය කිරීම අරමුණු කළහ. 1836 සිට 1846 දක්වා කාලයේ මෙක්සිකෝව තුළ කොන්සවේටිව් පාලනයක් තිබූ අතර එම කාලයේ බෙනිටෝ හු'ආරේ බොහෝ දුරට මැතිවරණ කාර්යයන්ගෙන් ඉවත්ව සිටි නමුත් වෘත්තීය පත්වීම් භාර ගත්තේ ය. 1841 දී ප්‍රාන්ත රජය විසින් ඔහුව ෆෙඩරල් අධිකරණයේ විනිශ්චයකාරවරයෙකු ලෙස පත්කරන ලදි.

1843 ඔක්තෝබර් 31 වැනි දින බෙනිටෝ හු'ආරේ විසින් ඕවාසාකා හි ඉහළ පැලැන්තිය නියෝජනය කළ අන්තෝනියෝ මාසා හෙවත් කලක් ඔහුගේ ස්වාමියෙකු ද වූ ධනවතෙකුගේ දහහත් හැවිරිදි දියණිය වන මාර්ගරීතා මාසා (Margarita Maza) නම් වංශවත් සුදු ජාතික කාන්තාව සමඟ විවාහ දිවියට එළැඹියේ ය. මෙම වෙනස්

ජාතිකත්වයන් මිශ්‍ර වූ විවාහය එකල නුහුරු දෙයක් ලෙස දිස් වුවද, මාර්ගරීතා මාසා 1871 දී පිළිකාවක් හේතුකොටගෙන මියයන තුරුම ඔවුන්ගේ විවාහ දිවිය සාර්ථකව පැවතියේ ය. මෙම විවාහය හරහා බෙනිටෝ හට එතෙක් නොතිබූ සමාජ තත්ත්වය සහ පිළිගැනීම ළඟාකර ගැනීමට හැකි වූ අතර ඒ හරහා ඉහළ පැලැන්තිය වෙත අවතීර්ණ වීමට සපොතෙක් ජාතිකයකු වූ ඔහුට අවස්ථාව ද උදා විය.



*බෙනිටෝ හු'ආරේ ඔහුගේ සොයුරිය (වම්පස) සහ බිරිඳ (දකුණු පස) සමග*

බෙනිටෝ හු'ආරේගේ දේශපාලන ගමන් මග ප්‍රාන්ත දේශපාලනයට පිවිසීමත් සමඟ ඇරඹි අතර රාජ්‍ය නායකයකු ලෙස ඔහු විසින් පසුකාලීනව අත්පත් කරගත් කීර්තිය හා සාර්ථකත්වය පසුපස ඔහු ඕවාසාකා හිදී ලැබූ දේශපාලන අත්දැකීම් ප්‍රබල භූමිකාවක් නිරූපණය කළේ ය. ලිබරල්වාදී අදහස් සමඟ ඔහුගේ දේශපාලන මතවාදයන් වර්ධනය වීම ඕවාසාකාහි කලා සහ විද්‍යා ආයතනයේ දී සිදුවූ අතර ප්‍රාන්ත දේශපාලනය තුළ ශක්තිමත් යුරෝපීය මෙක්සිකානු ක්‍රෙයෝල් පන්තියක්[1] නොවීම බෙනිටෝ හු'ආරේට ප්‍රාන්ත දේශපානයට පිවිසීම පහසු කළේ ය. ප්‍රාන්ත දේශපාලන පද්ධතියේ තිබූ විවෘතභාවය නවකයන්ට දේශපාලනයට පිවිසීමට දොරටු විවර කර තිබූ අතර ඒ හරහා බෙනිටෝ හු'ආරේ සිය දේශපාලන පදනම

[1] ක්‍රෙයෝල් පන්තිය (Criollos) 16වන සියවසේ ස්පාඤ්ඤයේ යටත් විජිතයන්හි උපත ලද පිරිසිදු ස්පාඤ්ඤ සම්භවයක් සහිත සමාජ පන්තිය හැඳින්වීමට යෙදේ.

ගොඩනගා ගත් අතර දේශපාලන දැනුම සහ අත්දැකීම් වර්ධනය කර ගැනීමට ද ප්‍රාන්ත දේශපාලනය ඔහුට ඉවහල් විය.

## නායකත්වය කරා ගිය ගමන් මග

බෙනිටෝ හු'ආරේ (Benito Juarez) යන කෙටි නාමයෙන් හඳුන්වන මෙක්සිකෝවෙහි විසිහය වන ජනාධිපතිවරයා 1958 සිට 1972 එනම් ඔහුගේ මරණය තෙක් විටින් විට පස්වරක් එරට ජනාධිපති ධූරය හෙබ වූ ජාතික නායකයෙකු ලෙස හඳුනාගත හැකි ය. එතුමාගේ නායකත්වය තෙක් පැමිණි ගමන් මග විවිධ දුෂ්කරතා, බාධක කම්කටොළු මැදින් සිදු වූවක් බව එතුමාගේ ජීවන සටහන් පරිශීලනය කිරීමේ දී අවබෝධ කර ගත හැකි වේ.

බෙනීතෝ හු'ආරේගේ නායකත්වය කරා පිවිසෙන ගමන් මාර්ගයේ ආරම්භය සනිටුහන් වන්නේ එතුමා නීති උපාධියක් ලබා ගැනීමෙන් අනතුරුව මහ නගර සභාවේ ආසනයක් දිනා ගැනීමත් සමඟ ය. කෙසේ වෙතත්, බෙනීතෝ හු'ආරේ ජීවිතයට දේශපාලනය ඒකාබද්ධ කරගත් නායකයෙකු ලෙස පෙන්වා දිය හැකි ය. එතුමා රජයේ ව්‍යවස්ථාදායකයේ ද සාමාජිකයෙකු ලෙස කටයුතු කළේ ය. 1841 වසරේ දී විනිසුරුවරයෙකු වූ මෙතුමා රජයේ ආණ්ඩුකාරවරයෙකු ලෙස ද සේවය කළේ ය. එය ඔහුගේ නායකත්ව ගමන් මගෙ හි හැරවුම් ලක්ෂයක් ලෙස හැඳින්විය හැකි ය. මන්ද, එය එතුමා ජාතික වශයෙන් ප්‍රමුඛත්වයට ගෙන ඒමට ඉවහල් වූ තනතුරක් නිසාවෙනි. 1853 වසරේ දී ගතානුගතික මතධාරීන් නැවත බලයට පැමිණීමත් සමඟ මෙක්සිකෝව තුළ නව ප්‍රතිසංස්කරණ ඇතිවීම නතර වූ අතර හු'ආරේ ඇතුළු බොහෝ ප්‍රමුඛ නිදහස් මතධාරීන් පිටුවහල් කරන ලදි . එබැවින්, ඔහු 1853-1855 දක්වා නිව් ඕලන්ස් හි ( New Orleans) අනෙකුත් මෙක්සිකානුවන් සමඟ අදහස් හුවමාරු කරගනිමින් සහ නැවත උපන් බිමට යාමට සැලසුම් නිර්මාණය කරමින් දුගී ජීවිතයක් ගත කළේ ය. අවසානයේ, 1855 දී නිදහස් මතධාරීන් විසින් ජාතික ආණ්ඩුවේ බලය ලබාගැනීමත් සමඟ හු'ආරේ තම සැලසුම් සහ අදහස් ක්‍රියාවට නැංවීමේ අවස්ථාව හිමි වුණේ ය. ඒ අනුව ඔහු හු'ආන් අල්වරෙස් ( Juan Alvarez) ගේ පාලන තන්ත්‍රය යටතේ අධිකරණ හා මහජන උපදේශක අමාත්‍යවරයා ලෙස සම්බන්ධ විය. හු'ආරේගේ සහයෝගය ඇතිව නිදහස් මතධාරීන් විසින් ප්‍රධාන

වශයෙන් ප්‍රතිසංස්කරණ තුනක් ගෙන එන ලදි. තව ද අධිකරණ අමාත්‍යවරයා ලෙස නීතිය පසිඳලීමේ වගකීම මෙතුමා සතු විය.

1856 ජුනි මාසයේ දී රජය විසින් මුදල් අමාත්‍ය ධූරය ලෙස නව අමාත්‍ය ධූරයක් ප්‍රකාශයට පත් කරන ලදි. එමගින් ශක්තිමත් හා ස්ථාවර මෙක්සිකෝ රාජ්‍යයක් නිර්මාණය කිරීමට රජය බලාපොරොත්තු විය. මෙහි උච්චතම අවස්ථාව වූයේ 1857 දී නිදහස් මතධාරී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පුළුල් කිරීම යි. එම වසරේදී ම ඉග්නේසියෝ ගොමොන්ෆෝර්ත් (Ignacio Comonforth) ජනාධිපති ලෙස තේරී පත් වූ අතර හු'ආරේ ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලසුන සඳහා තෝරා ගන්නා ලදි. එම නිසා ව්‍යවස්ථාවට අනුව එතුමා මෙක්සිකෝවෙහි උප ජනාධිපතිවරයා ලෙස ද සේවය කළේ ය. හු'ආරේගේ අනාගත ගමන් මග උදෙසා ඔහුගේ අධිකරණයේ තනතුර ඉතා වැදගත් මෙන් ම තීරණාත්මක තනතුරක් විය. විශේෂයෙන් ම, 1858 දී ගතානුගතික මතධාරීන් විසින් කැරලි ගසා, විප්ලව කර ගොමොන්ෆෝර්ත් නෙරපා හරින ලද අවස්ථාවේ දී මෙතුමාට ජනාධිපති ධූරය සඳහා නීතිමය අයිතියක් හිමි ව තිබුණේ ය. මෙක්සිකෝ සිටි (Mexico City) නගරය වටා පාලනය කිරීමට සොල්දාදුවන් අඩු වූ අතර මෙතුමා නැගෙනහිර වරාය නගරයක් වූ වෙරාක්‍රෑෆ් ( Veracruz) නගරයට ඉවත්ව ගියේ ය.

වෙරාක්‍රෑෆ්හි දී හු'ආරේට දැඩි අපහසුතාවලට මුහුණ දෙන්නට සිදුවිය. එහි දී ඔහු ආණ්ඩුවක් නිර්මාණය කළේ ය. මෙසේ ආණ්ඩුව නිර්මාණය කිරීමේ දී ඇති වූ ගැටුම්, පාවාදීම් හා පරාජයන් අපහසුවෙන් වුව ද දරා සිටින්නට සිදුවිය. මන්ද යත්, ව්‍යවස්ථාව බලාත්මක කර ක්‍රියාත්මක කිරීමත් හමුදා භටයන් කල කළමනාකරණය කර ගතානුගතික මතධාරීන් පරාජය කිරීමත් සිදුකළ යුතු වූ නිසාවෙනි. කෙසේ වුවත්, මෙතුමා තම අභිමතයන් හා ශක්තීන් පිළිබඳ අවධානය යොමු කරමින් ඔහුගේ රජයේ පාලකයා ඔහු බව මනාව ඔප්පු කර පෙන්වීය.

පූජක පක්ෂය නීත්‍යානුකූල ආණ්ඩුවට එරෙහිව ගතානුගතික මතධාරීන්ට උදවු කළ නිසා පූජක පක්ෂයේ බලය මැඩලන්නට විවිධ නීති පැනවීමට හු'ආරේට සිදුවිය. ඒ අනුව 1860 අග භාගය වන විට ගතානුගතික මතවාදීන් අධෛර්යමත් වූ අතර 1861 ජනවාරි මස නැවත මෙක්සිකෝ සිටි නගරය වෙත පැමිණි හු'ආරේ එහි ජනාධිපතිවරයා ලෙස පත්විය.



*බෙනීටෝ පාබ්ලෝ හු ආරේ ගර්සියා*

## බෙනිටෝ හු'ආරේ නායකත්වයට පැමිණීමෙන් පසු සිදුකළ සේවය

හු'ආරේ විනිසුරුවරයෙකුගේ භූමිකාවේ සිට ජනාධිපතිවරයාගේ භූමිකාව දක්වා කටයුතු කිරීමේ දි අති විශාල මෙහෙයක් මෙක්සිකානු ජනතාවට ඉටු කළේ ය. එතුමන් විසින් සිදුකරන ලද ' Le reforma del norte' හෙවත් 'උතුරේ ප්‍රතිසංස්කරණ' මින් ප්‍රධාන තැනක් ගනියි. හු'ආරේ මෙක්සිකානු ඉතිහාසයේ වැදගත් නායකයෙකු ලෙස සලකනු ලබයි.

හු'ආරේ අධිකරණ අමාත්‍යයවරයා ලෙස පත් වීමෙන් පසු සිදු කරන ලද ප්‍රතිසංස්කරණ මාලාව 'Ley Juarez' හෙවත් හු'ආරේ නීති ලෙස හඳුන්වනු ලැබූ අතර මෙම නීති 1855 වර්ෂයේ දී හඳුන්වා දෙනු ලැබීය. මෙම නීති හරහා 'fueros' නම් විශේෂ නිදහස් කිරීම් සහ සිවිල් ගැටලු සඳහා පල්ලියේ උසාවි මෙන් ම විශේෂ හමුදා බලය යොදා ගැනීම පිළිබඳව ද සඳහන් කර ඇත.

ප්‍රතිසංස්කරණවාදීන් විසින් හඳුන්වා දුන් ව්‍යවස්ථාවට අනුව හු'ආරේ නිතැතින් ම ජනාධිපතිවරයා බවට පත් වුවද කොන්සවේටිව්වාදීන් විසින් ඇති කළ කැරැල්ලක් හේතුවෙන් හු'ආරේ ප්‍රමුඛ ඔහුගේ රජයට වෙරාකෘස් වෙත යාමට සිදුවිය. වර්ෂ 1859 සිට හු'ආරේ විසින් නීති නියෝග සමුදායක් වෙරාකෘස්හි රැඳී සිටින අතරවාරයේ දී

නිකුත් කරන ලදි. මෙම නීති නියෝග සමුදාය හු'ආරේගේ ප්‍රතිසංස්කරණ අතර වැදගත්කමක් උසුලයි. එයට හේතුව වන්නේ මෙම නියෝග හරහා ඔවුන්ගේ අරමුණ වූයේ පල්ලිය සහ රාජ්‍යය එකිනෙකාගෙන් වෙන් කර තැබීම යි.

- පල්ලිය සතු වූ දේපල ජනසතු කිරීමේ නීතිය (Law of Nationalization of Ecclesiastical Property)
- සිවිල් විවාහ නීතිය (Civil Marriage Law)
- සිවිල් ලේඛන පිළිබඳ සාමාන්‍ය නීතිය (Organic Law of the Civil Registry)
- කන්‍යා සොහොයුරියන් සහ ප්‍රචණ්ඩ ක්‍රියා විරහිත කිරීම පිළිබඳ නීතිය (Law of Exclaustration of Nuns and Friars)
- ආගමික නිදහස පිළිබඳ නීතිය (Law on Freedom of Religion)

කොන්සවේටිව්වාදීන්ගේ කැරැල්ල අවසන් වීමෙන් පසුව යලිත් හු'ආරේ මෙක්සිකෝව වෙත පැමිණි අතර 1857 ව්‍යවස්ථාව අනුව යලි තම රජය පිහිටුවිය. නමුත් කොන්සවේටිව්වාදීන් ප්‍රංශ පාලකයකු වූ තුන්වන නැපෝලියන්ගේ සහයෝගයත් සමඟ නැවත මෙක්සිකෝව ආක්‍රමණය කළ අතර 1865 දී එක්සත් ජනපද දේශසීමා තෙක් හු'ආරේ පසුපස හඹා යන ලදි. කෙසේ හෝ අවසානයේ දී 1867 වර්ෂයේ දී හු'ආරේ බලය තමන් සතු කරගත් අතර ඔහුගේ ප්‍රථම රාජකාරිය වූයේ සිවිල් යුද්ධය නිසා ඇති වූ භීතිකාව අවම කර කඩා වැටුණු ආර්ථිකය නැවත ශක්තිමත් කිරීම යි. මෙම කාලය තුළ දී හු'ආරේ හට එක්සත් ජනපදයේ අනුකම්පාව සමඟ ආධාර ද හිමි විය.

1867 දෙසැම්බර් මස හු'ආරේ යලි ජනාධිපති ධූරයට පත්විය. දේශපාලනික ස්ථාවරභාවය හැරුණු විට ඔහුගේ අනෙකුත් අරමුණු වූයේ ආර්ථිකය ස්ථාවර තත්ත්වයකට පත් කිරීම සහ පොදු අධ්‍යාපනය දියුණු කිරීමයි. එම ධූර කාලය අවසන් විමෙන් පසුව හු'ආරේ 1871 වර්ෂයේ දී යළිත් වරක් ජනාධිපති ධූරයට පත්විය. 1871 ඔහුගේ නැවත පත්විම පෙර පත්විමට වඩා උණුසුම් මුහුණුවරක් ගනු ලැබීය. විරෝධතා මධ්‍යයේ වුවද එරට කොංග්‍රසය ඔහු විසින් යෝජනා කළ බදු

ප්‍රතිසංස්කරණ සම්මත කළ අතර එමඟින් එතෙක් පැවති අවුල් සහගත මිනුම් ක්‍රමය වෙනුවට මෙට්‍රික් ක්‍රමය (Metric Method) හඳුන්වා දෙනු ලැබීය.

හු'ආරේගේ පාලන සමය තුළ මෙක්සිකානුවන් නවීකරණය වූ ආර්ථිකයක සහ වෙනත් ආයතනයන්ගේ පහසුකම් අත් විඳි අතර මාර්ග හා දුම්රිය මාර්ග සහ සන්නිවේදන ජාලයන්ගේ වර්ධනය වීමත් මෙන්ම අධ්‍යාපනයේ දියුණුවත් නිසා බොහෝ පහසුකම් අත් විඳින ලදි.

## බෙනිටෝ හු'ආරේගේ විදේශ ප්‍රතිපත්තිය

හු'ආරේ මෙක්සිකෝවේ ගෞරවයට පාත්‍ර වන්නේ මෙක්සිකානු ජාතිකවාදයේ ප්‍රමුඛ සංකේතයක් මෙන්ම විදේශ මැදිහත්වීම් වලට ප්‍රතිරෝධය දැක්වූ අයෙකු ලෙසයි. ඔහු ප්‍රජාතන්ත්‍රවාදී ජනරජයක් නිර්මාණය කිරීමට ව්‍යවස්ථාමය ප්‍රතිසංස්කරණ සිදුකළා සේ ම විදේශ ආක්‍රමණවලින් තම භූමිය ආරක්ෂා කර ගැනීමට කටයුතු කළේ ය. එය ඔහුගේ නාමය අදටත් ගෞරවයට පාත්‍ර වීමට හේතු වී ඇත. හු'ආරේ තම විදේශ ප්‍රතිපත්තියේ දී, අනෙකුත් රාජ්‍ය නායකයින් සමඟ සමීපව කටයුතු කරනු ලැබූ අතර බ්‍රිතාන්‍ය, ස්පාඤ්ඤය, ප්‍රංශය, ඇමරිකා එක්සත් ජනපදය සමඟ විශේෂ සබඳතා පවත්වා ඇත. විශේෂයෙන් තම අසල්වැසි රාජ්‍ය වන ඇමරිකා එක්සත් ජනපදය සමඟ සම්බන්ධතා පැවැත්වීමේ වැදගත්කම ඔහු අවබෝධ කර ගත් අතර ඇමරිකානු ජනාධිපති ලින්කන් (Lincoln) සමඟ ලිපි ආදිය හුවමාරු කරගත් බව හා යුද්ධයේ දී හු'ආරේට සහයෝගය ලබා දුන් බව ද සඳහන් වේ. 1859 දී එක්සත් ජනපදය, හු' ආරේ රජය පිළිගත් අතර හු'ආරේගේ විදේශ සබඳතා ලේකම් මෙල්චර් ඔකම්පෝ (Melchor Ocampo) හා එක්සත් ජනපද තානාපති රොබර්ට් එම් මැක්ලේන් (Robert M. McLane) සමග ගිවිසුමකට ද (The McLane-Ocampo Treaty) පැමිණ ඇත.

1860 දී මෙක්සිකෝවේ, කොන්සවේටිව්වරුන් (Conservatives) හා ලිබරල් ප්‍රතිසංස්කරණවාදීන් (Liberal refomist) අතර කලක සිට පැවති සිවිල් යුද්ධය අවසානයේ කොන්සවේටිව්වරුන් පරදා වෙරාක්‍රුස් (Veracruz) ප්‍රදේශය පාලනය කළ හු'ආරේ විසින් මෙක්සිකානු නගරය අත්පත් කරගනු ලැබීය. එම ජයග්‍රහණය

හු'ආරේගේ ස්ථාවරය බෙහෙවින් ශක්තිමත් කළේ ය. නමුත් මෙක්සිකානු රජයට ගෙවීමට වැඩි වශයෙන් විදේශ ණය එකතු වීම නිසා රජය අස්ථාවර විය. එහි දී ඇමෙරිකානු රාජ්‍ය ලේකම් සෙවාර්ඩ් (Seward) විසින් ණය වෙනුවට පතල් කැණීම් සහ සහන ලබා දෙන සැලැස්මක් ඉදිරිපත් කළේ ය. තව ද එක්සත් ජනපද තානාපති තෝමස් කොර්වින් (Thomas Corwin) හා මෙක්සිකානු නියෝජිත මැනුවෙල් සැමකෝනා (Manuel Zamacona) සමග ගිවිසුමක් පිළිබඳ ව සාකච්ඡා කළ නමුත් ඇමරිකානු කොංග්‍රසය විසින් එය ප්‍රතික්ෂේප කරනු ලැබීය. විකල්පයක් නොමැති වූ නිසා හු'ආරේ ණය ගෙවීම වසර දෙකකට අත්හිටුවීය. එමෙන්ම 1861 ඔක්තෝබර් 31 දින නො ගෙවූ ණය පියවා ගැනීම සඳහා ප්‍රංශ හා බ්‍රිතාන්‍ය නියෝජිතයින් සමග බ්‍රිතාන්‍යයේ දී ත්‍රෛපාර්ශ්වීය ගිවිසුමක් අත්සන් කළේ ය. එයට අනුව දෙසැම්බර් 8 දින යුරෝපීය හමුදා වෙරාක්‍රෑෆ් වෙත ගොඩබස්වනු ලැබීය. කොන්සර්වේටිව්වරුන් ඔවුන් මිතුරන් සේ සැලකුව ද හු' ආරේ ඔවුන්ට විරුද්ධ ව කටයුතු කළේ ය.

1862 දී ප්‍රංශ අධිරාජ්‍යා වූ තුන්වන නැපෝලියන් (Napolean III), මෙක්සිකෝවේ ප්‍රංශ සේවා සේවාදායක රාජ්‍යයක් පිහිටුවීමට උපායමාර්ග යෙදූ අතර දැඩි මෙක්සිකානු විරෝධය හේතුවෙන් ප්‍රංශ හමුදා ඉවත් කරගැනීමට නැපෝලියන්ට සිදුවිය. මෙක්සිකෝවේ තිබූ රිදී සම්පත් ලබා ගැනීම ද මෙම යුරෝපීය බලපෑම්වල අරමුණක් විය. ඒ අවධියේ ඇමරිකාව, සිවිල් යුද්ධය හේතුවෙන් දුර්වල ව සිටි නිසා එය ඔවුන්ව දිරිමත් කරන පුවතක් විය. ඇමෙරිකානු රාජ්‍ය ලේකම් සෙවාර්ඩ් ප්‍රංශය සමඟ සබඳතා පවත්වමින් ප්‍රංශ අභිප්‍රායන් වැළැක්වීමට ප්‍රවේශම් සහගත ප්‍රතිපත්තියක් අනුගමනය කළේ ය. එමගින් එක්සත් ජනපදයට මෙක්සිකෝව සම්බන්ධ කර ගැනීමට හැකි යැයි ඔහු බලාපොරොත්තු විය. මේ වෙන විට ප්‍රංශ හමුදා මෙක්සිකෝව අල්ලාගත් අතර, 1864 දී මෙක්සිකෝවේ අධිරාජ්‍යයා ලෙස මැක්සිමිලියන් (Maximilian) පත්කරනු ලැබීය. ප්‍රංශ සැලසුම් පැහැදිලි වූ පසු ස්පාඤ්ඤ හා බ්‍රිතාන්‍ය හමුදා මෙක්සිකෝවෙන් ඉවත් විය. මෙක්සිකෝවේ මෙම ප්‍රංශ මැදිහත්වීම් පුරාවට ම ඇමරිකාව මධ්‍යස්ථ ප්‍රතිපත්තියක් අනුගමනය කළ අතර 1865 ඇමරිකානු සිවිල් යුද්ධයේ අවසානයෙන් පසුව ඇමරිකාව හු'ආරේ සඳහා සහය දුන්නේ ය. මැක්සිමිලියන් ලිබරල් ප්‍රතිපත්ති අනුගමනය කළ ද එය අසාර්ථක සමග 1865 වසරේ දී ලබාගත් ලිබරල් මිලිටරි ජයග්‍රහණත් මැක්සිමිලියන්ගේ තත්වය වඩාත් දුෂ්කර කළේ ය. ඒ අනුව සටන් කිහිපයකින් පසුව 1866 නොවැම්බර් මස සිට 1867

නොවැම්බර් මස දක්වා අදියර තුනකින් ප්‍රංශ හමුදා ඉවත් කර ගැනීමට නියෝග කළේ ය. මෙය මෙක්සිකෝව කෙරෙහි යුරෝපීය බලපෑමේ අවසානය සනිටුහන් කළේ ය.

හු'ආරේගේ දේශපාලන ධෛර්යය දශක ගණනාවක මූල්‍ය බිඳවැටීම, යුද්ධය, අභ්‍යන්තර පක්ෂ කණ්ඩායම් හා විදේශ ආධිපත්‍ය තුළින් රට බේරා ගැනීමේ ඔහුගේ චිත්ත ශක්තිය හා අධිෂ්ඨානය මගින් පිළිබිඹු වූ අතර එය තවත් නායකයෙකුගෙන් බලාපොරොත්තු වීම දුෂ්කර ය. මේ අයුරින් ප්‍රංශයට එරෙහි නායකත්වය (1861-1867) හේතුවෙන් හු'ආරේ ජාතික වීරයෙකු ලෙස සලකනු ලබයි.



1867 ජූනි මස 16 වැනි දින පේරු රජය විසින් හු'ආරේගේ ජයග්‍රහණ පිළිගත් අතර එම වසරේ දී ම, ජූලි මස 28 වැනි දා පේරු හි සැන් ප්‍රනාන්දුගේ වෛද්‍ය විද්‍යාලය (San Fernando Medical college in Peru) ඔහුට ගෞරව කිරීම සඳහා රන් පදක්කමක් නිකුත් කෙරිණි. 1872 හු'ආරේගේ මරණයෙන් පසු ඔහුට ගෞරවය පිණිස ඔක්සාකා (Oaxaca) නගරයේ සහ ප්‍රාන්තයේ නිල නම්වලට ද " හු'ආරේ" නාමය එක් කළ අතර තවත් බොහෝ ස්ථාන සහ ආයතන හු'ආරේ නාමයෙන් නම් කරන ලදි. නිව්යෝර්ක් නගරයේ මැන්හැටන් හි බ්‍රයන්ට් උද්‍යානයේ (Bryant Park in Manhattan) ස්ථාපනය කරන ලද මූර්තිය හු'ආරේගේ ය. එහි "අන් අයගේ අයිතීන්ට ගරු කිරීම සාමය" යනුවෙන් කොටා ඇත. මෙම උපුටා දැක්වීම් මගින් විදේශ කටයුතු සම්බන්ධයෙන් හු'ආරේගේ ස්ථාවරය සාරාංශ කරයි. තව ද " බෙනිටෝ හු'ආරේ මාර්ග" යනුවෙන් ඉන්දියාවේ දකුණු දිග පිහිටි ප්‍රධාන මාර්ගයක් ද නම් කොට ඇත.

## <u>ගත හැකි ආදර්ශ</u>

බෙනිටෝ හු'ආරේ නැමැති නායකයා ද කුඩා කල සිට විවිධාකාර වූ දුෂ්කරතා මධ්‍යයේ තම ජීවිතය ජයගත් නායකයෙකි.

කුඩා කල විඳි දුෂ්කරතාවන්ට සාර්ථක ව මුහුණ දෙමින් ඔහු පැමිණි ගමන් මග පිළිබඳව අවධානය යොමු කිරීමේ දී පැහැදිලි වන්නේ ඔහු විසින් තමන් වෙත එල්ල වූ අභියෝගයන්ට සාර්ථක ව මුහුණ දීම මගින් බෙනිටෝ හු'ආරේ තව තවත් ශක්තිමත් පුද්ගලයෙක් බවට පත් වූ බව යි. කොන්සවේටිව්වාදීන්ගේ කැරැලි තුන්වන නැපෝලියන්ගේ ආක්‍රමණයටත් පසුබට නොවූ ඔහු එම බාධාවන්ට සාර්ථක ලෙස මුහුණ දෙමින් තම ප්‍රතිසංස්කරණ ඉදිරිපත් කළේ ය.

බෙනිටෝ හු'ආරේ නම් වු නායකයාගේ ජිවිත කථාව අධ්‍යයනය කිරීමේ දි ඔහු තමන් සතු වූ බලය අනිසි ආකාරයෙන් භාවිත කළ බවට සාක්ෂි නොමැති අතර ඔහු වෙත හිමි වූ ව්‍යවස්ථාදායක අසුනේ සිට ජනාධිපති ධූරය දක්වා ම තමන්ගේ උපරිමයෙන් ජනතාවට සේවය කළේ ය.

හු'ආරේ විසින් සිදුකළ සේවය මෙක්සිකානු ජනතාවගේ පමණක් නොව විදෙස් රටවල ජනතාවගේ පවා නොමඳ පැසසුමට ලක්විය. ඔහුට ගෞරව පිණිස විදේශයන් හි නිර්මාණය කර ඇති බොහෝ ප්‍රතිමා ඔහු නමින් නම් කර ඇති මාර්ග හා ගුවන්තොටුපල ආදිය පිළිබඳ ව අධ්‍යයනය කිරීමේ දී විදෙස් ජනයා තුළ ඔහු කෙරෙහි පැවති ගෞරවය නොමඳ ව පිළිබිඹු වේ.

මෙවන් වූ ගුණාංග තුළින් ඔහු තුළ වූ ආදර්ශවත් චරිතය පිළිබිඹු වන අතර එම ගුණාංග පුද්ගල ජීවිතයට ද බොහෝ වැදගත් වේ.

## <u>සාරාංශය</u>

බෙනිටෝ පැබ්ලෝ හු'ආරේ ගාෂියා වූ මෙම නායකයා මෙක්සිකානු ඉතිහාසයේ වැදගත් ජනාධිපතිවරයෙකු ලෙස හඳුන්වයි. එමෙන්ම ඔහු විසින් සිදු කළ සේවය මෙක්සිකෝවේ පමණක් නොව අනෙකුත් රටවල පවා නොමඳ පැසසුමට පාත්‍ර විය.

කුඩා කල සිට ම දෙමාපිය සෙනෙහස ලැබීමට තරම් වාසනාවන්ත නොවූ හු'ආරේ ඉන්පසුව තම මුත්තණුවන් හා මිත්තණිය සහ මාමාගේ සෙවණේ හැදී වැඩී පසුව තම සොයුරිය සමඟ විවිධාකාර වූ දුෂ්කරතා මධ්‍යයේ ජීවිතය ගෙන යමින් අධ්‍යාපනය මැනවින් හදාරා නීතිවේදී උපාධිය ලබා ගැනීමට සමත් විය. ව්‍යවස්ථාදායකය සාමාජිකත්වයේ සිට ජනාධිපතිවරයෙකු දක්වා තනතුරු හෙබ වූ ඔහු මෙක්සිකානු ජනතාවට තමන්ගේ හැකි උපරිමයෙන් සේවය කරන ලදි. හු'ආරේ හට සිදු කරන ගෞරවයක් ලෙස ඔහුගේ ජන්ම දිනය වන මාර්තු 3 වැනි දින එරට මහජන දිනයක් ලෙස නම් කර ඇති අතර එම දිනය මුළුමහත් මෙක්සිකෝව විසින් හු'ආරේ සිහිකර ඉතාමත් ගෞරවයෙන් සමරනු ලබයි.

කොන්සවෙටිව්වාදීන්ගේ කැරලි සහ තුන්වන නැපෝලියන්ගේ ආක්‍රමණයට සාර්ථකව මුහුණ දුන් හු'ආරේ තමන් මිය යන තෙක් ම මෙක්සිකානු ජනතාවට තම සේවය නොපිරිහෙලා ලබා දෙනු ලැබී ය.

"ජනතාවගේ පුත්‍රයකු ලෙස මා සතුව ඇති එකම අරමුණ වන්නේ ජනතා අභිවෘද්ධිය බව මට කිසි දිනෙක අමතක කළ නොහැකි ය."

බෙනිටෝ පැබ්ලෝ හු'ආරේ ගාෂියා

# මූලාශ්‍ර නාමාවලිය

(2021). *Benito juárez. leyes DE Reforma, qué Son y por qué son IMPORTANTES*. Benito Juárez. Leyes de Reforma, qué son y por qué son importantes. https://www.milenio.com/cultura/benito-juarez-leyes-de-reforma-que-son-y-por-que-son-importantes. [Accessed 2021.08.10)

Admin, C., 2016. *Mexican Presidents: Benito Juárez – Casa Blanca Mexican Restaurant, Massachusetts*. [online] Casablancamexican.com. Available at: https://casablancamexican.com/mexican-presidents-benito-juarez/ [Accessed 4 August 2021].

Benito Juarez Biography, Accomplishments, and facts. [online] Available at: https://www.britannica.com [Accessed 2021.08.05]

Biography.com Editors. (2014). Benito Juarez. A&E Television Networks. Available at: https://www.biography.com/political-figure/benito-juarez (Accessed 01.08.2021)

Biography.com Editors. (2014). Benito Juarez. Biography. Available at: https://biography.yourdictionary.com (Accessed on 12/06/2021)

Cocking, L. (2017). Everything you need to know about Benito Juarez, Mexico's only indigenous president. Culture trip. Available at: https://theculturetrip.com (Accessed on 12/06/2021)

Connolly, R.M. (1961). Philosophy of Benito Juarez and its influence in the formation of his domestic policy and his relation with United States. [online] Available at: https://krex.k-state.ed [Accessed 2021.08.05]

Editors, b., 2021. *Benito Juárez*. [online] Biography. Available at: https://www.biography.com/political-figure/benito-juarez [Accessed 9 August 2021].

Encyclopedia of World Biography. Benito Juarez Biography. Available at: https://www.notablebiographies.com/Jo-Ki/Ju-rez-Benito.html (Accessed 07.06.2021)

French Intervention in Mexico and the American Civil War. [online] Available at: https://history.state.gov [Accessed 2021.08.04]

Juarez, Benito 1806-1872. [online] Available at: https://www.encyclopedia.com [Accessed 2021.08.06)

Kiddle. Benito Juarez facts for kids. Available at: https://kids.kiddle.co/Benito_Ju%C3%A1rez (Accessed 07.06.2021)

Scholes, W.V. 2021. Benito Juarez president of Mexico. Britannica. Available at: https://www.britannica.com/biography/Benito-Juarez (Accessed 01.08.2021)

The Famous People. Benito Juarez. Available at: https://www.thefamouspeople.com/profiles/benito-juaacuterez-4660.php (Accessed 07.06.2021)

# හුආන් පෙරෝන්



**කණ්ඩායම් සාමාජිකයන් :**

- මණ්දාකිණී අත්තනායක
- අංජනා සන්දීපනී
- ශෂිණී විජේතිලක
- කාවින්ද්‍යා දිනාලි
- දිල්ශානි වීරසිංහ

## හැඳින්වීම

ලොව පවතින රාජ්‍යයන්ගේ ඉතිහාසය විමසා බැලීමේ දී එම සෑම රාජ්‍යකම අනාගතය හැඩගැසීම උදෙසා හේතු වූ කැපීපෙනෙන චරිතයන් දැක ගත හැකිය. රාජ්‍යයක ජනතාව කිසියම් පුද්ගලයෙකුගේ නම ඇසූ පමණින්, රුව දුටු පමණින් ඔහුව හෝ ඇයව හඳුනාගන්නේ නම් එම පුද්ගලයා එරටෙ හි කැපීපෙනෙන, නො මැකෙන කාර්යභාරයක් ඉටුකළ පුද්ගලයෙකු විය යුතු ය. ලොව අටවන විශාලත ම රාජ්‍යය වන දකුණු ඇමරිකා මහද්වීපයේ පිහිටි දිගු ඉතිහාසයකට උරුමකම් කියන ආජන්ටිනාවේ ද එලෙස නො මැකෙන නමක් ඉතුරු කළ මිනිසෙකු සිටින්නේ ය. එලෙස නො මැකෙන නමක් ඉතුරු කළ මිනිසා නමින් හුආන් දොමින්ගෝ පෙරෝන් (Juan Domingo Perón) නම් වේ. ඔහු හමුදා ජෙනරාල්වරයෙකු සහ ජනාධිපතිවරයෙකු ලෙස ආර්ජන්ටිනා ඉතිහාසයේ විශාල චරිතයක් රඟ දැක්වීය. ඔහුගේ ගමන් මග විවිධ වූ හැල හැප්පීම් මධ්‍යයේ ඇවිද ගිය මඟක් විය. එනිසා ම ඔහු ආන්දෝලනාත්මක චරිතයක් මෙන් ම බොහෝ ජනයා අතර පරමාදර්ශී චරිතයක් ද විය.

හුආන් දොමින්ගෝ පෙරෝන් 1895 වර්ෂයේ ඔක්තෝබර් මස 8 වන දා බුවනෝස් අයර්ස් (Buenos Aires) ප්‍රාන්තයේ ලොබොස් (Lobos) නම් ප්‍රදේශයේ දී උපත ලබන්නේ ය. ඉතා තරුණ වයසක දී යුධ පාසලට ඇතුළත් වන පේරෝන් එතුළින් සිය දිවියට බොහෝ අත්දැකීම් එකතු කර ගනිමින් කෙමෙන් කෙමෙන් එරට හමුදාව තුළ මෙන් ම, දේශපාලන ලොව තුළ ද නැගී එන චරිතයක් බවට පත් වන්නේ ය. කෙමෙන් ඔහුගේ දේශපාලනමය බලය වර්ධනය වූ අතර, 1944 දී යුධ අමාත්‍ය බවට ද පසුව උප ජනාධිපති තනතුරට ද, 1946 පෙබරවාරි මාසයේ දී ප්‍රථම වරට ජනාධිපති ධූරයට පත්වෙමින් නායකයෙකුගේ චරිතයට අවතීර්ණ වූවේ ය.

හුආන් පෙරෝන්ගේ ආධාරකරුවන් වන ජස්ටිසියලිස්ට් (Justicialist) පක්ෂයේ සාමාජිකයන් හෝ පෙරෝන් විසින් අනුගමනය කරන ලද ජනතාවාදී හා ජාතිකවාදී ප්‍රතිපත්ති පිළිපදින්නන් පෙරෝනිස්ට්වරු (Peronist) ලෙස හඳුන්වන ලදී. මෙලෙස පෙරෝන් අනුගමනය කිරීම තුළින් පෙරෝනිස්ට්වාදය (Peronism) නමින් දේශපාලනික චින්තනයක් ද බිහි වීමෙන්, දේශපාලන ලෝකයේ ඔහු අත්කරගෙන තිබූ බලය සුළුපටු නො වන බව පිළිඹිබු වේ. ඔහු නැවත 1952 දී සහ 1973 දී දෙවරක් ම ජනාධිපති තනතුරට පත් වුවේ හමුදා-නාවික කැරලි, බලයෙන් පහ කිරීම් වැනි

විවිධ බාධක මධ්‍යයේ ය. ඔහු විසින් බොහෝ සමාජ, ආර්ථික, හා දේශපාලනමය සේවාවන් රැසක් සිදු කළ අතර ඔහු ආජන්ටිනාව නැවත හැඩගැස්වූවා යැයි කිව හැක.

මෙලෙස ආර්ජන්ටිනාවේ ඉතිහාසය තුළ නමක් රැන්දූ හුආන් පේරෝන් නම් වූ ඒ අසහාය නායකයා මෙලොවෙන් සමුගත්ත ද ඔහුගේ උරුමය අද වන විට ද නො මැකී පවතී. මෙයට පෙන්වා හැකි කදිම නිදසුන නම් 2019 වසරේ දී එරට ජනපති බවට පත් වූ ඇල්බර්ටෝ ෆර්නැන්ඩස් (Alberto Fernández) ද පෙරොනිස්ට් පාක්ෂිකයෙක් වීමයි. මෙලෙසින් ආර්ජන්ටිනා ඉතිහාසයේ මෙන් ම ලෝක ඉතිහාසයේ ද නො මැකෙන නමක් සනිටුහන් කළ හුආන් පෙරෝන් නම් වූ ඒ මිනිසා මෙලොවට පැමිණි දා පටන් මෙලොවින් සමු ගන්නා තුරු ම ඔහුගේ ජීවිත කතාව මෙම පරිච්ඡේදයෙන් විමසා බැලෙයි.

## ළමා කාලය , අධ්‍යාපනය සහ දේශපාලනයට පිවිසීම



*පෙරෝන්ගේ පාසල් කාලයේදී*

ජුවානා සෝසා ටොලිඩෝ (Juana Sosa Toledo) සහ මාරියෝ ටොමස් පෙරොන්ගේ (Mario Tomás Perón) පුත්‍රයා වූ ජුවාන් ඩොමින්ගෝ පෙරෝන් ඇතුළු ඔහුගේ පවුල ස්පාඤ්ඤ ජාතිකයන් වන අතර 1830 වර්ෂයේ ඔහුගේ මවගේ පියා මියයන තෙක් ම සාර්ඩිනියහි (Sardinia ) පදිංචි විය. පෙරොන්ගේ මවගේ පියා බුවනෝස් අයර්ස්හි සාර්ථක සපත්තු සාදන්නෙකු මෙන් ම වෛද්‍යවරයෙකි. 1889 දී ඔහුගේ මරණයෙන් පසු ඔහුගේ බිරිද අසරණ විය. ඉන් පසුව පෙරෝන්ගේ පියා වූ මාරියො තොමස් පෙරෝන් වතු පරිපාලනයේ නියුතු වීම සඳහා ලොබෝස් වෙත ගොස් ඇත. එම කාලයේ දී ඔහුට පෙරෝන්ගෙ මව වූ ජුවානා සෝසා ටොලිඩෝ හමු වී ඇති අතර දෙදෙනා 1901 දී විවාහ විය. එම යුවලගේ පුත්‍රයා වූ ජුවාන් ඩොමින්ගෝ පෙරොන් 1895 ඔක්තෝබර් 8 වන දින බුවනෝස් අයර්ස් පළාතේ ලොබොස් හි උපත ලැබී ය.

මෙම කාලයේ දී පෙරෝන්ව රැකබලාගත් පියා මියගිය අතර ඔහුගේ මරණයෙන් පසු ඔහු වයස අවුරුදු දාසයක් වැනි තරුණ වයස දී හමුදා පාසලට ඇතුළත් වූවේ ය. 1915 දී ඔහු වඩාත් ගෞරවනීය ලුතිතන් තනතුරට උසස් කරන ලදි. 1924 දී වෙහෙස මහන්සි වී වැඩ කළ හුආන් පෙරෝන් කපිතාන් තනතුරකට (Captain) උසස් කරන ලද අතර 1926 දී එස්කුවෙලා ඩි ගුවෙරා (උසස් යුද විද්‍යාලය) (Escuela de Guerra {Superior War College}) වෙත අනුයුක්ත කරන ලදී. එහිදී පෙරෝන් හට වසර තුනක දැඩි පුහුණුවක් ලබා දුන්නේ ය. 1930 සැප්තැම්බර් මාසයේ දී ආර්ජන්ටිනාව කුමන්ත්‍රණයකට ලක් විය. පෙරෝන් කුමන්ත්‍රණයට සුළු වශයෙන් සහභාගී වූ නමුත් එය ඔහුට වටිනා පාඩමක් ඉගැන්වී ය. කුමන්ත්‍රණයට පක්ෂව සිවිල් වැසියන් විශාල වශයෙන් නගා සිටුවීම, හමුදා ජයග්‍රහණයට ඉවහල් වූ බව ඔහුට හැඟුණි. මෙය අනාගතයේ දී ඔහු තම වාසියට යොදා ගන්නා ලද පාඩමක් විය. 1931 දී පෙරෝන්ට උසස් යුධ විද්‍යාලයේ වසර පහක් ඉගැන්වීම් කටයුතු සඳහා අනුයුක්ත කරන ලද අතර පොත් කිහිපයක් ලිවීම සිදු කරන ලද්දේ ය. එය ඔහුගේ පසුකාලීන දේශපාලන දිවියට තීරණාත්මක කුසලතා වර්ධනය කිරීමට තවත් පිටුවහලක් විය.

හුආන් පෙරෝන් 1938-1940 දක්වා වසර දෙකක් පුරා හමුදා ආරක්ෂක නිලධාරියා ලෙස චිලී හි ආජන්ටිනා තානාපති කාර්යාලයේ සේවය කළේ ය. 1941 දී නැවත ආර්ජන්ටිනාවට පැමිණ, 1942දී කර්නල් තනතුර ලබා ගැනීම සඳහා තමා ලබාගත් දැනුම උපයෝගී කර ගත් අතර, ආර්ජන්ටිනාවේ අකාර්යක්ෂම සිවිල් රජය පෙරලා

දැමූ 1943 කුමන්ත්‍රණය සැලසුම් කළ රහසිගත හමුදා සංවිධානය වන එක්සත් නිලධාරීන්ගේ කණ්ඩායමට (Grupo de Oficiales Unidos; GOU) සම්බන්ධ විය.

## නායකත්වය කරා ගිය ගමන් මඟ

හුආන් පෙරෝන් නායකත්වය කරා ගිය ගමනේ දී ඒ තුළ වැඩි ඉඩකඩක් වෙන් වන්නේ ඔහුගේ හමුදා ජීවිතයටයි. 1943 දී හමුදා නිලධාරියෙකු ලෙස ඔහු ආර්ජන්ටිනාවේ අකාර්යක්ෂම සිවිල් රජයට එරෙහිව හමුදා කුමන්ත්‍රණයකට සම්බන්ධ විය. 1943 දී, සාර්ථක හමුදා කුමන්ත්‍රණයකට සහභාගී වීමෙන් පසු, පෙරොන් ආර්ජන්ටිනාවේ කම්කරු ඇමති බවට පත් විය. ඊළඟ අවුරුදු තුනේ මිලිටරි පාලන තන්ත්‍රයන් වැඩි වැඩියෙන් පැමිණියේ පෙරෝන්ගේ බලපෑමට යටත්ව ය. ඔහු කම්කරු හා සමාජ සුභසාධන ලේකම් ධුරය පමණක් ඉල්ලා සිටියේ ය. කම්කරු ලේකම් ධුරයට පත් වූ ඔහුගේ බලපෑම වර්ධනය වූ අතර 1944 දී ඔහු උප සභාපති සහ යුද ඇමති ද විය. එසේ ම පසුව උප ජනාධිපති තනතුරට ද පත්වෙමින් නායකයෙකුගේ චරිතයට අවතීර්ණ වූවේ ය.

1945 ඔක්තෝම්බර් මස මුල දී, ප්‍රතිවාදී හමුදා සහ නාවික හමුදා කුමන්ත්‍රණයකින් පෙරෝන්ව ඔහුගේ තනතුරුවලින් නෙරපා හැරිය ද, පසුව පෙරෝන් විවිධ බාධක මධ්‍යයේ 1946 පෙබරවාරි මාසයේ දී ප්‍රථම වරට ජනාධිපති ධූරයට පත් වූවේ ය.



*ජනාධිපති හුආන් පෙරෝන් ඔහුගේ නිල කාර්යාලයේ සිටින අවස්ථාවක්*

ජනාධිපති ලෙස පළමු වාරය 1946 සිට 1951 වූ අතර , ඔහුගේ පළමු ධූර කාලය තුළ දී, පෙරෝන් දක්ෂ පරිපාලකයෙකු විය. රැකියා හා ආර්ථික වර්ධනය වැඩි කිරීම, ජාත්‍යන්තර ස්වෛරීභාවය සහ සමාජ සාධාරණත්වය ඔහුගේ ඉලක්ක විය. දෙවන වරටත් ඔහු ජනාධිපති ලෙස 1951 පත් වී 1955 දක්වා කාලයක් සේවය කළේ ය. පෙරෝන්ගේ ගැටලු ආරම්භ වූයේ ඔහුගේ දෙවන වාරයේ දීය. හුආන් පෙරෝන් 1955 දී රටින් පිටුවහල් කරන ලද අතර, ඔහු ඊළඟ අවුරුදු 18 ගත කළේ ප්‍රධාන වශයෙන් වෙනිසියුලාව සහ ස්පාඤ්ඤය තුළ ය. කෙසේ වුව ද නැවතත් තම රටට පැමිණ 1973 දී නැවත බලයට පැමිණෙන පෙරෝන්, 1974 ජූලි මාසයේ දී ඔහු මිය යන තෙක් ම තම ජනාධිපති ධූර කාලය ගෙන ගියේ ය.

පෙරෝන් වසර නවයකට වැඩි කාලයක් ජනාධිපති ධූරයේ සිටිමින් කම්කරුවන්ගේ හා පොදුවේ රටේ පහළ පංතියේ පාලකයා ලෙස පෙනී සිටියේ ය. මේ අනුව හුආන් පෙරෝන් තෙවරක් ආජන්ටිනාවේ ජනාධිපති ලෙස තේරී පත්වීමෙන් ඔහු තුළ ඇති නායකත්ව ගුණාංග හෙළිදරව් කළ අතර විසිවන සියවසේ වඩාත් බලගතු ආජන්ටිනා දේශපාලනඥයා ලෙස ඔහු කිරුළු දැරීය.

## නායකත්වයට පැමිණීමෙන් පසු සිදු කල සේවාව

20 වන සියවසේ දී හුආන් පෙරෝන්ගේ රජය, ලතින් ඇමරිකානු ඉතිහාසයේ වඩාත් ම සාර්ථක ප්‍රගතිශීලි රජයන්ගෙන් එකක් විය. පෙරෝන් වසර නවයකට වැඩි කාලයක් ජනාධිපති ධූරයේ රැඳී සිටිමින් ජයග්‍රහණ රාශියක් තම ජනතාවට ලබා දීමට කටයුතු කළේ ය. වර්ෂ 1946 දී බලයට පත්වීමෙන් අනතුරුව හුආන් පෙරෝන් විසින් සිදු කළ සේවාව ප්‍රධාන වශයෙන් කොටස් කිහිපයකට වෙන් කොට හඳුනා ගත හැකි ය. එනම් දේශපාලනික, ආර්ථික සහ සමාජීය වශයෙනි. මොහුගෙන් සිදු වූ සේවාව ආර්ජන්ටිනාවේ සංවර්ධනය කෙරෙහි සමස්තයක් වශයෙන් බලපා ඇති බව පැහැදිලි වේ.

### දේශපාලනික සේවාවන්

පෙරෝන් ආර්ජන්ටිනාවේ ව්‍යුහාත්මකව විප්ලවීය වෙනසක් සිදු කළ බැවින් ඔහු තම රට නැවත හැඩගැස්වීමටත්, කාර්මික සේවකයන්ට වැටුප් වැඩි වීම වැනි ප්‍රතිලාභ ලබා දීමටත් කටයුතු කළේ ය. හුවාන් පෙරෝන්ගේ ආධාරකරුවන් වන ජස්ටිස්ලිස්ට්

(Justicialist) පක්ෂයේ සාමාජිකයන් හෙවත් පෙරෝන් අනුගමනය කරන ලද ජනතාවාදී හා ජාතිකවාදී ප්‍රතිපත්ති පිළිපදින්නන් "පෙරෝනිස්ට්වරු" ලෙස හඳුන්වන ලද්දේ ය. එම අනුගමනය කිරීම තුළින් "පේරොනොස්ට්වාදය" (Peronism) නමින් නව දේශපාලනික චින්තනයක් බිහි විය. එම "පේරොනොස්ට්වාදය" සමාජ සාධාරණත්වය, ආර්ථික ජාතිකවාදය හා ජාත්‍යන්තර නො බැඳි ප්‍රතිපත්ති සමඟ ද බැඳී පවතින බවට සඳහන් වේ.

පෙරෝන් දෙවන ලෝක යුද්ධ සමයේ දී, ආර්ජන්ටිනාව අපනයන මගින් රැස්කර ගත් විදේශ විනිමය, කෘෂිකාර්මික නිෂ්පාදන සහ නවෝත්පාදනයන් සඳහා වෙන්කරන ලදී. පෙරෝන් විසින් රටේ දේශපාලනය සඳහා ත්‍රිවිධ හමුදාවේ අණ උපයෝගී කරගත්තේ ය. ඔහුගේ පාලන කාලය තුළ දී ඔහු රටේ පහළ පන්තියේ පාලකයා හා නායකයා ලෙස පෙනී සිටියේ ය. ඒ අතර ම, පෙරෝන් සමූපකාර රාජ්‍යයක් පිහිටුවීමට පියවර ගත්තේ ය. නව ව්‍යවස්ථා සම්මත කළ, පළාත් දෙකක පුරවැසියන්ට ව්‍යවස්ථාදායකයන් හි සෘජු නියෝජනයක් ලබා දෙන ලදී. පෙරෝන්ගේ දේශපාලනික සේවාවන් ලෙස කාන්තාවන් සඳහා ඡන්ද අයිතිය ලබාදීමට කටයුතු කළේ ය. පෙරෝන් තෙවරක් ම එරට ජනපති බවට පත් වීමෙන් පෙනී යන්නේ ඔහු කෙරේ ජනතාව තුළ කෙතරම් ප්‍රසාදයක් තිබුනේ ද යන්නයි. වර්තමානයේ දීද හුවාන් පෙරෝන් එරට ජනයාගේ ගෞරවයට පාත්‍ර වන්නේ ය.

**සාමාජීය සේවාවන්**

ඔහු විසින් කරන ලද සාමාජීය සේවාවන් අතරින් සුදුසුකම් ලත් සැමට අධ්‍යාපනය නොමිලේ ලබා දීම ප්‍රමුඛ වේ. බලයට පැමිණීමට පෙර 1931 දී පෙරෝන් යුධ විද්‍යාලයේ ඉගැන්වීම සඳහා අනියුක්ත කරන ලද අතර එහි දී ඔහු විසින් වසර පහක් ඉගැන්වීම් කටයුතු කරමින් පොත් කිහිපයක් ලිවීම සිදු කරන ලද්දේ ය. තවද ඔහු විසින් තම රටේ අඩු ආදායම් ලාභීන් හට නිවාස ලබාදීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කළේ ය. ඔහු රටේ වෘත්තිකයන් සඳහා ගෙවන නිවාඩු සම්මතයක් බවට පත් කරන ලදී. සියලුම කම්කරුවන් සහ බැංකුකරුවන් හට නොමිලේ වෛද්‍ය ප්‍රතිකාර සහ ඔවුන්ගේ නිවාඩු ,සංචාර සඳහා වැය වන වියදම්වලින් අඩක් ගෙවීමට ඔහුගේ පාලන සමය තුළ දී කටයුතු කළේ ය. එසේම වෘත්තීය ජීවිතයේ දී කාන්තාවන් හට දරු ප්‍රසූතියෙන් පසුව ලැබිය යුතු "දරු ප්‍රසූති නිවාඩු" මාස තුනක කාලයක් දක්වා දීර්ඝ කරන ලදී.

පෙරෝන් කැබිනට් මණ්ඩලයට සෞඛ්‍ය අමාත්‍යාංශයක් හඳුන්වා දුන්නේ ය. එහි පළමු ප්‍රධානියා වන ස්නායු විශේෂඥ රමින් කැරිලෝ (Ramón Carrillo) සෞඛ්‍ය සේවා පහසුකම් 4200 කට වැඩි ප්‍රමාණයක් නිම කිරීම අධීක්ෂණය කළේ ය. පෙරෝන් ආර්ජන්ටිනාව පුරා කම්කරුවන් සඳහා විනෝදාස්වාද මධ්‍යස්ථාන ඉදි කළ අතර ලෝවර් සියෙරාස් හි (Lower Sierras) හෝටල් 8ක් ඉදිකරන ලදී. තවද කැබින් රාශියක් සහිත චිත්‍රපට ශාලාවන් සහ පිහිනුම් තටාක සහිත නිවාඩු නිකේතනයක් ද ලබා දුන්නේ ය. මෙම නිවාඩු නිකේතනය වසරකට දින 15 ක් කම්කරුවන්ට ලබා ගත හැකි අතර දිනකට ශත 15ක වියදමින් සියලුම සේවාවන් ඇතුළත් විය. එමෙන් ම ඔහු "කතෝලික පාසල් ක්‍රමය" රජයේ පාලනය යටතට පත් කළේ ය. ඔහුගේ බිරිඳක් වූ "එවිටා ඊවා පෙරෝන් පදනම" (Evita Eva Perón Foundation) හරහා විවිධ වූ සමාජ සේවාවන් රැසක් සිදු කරන ලදී. එනම් රෝහල්, පාසල්, මහලු නිවාස හා අඩු වියදම් නිවාස ඉදි කළේ ය. තවද ඔහු විසින් කරන ලද තවත් සමාජීය සේවාවක් ලෙස, නත්තල් දිනයේ දී දුප්පතුන් සඳහා විවිධ ත්‍යාග, මුදල් ත්‍යාග, සහ ආහාරපාන පරිත්‍යාග කළේ ය.

**ආර්ථිකමය සේවාවන්**

පෙරෝන් තම රට වන ආජන්ටිනාව, කාර්මීකරණය සහ රජය මැදිහත් වූ ආර්ථිකයක් කරා යන ක්‍රියාමාර්ගයක් ලෙස සකස් කරමින් කම්කරු පන්තිය සඳහා වැඩි ආර්ථික හා සමාජ ප්‍රතිලාභ ලබාදීමට කටයුතු කළේ ය. හුආන් පෙරෝන් විසින් ක්‍රියාත්මක කළ මූල්‍යමය ප්‍රවර්ධනය වැඩසටහන් තුළින් ආජන්ටිනාවේ ආර්ථිකය ශක්තිමත් වූ අතර රටෙ හි විනිමය ප්‍රවර්ධනයට එය මහඟු රුකුලක් විය.

1936 දී ලබාගත් බලශක්ති ප්‍රමාණය මෙන් විසි ගුණයක බල ශක්ති ප්‍රමාණයක් 1954 වන විට නිපදවීමට (කිලෝවොට් බිලියන දෙකක බලශක්තියක් නිපදවීම) ප්‍රධාන ජල විදුලි ව්‍යාපෘති 45කට වැඩි ප්‍රමාණයක් දියත් කරන ලදී. 1947 වන විට ආජන්ටිනාව තමන්ගේ ම යකඩ හා වානේ කර්මාන්තයන් ද දියුණු කරමින් තිබුණි. ගල් අඟුරු නිස්සාරණය සහ අනෙකුත් අමුද්‍රව්‍ය ද එකල නවීන තාක්‍ෂණය භාවිතයෙන් දියුණු කරන ලදී. එමගින් ගොවිපල යන්ත්‍රෝපකරණ නිෂ්පාදනය, ගුවන් යානා සහ කාර් නිෂ්පාදනය සැලකිය යුතු ප්‍රමාණයකින් ඉහළ ගියේය. ඔහු ආජන්ටිනාවේ විදේශ ණය ගෙවීම සඳහා 1946 දී අවුරුදු පහක සැලැස්මක් දියත් කරන ලදී. ඔහු විසින්

ආර්ථිකය සංවර්ධනය සඳහා නැව් තැනීමේ ව්‍යාපෘති ආරම්භ කරන ලද අතර, ඔහුගේ පාලනය යටතේ නැව් තැනීම ඉතා වර්ධනය විය.



*1946 දී ජනාධිපති පෙරෝන් ඔහුගේ මංගල පෙළපාලියේ සිටින මොහොතක්*

එහෙත් දිගුකාලීනව මෙම ප්‍රගතිශීලී වෙනස්කම් පවත්වා ගැනීමට පෙරෝන් අසමත් විය. පෙරොන් අසාර්ථක වීමට ප්‍රධාන හේතුව වූයේ ඔහුගේ ප්‍රතිසංස්කරණ ප්‍රමාණවත් තරම් රැඩිකල් නො වීමයි. නිදසුනක් වශයෙන්, ඔහු ග්‍රාමීය වැටුප් වැඩි කළ අතර ඉඩම් හිමියන්ට “විනිමය ප්‍රවර්ධන ආයතනය” (AIPE - Argentina Institute for Promotion of Exchange ) වෙත ලාභ විකිණීම සඳහා බල කළ ද, ඔවුන් එයට අකමැත්ත ප්‍රකාශ කල පසු ඊළඟ පියවර ගැනීම ඔහු විසින් ප්‍රතික්ෂේප කළේ ය. ඔහු ඉඩම් ජනසතු කළේ නැත. මේ අනුව, වගා කරනු ලබන ඉඩම් ප්‍රමාණය 1934-38 දී හෙක්ටයාර මිලියන 22 සිට 1955 දී මිලියන 17 දක්වා පහත වැටුණි.

කෙසේ වෙතත් ඔහුගේ දර්ශනය කිසිසේත් ෆැසිස්ට්වාදී නොවූ අතර ධනවාදය සහ සමාජවාදය අතර පැහැදිලිව ගමන් කිරීමට උත්සාහ කළ "ජස්ටිෂලිස්මෝ" (Justicialismo) නම් ක්‍රමය යි. මෙවැනි ප්‍රතිපත්තීන් අනුගමනය කරමින් ඔහු ආජන්ටිනාවට මහඟු සේවයක් ඉටු කළේ ය.

# විදේශ ප්‍රතිපත්තිය

ආජන්ටිනාවේ ආර්ථිකය, සමාජ ව්‍යුහය, දේශපාලනය හා සංස්කෘතිය ශක්තිමත්ව නිර්මාණය කිරීමට පුරෝගාමී වූ ශ්‍රේෂ්ඨ නායකයෙකු වශයෙන් හුආන් පෙරෝන් වර්තමානයේදීත් සමාජ ආදරයට සහ ගෞරවයට පාත්‍ර වේ. එකල, ආජන්ටිනාවේ ජාත්‍යන්තර අභිලාෂයන් අතර දකුණු ඇමරිකාවේ පළමු ස්ථානය ලබා ගැනීමත්, ලතින් ඇමරිකාවේ නායකත්වය ලබා ගැනීමත් සහ ලෝකයේ ප්‍රධාන ස්ථානයක් අත්කරගැනීමත් ප්‍රමුඛ විය. මෙම අරමුණු කරා ළඟා වීමට පෙරොන් හට සාර්ථක ආර්ථික ව්‍යාප්තියක්, අසල්වැසි දේශයන්හී ආජන්ටිනාවේ බලපෑම තහවුරු කිරීමට නිදහස් හස්තයක් සහ ගෝලීය සබඳතා හා අභිලාශයන් සපුරා ගැනීම සඳහා විදේශීය සහායත් අවශ්‍යවන බව පසක් විණි. මෙම අරමුණු ඉටු කරගැනීම සඳහා ලෝක බලවේගයක සහයෝගය අත්‍යවශ්‍ය වූ අතර, පේරෝන් කිසිවිටක එවැනි සහයෝගීතාවයක් ලබාගෙන නො මැත. එයට හේතුව වන්නේ, පෙරෝන් යටතේ ආජන්ටිනාව නව ලෝක බල රටාවකට හැඩ ගැසුනු හේතුවෙන් කිසිදු ලෝක බලවේගයක් සමඟ සාර්ථක බැඳීමක් ඇති කරගැනීමට ආජන්ටිනාවට නො හැකි වීමයි.

පෙරෝන් යටතේ විදේශ ප්‍රතිපත්තිය සඳහා බලපාන ලද දේශීය සාධක වශයෙන් අපිරිසිදු යුද්ධය , නායකත්වය සහ බලපෑම් කණ්ඩායම් පෙන්වාදිය හැකි ය. අපිරිසිදු යුද්ධය (Dirty War) (1976-1983 ඒකාධිපතිවාදය) හේතුවෙන් මිනිසුන් තිස්දහසක් පමණ අතුරුදහන් වූ අතර එය ආජන්ටිනාව මානව හිමිකම් වැළඳගැනීමට ප්‍රධාන සාධකයක් විය. එමෙන් ම, මෙම කාලයේ දී, හුආන් දොමින්ගෝ  පෙරෝන් රට තුළ තිබූ ප්‍රධාන දේශපාලන පක්ෂ දෙකෙන් එකක් වන ජස්ටිස්ලිස්ට් පක්ෂයට දැඩි බලපෑම් කළේ ය. ඔහුගේ එම බලපෑම් ආජන්ටිනාව "ජාත්‍යන්තර තලයේ මධ්‍යස්ථ රටක්" යන ස්ථාවරය නැවත තහවුරු කිරීමට සමත්විණි. ජස්ටිස්ලිස්ට් පක්ෂය විසින් කම්කරු පන්තියට අනුග්‍රහය දැක්වීම සහ ප්‍රජාතන්ත්‍රවාදය වැළඳගැනීම වැනි පෙරෝනිස්ට්වාදයේ පරමාදර්ශ රට තුළ ක්‍රියාත්මක කළේ ය. එමෙන් ම රැඩිකල් සිවිල් සංගමය (UCR: Radical Civic Union) මුල දී ගතානුගතික පක්ෂයක් ලෙස ක්‍රියාකළ නමුත් පසුව ජාතිකවාදය සහ ප්‍රජාතන්ත්‍රවාදය වැළඳගැනීම වැනි වෙනත් පරමාදර්ශයන්ට ප්‍රමුඛත්වය දුන්නේ ය.

පෙරෝන් යටතේ විදේශ ප්‍රතිපත්තිය සඳහා බලපාන ලද බාහිර සාධකයක් වන්නේ ස්පාඤ්ඤ-ඉතාලි පරපුර යුරෝපය සමඟ ආර්ජන්ටිනාවේ දේශපාලන පෙළ ගැසීමයි. එමෙන් ම, ජාතික නිෂ්පාදන විවෘත වෙළඳපොලකට විකිණීමට හැකිවීම රටේ ජාත්‍යන්තර මධ්‍යස්ථභාවය දිරිමත් කිරීමට හේතු විය. ඒ තුළින් ඇති වූ ආර්ථික වර්ධනය තුළ, ආජන්ටිනාව දකුණු ඇමරිකානු රටවල් සමඟ සන්ධානගතවීමක් දක්නට ලැබුණි. එය බලවත් රාජ්‍යයන් මත යැපීම අඩු කිරීමට හේතුවක් වීම මෙන් ම ආණ්ඩුවේ ස්වභාවය, එනම් ආඥාදායක කාලය තුළ ආර්ජන්ටිනාව මධ්‍යස්ථ ස්ථානයක සිට වඩාත් ආක්‍රමණශීලී තත්වයකට මාරු වීමට හේතුවක් ද, මෙයට උදාහරණයක් වශයෙන් ෆොල්ක්ලන්ඩ් යුද්ධය (Falklands War) පෙන්වා දිය හැකි ය.

පෙරෝන්ගේ විදේශ ප්‍රතිපත්තිය විමසා බැලීමේ දී, එක්සත් ජනපදය කෙරෙහි ආර්ජන්ටිනා ප්‍රතිපත්තිය, සාම්ප්‍රදායිකව දුරස්ථ ස්වභාවයක් උසුලන බව පෙනී යයි. මෙයට ප්‍රධාන හේතූන් ලෙස දිගුකාලීනව බ්‍රිතාන්‍යය සමඟ පැවැත් වූ සබඳතා, ආර්ජන්ටිනා ව්‍යාප්තිවාදය සහ අර්ධ ගෝලයේ නායකත්වය සඳහා එක්සත් ජනපද ප්‍රතිපත්ති බාධක පෙන්වා දිය හැක. පෙරොන් යටතේ ආජන්ටිනා විදේශ ප්‍රතිපත්තිය ඉතා ආක්‍රමණශීලී වූවක් විය. ඒ අතරින් එක්සත් ජනපදය කෙරෙහි විරෝධය වඩාත් කැපී පෙනුණි. මෙම ආක්‍රමණශීලී එක්සත් ජනපද විරෝධතාවය තුළින් ආජන්ටිනාවේ අනාරක්ෂිත බව පිළිබිඹු විය. එමෙන් ම, පෙරෝනිස්ට් විප්ලවය විසින් දැඩි අවධාරණයකින් වර්ණ ගැන් වූ "ධනපති විරෝධී" සහ "අධිරාජ්‍ය විරෝධී" දේශපාලන සටන්පාඨ ආර්ථික පිරිහීම හේතුවෙන් වඩාත් උත්සන්න විය. කෙසේ වෙතත්, 1952 අවසානය වන විට, මෙම එක්සත් ජනපද විරෝධී ප්‍රතිපත්තිය ලාභදායී නො වන බව පෙරෝන් හට පැහැදිලිව ම පෙනී ගියේ ය. වැදගත්ම දෙය නම්, පෙරෝන්ගේ නිගමනයන්ට අනුව ඔහුගේ අභ්‍යන්තර ආර්ථික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සාර්ථක විදේශ ආර්ථික සහයෝගයක් අත්‍යවශ්‍ය වූ අතර, එය ඔහුගේ බලයේ රැඳී සිටීමටත්, ලතින් ඇමරිකාවේ ඔහුගේ විදේශ ප්‍රතිපත්ති අරමුණු සාක්ෂාත් කර ගැනීමටත් පූර්වාවශ්‍යතාවක් විය. පසුකාලයේ දී ආර්ජන්ටිනාවේ එක්සත් ජනපද විරෝධී ප්‍රචාරය මුළුමනින් ම නැවතී ඇත. ආජන්ටිනාව තුළ එක්සත් ජනපදයේ පුවත් සේවා හා ප්‍රකාශන සඳහා තිබූ සීමා ඉවත් කර ඇති අතර එක්සත් ජනපදයට අයත් ව්‍යාපාරික අවශ්‍යතා සඳහා වඩාත් හිතකර කොන්දේසි නිර්මාණය විය. ඇමරිකානු සංවිධානය (OAS - Organization of American States) සහ

එක්සත් ජාතීන් (United Nations) තුළ එක්සත් ජනපද අරමුණු සහ යෝජනා සඳහා පෙරෝන් වැඩි සහයෝගයක් ලබාදුන් බවට සාක්ෂි ද තිබේ. ඒ වෙනුවට, පෙරෝන් එක්සත් ජනපදයෙන් බලාපොරොත්තු වූයේ:

(අ) ලතින් ඇමරිකාව විසින් ආර්ජන්ටිනා දේශපාලන හා ආර්ථික අරමුණු කෙරෙහි යහපත් ආකල්පයක් අනුගමනය කිරීම;
(ආ) එක්සත් ජනපදයේ පෞද්ගලික ව්‍යාපාර ආර්ජන්ටිනාවේ ආයෝජනය කිරීමට සහ ණය කොන්දේසි ලිහිල් කිරීමට දිරිමත් කිරීම;
(ඇ) ලිබරල් කොන්දේසි මත තාක්ෂණික උපදෙස් හා ද්‍රව්‍ය ලබා දීමෙන් ආර්ජන්ටිනා හමුදා පහසුකම් පුළුල් කිරීමට ආධාර කිරීම ය.

පෙරෝන් අවධාරණය කළේ මෙම ගිවිසුම ආර්ජන්ටිනාව තුළ කොමියුනිස්ට්වාදයට එරෙහිව දැඩි ස්ථාවරයක් අනුගමනය කිරීමත්, ලතින් ඇමරිකාව පුරා කොමියුනිස්ට්වාදයේ වර්ධනයට එරෙහිව සටන් කිරීමට සහ බාහිර කොමියුනිස්ට් ආක්‍රමණයක දී දකුණු ඇමරිකාව ආරක්ෂා කිරීමටත් හේතු වීම තුළින් එක්සත් ජනපදයට වාසි සැලසෙන බවයි.

ආර්ජන්ටිනාව පැරගුවේ, චිලී සහ ඉක්වදෝරය සමග "ආර්ථික වෘත්තීය සමිති" (Economic Trade Unions) ගිවිසුම් අත්සන් කළ අතර, ආජන්ටිනාවට එකී වෙළඳ පොරොන්දු නිසි ආකාරයෙන් ඉටු කිරීමට නො හැකි වීම හේතුවෙන් සැලකිය යුතු බලපෑමක් එම ගිවිසුම් මගින් ආජන්ටිනා ආර්ථිකයට සිදුකිරීමට නො හැකි වී ඇත. විදේශ ප්‍රතිපත්තීන් තුළින් ලතින් ඇමරිකාවට සිදුකරන බලපෑම් පුළුල් කිරීමට පෙරෝන් උත්සාහ කළ අතර සංස්කෘතික අංගයන් හැරුණුකොට, ලතින් ඇමරිකාවේ සිය බලපෑම ව්‍යාප්ත කිරීමට ආර්ජන්ටිනාව ගත් උත්සාහයන් සුළු සාර්ථකත්වයක් අත්කර ගැනීමට සමත් විය.

එපමණක් නොව පෙරෝන් විසින් ඇල්බේනියාව හැර සෝවියට් සංගමය සහ යුරෝපීය රටවල් සමඟ රාජ්‍ය තාන්ත්‍රික සබඳතා පවත්වාගෙන යාමට කටයුතු කළේ ය. මේ සෑම රටක ම බුවනෝස් අයර්ස් හි නේවාසික දූත මණ්ඩල පිහිටා තිබිණි. එමගින් ආර්ජන්ටිනාව තුළ සහ අසල්වැසි රටවල කොමියුනිස්ට් ප්‍රචාරය බෙදා හැරීම සඳහා නාලිකා සැපයීම සිදුවිණි. එයට අනුප්‍රාප්තිකව පෙරොන් සෝවියට් සමාජවාදී ජනරජයන්ගේ සංගමයේ, චෙකොස්ලොවැකියාව, පෝලන්තය සහ රුමේනියාවහි

නේවාසික දූත මණ්ඩල (Residential Missions) පවත්වාගෙන යාමට කටයුතු කළේ ය. කෙසේ නමුදු ආර්ජන්ටිනාව සෝවියට් සමාජවාදී ජනරජය සමග තානාපති සබඳතා පවත්වා ගෙන ගිය අතර එතුළින් දෙරට වෙළඳ සබඳතා දියුණු කරගැනීම පෙරෝන්ගේ අරමුණ විය.

පෙරෝන්ගේ විදේශ ප්‍රතිපත්තිය සැකෙවින් සලකා බැලීමේදී පෙනී යන්නේ ආජන්ටිනාව එක්සත් ජනපදය හෝ සෝවියට් සංගමයට සහයෝගය නො දක්වමින් නමුත් දෙපාර්ශවය සමඟම මිත්‍රශීලී සබඳතාවයක් පවත්වා ගනිමින් "තෙවන ස්ථානය " (Third position) යන ප්‍රතිපත්තිය අනුගමනය කළ බවයි. කෙසේනමුදු එක්සත් ජනපදයට අභියෝග කර කියුබාව සමග නැවත විවෘත වෙළඳාම ආරම්භ කිරීමට කටයුතු යෙදුවේ ආර්ථික ස්වාධීනත්වය ඇති කරගැනීම පෙරෝන්ගේ ප්‍රධාන ඉලක්කයක් වී තිබූ නිසා ය. පෙරෝන් බොල්ෂෙවික් විප්ලවයෙන් (Bolshevik Revolution) පසු ප්‍රථම වතාවට සෝවියට් සමාජවාදී ජනරජයන්ගේ සංගමය සමග නැවත රාජ්‍ය තාන්ත්‍රික සබඳතා ස්ථාපිත කිරීමට කටයුතු කළේ ය. පෙරෝන්ගේ විදේශ ප්‍රතිපත්තියේ දක්නට ලැබෙන තවත් එක් විශේෂ ලක්ෂණයක් වන්නේ ඔහු විදේශ ණය ගැනීම ප්‍රතික්ෂේප කළ අතර ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) සමග ද සම්බන්ධ නො වීය.

ස්පාඤ්ඤය අතර ආජන්ටිනාව පැවැත් වූ සබඳතා සලකා බැලීමේ දී නිදහසින් පසු දෙරට අතර යහපත් සබඳතා පැවතුන බව පෙනීයයි. දෙවන ලෝක යුද්ධයෙන් පසු ආර්ජන්ටිනාව ස්පාඤ්ඤයට දැඩි සහයෝගයක් දැක් වූ අතර සාගතය වැළැක්වීම සඳහා ස්පාඤ්ඤයට නොමිලේ ධාන්‍ය සැපයීම මෙයට උදාහරණ සපයයි. ඉතාලිය සමග ද යහපත් සබඳතාවයක් පවත්වා ගැනීමට පෙරෝන් සමත් විය. ආජන්ටිනා ජනගහනයට ඉතාලි සම්භවයක් තිබීම ද මෙයට හේතුවක් විය. ආර්ජන්ටිනා මැතිවරණ දිස්ත්‍රික්කයෙහි පාලන කටයුතු සිදුකළේ ද්විත්ව පුරවැසිභාවය ඇති ආර්ජන්ටිනා ඡන්දදායකයින් විසින් තේරී පත් වූ මන්ත්‍රීවරුන් ය. ඊශ්‍රායලය සහ ආර්ජන්ටිනාව අතර තිබූ සබඳතා පරස්පර විරෝධී නමුදු ආර්ජන්ටිනාව තුළ ලතින් ඇමරිකාවේ විශාලතම යුදෙව් ප්‍රජාව වාසය කළ බැවින් ඊශ්‍රායලය සමග ද මිත්‍ර සබඳතා වර්ධනය විය. ආර්ජන්ටිනාව සැමවිටම ජර්මනිය සමග ද යහපත් සබඳතා පැවැත්වීය. දෙවන ලෝක යුද්ධයේ දී පවා ආර්ජන්ටිනාව මධ්‍යස්ථව කටයුතු කළේ ය. මෙම හේතූන් නිසා ජර්මානුවන් බොහෝ ප්‍රමාණයක් යුද්ධයෙන් පසු ආජන්ටිනාවට සංක්‍රමණය වූහ.

මෙකල ආජන්ටිනාව එක්සත් ජාතීන්ගේ සහ අනෙකුත් ජාත්‍යන්තර සංවිධාන සමග පැවැත් වූ සාමාජිකත්වය එතරම් සාර්ථක නො වූවකි. එක්සත් ජාතීන්ගේ සාම සාධක කටයුතු සඳහා සහභාගී වන මහා මණ්ඩලයෙන් සහ ආරක්ෂක මණ්ඩලයෙන් එළඹෙන තීරණ වලට පෙරෝන් ගරු කළේ ය. පෙරෝන්ගේ සමයේ දී ආර්ජන්ටිනාව සාමාජිකත්වය දැරූ අනෙකුත් ජාත්‍යන්තර සංවිධාන ලෙසඃ ජාත්‍යන්තර පරමාණුක බලශක්ති ඒජන්සිය (The International Atomic Energy Agency) , ලෝක වෙළඳ සංවිධානය (The World Trade Organization), පැරිස් සමාජය (Paris Club) , G-15, G-20, G-24, G-77 පෙන්වා දිය හැක.

පෙරෝන්ගේ විදේශ ප්‍රතිපත්තිය සැකෙවින් විමසා බැලීමේ දී පෙනී යන්නේ, ආජන්ටිනාව රටවල් කිහිපයක් සමග පමණක් සාර්ථක විදේශ සබඳතා පවත්වා ගැනීමට සමත් වී ඇති බවයි. එමෙන් ම, බ්‍රසීලය මෙන් එක්සත් ජනපදය සමග ද දීර්ඝකාලීන මිත්‍රශීලී සහයෝගීතාවයක් ඇති කර ගැනීමට ආර්ජන්ටිනාවට නො හැකි වූ අතර මූලික දේශපාලන, මතවාදී හා ආර්ථික ප්‍රතිපත්තීන් නිසා පෙරෝන් හට සෝවියට් සංගමය සමග ද දීර්ඝකාලීන මිත්‍රශීලී සබඳතා ඇති කරගැනීමට නො හැකි විය. මෙම හේතූන් නිසා ආජන්ටිනාව හුදකලාවීමේ ප්‍රතිපත්තියට (Isolation Policy) නැඹුරු විය. කෙසේ වුව ද සමස්තයක් ලෙස බලනවිට පෙරෝන්හට සාර්ථක විදේශ ප්‍රතිපත්තියක් ගෙන යාමට හැකි වී ඇති බව පිළිබිඹු වේ.

## <u>ගත හැකි ආදර්ශ</u>

යමෙකුගේ දක්ෂතාවයන් ඉස්මතු වනුයේ ඔහුට හෝ ඇයට මුහුණදීමට සිදුවන අභියෝගයන් හා අපහසුතාවයන් ප්‍රමාණය මතයි. හුආන් පෙරෝන් අතිවිශිෂ්ඨ දේශපාලනඥයෙකු වූ අතර සැබෑ නායකයෙකු වීමට නම් ඔහු තුළ නිතැතින්ම නායකයෙකු වීමේ අභිප්‍රාය ඇවසි බව මෙම චරිතය තුළින් අවධාරණය වේ. දක්ෂ පරිපාලකයෙකු වූ පෙරොන්ගේ අරමුණු වූයේ රැකියා හා ආර්ථික වර්ධනය, ජාත්‍යන්තර ස්වෛරීයභාවය සහ සමාජ සාධාරණත්වයයි. තමා සතු දැනුම හා දැක්ම උපයෝගී කර ගනිමින් කුමන අසීරු තත්වයක වුවද තම රාජ්‍යයට හා පුරවැසියන්හට යහපත හා සාර්ථකත්වය ළඟා කරදීමට ඔහු සමත් විය. අප්‍රතිහත ධෛර්යය ද පෙරොන්ගේ චරිතයෙන් උකහා ගත හැකි තවත් එක් ගුණාංගයකි.

විශේෂයෙන් ම වෘත්තීය ජීවිතයේ සාර්ථකත්වයට මෙන් ම පෞද්ගලික ජීවිතයේ සාර්ථකත්වයට මෙම ගුණාංග ඔහුට විශාල පිටුබලයක් සපයන ලදී. කම්කරුවන්ට මූලික අයිතිවාසිකම් වැඩි කර යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම හා ආර්ථිකය යාවත්කාලීන කිරීමේ දී නිවැරදි අදහස් තුළ තමන්ගේ ස්ථාවරත්වයෙහි රැඳීමට තරම් දැඩි ආත්ම විශ්වාසයක් හුආන් පෙරෝන් සතු විය. තමා හට උපදෙස් දෙන්නන්ගේ ඇතැම් උදාසීන හා ප්‍රතිඵල රහිත උපදෙස් පසෙකට දමා තම ආත්ම විශ්වාසය පවත්වාගත් ඔහු බොහෝ අවස්ථාවල දී සාර්ථකත්වයට පත් විය.

සීතල යුද්ධ සමයේ දී නැගෙනහිර හා බටහිර දෙරට අතර හොඳ පදනමක් ඇති කරන ලද දක්ෂ දේශපාලඥයෙකු වූ පෙරොන්ගේ සැලසුම් සහගත හා තරඟකාරීවීම විශේෂ ගුණාංග ද්විත්වයකි. හුආන් පෙරෝන්ගේ චරිතය හඳුනාගත හැක්කේ, විශිෂ්ට නායකයෙකු සතු ගුණාංග වලින් සපිරි පරිණතම නායකයෙකු ලෙසයි. ඔහු කීපවරක් ම ආර්ජන්ටිනාවේ ජනාධිපති ධූරයට පත්වීම මගින් ද පැහැදිලි කරනුයේ නායකයෙකු ලෙස ඔහු අත්කොට ගෙන තිබූ සාර්ථකත්වයත් සහ පෙරෝන් මත එරට ජාතිකයන් තබා තිබූ දැඩි විශ්වාසයයි. මෙතුමාගේ චරිත කතාව අධ්‍යනය කරන අයෙකුට එම චරිතයෙන් ගත හැකි ආදර්ශ බොහොමයක් ඇත. ඒ අතරින් ඔහුගේ බුද්ධිමත්භාවය, ආත්ම විශ්වාසය, අප්‍රතිහත ධෛර්ය, අවංකකම, සමාජශීලිත්වය කැපී පෙනෙන ගුණාංග ලෙස හඳුනාගත හැකි ය.

සියලු බාධක සාර්ථක ලෙස ජයගනිමින් තම රටෙහි අභිවෘද්ධිය කරා මොහු විසින් ඉටු කරන ලද කාර්යභාරය අති මහත් ය. තම අනුගාමිකයන්ට හා සමකාලීනයන් හට නිරන්තරයෙන් ආදර්ශමත් පුද්ගලයෙකු වූ හුආන් පෙරෝන් ඒ තුළින් ජනතා ප්‍රසාදය හා ගෞරවය දිනා ගත්තේ ය. මේ හේතුවෙන් ආදර්ශවත් නායකයෙකු ලෙස ඔහුගේ නම ලෝක දේශපාලන වේදිකාව තුළ තවමත් බබළන්නේ ය. තවද මෙවැනි ගුණාංග හා නායකත්ව ලක්ෂණ තුළින් හුවාන් පෙරෝන් දැනට ලෝක දේශපාලන වේදිකාවේ ලොකු කුඩා සෑම රාජ්‍යයකම ආදර්ශවත් චරිතයක් වී හමාරය. මෙම යුග පුරුෂයාගේ සෑම යහපත් ගුණාංගයක් ම අපගේ ජීවිතවලට එක්කර ගැනීමට අප උත්සහ කළ යුතු ය.

## සාරාංශය

ආර්ජන්ටිනාවේ දිගු ඉතිහාසය තුළ නො මැකෙන නමක් ඉතුරු කළ පුද්ගලයෙකු ලෙස හුආන් දොමින්ගෝ පෙරෝන් (Juan Domingo Perón) හැඳින්විය හැක. ඔහු විටෙක හමුදා ජෙනරාල්වරයෙකු ලෙස ද , තවත් විටෙක ජනාධිපතිවරයෙකු ලෙස ද ආර්ජන්ටිනා ඉතිහාසය තුළ විශාල චරිතයක් රඟ දැක්වූවේ ය. ඔහුගේ දිවිය වෙනස් වන සන්ධිස්ථානයක් වන්නේ ඉතා තරුණ වයසකින් ම හමුදා සේවයට බැඳීමයි. ඔහු හමුදා සේවයේ ප්‍රගතියක් පෙන්නුම් කරමින් කෙමෙන් ඉදිරියට ගමන් කළේ ය.

ආර්ජන්ටිනාවේ අකාර්යක්ෂම සිවිල් රජය පෙරලා දැමූ 1943 කුමන්ත්‍රණය සැලසුම් කළ රහසිගත හමුදා සංවිධානයක් වන එක්සත් නිලධාරීන්ගේ කණ්ඩායමට (Grupo de Oficiales Unidos; GOU) සම්බන්ධ වීම ඔහුගේ දිවියේ තවත් එක් සන්ධිස්ථානයක් විය. ඔහු 1944 දී ජනාධිපති, ජෙනරාල් එඩෙල්මිරෝ ජේ. ෆැරල් (1944-46) යටතේ යුද ඇමති බවට පත් වී පසුව උප ජනාධිපති තනතුරට ද පත්වෙමින් නායකයෙකුගේ චරිතයට අවතීර්ණ වූවේ ය. ඒ වනවිට ඔහුට අඩු වරප්‍රසාදිත කම්කරුවන්ගේ සහය සහ හමුදාව තුළ ජනප්‍රියතාවය සහ අධිකාරය නො මදව තිබුණි. 1945 ඔක්තෝබර් මස මුල දී, පෙරෝන්ව ඔහුගේ තනතුරුවලින් නෙරපා හැරුණු අතර ඔහු නැවත ඔක්තෝබර් 17 වන දින අත්අඩංගුවෙන් නිදහස් විය. පසුව ශක්තිමත් හා සාධාරණ ජාතියක් ගොඩනැගීමේ පොරොන්දුව මත පෙරෝන් 1946 පෙබරවාරි මාසයේ දී ජනාධිපති ධූරයට පත් වූවේ ය.

ඔහු කම්කරු පන්තියට ආර්ථික හා සමාජ ප්‍රතිලාභ ලබා දීමටත්, පොදු සේවා දියුණු කිරීමටත් අවධානය යොමු කළේ ය. කෙමෙන් එරට දේශපාලනික ගමන් මඟ පෙරෝන් යටතට පත් වුණි. පෙරෝන්ගේ ජනතාවාදී හා ජාතිකවාදී ප්‍රතිපත්ති පිළිපදින්නන් පෙරෝනිස්ට්වරු ලෙසත්, එතුළින් බිහි වූ දේශපාලනික චින්තනය පෙරෝනිස්ට්වාදය නමින් ද හැඳින්වීය. මෙලෙසට පෙරෝන් විසින් දේශපාලනික, සමාජීය හා ආර්ථික සේවාවන් රැසක් සිදුකරන ලද බව පෙනෙන්නට තිබෙන කරුණකි. 1952 දී නැවත ජනපති ධූරයට පත් වූ පෙරෝන්ව හමුදා-නාවුක කැරැල්ලකින් 1955 දී බලයෙන් පහ කරන ලදී. ඔහු නැවතත් 1973 වසරේ දී තෙවන

වරට ද ජනපති ධූරයට පත් වූයේ ආර්ජන්ටියානු දේශපාලනික ඉතිහාසයේ නො මැකෙන නමක් සනිටුහන් කරමිනි.

ඔහුගේ ජීවිතය විවිධ වූ හැල හැප්පීම්වලින් යුක්ත වූව ද එම පැමිණි අර්බුදයන් ජය ගනිමින් සිය ඉලක්ක කරා ගමන් කිරීමට ඔහුට හැකි විය. එමෙන් ම මෙම බාධක මධ්‍යයේ ඔහු විසින් ආර්ජන්ටිනාවේ අභිවෘද්ධිය උදෙසා ඉටු කරන ලද කාර්යභාර්යය අති මහත් ය. ජනපති ධූරයට පත් වීමට නම් නායකයෙකුට ජනතා ප්‍රසාදය තිබිය යුතු ය. ඒ අනුව පෙරෝන් තෙවරක් ම එරට ජනපති බවට පත් වීමෙන් පිළිඹිබු වන්නේ ඔහු කෙරෙහි ජනතාව තුළ කෙතරම් ප්‍රසාදයක් තිබුණේ ද යන්නයි. අද වන විට ද ඔහු එරට ජනයාගේ ගෞරවයට පාත්‍ර වන්නේ ය. එදා ඔහු ඉගැන් වූ දෑ අද වන විට ද නො මැකී පවතින්නේ ඔහු කෙතරම් සාර්ථක නායකයෙකු ද, ඔහුගේ ඉගැන්වීම් කෙතරම් සාර්ථක ද යන්න පිළිඹිබු කරමිනි. ඒ අනුව 1974 වසරේ දී හුආන් පෙරෝන් නම් වූ ඒ අසහාය නායකයා මෙලොවින් සමුගත්ත ද, ඔහු එරට ඉතිහාසයේ පමණක් නොව ලෝක ඉතිහාසය තුළ ද කැපී පෙනෙන චරිතයක් ලෙස නො මැකෙන උරුමයක් ඉතුරු කිරීමට සමත් විය.

# මූලාශ්‍ර නාමාවලිය

Anon, Juan Domingo Perón. *Biography*. Available at: https://biography.yourdictionary.com/juan-domingo-peron [Accessed August 08, 2021].

Anon, Juan PERÓN: 1895-1974: Former Argentine president - ascension of Saint Evita. *Ascension Of Saint Evita - Perónist, Argentina, Party, and Government - JRank Articles*. Available at: https://biography.jrank.org/pages/3420/Per-n-Juan-1895-1974-Former-Argentine-President-Ascension-Saint-Evita.html [Accessed August 10, 2021].

Biles, R.E., 1985. Juan Peron and the reshaping of Argentina. edited by Frederick C. Turner and Jose Enrique MIGUENS. (Pittsburgh: University of Pittsburgh Press, 1983. Pp. XII + 268. $24.95.). *American Political Science Review.* Available at: https://econpapers.repec.org/article/cupapsrev/v_3a79_3ay_3a1985_3ai_3a01_3ap_3a248-249_5f22.htm [Accessed August 08, 2021].

Fitzgibbon, R.H. (1956). Argentine Upheaval: Perón's Fall and the New Regime. By Arthur P. Whitaker. (New York: Frederick A. Praeger, Inc. 1956. Pp. x, 179. $3.50.). *American Political Science Review,* 50(4), pp.1192–1193.

F.McGann, T., 2021. *Juan Peron.president of Argentina*. [Online] Available at: https://www.britannica.com/biography/Juan-Peron.

History.com editors, 2010. Perón deposed in Argentina. *History.com*. Available at: https://www.history.com/this-day-in-history/peron-deposed-in-argentina [Accessed August 11, 2021].

history.state.gov. (n.d.). *Foreign Relations of the United States, 1952–1954, The American Republics, Volume IV - Office of the Historian*. [online] Available at: https://history.state.gov/historicaldocuments/frus1952-54v04/d125[Accessed August 09, 2021].

# හුආන් මැනුඑල් සැන්ටෝස්



**කණ්ඩායම් සාමාජිකයන් :**

- කවිෂි ඉමායා සුරවීර
- සුභානි වික්‍රමසිංහ
- දේශානි බණ්ඩාර
- තරුෂි දිව්‍යාංජලී
- කල්හාරි මදුවන්ති

# හැඳින්වීම

ගතානුගතික දේශපාලන න්‍යායපත්‍රවලින් ඔබ්බට ගොස් නව ප්‍රගතිශීලී අදහස් ඔස්සේ රට තුළ සාමය ස්ථාපිත කරලීම උදෙසා දුෂ්කර, අභියෝගාත්මක එ නමුත් සාර්ථක යාත්‍රාවක නිරත වූ අසහාය දේශපාලන පෞරුෂයක් වශයෙන් කොළොම්බියාවේ හිටපු ජනාධිපති හුආන් මැනුඑල් සැන්ටෝස් (Juan Manuel Santos) පෙන්වා දිය හැකිය. 1990 දශකයේ අගභාගය පමණ වන විට සක්‍රීය දේශපාලනයට පිවිසි සැන්ටෝස් දෙවරක් ම කොළොම්බියාවේ ජනාධිපති ධූරයට පත්වීම තුළ ඔහුගේ දේශපාලන පරිණතභාවය මොනවට ප්‍රකට වේ.

කොළොම්බියානු රාජ්‍ය දශක ගණනාවක් මුහුණ පා සිටි ජාතික අර්බුදය සමථයකට පත් කොට කොළොම්බියාව යළිත් වරක් සාමකාමී රාජ්‍යක් බවට පත් කිරීම උදෙසා සැන්ටෝස්ගේ දේශපාලන ආගමනය, ඔහු සතු කාලෝචිත දේශපාලන ප්‍රතිසංස්කරණ මෙන් ම මානව හිතවාදී ගුණාංග යන මේ සියල්ල එක ලෙස ඉවහල් විය. මෙය සැන්ටෝස් නාමය ජාතික මෙන් ම ජාත්‍යන්තර තලය තුළ පවා පැසසුමට ලක් වන්නට තරම් ප්‍රබල සාධකයක් වූ අතර 2016 වසරේ දී එතුමා සාමය පිළිබඳ නොබෙල් ත්‍යාගය ලැබීම තුළ ඔහු සිය මව් රටට කළ සේවාව කෙතරම් ද යන්න ගම්‍ය වේ. ඔහුගේ ධූර කාලය තුළ ප්‍රමුඛ කාර්යය වූයේ කොළොම්බියාවේ බිඳ වැටී තිබූ ජාතික ආරක්ෂාව යළිත් තහවුරු කිරීම වුව ද ඉන් ඔබ්බට ගොස් රාජ්‍යයක් වශයෙන් මුදුන්පත් කරගත යුතු අනෙකුත් ඉලක්ක ද ඉටුකර ගැනීම උදෙසා ඔහු සිය නායකත්වය හැසිරවීය. එය එතරම් පහසු නො වීය. සිත් රිදීම්, හැල හැප්පීම් වලින් ගහණ වූ එම ගමන තුළ සැන්ටෝස් ට ඔහුගේ අරමුණ සාක්ෂාත් කර ගැනීමට ඉවහල් වූයේ ඔහු සතුව පැවති නො පසුබස්නා චිත්ත ශක්තිය, මානුෂීය ගුණාංග ප්‍රමුඛ කොටගත් ධනාත්මක චරිත ලක්ෂණයන් ය.

දේශපාලන පසුබිමක උපත ලැබූ සැන්ටෝස් තුළ සහජයෙන් ම සාර්ථක දේශපාලඥයෙක් වීමට අවශ්‍ය කරන්නා වූ චරිත ලක්ෂණ තිබූ අතර ඔහුගේ අධ්‍යාපනය, නාවික නිලධාරියෙක් ලෙස ලත් අත්දැකීම් හා පුවත්පත් කලාවේදියෙක් ලෙස ලත් පන්නරය සැන්ටෝස් ලතින් ඇමරිකානු කලාපය තුළ පමණක් නොව සමස්ත ලෝකය තුල ම විශිෂ්ට ගණයේ නායකයෙකු ලෙස ප්‍රකට වීමට හේතු විය. එවන් වූ අග්‍රගණ්‍ය මිනිස් පෞරුෂයක ළමා කාලය, අධ්‍යාපනය, දේශපාලන ආගමනය, නායකත්වය කරා ගිය ගමන, නායකයකු ලෙස ඔහු ඉටුකළ සේවාව හා

ඔහු සිය රටේ ජාතික අභිලාෂ සාක්ෂාත් කර ගැනීම උදෙසා අනුගමනය කරන ලද විදේශ ප්‍රතිපත්තීන් සහ අවසානයේ මෙවැනි අද්විතීය නායකයෙකුගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ මෙහිදී විචාරාත්මකව විමසා බැලෙයි.

## ළමා කාලය, අධ්‍යාපනය හා දේශපාලනයට පිවිසීම

හුආන් මැනුඑල් සැන්ටෝස් කැල්ඩෙරන් (Juan Manuel Santos Calderón) 1951 අගෝස්තු මස 10 වන 64 දින කොළොම්බියාවේ බොගෝටා (Bogotá, Colombia) හි උපත ලැබී ය. ඔහු එන්රිකේ සැන්ටෝස් කැස්ටිලෝ (Enrique Santos Castillo) සහ ක්ලෙමෙන්සියා කැල්ඩෙරින් නීටෝ (Clemencia Calderón Nieto) දෙපලගේ දරුවන් හතර දෙනාගෙන් තුන්වැන්නා වූ අතර ඔහුගේ අනෙක් සහෝදරයන් වූයේ එන්රික් (Enrique), ලුයිස් ෆර්නැන්ඩු (Luis Fernando) සහ ෆිලිපේ (Felipe) ය. 1938-42 කාලයේ දී සැන්ටෝස්ගේ ලොකු මාමා වන එඩ්වාඩො සැන්ටෝස් මොන්ටෙජෝ (Eduardo Santos Montejo) කොළොම්බියාවේ ජනාධිපති ධූරය හෙබවූ අතර සැන්ටෝස්ගේ ඥාති සහෝදරයෙකු වන ෆ්‍රැන්සිස්කෝ සැන්ටෝස් කැල්ඩෙරන් (Francisco Santos Calderón), අල්වාරෝ උරිබේ වැලෙස්ගේ (Álvaro Uribe Vélez) ජනාධිපතිධූර කාලය යටතේ (2002-2010) උප සභාපති තනතුර දැරීය. ඔහුගේ මුතුන් මිත්තන් වූ ඇන්ටෝනියෝ සැන්ටෝස් (Antonio Santos) කොළොම්බියාවේ නිදහස වෙනුවෙන් දිවි පිදූවෙකි.



*සැන්ටෝස් කුඩා අවධියේ දී*

සැන්ටෝස් සිය පාසල් අවධියේ වැඩි කාලයක් ගත කළේ බෝගෝටා හි පිහිටි කොලෙජියෝ සැන් කාලෝස් හි (Colegio San Carlos', Bogotá) වන අතර එය ද්වීතීයික පිරිමි පාසලකි. එය පළමුවෙනි ශ්‍රේණියේ සිට 12 වන ශ්‍රේණිය දක්වා උගන්වනු ලබයි. ඉන්පසු ඔහු 1969 දී අද්මිරාල් පඩිල්ලා නාවික ඇකඩමිය (Admiral Padilla Naval Cadet School) තුළින් තම ප්‍රථම උපාධිය සම්පුර්ණ කරගත් අතරම එහි දී කොළොම්බියානු නාවික හමුදාවට ද ඇතුළත් විය. 1971 වසරේ දී සැන්ටොස් නාවික හමුදාවෙ හි NA-42139 යන නිලය අතහැර නාවික භට තනතුරෙන් ඉවත්වන අතර ඇමරිකාවේ කැන්සාස් විශ්ව විද්‍යාලයට (University of Kansas) ඇතුළත් විය. එහි දී වසර දෙකක් අධ්‍යාපනය ලැබීමෙන් අනතුරුව ඔහු ආර්ථික විද්‍යාව හා ව්‍යාපාර පරිපාලනය සම්බන්ධයෙන් තම උපාධිය සම්පූර්ණ කරනු ලැබී ය.

උපාධියෙන් පසු සැන්ටෝස් ලන්ඩනයට සංක්‍රමණය විය. එහි දී ඔහු නගරයේ රැඳී සිටි කාලය ඇතුළත ලන්ඩනයේ ආර්ථික විද්‍යාව හා දේශපාලන විද්‍යාව උගන්වන පාසලක වසර 02ක් අධ්‍යාපනය ලැබුවේ ය. එහි දී ඔහු 1975 දී ආර්ථික සංවර්ධනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ගන්නා ලදී. එමෙන් ම මීට අමතරව ඔහු ලන්ඩනයේ ගත කළ කාලයේදී "කොළොම්බියාවේ කෝපි වගාකරුවන්ගේ ජාතික සම්මේලනය" (National Federation of Coffee Growers of Colombia) හා සම්බන්ධ වී එහි ලන්ඩන් මූලස්ථානයේ නියෝජිතයෙකු ලෙස කටයුතු කළේ ය. 1981 වර්ෂයේ දී හාවඩ් විශ්වවිද්‍යාලයේ (Harvard University) JFK රජයේ පාසලෙන් රාජ්‍ය පරිපාලන ශාස්ත්‍රපති උපාධිය ලබා ගත් අතර, නැවතත් ඔහු ටෆ්ට්ස් විශ්වවිද්‍යාලයේ (Fletcher School of Law and Diplomacy- Tufts University) නීති හා රාජ්‍ය තාන්ත්‍රික පාසල හා සම්බන්ධ විය.

රටේ විශාලත ම පුවත්පත්වලින් එකක් වන එල් ටයිම්පෝ (El Tiempo) පුවත්පතේ නිර්මාතෘකරුවන් වනුයේ ද සැන්ටෝස් පවුල යි. යුරෝපයේ අධ්‍යාපනය නිම කිරිමෙන් පසු 1981 දී ඔහු නැවත කොළොම්බියාව බලා පැමිණෙන අතර ඔහුගේ මෙම නැවත පැමිණීම, ඔහු දේශපාලන ක්ෂේත්‍රයට පිවිසීමේ හැරවුම් ලක්ෂය විය. ඔහුගේ නැවත පැමිණීමත් සමඟ රටේ ප්‍රධාන පෙළේ පුවත්පතක් වන එල් ටයිම්පෝ හි තීරුලිපි රචකයෙකු හා උප අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කිරීමට ලැබිණි. වසර

දෙකක් එම ධූරයේ කටයුතු කිරීමෙන් අනතුරුව ඔහු එම පුවත්පතෙ හි ප්‍රධාන අධ්‍යක්ෂක ධූරය හොබවන්නට විය.

සැන්ටෝස් පළමුවෙන් විවාහ වන්නේ සිල්විියා අමායා ලොන්ඩෝනෝ (Silvia Amaya Londoño) සමග ය. ඇය චිත්‍රපට අධ්‍යක්‍ෂවරියක මෙන් ම රූපවාහිනි වැඩසටහන් ඉදිරිපත් කරන්නියක ලෙස ද කටයුතු කළ අතර ඇයත් සමග පැවැත්වූ විවාහ දිවිය වසර තුනකට සීමා විය. ඉන් අනතුරුව ඔහු දෙවන වරට විවාහ වන්නේ ඔහු උප අධ්‍යක්‍ෂවරයෙකු ලෙස එල් ටයිම්පෝ හි සේවය කරන අතරතුර දීය. ඇය මාරියා ක්ලෙමෙන්සියා රොඩ්රිගුස් මුනෙරා (María Clemencia Rodríguez Múnera) නම් වන අතර ඇය සන්නිවේදන අමාත්‍යාංශයේ පෞද්ගලික ලේකම්වරියක ලෙස කටයුතු කරනු ලැබී ය. ඇයගේ වෘත්තීය ජීවිතය සැන්ටෝස්ගේ දේශපාලන ගමන් මගේ ආරම්භයට පිටිවහලක් වූ අතර ඔහුට දාව ඇයට දරුවන් තිදෙනෙකු ද වේ.

සැන්ටෝස්ගේ දේශපාලන ජීවිතය ආරම්භ කිරිමට විශේෂයෙන් ම ඔහුගේ අධ්‍යාපන සුදුසුකම් ද පවුල් පසුබිම ද ප්‍රධාන වශයෙන් ම ඉවහල් විය. ඔහු දේශපාලන ක්ෂේත්‍රයට පළමුවෙන් ම අවතීර්ණ වන්නේ 1991 වර්ෂයේදී ය. ඒ ජනාධිපති සීසර් ගිවිරියා ටෘජිලෝගේ (César Gaviria Trujillo) පාලනය සමග වන අතර ඒ එම කාලය තුළ දී ටෘජිලෝගේ විදේශ වෙළඳ ඇමතිවරයා ලෙස පත්වීමත් සමග ය. මේ සමග ම මෙක්සිකෝව (Mexico) සහ වෙනිසියුලාව (Venezuela) අතර සිදු වූ නිදහස් ද්වීපාර්ශවික වෙළඳ ගිවිසුම් ඇති කර ගැනීමේ ක්‍රියාවලිය අධීක්‍ෂණය කරනු ලැබුවේ සැන්ටොස් විසිනි. යුරෝපයේ සිටිය දී සැන්ටොස් විසින් ලබාගත් අත්දැකීම්, සහභාගි වූ සියලු ම සංවිධාන, සම්මේලන මෙන් ම නැවත කොළොම්බියාවට පැමිණ තම පුවත්පතේ තීරුලිපි රචකයාගේ තනතුරේ සිට අධ්‍යක්ෂක තනතුර දක්වා හෙබ වූ ධූරයන් ඔහුගේ දේශපාලන ආගමනයටත් එහි සාර්ථකව කටයුතු කිරීමටත් ඔහුට මනා පිටිවහලක් විය.

## නායකත්වය කරා ගිය ගමන් මග

සැන්ටෝස් ක්‍රියාකාරී දේශපාලනයට පිවිසෙන්නේ 1991 දී, එවකට රජයේ විදේශ වෙළෙඳ ඇමැතිවරයා ලෙස ය. 1961 පමණ සිට කොළොම්බියාවේ සක්‍රීයව පැවැති

ෆාර්ක් සංවිධානය (FARC - Revolutionary Armed Forces of Colombia) ගිවිසුමකට එළඹීමට කරන ලද සාකච්ඡාවල පාර්ශවකරුවෙකු විය. ඔහු 1990 දශකයේ අග භාගයේ දී කොළොම්බියානු ලිබරල් පක්ෂයේ (Colombian Liberal Party) නායකයෙකු වූ අතර, 2000 සිට 2002 දක්වා භාණ්ඩාගාර හා රාජ්‍ය ණය ඇමති ලෙස කටයුතු කළේ ය. ඒ අතර ජනාධිපති ඇන්ඩ්‍රස් පස්ට්‍රානාගේ (Andres Pastrana) කැබිනට් මණ්ඩලයේ ද කටයුතු කළේ ය.

2005 දී සැන්ටෝස්, ජාතික යුනිටි සමාජ පක්ෂය (Social Party of National Unity) ඇති කිරීමට දායක වූයේ ය. ඔවුහු 2006 දී අල්වාරො උරිබේ වේලෙස්ගේ කැබිනට් මණ්ඩලයේ ආරක්ෂක ඇමතිවරයා ලෙස එක් වූ අතර එහි දී ඔහු විසින් ෆාර්ක් සංවිධානයට එරෙහි රජයේ මිලිටරි මෙහෙයුම් දියත් කිරීමට මූලිකත්වය ගන්නා ලදී. කොළොම්බියාවේ බටහිර සමඟ රාජ්‍ය තාන්ත්‍රික මතභේදයක් ඇති කර ගනිමින් 2008 මාර්තු මාසයේ දී ඉක්වදෝර (Ecuador) භූමියේ මතභේදයට තුඩුදුන් වර්ජනයක් හේතුවෙන් ෆාර්ක් සංවිධානයේ ජ්‍යෙෂ්ඨ නායකයෙකු සහ ඔහුගේ යටත් නිලධාරීන් ගණනාවක් මරණයට පත්විය. කොළොම්බියානු දේශපාලඥ ඉන්ග්‍රිඩ් බෙටන්කෝට් (Ingrid Betancourt) ඇතුළු ෆාර්ක් සංවිධානය විසින් රඳවාගෙන සිටි ප්‍රාණ ඇපකරුවන් පහළොස් දෙනා බේරා ගැනීමට දියත් කළ බුද්ධි මෙහෙයුම සැන්ටෝස් මාස හතරකට පසුව අධීක්ෂණය කළේ ය. 2008 මාර්තු මාසයේ දී ෆාර්ක් නිර්මාතෘ මැනුඑල් මරුලන්ද වැලෙස්ගේ (Manuel Marulanda Velez) හෘදයාබාධයෙන් සිදුවූ මරණය සහ ප්‍රාණ ඇපකරුවන් පහළොස් දෙනා බේරා ගැනීමේ බුද්ධි මෙහෙයුම යන සිදුවීම් දෙක එම ව්‍යාපාරයට විනාශකාරී පහරක් විය. කෙසේ වෙතත් එම වසර අවසානයේ දී ගරිල්ලා විරෝධී ව්‍යාපාර (Antiguerrilla Campaigns) වල දී මරණ සංඛ්‍යාව වැඩි කිරීමේ අරමුණින් වෙස්වලාගත් පැරාමිලිටරි කණ්ඩායම් විසින් පොලිසිය හා හමුදා ඒකක වල සිය ගණනක් සිවිල් වැසියන් ඝාතනය කර ඇති බව හෙළිදරව් වූ විට සැන්ටෝස් මහත් කණස්සල්ලට පත්විය. මේ සම්බන්ධයෙන් සැන්ටෝස් නිලධාරීන් දුසිම් ගණන් සේවයෙන් පහකළ නමුත් වගකිවයුත්තන්ට එරෙහිව නඩු පැවරීම සම්බන්ධයෙන් රජය ප්‍රමාද වීම ගැන මානව හිමිකම් සංවිධාන විසින් විවේචන ද එල්ල කරනු ලැබීය.

2009 දී ජනාධිපතිවරණය සඳහා තරඟ කිරීමට සැන්ටෝස් සිය කැබිනට් ධූරයෙන් ඉල්ලා අස්විය. ව්‍යවස්ථානුකූලව තුන්වන වාරයක් ඉල්ලීම තහනම් කර තිබූ

උරිබේගේ ප්‍රතිපත්ති දිගටම පවත්වාගෙන යන බවට ඔහු දුන් පොරොන්දුව ඡන්දදායකයින් අතර ජනප්‍රිය විය. 2010 මැයි මාසයේ පැවති පළමු වටයේ ඡන්ද විමසීමේ දී සැන්ටෝස්ට 47%ක ඡන්ද ප්‍රතිශතයක් ලැබුණු අතර ජුනි 20 දින පැවති දෙවන වටයේදී ඔහු 69% ක ඡන්ද ප්‍රතිශතයක් ලබා ගත්තේ ය. සැන්ටෝස් 2010 අගෝස්තු 7 වන දින එරට ජනපති පදවි ප්‍රාප්තියට පත්විය.

සැන්ටෝස්ගේ පරිපාලනයේ වඩාත් ම කැපී පෙනෙන ජයග්‍රහණය වූයේ ෆාර්ක් සංවිධානය සමඟ සාකච්ඡා පැවැත්වීම සඳහා පාර්ශවකරුවන් කේවල් කිරීමේ මේසයට (Bargaining Table) ගෙන ඒමයි. කොළොම්බියානු ඉතිහාසයේ තුන්වන වරටත් රජය සාම සාකච්ඡා ආරම්භ කළ අතර එය 2012 ඔස්ලෝ හි දී (Oslo, Norway) ආරම්භ විය. එම සාකච්ඡාවන්ගේ ආරම්භය නිසා සැන්ටෝස්ගේ ජනප්‍රියතාව දළ වශයෙන් 60% පමණ ප්‍රතිශතයකින් ඉහළ ගියේ ය.

2014 ජනාධිපතිවරණයේ දී දක්ෂිණාංශික ඔස්කාර් අයිවන් සූලූගා (Oscar Ivan Zuluga) පරාජය කිරීම සඳහා 51% ක ඡන්ද ප්‍රතිශතයක් ලබා ගනිමින් ජුනි මාසයේ දී සැන්ටෝස් දෙවන වරටත් එරට ජනාධිපති ධූරයට පත්විය. මේ අතර, සාකච්ඡා පාර්ශවයන් විසින් සකස් කරන ලද න්‍යාය පත්‍රයේ ප්‍රධාන කරුණු තුනක් පිළිබඳව සාකච්ඡා එකඟතාවයකට පැමිණි නමුත් නොවැම්බර් මැද භාගයේ දී උසස් හමුදා නිලධාරියකු සහ තවත් පුද්ගලයින් දෙදෙනෙකු ගරිල්ලා කණ්ඩායම විසින් පැහැරගෙන යාමෙන් එම සාකච්ඡා රජය විසින් අත්හිටවනු ලැබීය. සති දෙකකට පමණ පසු ෆාර්ක් සංවිධානය ඔහුව නිදහස් කළ විට සාකච්ඡා වහාම ආරම්භ විය. දෙසැම්බර් 20 වෙනිදා ෆාර්ක් සංවිධානය විසින් ඒකපාර්ශවිකව සටන් විරාමයක් ආරම්භ කළ අතර 2015 ජනවාරි මැද භාගයේ දීත්, ද්විපාර්ශ්වික සටන් විරාමයක් ගැන සාකච්ඡා ආරම්භ කරන ලෙස හවානා හි සාකච්ඡාකරුවන්ට සැන්ටෝස් විසින් උපදෙස් දෙනු ලැබී ය. අවසානයේ දී 2016 සැප්තැම්බර් 26 දා කාර්ටේජනාහී දී (cartegena) සැන්ටෝස් තම රජය හා ෆාර්ක් සංවිධානය අතර අවසන් ඓතිහාසික සාම ගිවිසුමට අත්සන් තබන ලදී. ඒ කෙසේ වෙතත් කොළොම්බියානු ජනතාව ගිවිසුම ප්‍රතික්ෂේප කිරීම නිසා සැන්ටෝස් දැඩි කම්පනයට පත්විය. "අපි ලෝක නායකයින් ඉදිරියේ ගිවිසුමට අත්සන් තබන විට කර්ටේනාවේ බලාපොරොත්තු ආලෝකය දැල් වී තිබූ අතර දැන් එය හදිසියේ නිවී යන බවක් පෙනෙන්නට තිබේ" යනුවෙන් ඔහු සිය නොබෙල් දේශනය අතරතුර ඒ සිදුවීම පිළිබඳ අවධාරණය කළේ

ය. ඉන් පසුව 2018 දී සිය ධුරයෙන් ඉවත් වූ දා සිට, ඔහු විසින් ඇති කරන ලද සාමය අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා තවදුරටත් වෙහෙස මහන්සි වී වැඩ කළේ ය.



*ජනාධිපති සැන්ටෝස් 2016 දී නොබෙල් සාම ත්‍යාගය ලැබූ අවස්ථාව*

## නායකත්වයට පැමිණීමෙන් පසු සිදු කළ සේවාව

**සාම සාකච්ඡා**

2010 ජූනි මාසයේ දී සැන්ටෝස් කොළොම්බියාවේ ජනාධිපති ලෙස තේරී පත්විය. මාස දෙකකට පසු පැවති සමාරම්භක උත්සවයකින් පසු ඔහු වැඩ භාර ගත්තේ ය. ජනාධිපති සැන්ටෝස් සිය මංගල කතාවේ දී සංවාදය තුළින් සාමය සෙවීම තම ප්‍රමුඛතාවය ලෙස නම් කළේ ය. සම්මුඛ සාකච්ඡාවක දී පවා ඔහු හෙළිදරව් කළේ, "මගේ සැබෑ රැකියාව සන්නද්ධ ගැටුම් නිරාකරණය කර ගැනීමෙන් ලෝකය යහපත් කරවීම යි. එය හොඳ හේතුවක් වන අතර එය මගේ ආශාව වී තිබේ. මම කොළොම්බියාවේ සාම ක්‍රියාවලිය ආරම්භ කළේ එ බැවිනි. සාමය යනු ලෝකයට ස්ථිර පදනමක් මත අවශ්‍ය දෙයකි" යනුවෙනි.

2012 සැප්තැම්බර් මාසයේ දී ඔහු සිය රජය කොළොම්බියාවේ විප්ලවවාදී සන්නද්ධ හමුදාව (Revolutionary Armed Forces of Colombia - FARC) සමඟ විධිමත්

සාකච්ඡා වලට එළඹ ඇති බව ප්‍රසිද්ධියේ ප්‍රකාශ කළේ ය. සංවාදය සඳහා උත්සාහ කරනවා විනා මිලිටරිමය වශයෙන් ඔවුන් පරාජය කිරීමේ අරමුණින් ෆාර්ක්-ගරිල්ලා හමුදාවන්ට එරෙහිව සටන් කිරීමේ ඔහුගේ පූර්වගාමීන්ගේ ප්‍රවේශය බිඳ දැමී ය. ජනාධිපතිවරයා වශයෙන් ඔහු ෆාර්ක් සංවිධානයට එරෙහිව දිගින් දිගටම මිලිටරි ප්‍රහාර එල්ල කළ නමුත් ඔහු ආර්ථික වර්ධනය පිළිබඳව ද අවධාරණය කළේය. ඔහු බලයට පත් වී මාස කිහිපයකට පසු කොළොම්බියා හමුදාව විසින් ෆාර්ක් සංවිධානයේ ප්‍රධානී මොනෝ ජොජෝයි (Mono Jojoy) ඝාතනය කරන ලදී.

කෙසේ වෙතත්, සැන්ටෝස්ගේ පරිපාලනයේ වඩාත් ම කැපී පෙනෙන ජයග්‍රහණය වූයේ ෆාර්ක් සංවිධානය සමග එකඟතාවයන්ට පැමිණීමට හැකි වීම යි. කොළොම්බියානු ඉතිහාසයේ තෙවන වරටත් සැන්ටෝස්ගේ රජය ඍජු සාම සාකච්ඡා ආරම්භ කළ අතර එය 2012 ඔස්ලෝ හිදී ආරම්භ වී හවානා හිදී පවත්වාගෙන යන ලදී. එම සාකච්ඡාවන්ගේ ආරම්භය නිසා සැන්ටෝස්ගේ ජනප්‍රියතාව 60%කින් පමණ වැඩි වන්නට විය. 2014 ජූනි මාසයේ දී ඔහු නැවත ජනාධිපති ලෙස තේරී පත්විය.

එකඟ වූ කාලසීමාව තුළ රජය සහ ෆාර්ක් සංවිධානය අතර අවසන් සාම ගිවිසුම කෙළවර වී නො තිබුණ ද, 2016 ජූනි 23 වන දින සැන්ටෝස් නැවත හවානා වෙත පැමිණියේ ය. මෙවර ෆාර්ක් සංවිධානයේ නායක රොඩ්රිගෝ ලොන්ඩොනෝ (Rodrigo Londono) ස්ථිර සටන් විරාම ගිවිසුමක් අත්සන් කරන ලදී. අවසන් ගිවිසුම අත්සන් කිරීමෙන් දින 180 ක් ඇතුළත ෆාර්ක් සටන්කාමීන් එක්සත් ජාතීන්ගේ අධීක්ෂණය යටතේ ඔවුන්ගේ අවි ආයුධ භාර දිය යුතු බව ගිවිසුමේ සඳහන් විය. සැප්තැම්බර් 26 දා කාර්ටේජනා හිදී සැන්ටෝස් සහ ලොන්ඩොනෝ ඓතිහාසික අවසන් සාම ගිවිසුමකට අත්සන් තැබූහ.

2014 දී සහ 2016 දී නැවත සැන්ටෝස් තේරී පත් වු විට කොළොම්බියානුවන් ජනමත විචාරණයක දී ඔහුගේ රජය සහ කැරලිකරුවන් අතර පැවති සාම ගිවිසුම ප්‍රතික්ෂේප කරන ලදී. මෙම ප්‍රතික්ෂේප කිරීම ගැන ඔහු පෞද්ගලිකව සම්මුඛ සාකච්ඡාවකදී හෙළි කළේ, ජනමත විචාරණයෙ හි ප්‍රතිඵලය සම්බන්ධයෙන් ඔහු දැඩි ලෙස කම්පාවට පත් වන බව හා එය ඔහු කිසිසේත් බලාපොරොත්තු නොවූ බවත් ය. ඔහු එය කොළොම්බියාව ඇතුළුව ලොව පුරා සිදු වෙමින් පවතින දේශපාලන ද්‍රැවීකරණයේ කොටසක් බවට සැලකුවේ ය. තව ද එම අවස්ථාවේ දී

ඔහු ව්‍යාජ ප්‍රවෘත්තිවල බලය අවතක්සේරුවට ලක් කිරීම පිළිබඳව ද කණස්සල්ල ප්‍රකාශ කර සිටියේ ය. ඒ කෙසේ වෙතත් අවසානයේ දී ඔහු අර්බුදය මධ්‍යයේ අවස්ථාවක් සෙවීමට තීරණය කළේ ය. ජනමත විචාරණය පරාජය වීමත් සමඟ ම සාම ගිවිසුම කඩ කිරීම සඳහා සිය ජනාධිපති ධූරය පරදුවට තැබීම සැන්ටෝස්ට විශාල පහරක් විය. කියුබාවේ හවානා හි නිපුණතාවයෙන් හා අධිෂ්ඨානයෙන් යුතුව මෙහෙයවන ලද මෙම සංකීර්ණ පියවර අනුගමනය කළේ සංකීර්ණ සාකච්ඡාවන් ය. දශක පහකටත් වැඩි කාලයක් පැවති සන්නද්ධ ගැටුම්වලට තිත තබමින් ජනාධිපති සැන්ටෝස් 2016 අග භාගයේ දී අභියෝග මැදින් මෙහි අවසානය කරා ළඟා වූයේ ය.

අවසානයේ දී සාම ගිවිසුම 2016 නොවැම්බර් මාසයේ දී අත්සන් කරන ලදී. 2016 නොවැම්බර් වන විට සැන්ටෝස් සක්‍රීය දේශපාලනයෙන් විශ්‍රාම ගොස් සිටියේ ය. සාම ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම ඉතා වැදගත් වූ අතර එය වඩාත් දුෂ්කර විය. සාමය ඇති කිරීම ඔවුන් සාර්ථකව කළ බව ප්‍රත්‍යක්ෂ වශයෙන් ලොවට පෙනෙන්නට වූ කරුණකි. නමුත් එය ඊට එහා ගිය සංකීර්ණ හා මන්දගාමී ක්‍රියාවලියක් විය. පාප් වහන්සේ 2016 දී කොළොම්බියානු සංචාරයක නියැලුනේ ද, සාම ගිවිසුම අත්සන් කිරීමෙන් පසුව එය වඩාත් අවශ්‍ය හා වඩාත් යෝග්‍ය වූ නිසාවෙනි.

ගුවන් විදුලි සම්මුඛ සාකච්ඡාවක දී සැන්ටෝස් සඳහන් කළේ, සාමකාමී කාලවල දී නායකත්වය දීමට වඩා යුද්ධ කාලවල දී නායකත්වය දීම ඉතා පහසු බවයි. සාර්ථක යුද නායකයෙකු වීමට ඉතා සරල ආකාරයේ නායකත්වයක් අවශ්‍ය බවත් සාමය ඇති කිරීමට සම්පූර්ණයෙන 'ම වෙනස් ආකාරයේ නායකත්වයක් අවශ්‍ය බවත්, නියෝග දීම වෙනුවට, ඒත්තු ගැන්වීම, මිනිසුන්ගේ හැඟීම් වෙනස් කිරීම, සමාව දිය යුතු ආකාරය, සංහිඳියාව ඇති කිරීම ගැන ඔවුන්ට ඉගැන්වීම අවශ්‍ය වන අතර එය වඩාත් දුෂ්කර කාර්යයක් වනු ඇත බවත් ය.

ෆාර්ක් සංවිධානය සමඟ කොළොම්බියාවේ ගැටුම නිල වශයෙන් අවසන් කරන බව නිවේදනය කරමින් සැන්ටෝස්, ෆොන්සේකා හි (Fonseca) පැවති උත්සවයක දී පැවසූයේ, "අපට කවදාවත් දියුණු කර ගැනීමට නොහැකි වූ රටේ ඇතැම් ප්‍රදේශ දැන් අපට දියුණු කළ හැකියි" යනුවෙනි. කෙසේ වෙතත්, 2018 ජනාධිපතිවරණයේ දී සැන්ටෝස්ගේ අනුප්‍රාප්තික අපේක්ෂකයා වන අයිවන් ඩියුක් (Iván Duque) තෝරා ගැනීමේ දී සාම ගිවිසුමේ අන්තර්ගතයට තර්ජනයක් එල්ල විය.



*ජනාධිපති හුආන් මැනුවල් සැන්ටෝස්*

සැන්ටෝස් සාධාරණ සංක්‍රාන්තියක් සහතික කිරීමටත්, අවසානයේ සමගිය හා සංහිඳියාව සඳහා අඩිතාලම දැමීමටත් පියවර ගත්තේ ය. ඔහු අවධාරණය කළේ වින්දිතයින් සඳහා යුක්තිය ඉටු කිරීම පමණක් නොව, වැදගත් කරුණක් ලෙස සත්‍ය සඳහා ඇති ආශාව, යුද්ධයේ දී සිවිල් වැසියන් පීඩාවට පත් වීම පිළිබඳව විමර්ශනය කිරීම සඳහා වූ ඓතිහාසික සත්‍ය කොමිෂන් සභාවක් ආරම්භ කිරීම යි.

ඔහු බ්‍රිතාන්‍ය අග්‍රාමාත්‍ය ටෝනි බ්ලෙයාර් (Tony Blair ) සමග "තුන්වන මාර්ගය" (On The Third Way) ගැන පොත් කිහිපයක් ලියා ඇති අතර ඉන් එකක් වන ෆාර්ක් සමග සාම ක්‍රියාවලිය පිළිබඳ "සාමය සඳහා සටන" (The Battle for Peace) ඔහුගේ අවසන් පොත විය. සාමය, යුක්තිය සහ මානව හිමිකම් සඳහා සහයෝගීව වැඩ කරන්නා වූ ගෝලීය නායකයින්ගෙන් සමන්විත වූ ස්වාධීන කණ්ඩායමක් වන "දි එල්ඩර්ස්" (The Elders) සමග ඔහු 2019 දී එක්විය. එතැන් සිට ඔහු සිය සහෝදර වැඩිහිටියන් සමග ඉතියෝපියාවට ගොස් සරණාගතයින්, අභ්‍යන්තර අවතැන් වූ ජනතාව සහ ඔවුන්ගේ මානව අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම පිළිබඳව අවධානය යොමු කරමින් ඉතියෝපියාවේ ජනාධිපති සහ අගමැති සමග ඉහළ පෙළේ රැස්වීම්වලට සහභාගී විය. ඔහු දැනට සාමය ප්‍රවර්ධනය කිරීම, පරිසරය ආරක්ෂා කිරීම සහ දුප්පත්කමට එරෙහිව සටන් කිරීම සඳහා නිර්මාණය කළ "කොම්පස් පදනමේ" (Compass Foundation) සභාපතිවරයා වේ.

**ආර්ථික සේවාව**

කොළොම්බියානුවන්ගේ ආර්ථික සුභසාධනය හා ආරක්ෂාව පිරිහෙමින් පවතින බවට කොළොම්බියානුවන් බොහෝ දෙනෙකුට හැඟීමක් තිබුණ ද, 2009 සිට 2013 දක්වා රටේ දළ දේශීය නිෂ්පාදිතය සාමාන්‍යයෙන් 4% ට වඩා වැඩි වූ අතර විරැකියාව සහ උද්ධමනය සාපේක්ෂව අඩු විය. කොළොම්බියානු ජනාධිපතිවරයා ලෙස 2010 සිට 2018 දක්වා වූ කාල සීමාව තුළ දී ඔහුගේ රජයේ, ජාතික සංවර්ධන සැලැස්මට බහුමාන දරිද්‍රතා දර්ශකයක් (MPI-Multidimentional Poverty Index) ඇතුළත් කළ පළමු ජනාධිපති ලෙස ඔහු සිය පළමු ධුර කාලය තුළ දී රටේ සමාජ හා ආර්ථික දර්ශක සැලකිය යුතු ලෙස වැඩිදියුණු කිරීමට සමත් විය.

ඔහු 2015 දී ලෝක න්‍යාය පත්‍රය බවට පත් වූ තිරසාර සංවර්ධන ඉලක්ක (Sustainable Development Goals) වල ආරම්භක ප්‍රවර්ධකයෙකි. ලෝක මත්ද්‍රව්‍ය ගැටලුවට මුහුණ දීම සඳහා වඩාත් ඵලදායි ක්‍රම සාකච්ඡා කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ විශේෂ සැසිවාරයක් (United Nations General Assembly-2016) කැඳවීමේ ක්‍රියාවලියට ද ඔහු නායකත්වය දුන්නේ ය. ලෝක ආර්ථික සංසදය ඔහුව "තරුණ ගෝලීය නායකයා" (Young Global Leader) ලෙස නම් කළ අතර 2017 ස්විට්සර්ලන්තයේ ඩාවෝස් හි (Davos, Switzerland) පැවති ලෝක ආර්ථික සමුළුවේ දී ඔහුට "ගෝලීය රාජ්‍ය නායක" (Global Statesman award) සම්මානය හිමි විය.

**පාරිසරික සේවාව**

සැන්ටෝස් යනු ජෛව විවිධත්වය ආරක්ෂා කිරීම සහ දේශගුණික විපර්යාසයන්ට එරෙහිව සටන් කිරීම සඳහා විවෘතව පෙනී සිටි අයෙකි. ඔහු ජනාධිපතිව සිටියදී කොළොම්බියාවේ සංරක්ෂිත ප්‍රදේශ සැලකිය යුතු ලෙස ව්‍යාප්ත කළ අතර පරිසර අමාත්‍යාංශය ශක්තිමත් කළේ ය. මෙම අංශය තුළ ඔහුගේ විශාලත ම ජයග්‍රහණය නම් 2010 සිට 2018 දක්වා, හෙක්ටයාර මිලියන 1.2 සිට මිලියන 12.8 දක්වා සාගර සංරක්ෂිත ප්‍රදේශ ඇති කිරීමයි.

තම රටේ ජෛව විවිධත්වය ආරක්ෂා කර ගැනීමට සහ දේශගුණික විපර්යාසයන්ට එරෙහිව සටන් කිරීම සඳහා කළ ප්‍රගතිශීලී පාරිසරික ප්‍රතිපත්ති හේතුවෙන් 2017 දී

ජනාධිපති සැන්ටෝස් "රාජකීය උද්භිද කිව් ජාත්‍යන්තර පදක්කම" (Royal Botanic Kew International Medal) සහ "වනජීවී සංරක්ෂණ සංගමයේ තියඩෝර් රූස්වෙල්ට්" සම්මානයෙන් (Wildlife Conservation Society Theodore Roosevelt Award) පිදුම් ලැබී ය. 2017 දී පාරිසරික සංරක්ෂණය සඳහා වූ නොසැලෙන කැපවීම හේතුවෙන් ඔහු ජාතික භූගෝලීය සංගමයේ (National Geographic Society) ගෞරව සම්මානයෙන් පිදුම් ලැබී ය. ඊට අමතරව, ජාත්‍යන්තර සංරක්ෂණ සංවිධානය (Conservation International) "ගෝලීය දැක්ම සම්මානය" (Global Visionary Award) ද සැන්ටෝස්ට පිරිනමන ලදී.

**වත්මන් සේවාව**

සැන්ටෝස්ගේ ජනාධිපති ධුරයෙන් පසුව, හාවඩ් හිදී ද (2018) ඔහු ඇන්ජෙලෝපොලෝස් ගෝලීය මහජන නායකයෙක් (Angelopoulos Global Public Leaders Fellow) ලෙස නම් කරන ලදී. සෝර්බෝන් (La Sorbonne) සහ ලන්ඩන් ආර්ථික විද්‍යා පාසල (London School of Economics) ඇතුළු විවිධ විශ්වවිද්‍යාල මඟින් ඔහුට ගෞරව ආචාර්ය උපාධි පිරිනමා ඇත. ඔහු ඔක්ස්ෆර්ඩ් විශ්ව විද්‍යාලයේ බාහිර කථිකාචාර්යවරයෙක් ද වේ. තවදුරටත් ඔහු ජාත්‍යන්තර අර්බුද කණ්ඩායමේ (International Crisis Group), වනජීවී සංරක්ෂණ සමිතියේ (Wildlife Conservation Society), මත්ද්‍රව්‍ය ප්‍රතිපත්ති පිළිබඳ ගෝලීය කොමිසමේ (Global Commission on Drug Policy) සාමාජිකයෙක් ද වේ. මෙලෙස සැන්ටෝස් වසර ගණනාවක් මුළුල්ලේ සිදු කරන ලද සේවාව ප්‍රශංසනීය වේ.

## විදේශ ප්‍රතිපත්තිය

සැන්ටෝස් ජනාධිපතිවරයාගෙ ධූර කාල දෙක තුළ දී කොලොම්බියානු විදේශ ප්‍රතිපත්තියේ ගැඹුරු වෙනස්කම් මාලාවක් දක්නට ලැබේ. පසුගිය පාලන කාලය තුළ ස්ථාපිත කර තිබූ විදේශ ප්‍රතිපත්තියෙ හි ඇතැම් අංග ඔහු විසින් වෙනස් කරන ලදී. ඒ අනුව කලාපීය හා ජාත්‍යන්තර වශයෙන් හුදකලා වීමේ ප්‍රතිපත්තිය පසෙකලා, කොළොම්බියාව ජාත්‍යන්තර න්‍යාය පත්‍රය තුළ වඩා දෘශ්‍යමාන කිරීමට උත්සාහ

කරමින්, සැන්ටෝස් ජනාධිපතිවරයා කලාපීය හා ජාත්‍යන්තර සංවිධාන සඳහා වැඩි දායකත්වයක් ලබාදුන්නේ ය. සැන්ටෝස් පාලනාධිකාරියේ විදේශ ප්‍රතිපත්තියෙහි මූලික අභිලාෂයන් දෙකක් විය. ඒවා නම්, බහු පාර්ශ්විකවාදය මත පදනම්ව ජාත්‍යන්තර පද්ධතිය වෙත ඵලදායි ප්‍රවේශ වීමක් සිදුකිරීම (Effective Approach) සහ සාම ක්‍රියාවලියට (Peace Process) ප්‍රිය කරන කලාපීය හා ජාත්‍යන්තර නායකත්වයයේ ප්‍රතිරූපයක් ලෙස කොළොම්බියාව ගොඩ නැඟීම යි. ඒ නිසාවෙන්, සැන්ටෝස්ගේ පාලන කාල දෙක තුළ දී කොළොම්බියාවේ විදේශ අමාත්‍යංශය අතිමහත් කාර්යභාරයක් ඉටු කළේ ය. මන්ද, එහි ප්‍රධාන වගකීම වූයේ ජාත්‍යන්තර පද්ධතිය මගින් ඇති වූ අභියෝගයන්ට ප්‍රතිචාර දැක්වීමට හැකියාව ලබා ගැනීම සඳහා, විවිධ ජාත්‍යන්තර පාත්‍රයන් සමග නව මාවත් සොයා ගැනීමට හැකියාව සලසන, ඵලදායී ප්‍රවේශ කිරීමේ උපාය මාර්ගයක් (Effective Insertion Strategy) නිර්මාණය කිරීම නිසා ය.

උරිබේගේ පාලන සමයට වඩා වෙනස්ව ජනාධිපති සැන්ටෝස් විසින් සිය විදේශ ප්‍රතිපත්තිය සකස් කිරීම සඳහා මූලිකවම අනුගමනය කරන ලද්දේ තර්ජන ප්‍රත්‍යක්ෂ කර ගැනීමේ (Threat Perception) ක්‍රමවේදය යි. මෙම ක්‍රමවේදයට අනුව යමින්, සිය රාජ්‍යය වෙත තිබෙන තර්ජන හඳුනාගත් සැන්ටෝස් ජනාධිපතිවරයා, ඒවාට මුහුණදීමට හැකි වාතාවරණයක් කොළොම්බියාව තුළ ගොඩ නැඟීම සඳහා සිය විදේශ ප්‍රතිපත්තිය සකස් කළේ ය. සැන්ටෝස් ජනාධිපතිවරයා සිය පළමු ධූර කාලය තුළ හඳුනාගත් පළමු තර්ජනය වූයේ කොළොම්බියාවේ ජාතික අභිලාෂයන්ට බලපාන්නා වූ ෆාර්ක්, බැක්‍රිම් වැනි සතුරන් (FARC, BACRIM) ය. අනෙක් තර්ජනය, ජාත්‍යන්තර හා කලාපීය වශයෙන් කොළොම්බියාවේ හුදෙකලා වීමේ ප්‍රතිපත්තිය බව ජනාධිපතිවරයා වටහා ගත්තේ ය. ඔහු සිතුවේ, කොළොම්බියානු රාජ්‍යයේ විදේශ ප්‍රතිපත්තියට ඇති ප්‍රධානම අභියෝගය, පසුගිය රජය විසින් ක්‍රියාත්මක කරන ලද මිලිටරිවාදී ප්‍රතිපත්ති හේතුවෙන් කොළොම්බියාව කලාපීය හා ගෝලීය වශයෙන් පීඩා විඳි "හුදෙකලා තත්වය" බව යි. එමෙන් ම, පසුගිය පරිපාලනයේ දී කොළොම්බියාව ඇතුළත මානව හිමිකම් උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන්, ජාත්‍යන්තර පද්ධතිය තුළ කොළොම්බියාවේ ප්‍රතිරූපයට හානි සිදුවී තිබීම තවත් තර්ජනයක් ලෙස සැන්ටෝස් විසින් හඳුනාගන්නා ලදී. මේ ආකාරයට, තර්ජන හඳුනාගැනීමේ ක්‍රමවේදය අනුගමනය කරමින්, තර්ජන හඳුනාගනිමින්, ඒවාට

මුහුණදිය හැකි වාතාවරණයක් නිර්මාණය කිරීමට, සැන්ටෝස් ජනාධිපතිවරයා සිය විදේශ ප්‍රතිපත්තිය තුළින් උත්සාහ කළේ ය.

### 2010-2014 ධූර කාලය තුළ විදේශ ප්‍රතිපත්තිය

බ්‍රසීලය (Brazil), චිලී (chilie) හා ආජන්ටිනාව (Argentina) වැනි රටවල් සමඟ විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීමට හා වෙළඳ සබඳතා ශක්තිමත් කර ගැනීම සඳහා, ආර්ථික රාජ්‍ය තාන්ත්‍රික උපාය මාර්ගයක් භාවිතා කරමින්, සැන්ටෝස් ජනාධිපතිවරයා සිය විදේශ ප්‍රතිපත්තිය වඩාත් විවිධාංගීකරණයන්ට ලක් කිරීමට උත්සාහ කරන ලදී. මෙම සබඳතා වල වර්ධනය හේතුවෙන්, ජාත්‍යන්තර න්‍යාය පත්‍රය (International Agenda) පුළුල් කරමින්, ලතින් ඇමෙරිකානු රාජ්‍යයන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට සහ පුළුල් හා සම්බන්ධීකරණ උපාය මාර්ගයක් උත්පාදනය කිරීමට කොළොම්බියාවට අවස්ථාව සැලසුණි. මෙම නව වෙනසට අනුකූල වෙමින්, කොළොම්බියාව නව ද්විතීයික කලාපීය බලයක් ලෙස තහවුරු විය. මෙය කොළොම්බියාවේ ආර්ථික සංවර්ධනය සහ සහයෝගීතාවය සඳහා වූ අවස්ථා වර්ධනය කළේ ය. ඒ අනුව, කොළොම්බියාවට මඟ පෙන්වීම සඳහා, කලාපීය ඒකාබද්ධතාවය (Regional Integration) සැලකිල්ලට ගන්නා විදේශ ප්‍රතිපත්තියක් සැන්ටෝස් ජනාධිපතිවරයා විසින් ස්ථාපිත කරන ලදී.

එමෙන් ම, ජනාධිපතිවරයා සිය පළමු ධූර කාලය තුළ දී, ලතින් ඇමරිකානු සහ කැරිබියානු රාජ්‍ය සමුළුව (CELAC-The Community of Latin American and Caribbean States) මෙන් ම ලතින් ඇමරිකානු ජාතීන්ගේ සංගමය (UNASUR-Union of South American Nations) සමඟ සන්ධානගත වීම තුළින්, සම්මේලනය හා සහයෝගීතාවය සඳහා අවස්ථාව සැලසුණි. තවද කොළොම්බියාව, Human Rights watch , Amnesty International වැනි රාජ්‍ය නොවන සංවිධාන සමඟ සංවාද කිරීමට සහ එකඟතා ගොඩනගා ගැනීමට සැන්ටෝස් ජනාධිපතිවරයාගේ විදේශ ප්‍රතිපත්තිය යටතේ හැකිවිණි.

මේ කරුණු වලට අමතරව, කොළොම්බියාවේ නව බහුපාර්ශවික දිශානතිය, කොළොම්බියාව හා ඇමරිකා එක්සත් ජනපදය අතර සම්බන්ධතාවයට බලපෑමක් එල්ල කළ බවද දක්නට හැකි ය. ප්‍රාදේශීය බලවතෙකු ලෙස ඉස්මතු වීම කොළොම්බියාවට අවශ්‍ය කර තිබූ අතර, ඒ සඳහා සැන්ටෝස් ජනපතිගේ විදේශ

ප්‍රතිපත්තිය, එක්සත් ජනපදයේ උපකාර අහිමි කර නො ගනිමින්, නව වාණිජ හවුල්කරුවන් සහ සහයෝගීතාවය සඳහා නව අවකාශයන් සෙවීම ආරම්භ කළේ ය. තවද, එකල කොළොම්බියාව සහ ඇමරිකා එක්සත් ජනපදය අතර වඩාත් ගැඹුරු වූ තවත් කරුණක් නම්, පශ්චාත් ගැටුම්කාරී වැඩසටහන් (Post Conflict Programs) ප්‍රවර්ධනය කිරීම යි. එමෙන් ම සැන්ටෝස් ජනපති, සිය රට ස්වභාවික හා විකල්ප බලශක්ති සම්පත් වලින් පොහොසත් පාරිසරික බලශක්ති මධ්‍යස්ථානයක් ලෙස මෙන් ම, ස්වයංපෝෂිත ධාන්‍යාගාරයක් (Agricultural Pantry) ලෙස ද හුවා දක්වමින්, විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීමට උත්සාහ කළේ ය.

සැන්ටෝස් ජනාධිපතිවරයාගේ විදේශ ප්‍රතිපත්තිය සම්බන්ධ තවත් වැදගත් කරුණක් ලෙස, බහුපාර්ශ්විකවාදයේ නව අවකාශයන් සොයා යමින් පැසිෆික් කලාපය සමඟ සබඳතා ශක්තිමත් කර ගැනීම කෙරෙහි වැඩි උනන්දුවක් දැක්වීම පෙන්වා දිය හැකි ය. එමෙන් ම ආසියා පැසිෆික් කලාපය සමඟ සන්ධානයක් ඇති කර ගැනීමේ සංකල්පයක් ද සැන්ටෝස් ජනපති සතුව පැවතිණි. මෙම ආසියා පැසිෆික් කලාපය සමඟ සබඳතා විවිධාංගීකරණය කිරීමේ ප්‍රධාන අරමුණ වූයේ, ආසියා පැසිෆික් ආර්ථික සහයෝගීතා සංසදය (Asia–Pacific Economic Coopertaion) වෙත ඇතුළු වීම යි. සැන්ටෝස් ජනාධිපතිවරයාගේ විදේශ ප්‍රතිපත්තිය තුළින්, ආසියානු වෙළෙඳ පොළට ඇතුළු වීමට මෙන් ම, චීනය, ඉන්දියාව, ජපානය සහ අනෙකුත් අග්නිදිග ආසියානු රටවල් සමඟ වැඩි වාණිජ සම්බන්ධතාවයක් ඇති කර ගැනීමට, කොළොම්බියාවට ඉඩකඩ සැලසිණි. ආසියානු රාජ්‍යයන් සමඟ නිදහස් වෙළඳ ගිවිසුම් ඇතිකර ගැනීම, ආසියා පැසිෆික් කලාපය වෙත ඇතුලත්වීම සඳහා වූ කොළොම්බියානු විදේශ ප්‍රතිපත්තියේ ප්‍රධාන උපාය මාර්ගය විය.

එමෙන් ම, 2011 - 2012 කාලය තුළ කොස්ටාරිකා (Costa Rica), ගෝතමාලා (Gautemala), හොන්ඩුරාස් (Honduras ), හයිටි (Haiti) සහ මෙක්සිකෝව (Mexico) වැනි ජනපද සමඟ සාමය හා ආරක්ෂාව පිළිබඳ කලාපීය සංවිධානයක් සැන්ටෝස් සිය විදේශ ප්‍රතිපත්තිය යටතේ පවත්වාගෙන යන ලදී. තවද, නිදහස් වෙළඳාම පදනම් කරගත් න්‍යාය පත්‍රයේ විවිධාංගීකරණය උත්පාදනය කරමින්, නිදහස් වෙළෙඳ ගිවිසුම් අත්සන් කිරීම සම්බන්ධයෙන් ඇමරිකා එක්සත් ජනපදය සමඟ ඇති ගිවිසුමේ අනුමැතිය ලබාගැනීමට සැන්ටෝස් රජය සමත් විය. කොළොම්බියාවේ සබඳතා කලාපීය හා විශ්වීය කිරීමේ අරමුණු ඇතිව, සැන්ටෝස්

ජනාධිපතිවරයාගේ විදේශ ප්‍රතිපත්තිය යටතේ කොළොම්බියානු විදේශ අමාත්‍යාංශය විසින් ලෝකයේ විවිධ ප්‍රදේශවල කොළොම්බියානු තානාපති කාර්යාල විවෘත කිරීමේ හා රාජ්‍ය තාන්ත්‍රික සබඳතා ශක්තිමත් කිරීමේ ක්‍රියාවලියක් ගෙන යන ලදී. ඒ අනුව, කොළොම්බියානු විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් 2010, 2012, 2013 හා 2014 වර්ෂවල දී ට්‍රිනිඩෑඩ් (Trinidad), ටෝ-බාගෝ (Tobago), තුර්කිය (Turkey), ඉන්දුනීසියාව (Indonesia), එක්සත් අරාබි එමීර් රාජ්‍යය (United Arab Emirates), තායිලන්තය (Thailand), වියට්නාමය (Vietnam), අසර්බයිජානය (Azerbaijan) සහ ඇල්ජීරියාව (Algeria) වැනි රටවල් වල කොළොම්බියානු තානාපති කාර්යාල ස්ථාපිත කරන ලදී. එසේම, මෙම විදේශ ප්‍රතිපත්තිය යටතේ CIVETS (Colombia, Indonesia, Vietnam, Egypt, Turkey and South Africa) ප්‍රවර්ධනය කිරීම සඳහා තුර්කිය (Turkey), ඉන්දුනීසියාව (Indonesia) සහ වියට්නාමය (Vietnam) වැනි කලාපීය බලවතුන් ලෙස හැඳින්වෙන රාජ්‍යයන් සමඟ දේශපාලන හා රාජ්‍ය තාන්ත්‍රික සබඳතා ශක්තිමත් කරගන්නා ලදී. තවත් කරුණක් නම්, එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ රාජ්‍ය තාන්ත්‍රික කටයුතු භාරව සිටියේ කොළොම්බියානු කෝපි වගාකරන්නන්ගේ සංගමයේ රොබටෝ වැලෙස් වැලෙජෝ (Roberto Vélez Vallejo) ය. එහි ප්‍රධාන අරමුණ වූයේ ආසියානු වෙළඳපොළ සමග ශක්තිමත් වාණිජ සබඳතා ඇතිකර ගැනීම සහ කොළොම්බියානු කෝපිවගාකරන්නන්ගේ සංගමයට බලපෑමක් නොවන කොන්දේසි නිර්මාණය කිරීමට හැකියාව ලබා ගැනීම යි. කොළොම්බියානු රාජ්‍ය තාන්ත්‍රික කටයුතු යටතේ ඉන්දුනීසියාව වෙත ද අවධානය යොමු කරනු ලැබූ අතර එහි අරමුණ වූයේ ආසියානු දැවැන්තයා සමඟ සබඳතා ශක්තිමත් කර ගැනීම සහ කොළොම්බියාවට අග්නිදිග ආසියානු ජාතීන්ගේ සංගමයට ප්‍රවිශ්ඨ වීම සඳහා රාජ්‍ය තාන්ත්‍රික, ආර්ථික හා සංස්කෘතික යන අංශ සම්බන්ධ කරුණු ඇතුළත් බහුපාර්ශ්වීය ක්‍රියාපිළිවෙතක් අනුගමනය කිරීම යි. ට්‍රිනිඩෑඩ් හා ටොබැංගෝ රාජ්‍ය සමඟ රාජ්‍යතාන්ත්‍රික සබඳතා වලට පිවිසීමේ අරමුණ වූයේ වාණිජමය කාරණා සහ තාක්ෂණික හා නවෝත්පාදනයන් සඳහා සහයෝගිතා මාවතක් සකස් කර ගැනීම යි.

ඉහත කරුණු වලට, අමතරව 2012 දී සැන්ටෝස් රජය සහ ෆාර්ක් ගරිල්ලන් අතර ආරම්භ වූ සාකච්ඡා, කොළොම්බියානු විදේශ ප්‍රතිපත්තිය තීරණය කළ වැදගත්ම සාධකයක් ලෙස සැලකේ. මෙම සාධකය, සිය විදේශ ප්‍රතිපත්තිය යටතේ

කොළොම්බියාව ජාත්‍යන්තරීකරණය කිරීම සහ සාම ක්‍රියාවලියට සහාය වන කලාපීය හා ජාත්‍යන්තර සගයන් සෙවීම වැනි ක්‍රියාවන් සිදුකිරීමට සැන්ටෝස් ජනාධිපතිවරයාව පෙළඹවීය. මෙහිදී, ඇපකරු රාජ්‍යයන් (Guarantor States) වූ කියුබාව (Cuba), වෙනිසියුලාව (Venezuela), චිලී (Chilie) සහ නෝර්වේ (Norway) යන රාජ්‍යයන්, කොළොම්බියාවේ සාම ක්‍රියාවලියට සහ සංවාද වලට සහය දැක්වීමට මෙන් ම, සිය රාජ්‍යයන් සමඟ බහුපාර්ශ්වික සබඳතා ශක්තිමත් කිරීමට දායක වූහ. කොළොම්බියාවේ සාම ක්‍රියාවලියේ දී, කියුබාව විසින් නවාතැන් සහ ආරක්ෂාව සැපයීම සිදු කළ අතර වෙනිසියුලාව, ෆාර්ක් ගරිල්ලන් අතර, මැදිහත්කරුවෙකු (Mediator) ලෙස වැදගත් කාර්යභාරයක් ඉටුකළේ ය. නෙරුගා හා චිලී හි භූමිකාවන් වූයේ, කොළොම්බියාව වෙත ගැටුම් නිරාකරණය පිළිබඳ දැනුම ලබාදීම හා දේශපාලන සංක්‍රාන්තිය සඳහා උපාය මාර්ග නිර්මාණය කිරීම ය.

මේ ආකාරයට, කොළොම්බියාවේ ප්‍රතිරූපය වඩා වර්ධනය කරමින් සහ කොළොම්බියාව ජාත්‍යන්තර පද්ධතිය වෙත ප්‍රවේශ කිරීමේ උපායමාර්ගයක් අනුගමනය කරමින් කොළොම්බියාවේ විදේශ ප්‍රතිපත්තිය ඒකාබද්ධතාවය හා බහුපාර්ශ්විකවාදය වෙත වඩාත් නැඹුරු කරන්නට සිය පළමු ධූර කාලය තුළ දී සැන්ටෝස් ජනාධිපතිවරයා කටයුතු කළේ ය.



*ජනාධිපති හුආන් මැනුවල් සැන්ටෝස් එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩල සැසිවාරයක් අමතන අවස්ථාවක්*

**2014 - 2018 ධූර කාලය තුළ විදේශ ප්‍රතිපත්තිය**

පෙර පරිදි ම නව ධූර කාලයේ දීත් සිය විදේශ ප්‍රතිපත්තිය සකස් කිරීම සඳහා සැන්ටෝස් ජනාධිපතිවරයා තර්ජන හඳුනාගැනීමේ ක්‍රමවේදයක් අනුගමනය කළේ ය. කොළොම්බියාවේ කීර්ති නාමය හා ජාත්‍යන්තර නායකත්වයේ ප්‍රතිරූපය අභිමි

වීම සැන්ටෝස් ජනපතිගේ දෙවන ධූර කාලය තුළ දී හඳුනාගත් ප්‍රධාන තර්ජනයක් විය. සන්නද්ධ ගැටුම් වල ස්වභාවය වෙනස් වෙමින්, එනම් ප්‍රචණ්ඩතාවය සහ ප්‍රචණ්ඩක්‍රියා ග්‍රාමීය ප්‍රදේශ වලින් නාගරික ප්‍රදේශ වලට පැතිරෙමින් කොළොම්බියාව තුළ අනාරක්ෂිතභාවය පිළිබඳ ගැටලු අඛණ්ඩව පැවතීම අනෙක් විශාලතම තර්ජනය විය. ඊට අමතරව, ජාත්‍යන්තර න්‍යාය පත්‍රය විවිධාංගීකරණය කර තිබිය දීත්, නීතිවිරෝධී මත්ද්‍රව්‍ය පිළිබඳ ගැටලුව ද, තර්ජනයක් ලෙස අඛණ්ඩව පැවතුණි. සැන්ටෝස් ජනාධිපතිවරයා මෙම තර්ජන වලට මුහුණ දිය හැකි වාතාවරණයක් රට තුල ගොඩනැගීමේ අභිලාෂයෙන් යුතුව සිය නව විදේශ ප්‍රතිපත්තිය සකස් කළේ ය.

සැන්ටෝස් රජයෙ හි නව විදේශ ප්‍රතිපත්තිය සම්බන්ධ වැදගත් ම ක්‍රියාවක් නම් ඒකාබද්ධ කිරීම සහ බහු පාර්ශ්විකවාදය සඳහා නව අවකාශයන් ඇඳා ගැනීමේ අරමුණ පෙරදැරිව, ගෝලීය හවුල්කාරීත්වය ලබාගනිමින් කොළොම්බියාව, නේටෝ-උතුරු අත්ලාන්තික් ගිවිසුම් සංවිධානය (NATO-North Atlantic Treaty Organization) ට ඇතුළත් වීම යි. 2013 ජූනි මාසයේ දී සැන්ටොස් රජය උතුරු අත්ලාන්තික් ගිවිසුම් සංවිධානය සමඟ ආරක්ෂක තොරතුරු පිළිබඳ ගිවිසුමකට (Security Information Agreement) අත්සන් තැබූ අතර, එහි අරමුණ වූයේ කැරලිකරුවන්ට එරෙහිව සටන් කිරීම සඳහා සංවිධනය සමඟ තොරතුරු හුවමාරු කර ගැනීම යි. සැන්ටෝස් ජනපතිගේ නව විදේශ ප්‍රතිපත්තිය යටතේ කොළොම්බියාව නේටෝවට සම්බන්ධ වූයේ, සංහිඳියාව හා සංක්‍රාන්ති යුක්තිය (Transitional Justice) යන කරුණු සම්බන්ධයෙන් වූ අතර, එමඟින් ලෝකයේ ගැටුම් පවතින අනෙකුත් ප්‍රදේශ වලට සිය හැකියාවන්ගේ දායකත්වය ලබාදීමට තම හමුදාව, සාම සාධක හමුදාවක් බවට පත්කරගැනීමට තමාට හැකියාව ලැබෙනු ඇතැයි කොළොම්බියාව විශ්වාස කළේ ය. 2018 මැයි 31 දින කොළොම්බියාව නේටෝ සංවිධානයේ ගෝලීය හවුල්කාරීත්ව තත්වය ලබාගත් අතර, ඒ තුළින් විවිධ ආරක්ෂක අංශයන් හි දැනුම හුවමාරු කරගැනීමට සහ ත්‍රස්තවාදයට එරෙහිව සටන් කිරීම සඳහා කොළොම්බියාවට ඉඩ ප්‍රස්ථාව සැලසිණි. මේ කරුණු වලට අමතරව, කොළොම්බියාව නේටෝව සමඟ සන්ධානගත වීමෙන්, පෙර නොවූ විරූ ලෙස නේටෝ සංවිධානය ලතින් ඇමරිකාවේ ආයතනගත කිරීම සඳහා ද අවස්ථාව උදාවිණි.

සැන්ටෝස් ජනපතිගේ දෙවන පරිපාලනයේ දී, ඔහුගේ විදේශ ප්‍රතිපත්තිය තුළින් ක්‍රියාවට නැංවුණ තවත් එක් විශේෂ සිදුවීමක් නම්, කොළොම්බියාව ආර්ථික

සහයෝගීතාව සහ සංවර්ධනය සඳහා වූ සංවිධානය (OCED-Organization for Economic Co-operation and Development) සමඟ සන්ධානගත වීම යි. OCED සමඟ සම්බන්ධ වීමෙන්, සංවර්ධිත රාජ්‍ය සමඟ සාකච්ඡා කිරීමේ අවස්ථාව කොළොම්බියාව වෙත උදාවන බවට මෙන් ම, ආර්ථික ප්‍රතිලාභ ලබාගත හැකි බවට ද සැන්ටෝස් පරිපාලනය විසින් වටහා ගන්නා ලදී. 2015 මැයි 25 දින කොළොම්බියාව එම සංවිධානයට ඇතුලත් විය. මෙසේ සන්ධානගත වීමෙන්, කොළොම්බියාවට සිය ආර්ථික ප්‍රතිපත්ති කෙරෙහි ඉහළ විශ්වාසයක් ලැබුනා පමණක් නොව, කොළොම්බියාව ගැටුම් නිර්මාණය කරන ජාත්‍යන්තර පාත්‍රයෙකු බවට තිබූ ජාත්‍යන්තර මතය වෙනස් කිරීම සඳහා සැන්ටෝස් ජනාධිපතිවරයා සතුවූ අරමුණ සාක්ෂාත් කරගැනීමේ ගමන් මගෙ හි වැදගත් ජයග්‍රහණයක් සනිටුගහන් කළේ ය. OCED සමඟ සම්බන්ධ වීම තුළින්, කොළොම්බියාව වාණිජ ක්ෂේත්‍රය සහ විදේශ ආයෝජන සඳහා කදිම තෝතැන්නක් බවට පත්විය.

කොළොම්බියාවේ පශ්චාත් ගැටුම්කාරී (Post-Conflict) තත්වයට මුහුණ දීම සඳහා ජාත්‍යන්තර සහයෝගීතාව (International Cooperation) වෙත අවධානය යොමු කිරීම, සැන්ටෝස් ජනපතිගේ දෙවන ධූර කාලයේ විදේශ ප්‍රතිපත්තිය තුළින් සිදුවිය. ඒ අනුව 2014-2018 කාලය තුළ ඇමරිකා එක්සත් ජනපදය හා යුරෝපා සංගමය වැනි බලවතුන්, කොළොම්බියාව සමඟ සාකච්ඡා සඳහා වැඩි වශයෙන් මැදිහත් වීමක් දක්නට ලැබේ. එහි දී, මත්ද්‍රව්‍ය වැනි සිය අභිලාෂ සමඟ ගැටෙන තීරණාත්මක කරුණු සාකච්ඡා කරමින්, සාකච්ඡා වල ඇපකරු වීමේ වගකීම ඇමරිකා එක්සත් ජනපදය විසින් භාරගන්නා ලදී. එමෙන් ම, විවිධ සාකච්ඡා වලින් පසුව බැරැක් ඔබාමා රජය විසින්, කොළොම්බියාවේ පශ්චාත් ගැටුම්කාරී වාතාවරණයට පිලියම් නිර්මාණය කිරීමේ ව්‍යාපෘති වෙනුවෙන් අරමුදල් වෙන් කිරීමට පොරොන්දු විය. අතිරේකව, එක්සත් ජනපද රජය, මූලික වශයෙන් සටන් කරුවන් නැවත ඒකාබද්ධ කිරීම, බිම් බෝම්බ ඉවත් කිරීම සහ මානුෂීය ආධාර ලබා දීම යන කරුණු අරමුණු කරගත් ඩොලර් මිලියන 450 කින් සමන්විත පීස් කොළොම්බියා (Peace Colombia) නම් ආර්ථික ආධාර, කොළොම්බියාව වෙත වෙන් කළේ ය. අනෙක් අතට, ජර්මනිය (Germany), ප්‍රංශය (France) සහ ස්පාඤ්ඤය (Spain) වැනි යුරෝපා සංගමයේ වැදගත් සාමාජිකයන් ද, සංක්‍රාන්ති යුක්තිය, කෘෂි කර්මාන්තය සහ ගිවිසුම් ක්‍රියාත්මක කිරීම යන අංශ වලට අදාල සාම සාකච්ඡා සඳහා විශාල දායකත්වයක් ලබා දුන්නේ ය. ජනාධිපති සැන්ටෝස්ගේ පශ්චාත් ගැටුම් සංචාරය (Post-Conflict Tour) 2014

නොවැම්බර් මාසයේ දී ආරම්භ වූ අතර, එම සංචාරයේ ප්‍රධාන අරමුණ වූයේ යුරෝපය සමඟ සහයෝගීතාවය ශක්තිමත් කර ගැනීම පමණක් ම නොව, කොළොම්බියාවේ සාම ක්‍රියාවලිය සඳහා යුරෝපා සංගමයෙන් දේශපාලන සහයෝගය ලබාගැනීම සහ, විශේෂයෙන් ම, කොළොම්බියානු රාජ්‍යයේ පශ්චාත් ගැටුම් සඳහා මුදල් යෙදවීමට යුරෝපා රාජ්‍යයන් වෙතින් අරමුදලක් ලබා ගැනීම යි. මේ ආකාරයට ජනපති සැන්ටෝස් සිය විදේශ ප්‍රතිපත්තිය කොළොම්බියාවේ ජාතික අභිලාෂ මුදුන්පත් කර ගැනීම සඳහා සංවිධානාත්මකව මෙහෙය වීය.

## ගත හැකි ආදර්ශ

සැන්ටෝස් විසි එක්වන සියවසේ ලතින් ඇමරිකානු කලාපයේ විශිෂ්ට ගණයේ නායකයෙකු ලෙස සැලකෙන අතර ඔහු කොළොම්බියාවේ පැවති අර්බුදකාරී තත්වයන් සමනය කොට එරට තුළ යළිත් වරක් සාමකාමී වාතාවරණයක් ස්ථාපනය කිරීම උදෙසා සිය කාලය හා ශ්‍රමය වැයකොට ගෙනගිය දේශපාලන නායකත්වය ඔහුව අසහාය දේශපාලන පෞරුෂයක් බවට පත්කිරීමට හේතු විය. සැන්ටෝස් අනුගමනය කරන ලද ප්‍රතිපත්තීන් වලට පදනම වූයේ ඔහු කුඩාකල සිට ම ලද දේශපාලන ඇසුර, නාවික නිලධාරියකු ලෙස ලත් නායකත්ව අත්දැකීම් සහ පුවත්පත් කලාවේදියකු ලෙස ලත් දේශපාලන-සමාජයීය පන්නරය යි. මෙම කරුණු තුළින් ඔහු සිවිල් වැසියෙකු, නාවික නිලධාරියකු මෙන් ම දේශපාලඥයෙකු යනා දී වශයෙන් සමාජයේ විවිධ මට්ටම්වල කටයුතු කිරීම තුළ ලත් පරිණතභාවය, විචාරශීලීත්වය, දුරදක්නා නුවණ ආදී ගුණාංග පිළිබඳව මනාව පිළිබිඹු වේ. සැන්ටෝස් වූ කලී බොහෝ ඇසූ පිරූ තැන් ඇති, උගත්, බුද්ධිමත් මිනිසෙකි. ඔහු කුඩා අවධියේ සිට ම තම කාලය නිසි ලෙස කළමණාකරණය කොටගෙන විවිධ කාර්යයන් හි යෙදී ලත් පුහුණුව, දේශපාලන නායකයෙකු ලෙස පරිපූර්ණත්වයට පත්වීමට ඔහුට දොරටු විවර කර දුණි.

සැන්ටෝස්ට ඔහුගේ දේශපාලන හිතවත්කම් භාවිතා කොට පහසුවෙන් ම කොළොම්බියානු දේශපාලන ප්‍රවාහය තුළට පිවිසීමට හැකියාව තිබුණ ද ඔහු එම පහසු මග තෝරා නො ගත්තේ ඔහුට තවත් එක් දේශපාලඥයෙක් වීමට වඩා සිය රටට හා ජනතාවට අවැසි ආකාරයේ සේවයක් කළ හැකි සක්‍රීය දේශපාලන

පෞරුෂයක් වීමට තිබූ උනන්දුව නිසා ය. මේ නිසා ඔහු දේශපාලනයට පිවිසීමට පෙර හොඳ අධ්‍යාපනයක් ලබා සිය පදනම ශක්තිමත් කර ගැනීම ප්‍රමුඛ කොට සැලකීය. සැන්ටෝස්ගේ චරිතය හරහා උගත හැකි තවත් ආදර්ශයක් නම්, යම් කාර්යයකට ප්‍රවිශ්ඨ වීමට පෙර ඒ සඳහා සුදුසු පරිදි  වටපිටාව සකස් කරගැනීමත් කිසිදු බාහිර බලපෑමකින් බිඳලිය නො හැකි ආකාරයේ ශක්තියකින් ඊට ප්‍රවිශ්ඨ වීමත් තුළ සාර්ථක අවසානයක් කරා පිවිසීමට හැකි බව යි. දිගු කලක් තිස්සේ කොළොම්බියාව, ඇමරිකාව හා ලන්ඩනයේ උසස් අධ්‍යාපන ආයතන සහ විශ්වවිද්‍යාලවල උසස් අධ්‍යාපනය හැදෑරූ සැන්ටෝස් ආර්ථික හා ව්‍යාපාර පරිපාලනය හා සම්බන්ධව සිය උපාධි සම්පූර්ණ කිරීම තුළ ඔහු සතුවූ දැනුම් පිපාසය කෙතරම් ද යන්න පැහැදිලි වේ. ඕනෑම පුද්ගලයෙකු විශිෂ්ටත්වයට පත් කරලීමට අධ්‍යාපනය විසින් සිදු කරන සේවාව අතිමහත් ය. ඒ අනුව සැන්ටෝස් ඉතා හොඳ අධ්‍යාපනයක් ලබා ගැනීම, ඔහුගේ විශිෂ්ටත්වය කරා යන ගමන්මගට මූලාරම්භය විය. ඔහු අධ්‍යාපනය කෙරෙහි දැක්වූ ආකල්පය ඉතා යහපත් මෙන් ම අන් අයටද ආදර්ශමත් එකකි.

සැන්ටෝස් වූ කලී ඉතා දක්ෂ මෙන්ම කාර්යශූර  පුද්ගලයෙකි. ඔහු නාවික හමුදාව තුළ සේවය කරන සමයේ දී ලත් අත්දැකීම්,  කොළොම්බියාවේ සාමස්ථාපනය සඳහා ඔහු ගෙන ගිය විප්ලවීය ගමනට ඔහුට ඉවහල් විය. එමෙන් ම විවිධ රටවල දේශපාලඥයින් සමඟ සමීපව කටයුතු කිරීම සහ ඔවුන් සමඟ සාකච්ඡා කොට අදහස් හුවමාරු කර ගැනීම මෙන් ම ඔවුන්ගේ දේශපාලන අත්දැකීම්ද (නිදසුනක් වශයෙන් නෙල්සන් මැන්ඩෙලා දැක්විය හැකිය) තම දේශපාලන ගමනේ විවිධ අවස්ථා සඳහා ආදේශ කර ගැනීම සැන්ටෝස්ගේ ඉතා උසස් ගුණාංගයකි. ඔහුගේ නිහතමානීත්වය මෙ තුළින් වඩාත් කැපී පෙනෙයි.  දේශපාලඥයෙකු ලෙස පරිණත, කාලෝචිත සහ දූරදර්ශී ප්‍රතිපත්ති අනුගමනය කිරීමට මෙ ලෙස ඔහු සිය ජීවිතයේ විවිධ කාලවල දී ලැබූ  අත්දැකීම් ප්‍රයෝජනයට ගැනීම ඔහුගේ චරිතයේ ඇති තවත් එක් සුවිශේෂී ලක්ෂණයකි. එලෙස ක්‍රියා කිරීම තුළ සාර්ථක වීමට ඇති හැකියාව ඉහළ ය. සැන්ටෝස් කොළොම්බියානු ජනාධිපතිවරයා ලෙස රාජකාරි ආරම්භ කරන සමයේ ඔහුට තිබූ විශාල ම අභියෝගය වූයේ එරට සාමය සහ ජාතික ආරක්ෂාව නැවත ප්‍රතිස්ථාපනය කිරීම යි. එමෙන් ම එරට ආර්ථික, සමාජීය යනා දී අනිකුත් ක්ෂේත්‍රයන් ද ක්‍රමයෙන් සංවර්ධනය කිරීම සඳහා පවතින තත්ත්වය මැනවින් කළමණාකරණය කිරීමට කටයුතු කිරීම තුළින් ඔහු සිය අභියෝගය සාර්ථකව ජයගැනීමට සමත් විය. මෙලෙස සුදුසු වෙලාවට සුදුසු තීරණ ගැනීම සහ ප්‍රමුඛ සංසිද්ධිය තෝරාගෙන එයට

අනුව සිය රජය සහ ප්‍රජාව මෙහෙයවීම සැන්ටෝස්ගේ තවත් සුවිශේෂී නායකත්ව ගුණාංගයකි.

සැන්ටෝස් නායකයෙකු ලෙස කෙතරම් සාර්ථක වීද යන්න ඉස්මතු කරලීමට ඇති හොඳම සාක්ෂිය වනුයේ ඔහු 2016 වසරේ දී නොබෙල් සාම ත්‍යාගයට හිමිකම් කීමයි. කළ නො හැක්කක් නොමැත යන්න මනාව ප්‍රදර්ශනය කරමින් අඩසියවසකටත් අධික කාලයක් කොළොම්බියාව වසාගෙන සිටි කළු දුමාරයක් බඳු වූ ෆාර්ක්-ගරිල්ලා සටන්වලින් රට මුදවාගෙන සාමය සහ ජාතික සංහිඳියාව ස්ථාපනය උදෙසා එරට ආරක්ෂක අමාත්‍යවරයා සහ ජනාධිපතිවරයා ලෙස සිදුකළ ප්‍රශස්ත මෙහෙවර මෙලෙස ඔහුව නොබෙල් සාම ත්‍යාගලාභියෙකු බවට පත් කරන ලදී. මෙම ක්‍රියාන්විතයේ දී ඔහු අනුගමනය කරන ලද මානුෂවාදී ප්‍රතිපත්ති සහ සමස්ත මානව සංහතිය කෙරෙහි සැන්ටෝස් දැක්වූ සමානාත්මතාවය, අනෙකුත් ලෝක නායකයින්ට ද ඉතා හොඳ ආදර්ශයකි. සැන්ටෝස් විවිධ ක්ෂේත්‍රවලට සිය දායකත්වය දැක්වීම තුළ ඔහු බොහෝ අවස්ථාවල ජාත්‍යන්තරයේ පැසසුමට හා සම්මානයටද පාත්‍ර විය. ඔහු සෑම කාර්යයකදීම නො පසුබටව, උත්සාහාවන්තව හා ධනාත්මක සිතුවිලි සහිතව ක්‍රියා කිරීම මෙලෙස ඔහු ජාතික, ජාත්‍යන්තර ප්‍රජාවන් අතර ගෞරවනීය චරිතයක් වීමට ඉවහල් විය.

සෑම පුද්ගලයෙකුට ම කුමන හෝ මට්ටමක දී නායකයකු ලෙස කටයුතු කිරීමට සිදුවේ. නායකත්ව ගුණාංග සෑම පුද්ගලයකු තුළ ම අඩු වැඩි වශයෙන් පවතින අතර මෙම ගුණාංග ඔප්නංවා ගැනීම තුළ ඕනෑම ක්ෂේත්‍රයක දී සාර්ථකත්වයට පත්විය හැකි ය. එලෙස නායකත්ව ගුණාංග වර්ධනය කර ගැනීම උදෙසා අධ්‍යනය කළ හැකි විශිෂ්ට ගණයේ නායකත්ව පෞරුෂයක් ලෙස කොළොම්බියානු ජනාධිපති සැන්ටෝස් පෙන්වා දිය හැකි ය.

## සාරාංශය

සැන්ටෝස් සාමයට පියෙකි. ඔහු කොළොම්බියාවට කීර්තියක් අත්කර දුන් ජනාධිපතිවරයෙකි. ඔහු පරිණත දේශපාලඥයෙකි. දේශපාලනය යනු සැන්ටෝස්ට කුඩා කාලයේ පටන් ම ඉතා හුරුපුරුදු දෙයක් වූ නමුත් ඔහු දේශපාලනයට පිවිසුණේ හොඳ අධ්‍යාපනයක්, නාවික හමුදාවේ කැඩෙට් නිළධාරියෙකු ලෙස මනා හික්මීමක්

සහ පුවත්පත් ආයතනයක ඉහළ තනතුරක් හොබවා ලබාගත් සමාජ-දේශපාලනික පන්නරය තුළ ලද අත්දැකීම් තුළින් පරිපූර්ණ මිනිසෙකු වශයෙනි. එය, සැන්ටෝස් ඉතා කෙටි කාලයක් තුළ කොළොම්බියානු ඉතිහාසය නැවත ලිවීමට සමත් වන ආකාරයේ පරිණත, දූරදර්ශී සහ උපායශීලී දේශපාලන දැවැන්තයෙකු බවට පත්කිරීමට හේතු විය.

2010 වර්ෂයේ දී කොළොම්බියානු ජනපති ධූරයට පත්වීමෙන් පසුව සැන්ටෝස් සෘජුවම ෆාර්ක් සංවිධානය සමඟ සංවාද වලට එළඹීමට පෙරටුගාමී වීම තුළ ෆාර්ක් සංවිධානය සමඟ එකඟතාවයන්ට පැමිණීමට හැකිවීම, සැන්ටෝස්ගේ පාලන සමයේ කැපීපෙනෙන ජයග්‍රහණයකි. එහි ප්‍රතිඵලයක් ලෙස දශක පහකට වැඩි කාලයක් තිස්සේ එරට පැවති සන්නද්ධ ගැටුම් වලට තිත තබමින් 2016 අග භාගයේ දී කොළොම්බියාවේ සාමය ප්‍රතිස්ථාපනය කිරීමට සැන්ටෝස් ප්‍රමුඛ රජය සමර්ථ විය. පසුගිය පරිපාලනය විසින්, එනම් උරිබේ ජනාධිපතිවරයා විසින් ස්ථාපිත කොට තිබූ විදේශ ප්‍රතිපත්තියෙ හි, ඇතැම් අංශයන්, සැන්ටෝස් ජනාධිපතිවරයා විසින් වෙනස් කරන ලදී. ජනාධිපති උරිබේගේ පාලන සමයට වඩා වෙනස්ව ජනාධිපති සැන්ටෝස් විසින් සිය විදේශ ප්‍රතිපත්තිය සකස් කිරීම සඳහා මූලිකව ම අනුගමනය කරන ලද්දේ තර්ජන ප්‍රත්‍යක්ෂ කර ගැනීමේ ක්‍රමවේදය යි. මෙම ක්‍රමවේදයට අනුව යමින්, සිය රාජ්‍යය වෙත තිබෙන තර්ජන හඳුනාගත් සැන්ටෝස් ජනාධිපතිවරයා, ඒවාට මුහුණ දීමට හැකි වාතාවරණයක් කොළොම්බියාව තුළ ගොඩ නැගීම සඳහා සිය විදේශ ප්‍රතිපත්තිය සකස් කළේ ය. ඒ අනුව, පෙර තිබූ හුදෙකලා ප්‍රතිපත්තිය පසෙකලා, කොළොම්බියාව ජාත්‍යන්තර පද්ධතිය තුළ වඩාත් කැපී පෙනෙන රටක් බවට පත් කිරීමේ අරමුණ පෙරදැරිව, සැන්ටෝස් ජනාධිපතිවරයා විසින් කලාපීය හා ජාත්‍යන්තර සංවිධාන කෙරේ වැඩි සහභාගීත්වයකින් යුතුව ක්‍රියා කළේ ය. සැන්ටෝස් පාලනාධිකාරියේ විදේශ ප්‍රතිපත්තිය, ප්‍රධාන වශයෙන් අභිලාෂයන් දෙකක් සාක්ෂාත් කර ගැනීම සඳහා සකස් කරන ලදී. ඒවා නම්, බහුපාර්ශ්විකවාදය මත පදනම්ව ජාත්‍යන්තර පද්ධතිය වෙත ඵලදායි ප්‍රවේශවීමක් සිදුකිරීම සහ සාම ක්‍රියාවලියට ප්‍රිය කරන කලාපීය හා ජාත්‍යන්තර නායකත්වයේ ප්‍රතිරූපයක් ලෙස කොළොම්බියාව ගොඩ නැඟීම යි. මෙම අභිලාෂයන් සාක්ෂාත් කරගැනීමේ අරමුණ වූයේ කොළොම්බියාවේ සාම ක්‍රියාවලිය සඳහා අභ්‍යන්තර සහ බාහිර සහයෝගය ලබා ගැනීම යි. සැන්ටෝස් පරිපාලන කාලය තුළ දී සාමය සඳහා වූ ක්‍රියාකාරී රාජ්‍යතාන්ත්‍රිකත්වයක් දක්නට ලැබීම, ඒ සියලු අභිලාෂයන්හි ප්‍රතිඵලය විය.

2016 දී සැන්ටෝස් ට නොබෙල් සාම ත්‍යාගය පිරිනමන ලද්දේ ඔහු කොළොම්බියාවට අහිමිව ගිය සාමය අත්පත් කරගැනීමට සාමදූතයෙකු ලෙස දරණ ලද අප්‍රතිහත උත්සාහයට ගරුකිරීමක් වශයෙනි. ෆාර්ක් කැරලිකාර කණ්ඩායම සමඟ සාම ගිවිසුමක් විධිමත් ලෙස ඇති කිරීම තුළ කොළොම්බියාවේ සන්නද්ධ ගැටුම අවසන් කිරීමේ ඔහුගේ කාර්යභාරය අගයමින්, සැන්ටෝස්ට 2017 දී චැතම් හවුස් ත්‍යාගය (Chatham House Prize) පිරිනමන ලදී. කොළොම්බියාවේ සහ ලොව පුරා සාමය ඇති කිරීමට ගත් උත්සාහය වෙනුවෙන් "ලෝක යුදෙව් සම්මේලනයේ" (World Jewish Congress) ලතින් ඇමරිකානු ශාඛාව ඔහුට ෂාලොම් ත්‍යාගය (Shalom Prize) පිරිනැමීය. 2012 ඔක්තෝම්බර් මාසයේ දී ඔහුට මෙම සම්මානය පිරිනමන ලදී. එමෙන් ම තම රටට සහ කලාපයේ සාමය ඇති කිරීමට ගත් උත්සාහය වෙනුවෙන් ඔහුට කතෝලික පල්ලිය සහ අයර්ලන්තයේ "ටිපෙරරි ජාත්‍යන්තර සාම ත්‍යාගය" (Tipperary International Peace Award, Ireland) මගින් ආසීස් පහන ප්‍රදානය කළේ ය. එලෙස ඔහු ලෝකයේ දැඩි අවධානයට පාත්‍ර වෙමින් අනේකවිධ වූ ගෞරව සම්මාන වලින් පිදුම් ලබන චරිතයක් බවට පත්වූවා සේම, විවිධ වූ ක්ෂේත්‍රයන්ට, නානාවිධ වශයෙන් සිය දායකත්වය ලබාදෙමින් ජාතික හා ජාත්‍යන්තර ප්‍රවාහයන් තුළ තවදුරටත් සක්‍රීය නායකයෙක්ද විය. 2017 වසර අවසානයේ දී ලෝක ප්‍රකට "ටයිම්ස්" සඟරාවේ (Times Magazine) ලොව බලවත් ම මහජන පුද්ගලයින් 100 දෙනාගේ ලැයිස්තුවට ඔහු ඇතුළත් විය. එමෙන් ම ඔහු කොළොම්බියානු සාමස්ථාපනයට දැක්වූ දායකත්වයට අමතරව එරට පිරිහෙමින් පැවති ආර්ථිකය ශක්තිමත් කිරීමට කටයුතු සලසන ලද්දේ ව්‍යාපාර පරිපාලනය සහ ආර්ථික විද්‍යාව පිළිබඳව ඔහු සතු දැනුම ද යොදාගනිමිනි. එසේම ඔහුගේ පාරිසරික සේවාව විශ්වීය වශයෙන් ඉතා වැදගත් වූවකි.

මෙවන් අතිමහත් සේවාවන් රාශියක් සක්‍රීයව මෙහෙය වූ, හුආන් මැනුඑල් සැන්ටෝස් නාමය කොළොම්බියානු ඉතිහාසය තුළ පමණක් නොව සමස්ත ලතින් ඇමරිකානු කලාපයේ ද ඉන් ඔබ්බට ගොස් ජාත්‍යන්තර පද්ධතිය තුළ පවා කීර්තිමත් අග්‍රගණ්‍ය දේශපාලන චරිතයක් ලෙස අමරණීයව පවතිනු ඇත.

## මූලාශ්‍ර නාමාවලිය

Editors, t. F. n.d. *The FamousPeople.com.* [Online] Available at: - https://www.thefamouspeople.com/profiles/juan-manuel-santos-5605.php
[Accessed September 2021].

Fabio Sanchez, S. C., n.d. *La politica exterior de Santos : estrategia y diplomacia por la paz.* [Online] Available at: https://revistas.uexternado.edu.co/index.php/oasis/article/view/5881
[Accessed August 2021].

Granda, S. n.d. *Transformations in Colombia - USA relations during Santos Government.* [Online] Available at: http://web.isanet.org/Web/Conferences/FLACSO-ISA%20BuenosAires%202014/Archive/06b98d6d-9b60-431b-bb4a-67bd33bf0284.pdf
[Accessed August 2021].

Linares, S. M. June 2020. Transitivity Analysis of COlombian President Juan Manuel Santos' Nobel Peace Prize Lecture. *International al Journal of Language and Literary Studies.*

Michael Ray, J. W., n.d. *Britannica.com.* [Online] Available at: https://www.britannica.com/biography/Juan-Manuel-Santos
[Accessed August 2021].

Olowojesiku, R. 2019. avigating the Course set before you: Lessons in Leadership from Juan Manuel Santos. *Voices in Leadership.*

Oritz, J. T., 2020. Political Leadership for peace processes: Juan MAnuel Snatos - Between hawk and dove. *Leadership,* 17(1), pp. 99-100.

Starsunfolded.com, n.d. *starsunfolded.com.* [Online] Available at: https://starsunfolded.com/juan-manuel-santos/
[Accessed September 2021].

Wilson Lopez- Lopez, A. C.-. C. C. R.-. U., 2018. Social- Psychological Repertoire of the Colombian Conflict in the Presedential Discourse of Juan Manuel antos. *Revista Interamericana Journal of Psycology.*

# මිෂෙල් බැචලේ



**කණ්ඩායම් සාමාජිකයන් :**

- නිසලි එදිරිසිංහ
- මදාරා ජයලත්
- හිරුනි ආරියරත්න
- දිලිනි උදලාගම
- හිරුණි හිමාෂා

## හැඳින්වීම

සූර්ය කිරණ එදා මෙන් ම අදටත් මහ පොළව සිප රටා මවයි. සඳ එළිය, හිම තුහින, වැහි බිඳු, සුළං රැල් වන් කාරණා ද එසේම ය. මහ පොළව මත මිනිසා විසින් සිදු කරන්නා වූ අසාධාරණකම්, යුතුකම් පැහැර හැරීම් මෙන් ම උස්මිටිකම් මායිම් නො කර ඒවා ඉතා බලගතු ලෙස තම පුරුදුවල නිරතව හිඳී. මන්ද යත් යුගයෙන් යුගයට මිනිස් පුරවරයෙන් හමා ආ ඇතැම් බලගතු වූත්, අපූර්ව වූත් සංවේදී මිනිස් සුගන්ධයන් කාලයාගේ ඇවෑමෙන් විනාශ වූ අඳුරු දූවිලි නගර නැවුම් බවෙන් පුරවා ලීමට දායක වන බැවිනි. නේකවිධ කයෝර්ර බාධක හමුවේ වුව ද නො සැලෙමින්, තම අප්‍රතිහත ධෛර්යයෙන් වැඩී, භූමිය සාරවත් කරන දැවැන්ත ශක්තිමත් වෘක්ෂ ලතාවන් බඳු යකඩ කාන්තාවන් මිනිස් ශිෂ්ටාචාරයේ විකාශනය ආරම්භයේ පටන් මේ මහ පොළව මත බිහි විය.

ලතින් ඇමෙරිකානු කලාපයෙන් එලෙස බිහි වූ එක් ගිනි සිළුවක් මිහිකත ආලෝකවත් කරමින් ඉතිහාසයේ වීර කාන්තා ග්‍රන්ථයට තවත් එක් පරිච්ඡේදයක් එක් කළා ය. ඇය 1951 සැප්තැම්බර් මස 29 දින චිලී රාජ්‍යයෙ හි සැන්ටියාගෝ (Santiago) අගනුවර ගුවන් හමුදා බ්‍රිගේඩියර් ජනරාල්වරයෙක්ට සහ පුරාවිද්‍යාඥවරියකට දාව උපත ලැබූ දෙවැනි දරුවා විය. දෙමාපියන්ගේ රැකියා තත්වයන් හේතු කොටගෙන කුඩා කළ සංක්‍රමණික ජීවිතයක් ගත කළ ද එමගින් ඇය ඉංග්‍රීසි භාෂාව චතුර ලෙස හැසිරවීමටත්, විෂය බාහිර ක්‍රියාකාරකම් රැසකට සහභාගීවීමටත් වරම් හිමි කර ගත්තා ය. ඇයට පසු කලෙක විප්ලවකාරී අරමුණු සාක්ෂාත් කර ගැනීමට නිසැක ලෙස උපකාරී වන්නට ඇත්තේ එම අත්දැකීම් සමුදායන් ය. ඇයගේ රුධිර බිංදුවක් පාසා ගලා ගියේ, උදාරතර මනුෂ්‍යත්වය යන වග සනාථ කරමින් පීඩා විඳින ජනතාවට උපකාර කිරීමටත්, චිලී සෞඛ්‍ය පද්ධතිය වැඩිදියුණු කිරීමට දායක වීමටත් හැකි හොඳම අවස්ථාව ලෙස සලකා ඇය වෛද්‍ය වෘත්තිය තෝරා ගත්තා ය. ඒ අතරම නො සිතූ අයුරින් හමුදා කුමන්ත්‍රණයක ප්‍රතිඵලයක් ලෙස 1973 වර්ෂයේ දී ඇයගේ පියා රාජ්‍යද්‍රෝහී චෝදනා ලැබ සිරකරුවෙකු බවට පත් වූ අතර සැන්ටියාගෝ හි සිරකඳවුරක වදහිංසාවලට ලක්වෙමින් දිවි ගතකල ඔහු, 1974 මාර්තු 12 දී ඇයගේ දිවියට සදාකාලික අඳුරු මතකයක් එක් කරමින් හෘදයාබාධයක් වැළඳීමෙන් මරණයට පත් විය. 'වේදනාව මිනිසුන් වෙනස් කරයි' යන්න සනාථ කිරීමට සමත් වූ ඇය, අළු මතින් නැගුණු ෆීනික්ස් කිරිල්ලියක මෙන් ඒ වේදනාව තම ජීවන ගමනේ හැරවුම් ලක්ෂය බවට පත්

කර ගනිමින්, එක් වරක් නොව දෙවරක්ම චිලී රාජ්‍යයෙහි ජනාධිපතිනිය වීමට වරම් ලබා ගත්තාය. එය ඇයගේ මව් රටේ මෙන් ම ලතින් ඇමෙරිකානු කලාපයේම ප්‍රථම කාන්තා ආගමනය විය.

කැලිකසල දමා අපවිත්‍ර වූ ජලාශයක පතුල නො පෙනෙන්නාක් මෙන් අපරාධ රජ කෙරූ චිලී රාජ්‍යයේ නො පෙණුනු අනාගතය ඇයගේ අධිෂ්ඨානය හමුවේ කෙමෙන් කෙමෙන් පැහැදිලි වන්නට පටන් ගැනුණි. ඇය චිලී හි කාන්තා සමාජයේ වීරවරිය වූවා පමණක් නොව මානව හිමිකම් සුරැකීම පිළිබඳ ප්‍රබල හඬක් නංවමින් වර්තමානයේ මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස්වරිය ලෙස අමිල මෙහෙවරක් ඉටු කරමින් සිටින බැවින් පෘථිවි වාසීන් අතර ද, විරාජමාන චරිතයක් බවට පත් වී තිබේ. තවත් අටුවා ටීකා අවශ්‍ය නැත. ලෝක දේශපාලනයේ ප්‍රබල කාන්තා සළකුණක් වූ ඇය කරුණාවන්ත දෙනෙතකට හා නේත්‍රාකර්ෂණීය සිනාවකට උරුමකම් කියන මිෂෙල් බැචලේ (Michelle Bachelet) නම් වූ, ලතින් ඇමෙරිකානු කලාපයේ සිංහ ධේනුව විය. එවන් වූ අමරණීය කාන්තාවකගේ දිවියේ නොයෙක් මානයන් පිළිබඳ ගවේෂණයක යෙදීමට අප මෙතැන් සිට ඇයගේ දෛවෝපගත චාරිකාවට ප්‍රවිෂ්ට වනු ඇත.

## ළමා කාලය, අධ්‍යාපනය හා දේශපාලනයට පිවිසීම

1951 සැප්තැම්බර් මස 29 දින චිලී හි සැන්ටියාගෝ (Santiago) අගනුවර උපනගරයක් වූ ලා සිස්ටනා (La Cisterna) හිදී වෙරෝනිකා මිෂෙල් බැචලේ ජෙරියා (Verónica Michelle Bachelet Jeria) උපත ලැබුවා ය. ඇල්බටෝ බැචලේ මාටිනස් (Alberto Bachelet Martinez) සහ ඇන්ජෙලා ජෙරියා ගෝමස් (Angela Jeria Gomez) ඇයගේ මව්පියන් විය. පියා ගුවන් හමුදා බ්‍රිගේඩියර් ජනරාල්වරයෙකු ද මව පුරාවිද්‍යාඥවරියක ද විය. කුඩා බැචලේගේ ළමා කාලය ගත වූයේ රට තුළ එක් ස්ථානයකින් තවත් ස්ථානයකට සංක්‍රමණය වෙමිනි. බැචලේගේ පියාට එක් හමුදා කඳවුරකින් තවත් හමුදා කඳවුරකට මාරුවීමට සිදුවීම එයට හේතු විය. බැචලේ හට සිය අධ්‍යාපන කටයුතු කරගෙන යාමට සිදු වූයේ ද මෙම අභියෝගයට මුහුණදෙමිනි.

මේ හේතුවෙන් බැචලේ කින්ටෙරෝ (Quintero), ඇන්ටොෆැගස්ටා (Antofagasta) සහ සැන් බර්නාඩෝ (San Bernardo) වැනි ප්‍රදේශවල පිහිටි ප්‍රාථමික පාසල් කිහිපයක ම අධ්‍යාපනය ලැබුවා ය. 1962 දී බැචලේගේ පියා වොෂින්ටන් ඩී.සී. හි (Washington D.C.) පිහිටි චිලී තානාපති කාර්යාලයට අනියුක්ත කිරීම හේතුවෙන් ඇයට සිය පවුල සමඟ ඇමරිකාවට සංක්‍රමණය වීමට සිදු විය. ඒ අනුව ඇමරිකාවේ මේරිලන්ඩ් (Maryland) ප්‍රාන්තයේ බෙතෙස්දා (Bethesda) නගරය, පුරා වසර දෙකක් ඇයගේ වාසභූමිය විය. මේ කාලයේ ඇය වෙස්ටර්න් ජුනියර් උසස් පාසලට (Western Junior High School) ඇතුළත් වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස බැචලේ චතුර ලෙස ඉංග්‍රීසි භාෂාව හසුරුවන්නට උගත්තා ය. 1964 දී නැවත මව්රටට පැමිණි ඇය ලිසියෝ හවියේරා කරේරා (Liceo Javiera Carrera) නම් ප්‍රසිද්ධ උසස් බාලිකා පාසලට ඇතුළත් විය. පාසල තුළ දීප්තිමත් ශිෂ්‍යාවක වූ ඇය පාසල් ගායන කණ්ඩායම, අත්පන්දු කණ්ඩායම, නාට්‍ය කණ්ඩායම, වාදන කණ්ඩායම ආදිය නියෝජනය කිරීමට වරම් හිමිකරගත් අතර පංති නායිකා තනතුරට ද පත් වූවා ය. 1969 දී ඇය විශිෂ්ට දක්ෂතා දක්වමින් තම උසස් පාසල් අධ්‍යාපනය අවසන් කළා ය. විශ්වවිද්‍යාල ප්‍රවේශ විභාගයෙන් ඉහළ ම ලකුණු ලබාගත් ඇය, 1970 දී චිලී විශ්ව විද්‍යාලයේ (University of Chile) වෛද්‍ය පීඨයට ඇතුළත් විය. මුලින් ඇය සමාජ විද්‍යාව හෝ ආර්ථික විද්‍යාව හැදෑරීමට බලාපොරොත්තු වු නමුදු පසුව වෛද්‍ය විද්‍යාව තෝරාගත්තා ය. පසුකලෙක එයට හේතුව ලෙස ඇය සඳහන් කළේ පීඩා විඳින ජනතාවට උපකාර කිරීමටත්, චිලී සෞඛ්‍ය පද්ධතිය වැඩිදියුණු කිරීමට දායක වීමටත් හැකි හොඳම අවස්ථාව එය වූ බැවින් තමා වෛද්‍ය විද්‍යාව තෝරාගත් බව ය. විශ්වවිද්‍යාල දිවියේ පළමු වසරේ දී ඇය චිලී සමාජවාදී තරුණ සංවිධානය (Socialist Youth), සැල්වදොර් ඇලන්ඩේගේ (Salvador Allende) ජනාධිපතිවරණ ජයග්‍රහණයට පෙරටුගාමීව කටයුතු කල වාමාංශික දේශපාලන සන්ධානයක් වු පොපියුලර් යුනිටි (Popular unity) වැනි සංවිධානවල ක්‍රියාකාරී සාමාජිකාවක ලෙස කටයුතු කළා ය. මේ තුළින් ලබාගත් අත්දැකීම් බැචලේගේ පසුකාලීන දේශපාලන දිවියට මුල් අඩිතාලමක් විය.

කෙසේනමුත් 1970න් පසුකාල සමය බැචලේගේ දිවියේ එතරම් සුබදායී කාලවකවානුවක් නො වුණි. 1970 බලයට පත් සැල්වදොර් ඇලන්ඩේගේ (Salvador Allende) ආණ්ඩුව යටතේ චිලී ආහාර බෙදාහැරීමේ කාර්යාලයේ ප්‍රධානියා ලෙස

කටයුතු කල බැචලේගේ පියා 1973 දී රාජ්‍යද්‍රෝහී චෝදනා ලැබ සිරකරුවෙකු බවට පත්වූයේ නො සිතූ අයුරිණි. මෙය සිදු වූයේ සැල්වදොර් ඇලන්ඩේ (Salvador Allende) බලයෙන් පහකර ජනරාල් ඔගස්ටෝ පිනෂේ (Augusto Pinochet) බලයට පැමිණ 1973 සැප්තැම්බර් 11 දී ඇති වූ හමුදා කුමන්ත්‍රණයේ (coup d'état) ප්‍රතිඵලයක් ලෙස ය. පසුව සැන්ටියාගෝ හි (Santiago) සිරකඳවුරක වදහිංසාවලට ලක්වෙමින් දිවි ගතකළ බැචලේගේ පියා 1974 මාර්තු 12 හෘදයාබාධයක් වැළඳීමෙන් මරණයට පත් විය. පියාගේ මරණයෙන් පසුව ද විවිධ බාධකවලට මුහුණ දීමට බැචලේට සිදු විය.

මේ අතර සමාජවාදී පක්ෂය රහසිගතව හමුදා පාලන විරෝධී ව්‍යාපාරයක් සංවිධානය කරමින් සිටි අතර බැචලේ සහ ඇගේ මව එයට සම්බන්ධ වී කටයුතු කළ නමුත් එම සංවිධානයේ සියලු ම සාමාජිකයන් හමුදා පාලනයේ අත්අඩංගුවට පත් විය. 1975 මුල් කාලයේ දී චිලී රහස් පොලිසිය (Dirección de Inteligencia Nacional – DINA) විසින් බැචලේ සහ ඇගේ මව ඔවුන්ගේ ම නිවස තුළ සිරකර තබනු ලැබූ අතර පසුව ඔවුන්ව දෑස් බැඳ දමා සැන්තියාගෝ හි (Santiago) පිහිටි විලා ග්‍රිමාල්ඩි (Villa Grimaldi) නම් රැඳවුම් මධ්‍යස්ථානයකට ගෙන ගොස් විවිධ වදහිංසාවලට සහ ප්‍රශ්න කිරීම්වලට ලක් කරන ලදී. මෙහිදී නිරන්තරයෙන් මරණ තර්ජන හා බැනවැදීම්වලට මුහුණ දීමට ඔවුන්ට සිදු විය. පසුව ඇයව ක්වත්‍රො ඇලමෝස් (Cuatro Álamos) නම් තවත් සිරකඳවුරකට රැගෙන ගොස් රඳවා තබන ලදී. බැචලේගේ මෙම සිරකඳවුරු ජීවිතය අවසන් වූයේ එකල චිලී හි සිටි දේශපාලන සිරකරුවන් නිදහස් කරගැනීමට කටයුතු කළ රොබෙටෝ කොසැක්ගේ (Roberto Kozak) සහයෙනි. ඔහුගේ සහයෙන් ඇයට ඕස්ට්‍රේලියාවට පිටුවහල්බාවය ලබා ගැනීමට හැකි විය.

1975 මැයි මාසයේ දී බැචලේ ඕස්ට්‍රේලියාව අතහැර නැගෙනහිර ජර්මනියේ (German Democratic Republic) ඇම් ස්ටර්න් (Am Stern) පොට්ස්ඩෑම් හි (Potsdam) පදිංචියට පැමිණියා ය. පසුව 1976 ඔක්තෝබර් මාසයේ දී බැචලේ බාබෙල්ස්බර්ග් හි (Babelsberg) පිහිටි චිකිත්සාගාරයක සේවයට එක් විය. ඒ තම වෛද්‍ය අධ්‍යාපන කටයුතු ඊස්ට් ජර්මන් විශ්වවිද්‍යාලය (East German university) තුළ ඉදිරියට කරගෙන යාමට පෙර සූදානමක් ලෙස යි. මේ කාලයේ දී ඇයට තවත්


පිටුවහල් කෙරුනු චිලී ජාතිකයෙකු වන හෝර්හේ ලියොපොල්ඩෝ ඩවාලොස් කාර්තෙස් (Jorge Leopoldo Dávalos Cartes) නම් ගෘහ නිර්මාණ ශිල්පියා මුණගැසුණු අතර 1977 දී ඔහු සමඟ විවාහ දිවියට එළඹුණි. 1978 ජනවාරි වනවිට අධ්‍යාපන කටයුතු තවදුරටත් පුළුල් කරමින් ජර්මන් භාෂාව ඉගෙනගැනීමට කාල් මාක්ස් විශ්වවිද්‍යාලයේ හීඩර් ආයතනයට (Herder Institute) ඇතුළත් විය. (වර්තමානයේ ලෙයිප්සිංග් විශ්වවිද්‍යාලය-University of Leipzig) මේ කාලයේ සිදු වූ තවත් එක් වැදගත් සිදුවීමක් වූයේ 1978 ජූනි මාසයේ දී බැචලේ සහ ඩවාලොස් යුවලගේ ප්‍රථම දරුවා වන හෝර් හේ ඇල්බ(ර්)ටෝ සෙබස්තියන් (Jorge Alberto Sebastián) උපත ලැබීම යි. 1978 සැප්තැම්බර් මාසයේ දී නැවත පොට්ස්ඩැම් (Potsdam) වෙත පැමිණි බැචලේ බර්ලින් හම්බෝල්ඩ්ට් විශ්වවිද්‍යාලයට (Humboldt University of Berlin) ඇතුළත්ව වෛද්‍ය අධ්‍යාපන කටයුතු ඉදිරියට කරගෙන ගිය නමුත් පස් මසකට පසුව එනම් 1979 දී ඇයට නැවත සිය මව්රටට පැමිණීම අවසර හිමි විය.

අවුරුදු හතරක පිටුවහල් කාලයක් නිමාකර නැවත මව්රටට පැමිණීමෙන් පසු 1980 දෙවන භාගයේ දී ඇය  චිලී රාජ්‍යය තුළ නැවත ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කිරීම වෙනුවෙන් සටන් කළා ය. කෙසේ නමුත් මව්රටට පැමිණීමෙන් පසු බැචලේ රටින් පිටුවහල් කළ අවස්ථාවේ දී නතර කළ ස්ථානයේ සිට ම තම අධ්‍යාපන කටයුතු නැවත ආරම්භ කිරීමට සිදු විය. ඒ අනුව 1983 වනවිට ඇය වෛද්‍ය-ශල්‍ය වෛද්‍යවරියක (physician sergeon) ලෙස උපාධිය සම්පූර්ණ කළා ය. පසුව ඇය පොදු ජනතාවට සේවය කිරීමේ අරමුණින් සාමාන්‍ය වෛද්‍ය (General practitioner) තනතුරකට අයදුම් කළත් හමුදා රජය විසින් දේශපාලන වුවමනා මත එම ඉල්ලීම ප්‍රතික්ෂේප කරන ලදී. ජනතාවට සේවය කිරීමේ සිහිනය එවර බොඳ වී ගිය නමුත් 1983 දී චිලී වෛද්‍ය මණ්ඩලය විසින් ඇයට චිලී විශ්වවිද්‍යාලයේ රොබටෝ ඩෙල් රියෝ (Roberto del Río Children's Hospital) ළමා රෝහලේ ළමා රෝග හා මහජන සෞඛ්‍ය පිළිබඳ වැඩිදුර හැදෑරීමට ශිෂ්‍යත්වයක් ලබාදුණි.

මේ අතර 1984 පෙබරවාරි මාසයේ දී  බැචලේ සහ ඩවාලොස් යුවලගේ දෙවන දරුවා වන ෆ්‍රැන්සිස්කා වැලෙන්ටිනා (Francisca Valentina) උපත ලැබුවා ය. කෙසේ නමුත් දෙවන දරුවාගේ උපතින් පසුව බැචලේ සහ ඩවාලොස් නීතියෙන් වෙන් වූහ. 1986 දී බැචලේ තම විශේෂවේදී පාඨමාලාව විශිෂ්ට සාමාර්ථ සහිතව

අවසන් කළ නමුත් මූල්‍ය අපහසුතා හේතුවෙන් එයට අදාල සහතිකය ලබා ගැනීමට නො හැකි විය. මේ කාලය තුළ ඇය (Protection of children injured by state of emergency foundation- PIDEE) නම් රාජ්‍ය නො වන සංවිධානයේ සේවයට එක් වූ අතර 1986-1990 කාලය තුළ එහි වෛද්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා ලෙස සේවය කරමින් විවිධ වදහිංසාවලට ලක් වූ දරුවන් වෙනුවෙන් ඉමහත් සේවයක් ඉටුකළා ය. 1990 දී චිලී රාජ්‍ය ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක් බවට පත් වීමෙන් අනතුරුව බැචලේ චිලී සෞඛ්‍ය අමාත්‍යංශයේ බටහිර සැන්ටියාගෝ සෞඛ්‍ය සේවාවේ සේවයට එක් විය. එමෙන් ම පෑන් ඇමරිකානු සෞඛ්‍ය සංවිධානයේ (Pan-American Health Organization), ලෝක සෞඛ්‍ය සංවිධානයේ උපදේශකවරියක ලෙස සේවය කළා ය. පසුව ජාතික ඒඩ්ස් කොමිෂන් සභාවේ සේවයට එක් විය. මේ කාලය තුළ ඇයට හර්නන් හෙන්රික්ස් මාරිච් (Aníbal Hernán Henríquez Marich) නම් වෛද්‍යවරයෙකු හඳුනාගැනීමට අවස්ථාව ලැබුණි. එම සබඳතාවයේ ප්‍රතිඵලයක් ලෙස 1992 දෙසැම්බර් මාසයේ දී බැචලේගේ තෙවන දරුවා වන සොෆියා කැටලිනා (Sofía Catalina) උපත ලැබුවා ය. වෛද්‍යවරියක් ලෙස ඇයගේ දායකත්වය උපරිම ලෙස ලබා දුන් අතර 1994 සිට 1997 දක්වා බැචලේ හට නියෝජ්‍ය සෞඛ්‍ය අමාත්‍යවරයාගේ ජ්‍යෙෂ්ඨ සහයකවරිය ලෙස සේවය කිරීමට අවස්ථාව හිමි වීම ඇයගේ දිවිය දේශපාලනික දිශානතියකට යොමු කිරීමට සමත් විය.

*1961 දී සන්තියාගෝ හිදී ඇගේ පියා මව සහ සොහොයුරා සමඟ*



## නායකත්වය කරා ගිය ගමන් මග

ඇයගේ දක්ෂතාවය හේතුවෙන් 1995 දී සමාජවාදී පක්ෂයේ මධ්‍යම කාරක සභාවට තේරී පත් වීමට හැකි වූ අතර 1996 දී දේශපාලනයට තවදුරටත් අවතීර්ණ වෙමින් ලාස් කොන්ඩස් හි (Las Condes) නගරාධිපති ධූරයට තරඟ කිරීමට ඉදිරිපත් විය. එමගින් ඇයට ලබාගත හැකි වූයේ සිව්වන ස්ථානය වුව ද ඉන් නො නැවතී ඇය හමුදා සබඳතා පිළිබඳ ඇති වූ උනන්දුව හේතුවෙන් හමුදා මූලෝපාය පිළිබඳ හැදෑරීම සඳහා චිලී ජාතික දේශපාලන හා උපායමාර්ගික අධ්‍යයන ඇකඩමිය (National Academy of Political and Strategic Studies - ANEPE) හා සම්බන්ධ වූ අතර එහි දී ඉහළම ලකුණු ලබාගනිමින් දැක් වූ විශේෂ දක්ෂතා හේතුවෙන් ඇයට වොෂින්ටන් ඩී. සී. හි අන්තර් ඇමරිකානු ආරක්ෂක විශ්වවිද්‍යාලයේ (Inter-American Defense College) වැඩිදුර අධ්‍යාපනය හැදෑරීම සඳහා ජනාධිපති ශිෂ්‍යත්වයක් හිමි කරගත්තා ය. ඒ අනුව ඇය 1998 දී මහද්වීපික ආරක්ෂාව පිළිබඳ පාඨමාලාව (Continental Defense Course) සම්පූර්ණ කරමින් නැවත සිය මව්රටට පැමිණ එවකට සිටි ආරක්ෂක ඇමතිවරයාගේ ජ්‍යෙෂ්ඨ සහකාරවරිය ලෙස සේවයට එක් විය. පසුව ඇය චිලී හමුදාවේ යුධ විද්‍යායතනයේ දී යුධ විද්‍යාව පිළිබඳ තම ආචාර්ය උපාධිය ලබාගත්තා ය.

2000 මාර්තු 11 දී ජනාධිපති රිකාඩෝ ලාගෝස් (Ricardo Lagos) විසින් බැචලේ සෞඛ්‍ය අමාත්‍යවරිය ලෙස පත්කරන ලදී. දෙවර්ෂයකින් පසු 2002 ජනවාරි 7 ඇය චිලී රාජ්‍ය ආරක්ෂක අමාත්‍යවරිය ලෙස පත් වූ අතර එය ලතින් ඇමරිකානු කලාපයේ ප්‍රථම කාන්තා ආගමනය විය. චිලී ආරක්ෂක අමාත්‍යවරිය ලෙස බැචලේ නව යුධ උපකරණ මිලට ගනිමින් චිලී සන්නද්ධ හමුදාවන් නවීකරණය කිරීමට කටයුතු කළ අතර ජාත්‍යන්තර සාම මෙහෙයුම්වල නිරත විය. එමෙන් ම හමුදාව සහ ඒකාධිපතිවාදයෙන් පීඩාවිඳි ජනතාව අතර සංහිඳියාව ඇතිකිරීමට කටයුතු කිරීම, හමුදා විශ්‍රාම වැටුප් ක්‍රමය ප්‍රතිසංස්කරණය කිරීම වැනි සේවාවන් කැපී පෙණුනි. ආරක්ෂක අමාත්‍යවරිය ලෙස සිදු කළ සේවය ඇයගේ ජනාධිපතිවරණ ජයග්‍රහණයට ද මහඟු පිටිවහලක් විය.

ආරක්ෂක අමාත්‍යවරිය ලෙස ඇය සිදුකළ සේවය ජනාධිපතිවරණ සටනට ප්‍රවිශ්ට වීමට අඩිතාලමක් වූ අතර සමාජවාදී පක්ෂයේ (Socialist Party) ජ්‍යෙෂ්ඨයින් විසින්

2005 ජනාධිපතිවරණයට ඔවුන්ගේ අපේක්ෂකයා ලෙස ඇයගේ නාමය ඉදිරිපත් කරන ලදී. ජනාධිපතිවරණය සඳහා නාමයෝජනා භාරදීමට ඇය මුල දී එතරම් කැමැත්තක් නො දැක්වූ නමුත් තම ආධාරකරුවන්ගේ බලාපොරොත්තු සුන් කළ නොහැකි බවට වටහා ගත් බැවලේ අවසානයේ දී නාම යෝජනා භාරදීමට එකඟ වූවා ය.

එම වසරේ දෙසැම්බර් හිදී ජනාධිපතිවරණය පැවැත් වූ අතර ඇය සෙබෙස්තියන් පින්යේරා (Sebastian Pinera) (ජ්)වකින් ලවින් (Joaquin Lavin) හා වාමාංශික අපේක්ෂක ටෝමස් හිර්ෂ්ට (Tomas Hirsch) එරෙහිව තරඟ වැදුණා ය. නමුත් ඇයට හිමිවූයේ 46%ක ඡන්ද ප්‍රතිශතයක් පමණක් වූ බැවින් මැතිවරණය ජයග්‍රහණය කිරීමට අවශ්‍ය බහුතරය ලබා ගැනීමට අපොහොසත් විය. එහෙත් ඇයගේ දෛවෝපගත උරුමය හිස ඔසවන්නට පටන් ගැනුණි. 2006 ජනවාරි හි අතුරු මැතිවරණයක් පැවැත් වූ අතර එයට මුහුණ දුන් බැවලේ 53%ක ඡන්ද ප්‍රතිශතයක් ලබා ගනිමින් තම ප්‍රතිවාදියා වූ සෙබෙස්තියන් පින්යේරා (Sebestian Pinera) පරාජය කර චිලී රාජ්‍යයෙ හි ප්‍රථම ජනාධිපතිනිය බවට පත් වීමට වරම් ලබා ගත්තා ය. ඒ අනුව ඇය හිටපු රාජ්‍ය නායකයෙකුගේ හෝ දේශපාලන නායකයෙකුගේ බිරිඳ නො වූ පළමු ජනාධිපතිනිය ලෙස ඉතිහාසයට එක් විය.

2006 ජනවාරි 30 වන දින මැතිවරණ සුදුසුකම්ලාභී අධිකරණය (Elections Qualifying Court) විසින් නිල වශයෙන් ජනාධිපතිනිය ලෙස ප්‍රකාශයට පත් කිරිමෙන් පසුව වැඩ භාරගත් ඇය සිය ඇමති මණ්ඩලය ප්‍රකාශයට පත්කළ අතර එහි ඇමති ධූරයන් ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයට ම සමාන වන පරිදි පත් කරනු ලැබීය. ඇගේ මැතිවරණ පොරොන්දු අනුව සභාගයේ අභ්‍යන්තර බල තුලනයට අනුව ක්‍රිස්තියානි ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ (Christian Democrat Party) ඇමැතිවරුන් හතර දෙනෙකු, ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ (Party for Democracy) පස්දෙනෙකු, සමාජවාදී පක්ෂයේ සිව්දෙනෙකු, සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයෙන් (Social Democrat Radical Party) මෙන් ම පක්ෂ භේදයකින් තොරව තිදෙනකු පත් කිරීමට ද වගබලා ගත්තා ය. ඉන් අනතුරුව චිලී රාජ්‍යයේ ප්‍රජාතන්ත්‍රවාදයට අධිපති දෙවඟන බවට පත් වෙමින් දෙවරක් ම ජනාධිපති වීමේ භාග්‍යය හිමි කර ගත්තා ය. අවසානයේ දී ඇය තම මාතෘ භූමියට ණය නැති දියණියක විලස, ඉටු කළ යුතු

කාර්යභාරය නො පැකිළව ඉටු කරමින් ආදර්ශවත් නායිකාවක් ලෙස තම ප්‍රතිරූපය ගොඩනගා ගැනීමට ක්‍රියා කළා ය.



*මිෂෙල් බැචලේ 2003 ආරක්ෂක ඇමති ලෙස සබ්මැරීනයක් පරීක්ෂා කරන අතරතුර*

## <u>නායකත්වයට පැමිණීමෙන් පසු සිදු කළ සේවාව</u>

දහසක් බාධක හමුවේ අවසානයේ දී *බැචලේ* තම අරමුණ වෙත පැමිණියා ය. ඇය විසින් දුටු ප්‍රජාතන්ත්‍රවාදය රජයන චිලී රාජ්‍යයේ සිහිනය යථාර්ථයක් බවට පත් කිරීම උදෙසා ඇගේ වගකීම් ක්‍රම ක්‍රමයෙන් ආරම්භ කිරීමට පටන් ගත්තා ය. ඇය කෙරෙහි තිබූ ජනතා විශ්වාසය කොතෙක්ද කිවහොත් එක් වරක් නොව දෙවරක් ම ජනාධිපති ධූරයට පත් වීමට අවස්ථාව හිමි වූ අතර ඇයට ලැබුණු ජනතා වරම් සඳහා ඇයට හැකි උපරිම සාධාරණය ඉටු කිරීමට වග බලා ගත්තා ය.

## පළමු ධූර කාලය -2006 සිට 2010

ඇයගේ පළමු අදියර ආරම්භ වූයේ 2006 මාර්තු 11 වන දින වැල්පාරාසෝ හි (Valparaíso) පැවති ජාතික උත්සවයක දී චිලී ජනරජයේ ජනාධිපති ලෙස දිවුරුම් දීමත් සමග ය. ඇය ජනාධිපති ධුරයට පත් වූ මුල් මාස තුනෙන් වැඩි කාලයක් ගත කළේ සිය මැතිවරණ ව්‍යාපාරයේ දී පළමු දින 100 තුළ ක්‍රියාත්මක කරන බවට පැවසූ පොරොන්දු ඉටු කරමින් ය. වැඩිහිටි රෝගීන් සඳහා නොමිලේ සෞඛ්‍ය සේවා සැපයීම වැනි සරල පනත් වල සිට සමාජ ආරක්ෂක ක්‍රමය සහ මැතිවරණ ක්‍රමය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වූ සංකීර්ණ පනත් දක්වා එම පොරොන්දු විහිදී තිබුණි. ඇයගේ පළමු රාජ්‍ය සංචාරය සඳහා ආර්ජන්ටිනාව තෝරා ගත් අතර මාර්තු 21 වෙනිදා එරට බුවනෝස් අයර්ස් (Buenos Aires) වෙත පැමිණ, ජනාධිපති නෙස්ටර් කර්ච්නර් (Néstor Kirchner) හමු විය. එහිදී ඔහු සමග බලශක්ති සහ යටිතල පහසුකම් පිළිබඳ උපායමාර්ගික ගිවිසුම් අත්සන් කළා ය.

2006 මාර්තු මාසයේ දී බැචලේ විසින් විශ්‍රාම වැටුප් ක්‍රමය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා උපදේශක කමිටුවක් පිහිටුවන ලද අතර එහි ප්‍රධානත්වය දැරුවේ හිටපු අය-වැය අධ්‍යක්ෂක මාරියෝ මාර්සෙල් (Mario Marcel) විසිනි. 2006 ජූලි මාසයේ දී කොමිසම සිය අවසන් වාර්තාව නිකුත් කළ අතර, 2008 මාර්තු මාසයේ දී බැචලේ එම පනතට අත්සන් කර එය නීතියක් බවට පත් කළා ය. මෙම නව නීතිය ස්ථාපිත කිරීමෙන් මූලික සහයෝගිතා විශ්‍රාම වැටුපක් (Basic Solidarity Pension-PBS) මෙන් ම සහයෝගිතා විශ්‍රාම වැටුප් දායකත්වයක් (Solidarity Pension Contribution -APS) තුළින් ජනගහනයෙන් 60%ක් වූ දුප්පත් ප්‍රජාව සඳහා අවම විශ්‍රාම වැටුපක් සහතික කරන ලදි. මෙම ප්‍රතිසංස්කරණය මගින් සෑම දරු උපතක් (මළ දරු උපත් හැරෙන්නට) සඳහා කාන්තා විශ්‍රාමිකයින් හට ප්‍රාසාද දීමනාවක් ද ලබා දුනි. 2006 ඔක්තෝම්බර් මාසයේ දී බැචලේ විසින් සමාගම් උප කොන්ත්‍රාත් සේවකයින් (subcontracted employees) ආරක්ෂා කිරීම සඳහා නීති සම්පාදනය කළ අතර එමගින් මිලියන 1.2 ක පමණ සේවකයින් හට ප්‍රතිලාභ ලබා ගැනීමට හැකි වුණි. එසේම ඇය විසින් පෞද්ගලික අංශයේ රැකියා සඳහා ස්ත්‍රීපුරුෂභාවය නො සළකා සමාන වැටුපක් සහතික කිරීම අරමුණ කොට 2009 ජූනි මාසයේ දී වැටුප් සමානතා නීතිය (pay equality legislation) හඳුන්වා දෙන ලදී.

එමෙන් ම 2009 සැප්තැම්බර් මාසයේ දී 'චිලී ඔබ සමග වැඩෙයි' (Chile Grows with You) සැලැස්ම අත්සන් කළ අතර එමගින් අවුරුදු හයට අඩු, අවදානම් සහිත ළමුන් සඳහා පුළුල් සමාජ සේවාවන් සැපයීමට බලාපොරොත්තු විය. ඒ හා සමගාමීව අන්තර් සමාජ ආරක්ෂණ පද්ධතිය (Intersectoral Social Protection System) නමින් සමාජ සුභසාධන කළමනාකරණ පද්ධතියක් ද ස්ථාපිත කරන ලදී. එයින් නො නැවතුනු ඇය 2009 මාර්තු මාසයේ දී, 'මම මගේ පරිගණකය තෝරා ගනිමි' (I Choose my PC) නමින් වැඩසටහනක් ආරම්භ කළ අතර, එමගින් රජයේ සහනාධාර සහිත පාසල් වල අධ්‍යාපනයේ විශිෂ්ට දක්ෂතා පෑ හත්වැනි ශ්‍රේණියේ දිළිඳු සිසු සිසුවියන්ට නොමිලේ පරිගණක ප්‍රදානය කරන ලදි. එමෙන් ම 2009 සහ 2010 කාලය තුළ රජයේ රෝහල් වල මුළු දරු උපත් වලින් 80%ක ප්‍රමාණයක් සඳහා බැචලේ විසින් මාතෘ පැකේජ ලබා දීමේ නීතිමය ක්‍රියාවලියක් ආරම්භ කරන ලදි.

සමාජ සේවාවන්ට අමතරව යටිතල පහසුකම් දියුණු කිරීමට ක්‍රියා කළ ඇය ජනාධිපතිනියව සිටිය දී සැන්ටියාගෝ හි (Santiago) නව උමං දුම්රිය ස්ථාන 18ක් විවෘත කරන ලදි. 2009 දෙසැම්බරයේ දී තවත් සැන්ටියාගෝ හි නව උමං මාර්ගයක් ඉදි කරන බව නිවේදනය කරන ලද අතර එය 2016 මැද භාගය වන විට අවසන් කිරීමට හැකි විය.

මානව හිමිකම් ආරක්ෂා කරන දෙවගනක බඳු වූ බැචලේ ඒ වෙනුවෙන් බොහෝ ලෙස කැප විය. 2009 ජනවාරි මාසයේ දී ඇය විසින් සැන්ටියාගෝ හි මතක කෞතුකාගාරය විවෘත කළ අතර එහි පිනෝචේ (Pinochet) ගේ අවුරුදු 16 හමාරක ඒකාධිපති පාලනයේ භීතිය පෙන්නුම් කර තිබුණි. මානව හිමිකම් ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව පසුගිය පාලන සමයේ දී පාලකයින් විසින් රැගෙන ආ පනතක් නොවැම්බර් මාසයේ දී ඇය විසින් නීතියක් ලෙස ප්‍රකාශයට පත් කිරීමට ක්‍රියා කළා ය. එමගින් රෙටිග් සහ වැලෙක් කොමිෂන් සභා (Rettig and Valech commission) මාස 18ක් සඳහා නැවත විවෘත කිරීමට අවසර හිමි විය. එමෙන් ම ඇය ජනාධිපති බලතල භාවිත කර සමලිංගික විවාහ නීත්‍යානුකූල කිරීම සඳහා පනතක් යැවූ අතර ප්‍රජනන අයිතිවාසිකම් පනතක් සඳහා අනුග්‍රහය දක්වන ලදි. එයට අමතරව 2008 අගෝස්තු මාසයේ දී පරිසරය සඳහා අධීක්ෂණ ක්‍රියාවලියක් ද (Superintendence for the Environment) ඇති කරන ලදී. කාන්තාවන්ට ඇයගේ

පාලන කාලය තුළ විශේෂ ස්ථානයක් හිමි වූ අතර ඇගේ පළමු රජයේ අමාත්‍යංශ වලින් අඩක් මෙහෙයවනු ලැබුවේ කාන්තාවන් විසිනි.

ඇයගේ පළමු ධූර කාලයේ ආර්ථික ක්ෂේත්‍රය පිළිබඳ සොයා බැලීමේ දී වසර හතරක පාලන කාලය තුළ දී ආර්ථිකය 3.3% ලෙස සාමාන්‍ය ආකාරයට වර්ධනය වූ අතර එය ගෝලීය මූල්‍ය අර්බුදය හේතුවෙන් 2006 දී, 5.7% ක ඉහළ අගයක් ද 2009 දී -1.0% ක ඍණ වර්ධනයක් ද පෙන්නුම් කරන්නට විය. එමෙන් ම ඇයගේ පාලන කාලය තුළ දී නිරපේක්ෂ දරිද්‍රතාවය 13.7% සිට 11.5% දක්වා අඩු අගයක් පෙන්නුම් කරන්නට විය.

**දෙවන ධූර කාලය - 2014 සිට 2018**

2014 මාර්තු 11 වැනි දින බැචලේ දෙවැනි වරටත් චිලී රාජ්‍යයේ ජනාධිපතිනිය ලෙස දිවුරුම් දුන්නා ය. දෙවැනි ධූර කාලයේ දී ඇය අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කිහිපයක් ම සිදු කළා ය. බැචලේගේ 2013 මැතිවරණ පොරොන්දු පත්‍රිකාවෙ හි චිලී රාජ්‍යයේ සියලුම විද්‍යාර්ථයින්ට නොමිලේ උසස් අධ්‍යාපනය හැදෑරීමේ අයිතිය තහවුරු කිරීම ඇතුළත්ව තිබූ අතර, ඇය දෙවැනි වරට ජනාධිපතිනිය ලෙස පත් වූවාත් සමඟ ම ලාභ ලබන අධ්‍යාපන ආයතන වෙනුවට නිදහස් උසස් අධ්‍යාපන ක්‍රමයක් යෝජනා කළා ය. ඒ සඳහා ඇයට විපක්ෂයෙන් මෙන් ම විවිධ අංශවලින් බාධා එල්ල වුවත් එයින් නො නැවතුණු ඇය තම අරමුණු ඉටු කර ගැනීමට අධිකරණයේ සහය පැතුවා ය. එහි ප්‍රතිඵලයක් ලෙස 2015 දී චිලී හි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණයේ (Chile Constitutional Court) නියෝගයකට අනුව අඩු ආදායම්ලාභී විද්‍යාර්ථයින් ලක්ෂ දෙකකට නොමිලේ උසස් අධ්‍යාපනය හැදෑරීමට අවසර ලබා ගැනීමට ඇයට හැකි විය. ඉන් වසර තුනකට පසු 2018 දී චිලී සෙනෙට් සභාව එම රටෙහි දුප්පත් ම සිසුන් 60%ක ප්‍රමාණයකට නොමිලේ උසස් අධ්‍යාපන වරම් හිමිකර දෙමින් පනතක් සම්මත කරන ල දී. මීට අමතරව රාජ්‍ය විශ්වවිද්‍යාල සඳහා වූ අරමුදල් දෙගුණයකින් වැඩි කිරීමට සහ නව ව්‍යවස්ථාව මගින් උසස් අධ්‍යාපන අධිකාරිවරයෙකු පත් කිරීමටත් ඇය කටයුතු කළා ය. ඒ අනුව ඇය චිලී හි අධ්‍යාපනය නැංවීම සඳහා ප්‍රමුඛත්වය ගෙන කටයුතු කර ඇති බව පැහැදිලි වේ.

දෙවන ධූර කාලයේ දී බඳු ප්‍රතිසංස්කරණ කිහිපයක් සිදු කිරීමට ඇයට හැකි විය. 2014 සැප්තැම්බර් මාසයේ දී චිලී කොංග්‍රසය විසින් දළ දේශීය නිෂ්පාදිතයෙන්

3%කින් ආදායම වැඩිකර ගැනීම සඳහා බැචලේ ගෙන ආ බදු ප්‍රතිසංස්කරණ යෝජනාව සම්මත කරන ලදී. ප්‍රතිසංස්කරණයේ ඇතුළත් වූ සංශෝධන යටතට ආයතන බදු අනුපාතය 20% සිට 25% හෝ 27% දක්වා වැඩි කිරීම ආදිය ඇතුළත් විය.

බැචලේ චිලී රාජ්‍යයට කළ සේවාවන් අතර වඩාත් වැදගත් අවස්ථාවක් වූයේ සමලිංගික අයිතීන් තහවුරු කිරීමයි. 2015 ඔක්තෝබර් මාසයේ දී සිවිල් වෘත්තිය සමිති ගිවිසුම (Civil Union Agreement) සම්මත කිරීමත් සමඟ චිලී ව්‍යවස්ථාදායක අධිකරණය මගින් සමලිංගික සිවිල් සංගම් (same-sex civil unions) නීතිගත කරන ලදී. මෙම ගිවිසුම මගින් සමලිංගික යුවල සඳහා විවිධ අයිතිවාසිකම් සහ ප්‍රතිලාභ හිමි විය. තම සහකරු හෝ සහකාරිය මියගියහොත් විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ හා දේපළ උරුම කරගැනීමට, දේපළ සඳහා සමාන අයිතිවාසිකමක් දැරීමට මෙන් ම එකිනෙකා වෙනුවෙන් වෛද්‍ය තීරණ ගැනීමේ බලය ද මෙමගින් තහවුරු කරන ලදී. ඇය කාන්තාවන් සඳහා මෙන් ම ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ගොඩනැඟීම සඳහා ද ප්‍රමුඛත්වයක් ගෙන කටයුතු කළ අවස්ථා කිහිපයක් හඳුනාගත හැක.




*චිලී ජනාධිපති බැචලේ සිවිල් වෘත්තිය සමිති ගිවිසුම ඉදිරිපත් කරන ලද අවස්ථාවේ දී*

2015 දී දේශපාලන ප්‍රතිසංස්කරණ කීපයකට ම දායකත්වය ලබාදුන් බැචලේ ඔගස්ටෝ පිනොචෙ (Augusto Pinochet) පාලන ක්‍රමය මගින් හඳුන්වා දුන් ද්විතීක

ඡන්ද ක්‍රමය අහෝසි කිරීම, කොංග්‍රසයේ සභා දෙකෙහි ම ඡන්ද සඳහා සමානුපාතික නියෝජනය ප්‍රතිස්ථාපනය කිරීම හා අපේක්ෂකයන්ගෙන් 40%ක් කාන්තාවන් වීම ආදිය සම්මත කරන ලදී. නව ක්‍රමය 2017 මැතිවරණයෙන් බලපැවැත්වුණු අතර නියෝජිත මණ්ඩලයේ සාමාජිකයන් 120 සිට 155 දක්වාත්, සෙනෙට් සභාවේ ආසන 38 සිට 43 දක්වාත් ඉහළ නැංවීමට කටයුතු කළා ය. මීට අමතරව කොංග්‍රසය නියෝජනය කරන නව දේශපාලන පක්ෂ සංඛ්‍යාව වැඩි කිරීමට ද ඇය පියවර ගන්නා ලදී. 2016 දී රටින් පිට ජීවත් වන චිලී හි කාන්තාවන් හා පුරුෂයන් සඳහා විදේශීය ඡන්ද අයිතිය හඳුන්වා දුන් අතර එම පුරවැසියන්ට 2017 මැතිවරණයේ දී සිය ඡන්දය ලබා දීමට ඉඩ සලස්වන ලදී.

2016 ජූනි මාසයේ දී කාන්තා හා ස්ත්‍රී පුරුෂ අසමානතාවය සඳහා නව අමාත්‍යාංශයක් (Ministry for Women and Gender Inequality) පිහිටුවීමට ද ඇය කටයුතු කළා ය. 2017 අගෝස්තු මාසයේ දී යම් සීමා කිරීම් යටතේ ගබ්සාව නීතිගත කිරීම සිදු කරනු ලැබී ය. ඒ අනුව ස්ත්‍රී දූෂණය හේතුවෙන් ගැබ් ගැනීමේ දී, කළල රූපය මවගේ ජීවිතයට අනතුරක් වන අවස්ථාවේ දී හෝ කළල රූපය ක්ෂය නො වන අවස්ථාවල දී ගබ්සා කිරීමේ අයිතිය ලබා දෙමින් මුළුමනින් ම ගබ්සාව තහනම් කරමින් 1989 පිනොචෙ (Pinochet) පාලන සමයේ සිට පැවති තහනම ඉවත් කරන ලදී.

පරිසර සංරක්ෂණයට වැඩි අවධානයක් ලබාදීමට බැචලේ කටයුතු කළ අතර පාස්කු දූපතේ රපා නුයි (Rapa Nui) වැසියන් එම ප්‍රදේශය සංරක්ෂණ කලාපයක් ලෙස පත් කිරීමට 73%ක වැඩි ඡන්දයෙන් කැමැත්ත පළ කිරීමත් සමඟ ම 2017 සැප්තැම්බර් මස, වර්ග කිලෝමීටර් හත් ලක්ෂ විසිදාහක භූමි ප්‍රමාණයක් නව ආරක්ෂිත ප්‍රදේශයක් ලෙස නම් කරන ලදී. මෙමගින් අවම වශයෙන් වඳවීමේ තර්ජනයට ලක්ව ඇති මුහුදු විශේෂ 142ක් ආරක්ෂා කිරීමට අපේක්ෂා කරන ලදී.

පවුල්වාදී දේශපාලනයට පෙළඹෙන රාජ්‍ය නායකයින් අතර බැචලේ වෙනස් වන්නේ තම පවුලේ සාමාජිකයින්ට පවා නීතිය එක ලෙස ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ නිසා ය. ඊට හොඳම උදාහරණය වන්නේ තම පුත්‍රයා හා ලේලිය දූෂණ චෝදනා සඳහා වරදකරුවන් බව හෙළිදරව් වීමෙන් පසු වංචා, දූෂණ හා බලපෑම් පිළිබඳ සොයා බැලීම සඳහා එංගල් කොමිෂන් සභාව (Engel Commission) නමින් ජනාධිපති උපදේශක සභාවක් පිහිටුවීමට කටයුතු කිරීම යි. වර්තමානයේ දී පමණක්

නොව අනාගතයේ දී ද සිදු විය හැකි අක්‍රමිකතා වළක්වා ගැනීම සඳහා මෙම කොමිසමට ප්‍රතිසංස්කරණ කිහිපයක් සිදු කිරීමට ඇය කටයුතු කළා ය. ඒ අනුව විනිවිදභාවය පවත්වා නො ගැනීම හා දේශපාලනයේ දී මුදල් අවභාවිතයකට වරදකරුවෙකු වුවහොත් ඔහුව හෝ ඇයව ධූරයෙන් ඉවත් කිරීමට හා ඉන් පසු එළඹෙන මැතිවරණ දෙකකට ඉදිරිපත් වීම තහනම් කිරීමට මෙම සභාවට බලය පවතී. එමෙන් ම මැතිවරණ වියදම් සීමා කිරීමේ බලය හා චිලී හි මැතිවරණ සේවාව සඳහා ව්‍යවස්ථානුකූල ස්වාධිපත්‍යය සීමා කිරීම ද මෙමගින් තහවුරු කර ඇත. මෙම කොමිෂන් සභාවට මැතිවරණ ක්‍රියාවලිය වඩාත් කාර්යක්ෂමව අධීක්ෂණය කිරීම සඳහා රජයෙන් පූර්ණ නිදහස ලබා දී තිබීම විශේෂත්වයකි. 2018 ජනවාරි මාසයේ දී අක්කර මිලියන 10ක් ආවරණය කරමින් පැටගෝනියා (Patagonia) කලාපයේ නව ජාතික වනෝද්‍යාන පහක් ස්ථාපිත කිරීමට ඇය පියවර ගන්නා ලදී. බැචලේ සිය අවසාන ජනාධිපති නියෝගය ලෙස ජෛව විවිධත්වය ආරක්ෂා කිරීමට සාගර සංචිත නමයක් ඇති කළ අතර රාජ්‍ය ආරක්ෂාව සඳහා චිලී හි මුහුදු ප්‍රදේශය 4.2%ක සිට 42.4%ක් දක්වා විස්තාරණය කිරීමට කටයුතු කළා ය.

දශකයක පමණ කාලයක් මුළුල්ලේ චිලී රාජ්‍යයට නායකත්වය ලබා දෙමින් සිය රට වෙනුවෙන් මහඟු සේවයක් ඉටු කළ මිෂෙල් බැචලේ 2018 මාර්තු 11 දින නව ජනාධිපති සෙබෙස්තියන් පින්යේරාට (Sebestian Pinera) සිය වගකීම් බාර දී ධූරයෙන් ඉවත් විය. ඇය සැම විට ම ආදර්ශවත් නායිකාවක වූ අතර චිලී රාජ්‍යයේ අනාගතය යහපත් වනු ඇතැයි විශ්වාස කළා ය. විටෙක ඇය රට වැසියන් අමතා මෙසේ ප්‍රකාශ කළා ය, "සැම දෙයක්ම යහපත් අතට හැරෙනු ඇතැ'යි මම බලාපොරොත්තු වෙමි. මත විමසුම් වල දී මා රට වෙනුවෙන් කළ සේවාවන් හි දත්ත ගැන කතා කරන්නේ නැත. නමුත් අප ගන්නා යහපත් ක්‍රියාමාර්ග කවදා හෝ එල දරන බව මතක තබා ගන්න".

## <u>විදේශ ප්‍රතිපත්තිය</u>

මිෂෙල් බැචලේ චිලී හි ජනාධිපතිවරිය ලෙස ක්‍රියා කළ ධූර කාලයන් දෙකෙහි දී ම මානව හිමිකම් පිළිබඳ කාරණා සඳහාත්, අධ්‍යාපන ක්ෂේත්‍රය ශක්තිමත් කිරීම උදෙසා මෙන්ම ජාත්‍යන්තර සහ කලාපීය සංවිධාන වල වැදගත් ස්ථානයක් ලබා ගැනීම

සඳහා ඇයගේ විදේශ ප්‍රතිපත්ති මාලාව තුළ සැලකිය යුතු අවධානයක් යොමුව තිබිණි. බැචලේ පෙන්වා දෙන පරිදි ආයතන වැඩිදියුණු කිරීම හා නවීකරණය කිරීම, සමාජ ප්‍රතිපත්ති සඳහා විවෘත අවකාශයන් සහ නිදහස් වෙළඳ ගිවිසුම් (Free Trade Agreements) සඳහා සාකච්ඡා කිරීම් ඇතුළුව සක්‍රීය විදේශ ප්‍රතිපත්තියක් ප්‍රවර්ධනය කිරීම සඳහා එරට උත්සාහ දරා ඇත. මේ තුළින් ඔවුන් ලබාගත් සාර්ථකත්වය නිසා ම කලාපය තුළ සහ බහුපාර්ශ්වීය ආයතන තුළ ශක්තිමත් පැවැත්මක් ස්ථාපනය කරගැනීමට චිලී රාජ්‍යය සමත්ව ඇති බව ඇය පවසා සිටින්නී ය. එමෙන් ම බැචලේගේ රජය සමයේ ද ඇය විසින් අනුගමනය කළ සියලුම ප්‍රතිපත්තීන් සහ වැඩපිළිවෙලවල් චිලී රාජ්‍යය ඒ වන විටත් ලබා සිටි සාර්ථකත්වය තව තවත් සහතික කිරීමට හේතු වී ඇත.

**පළමු ධූර කාලය**

බැචලේ ජනාධිපති ධූරයට පත් වූ පළමු වසර තුළ ඇයට දැඩි අභියෝග එල්ල වූයේ චිලී රාජ්‍යයේ අසල්වැසි රාජ්‍යයන් වන ආර්ජන්ටිනාවෙන් හා පේරු රාජ්‍යයන් වලිනි. ආර්ජන්ටිනාව මගින් චිලී වෙත අපනයනය කරන ස්වාභාවික ගෑස් සඳහා අපනයන තීරු බදු වැඩි කිරීමට එරට ජනාධිපති නෙස්තොර් කිර්චනර් (Néstor Kirchner) නියෝගයක් නිකුත් කිරීමත් සමඟ ඊට විරෝධය පාමින් බැචලේ විසින් ඔහු වෙත 2006 ජූලි මාසයේ දී විරෝධතා ලිපියක් යැවී ය. ඒ, මෙමගින් 1996 දී එවකට දෙරටේ ජනාධිපතිවරුන් විසින් ස්වාභාවික වායු අපනයනය පිළිබඳව අත්සන් තබන ලද ද්විපාර්ශවික අවබෝධතා ගිවිසුමක් උල්ලංඝනය වූ ලෙස දක්වමිනි.

එමෙන් ම මේ සමඟ ම කාලාන්තරයක පටන් ආර්ජන්ටිනාව හා චිලී දේශය අතර පවතින දේශසීමා අර්බුදයක් නැවත පණ ගැනිනි. එනම් පැටගෝනියා (Ptagonia) දේශසීමාවේ කොටස් කිහිපයක සීමා නිර්වචනය කිරීම සඳහා 2006 දී ආර්ජන්ටිනා ජනාධිපති නෙස්තොර් කිර්චනර් විසින් මිෂෙල් බැචලේට කළ ආරාධනයට ඇයගේ රජය විසින් පිළිතුරු ලබා නො දීමත් සමඟ යි. ඒ අනුව ආර්ජන්ටිනාව විසින් දකුණු පැටගෝනියානු අයිස් පිටිය (The Southern Patagonian Ice Field) ආර්ජන්ටිනාවට අයත් බව පෙන්වමින් ඇතැම් සංචාරක සිතියම් ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව මෙම දේශසීමා අර්බුදය නැවත මතු විය. එම වසරේදීම, චිලී රාජ්‍යය විසින් දකුණු පැටගෝනියානු අයිස් පිටිය ආර්ජන්ටිනාවේ විශාල ප්‍රදේශයක් සමඟ සම්බන්ධ වී

ඇති බව දැක්වෙන සංචාරක සිතියම් පිළිබඳව පැමිණිලි කරමින් ආර්ජන්ටිනාව වෙත සටහනක් යවා ඇත.

පේරු රාජ්‍යය සමඟ ද චිලී දේශයට දේශසීමා අර්බුද පැවතී තිබේ. 2007 මුල් භාගයේ දී පේරු රාජ්‍යය විසින් චිලී රාජ්‍යය තම හවුල් මුහුදු සීමාව ඒකපාර්ශවිකව නැවත නිර්වචනය කළ බවට චෝදනා කළේ ය. 2007 අගෝස්තු මාසයේ දී චිලී රාජ්‍යය තමන්ගේ ස්වෛරී භූමි ප්‍රදේශයක් ලෙස සළකා තිබූ පැසිෆික් සාගරයේ කොටසක් පේරු රාජ්‍ය මගින් එරටට අයත් කොටසක් ලෙස දක්වමින් රාජ්‍ය නිල සිතියමක් ප්‍රකාශයට පත් කිරීමත් සමඟ චිලී රජය පේරු රාජ්‍යයට එරෙහිව විධිමත් රාජතාන්ත්‍රික විරෝධතාවක් (Formal Diplomatic protest) ගොනු කර සිය තානාපතිවරයා නැවත තම මව් රටට කැඳවා ගන්නා ලදී. මේ ක්‍රියාව සම්බන්ධයෙන් පේරු රාජ්‍යය චෝදනා කර සිටියේ, එය මෙම ආරවුල හේග් හි ජාත්‍යන්තර අධිකරණය (International Court of Justice in the Hague) වෙත ගෙන යෑමේ සැලසුමේ තවත් එක් පියවරක් ලෙස යි. ඒ අනුව 2008 දී පේරු රාජ්‍යයේ ඉල්ලීම පරිදි අධිකරණය විසින් බැචලේගෙන් ඉල්ලා සිටියේ චිලී රාජ්‍යයේ තානාපති තම රටට  ගෙන්වා නැවත සාකච්ඡා කරන ලෙස යි. කෙසේ වෙතත් 2008 මැයි 28 වන දින ජාතිය ඇමතීමේ දී කළ කතාවක පේරු හා චිලී රාජ්‍යයන් අතර සබඳතා පිළිබඳව අදහස් දක්වමින් බැචලේ කියා සිටියේ, "අප වෙන් කරනා දෙයට වඩා බොහෝ දේ අප එකතු කරයි. අපි එකම සාගරය දෙස බලා සිටින අතර අපගේ මිනිසුන්ගේ පැවැත්ම උදෙසා වන එක ම ආශාව ද බෙදා හදා ගනිමු" යනුවෙනි. ඒ අනුව 2009 වසරේ දී දෙරට අතර නිදහස් වෙළඳ ගිවිසුමක් බලාත්මක වීම දෙරටේ ද්විපාර්ශවීය සබඳතා වල වැදගත් සන්ධිස්ථානයකි. එමෙන් ම දෙරට අතර ආයෝජන ප්‍රවර්ධනය මෙන් ම ආරක්ෂණය හා ද්විත්ව බදු පිළිබඳව ආර්ථික අනුපූරක ගිවිසුම් {Economic Complementation Agreements(ACE 38), of Promotion and Protection of Investments and Double Taxation} අත්සන් තැබීම ද්විපාර්ශවීය ආර්ථික හා වාණිජ සබඳතා වල සැලකිය යුතු ප්‍රගතියක් පෙන්නුම් කළේ ය.

බොලිවියාව සමඟ ද මේ සමයේ දී ගැටලුකාරී සබඳතා වැඩි දියුණු විය. ඊට පි ළිතුරු වශයෙන් බැචලේ එරට ජනාධිපති එවෝ මොරාලෙස්ට (Evo Morales) සිය සමාරම්භක උත්සවයට සුහදශීලී ආරාධනයක් කළා ය. ඇගේ කාලය අවසානයේ දී

මොරාලෙස්, බැචලේගේ උපදෙස් හා මිත්‍රකම ගැන ප්‍රසිද්ධියේ ස්තුති කළ අතර ඔහු ඇයගෙන් බොහෝ දේ ඉගෙන ගත් බව ද පැවසී ය.

එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ වසර දෙකක් සඳහා ස්ථිර නො වන ආසන 5ක් තෝරා පත් කර ගැනීම උදෙසා 2006 දී පැවැති එක්සත් ජාතීන්ගේ 61 වන මහා මණ්ඩල සැසිවාරයේ දී ලතින් ඇමරිකානු සහ කැරිබියානු ආසන සඳහා වෙනිසියුලාව සහ ගෝතමාලාව අතර වූ තරඟයේ දී චිලී රාජ්‍යය සතු වූ ඡන්දය තීරණාත්මක එකක් විය. එය බැචලේ වෙත එල්ල වූ පරීක්ෂණයක් බඳු විය. කෙසේ වෙතත් මේ ආසන පිළිබඳ ගැටලුව චිලී හි ප්‍රධාන මතවාදී ගැටළුවක් දක්වා වර්ධනය වන්නට හේතු වී තිබිණි. මාස ගණනාවක් මුළුල්ලේ ම එක් රටක් තම ඡන්දය ලබාදීම සඳහා ඒකමතිකව තෝරා පත් කර ගත නො හැකි වූ කල ඡන්ද විමසීමට පෙර දිනයේ දී තම රාජ්‍ය ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටින බවට බැචලේ ප්‍රකාශයක් නිකුත් කළා ය. මෙය මහත් ආන්දෝලනයට තුඩු දුන් තීරණයක් විය.

චිලී රාජ්‍යයේ මතභේදාත්මක ගැටලුවක් බවට පත්ව තිබෙන සරණාගත අර්බුදය සඳහා බැචලේ විසින් ඇයගේ පළමු ධූර කාලයේ දී එනම් 2007 දී පිළියමක් ලෙස වෙනත් ලතින් ඇමෙරිකානු රටවලින් ලේඛන නොමැතිව චිලී රාජ්‍යයට සංක්‍රමණය වන විදේශීය සංක්‍රමණිකයින් 50,000කට ආසන්න ප්‍රමාණයකට සෙත සැලසෙන පරිදි පොදු සමා කාලයක් සම්මත කළා ය. 2008 මැයි මාසයේ දී දකුණු ඇමරිකානු ජාතීන්ගේ සංගමයේ (Union of South American Nations- Unasur) ප්‍රථම ප්‍රධානියා ලෙසත් නියෝජිතයා ලෙසත් එනම් “President Pro Tempore” ලෙස බැචලේ පත් විය. ඇය මෙම සංවිධානය ලතින් ඇමෙරිකානු රටවල පොදු අභියෝගයන්ට සාර්ථකව මුහුණ දීමටත්, කලාපීය ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලිය වේගවත් කිරීමටත්, කලාපයේ ආර්ථික සංවර්ධනය සඳහා උත්ප්‍රේරකයක් ලෙස ක්‍රියා කිරීමටත් වැදගත් මෙන් ම අත්‍යාවශ්‍ය විශාල ඉදිරි පියවරක් වන බව පෙන්වා දුන්නා ය. 2008 වසරේ ම සැප්තැම්බර් මාසයේ දී බොලීවියානු ජනාධිපති ඉවෝ මොරාලෙස් ඔහුට එරෙහි කුමන්ත්‍රණයක් පිළිබඳව අනතුරු ඇඟවීමත් සමඟ බැචලේ විසින් දකුණු ඇමරිකානු ජාතීන්ගේ සංගමයේ හදිසි සමුළුවක් කැඳවා බොලීවියාවේ අභ්‍යන්තර කටයුතු පිළිබඳව සොයා බැලීමට සහ මැදිහත්වීමට කොමිෂන් සභා දෙකක් බොලීවියාවට යැවීම සඳහා එකඟ විය.

බැචලේ විසින් ස්ථාපිත කරන ලද "බෙකාස් චිලී" (Becas Chile) වැඩසටහන එරට අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ක්‍රියාත්මක කළ දූරදර්ශී වැඩසටහනකි. මෙය චිලී හි දහස් ගණන් සිසුන්ට ලොව පුරා විශ්වවිද්‍යාල වල බලශක්ති, ජෛව තාක්‍ෂණය, තොරතුරු තාක්‍ෂණය, පරිසරය, සෞඛ්‍ය, අධ්‍යාපනය, විද්‍යාව සහ ඉංජිනේරු විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි හැදෑරීම සඳහා චිලී රජය විසින් අනුග්‍රහය දක්වන ශිෂ්‍යත්ව වැඩසටහනකි. 1963 දී ආරම්භ වී ඉන් දශකයකට පසු හමුදා කුමන්ත්‍රණයක් නිසා අත්හිට වූ චිලී-කැලිෆෝනියා (Chile- California) ගිවිසුම නැවත ස්ථාපිත කිරීමේ මූලික බලවේගය වූයේ ද බැචලේ ය. මෙම නව සබඳතාව තුළින් කෘෂිකර්මාන්තය, අධ්‍යාපනය, පුනර්ජනනීය බලශක්තිය, ජල සම්පත් කළමනාකරණය සහ මහාමාර්ග ප්‍රවාහන වැනි ක්ෂේත්‍රයන් හි චිලී සහ කැලිෆෝනියාව අතර තාක්‍ෂණික සහයෝගීතාව නැවත වරක් ප්‍රවර්ධනය කෙරිනි.

2009 පෙබරවාරි මාසයේ දී කියුබාවේ පැවැති 18 වන ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනයේ ප්‍රධාන ආරාධිතයා බවට පත්වෙමින් තෙදින නිල සංචාරයක් සඳහා කියුබාවට පිටත්ව ගිය බැචලේ දෙරට අතර සබඳතා වසර 37 කට පසු අලුත් කළා ය. එහිදී ප්‍රධාන වශයෙන් ම ඇය ඇමරිකා එක්සත් ජනපදය විසින් කියුබාවට එරෙහිව පනවා තිබූ ආර්ථික සම්බාධක අවසන් කළ යුතු බව ඇමරිකා එක්සත් ජනපදයට බල කර කියා සිටියා ය. මේ සංචාරය අතරතුර දී බැචලේ විසින් කියුබාව සමඟ ජෛව තාක්ෂණය ඇතුළු ක්ෂේත්‍ර ගණනාවක සහයෝගිතා ගිවිසුම් අත්සන් කිරීමට පෙළඹුණා ය. එමෙන් ම පසුගිය දශක දෙක පුරාවට දෙරට අතර වැඩි වැඩියෙන් තීව්‍ර වූ දේශපාලනික හා ආර්ථික සබඳතා තවදුරටත් ශක්තිමත් කිරීමටත්, අධ්‍යාපන ශිෂ්‍යත්ව අවස්ථා උදා කිරීමටත් මේ ගිවිසුම් හේතු කාරණා විය. මේ කාලයේ දීම 1962 දී ඇමෙරිකානු ජනපද සංවිධානයෙන් (Organization of American States) පලවා හැරි කියුබාව නැවත ඊට ඇතුළත් කර ගැනීම සඳහාත්, රියෝ කණ්ඩායම (Rio Group) තුළ කියුබාවට පූර්ණ සාමාජිකත්වය ලබා ගැනීම සඳහාත් චිලී දේශය උපකාරී විය.

2009 මාර්තු මාසයේ දී ජී 20 (G20) සමුළුවට පෙර පවත්වන ලද "ප්‍රගතිශීලි නායකයන්ගේ සමුළුව" (Progressive Leaders Summit) සඳහා සත්කාරකත්වය ලබා දීම බැචලේ ඇතුළු චිලී රාජ්‍යය සඳහා භාර විය. මේ සමුළුව බ්‍රිතාන්‍යයේ, ඇමරිකා එක්සත් ජනපදයේ, ස්පාඤ්ඤයේ, උරුගුවේ, ආර්ජන්ටිනාවේ සහ බ්‍රසීලයේ

දේශපාලන නායකයින්ගේ සහභාගීත්වයෙන් පැවැත්වුණු අතර එහිදී ගෝලීය මූල්‍ය අර්බුදයට විසඳුම් සාකච්ඡා කිරීම මූලික පරමාර්ථය විය. බැචලේ විසින් රටවල් කිහිපයක් සමඟම කලාපය තුළ හා ඉන් පිටත නිදහස් වෙළඳ ගිවිසුම් වලට එළඹ ඇත. ඒ අතර 2006 අගෝස්තු මාසයේ දී චීනය සමඟ පෙර අත්සන් කර තිබූ නිදහස් වෙළෙඳ ගිවිසුමක් ඇය විසින් ප්‍රසිද්ධියේ ප්‍රකාශයට පත් කළ අතර මෙය චීනය විසින් ලතින් ඇමෙරිකානු රාජ්‍යයක් සමඟ ඇති කරගත් පළමු ගිවිසුම යි. එමෙන් ම 2007 අගෝස්තු මාසයේ දී ජපානය සහ ඉන්දියාව සමඟ ද මෙයට සමාන ගිවිසුම් ප්‍රකාශයට පත් කරන ලදී. එමෙන් ම චිලී හි හිටපු ජනාධිපති රිකාඩෝ ලාගෝස්ගේ (Ricardo Lagos) නායකත්වය යටතේ නවසීලන්තය, සිංගප්පූරුව, බෲනෙයි සහ ට්‍රාන්ස්-පැසිෆික් උපායමාර්ගික ආර්ථික හවුල්කාරිත්වය (The Trans-Pacific Strategic Economic Partnership Agreement) සමඟ අත්සන් කර තිබූ බහුපාර්ශ්වීය වෙළඳ ගණුදෙනුවක් බැචලේ විසින් ප්‍රසිද්ධියේ ප්‍රකාශයට පත් කරන ලදී. එමෙන් ම බැචලේ විසින් ඕස්ට්‍රේලියාව, වියට්නාමය, තුර්කිය, සහ මැලේසියාව ඇතුළු කලාපයෙන් පිටත රටවල් සමඟ ද නිදහස් වෙළඳ ගිවිසුම් වලට එළඹීම සඳහා සාකච්ඡා පැවැත්වූවා ය. එමෙන් ම කලාපීය වශයෙන් ඇය පැනමා, පේරු සහ කොලොම්බියාව සමඟ ද්විපාර්ශවික නිදහස් වෙළඳ ගිවිසුම් සඳහා අත්සන් තැබුවා ය.

2009 දෙසැම්බර් මාසයේ දී චිලී දේශයට ආර්ථික සහයෝගිතාව හා සංවර්ධනය සඳහා වූ සංවිධානය (The Organisation for Economic Co-operation and Development - OECD) හා සම්බන්ධ වීමට ආරාධනයක් ලැබෙන්නේ, එරට දකුණු ඇමෙරිකාවෙන් ම ඒ සඳහා සුදුසුකම් ලබන පළමු රට බවටත්, මෙක්සිකෝවට පසුව ලතින් ඇමරිකාවෙන් සුදුසුකම් ලබන දෙවන රට බවටත් පත්වෙමින් ය. එහිදී ආර්ථික මූල්‍ය අර්බුදය පිළිබඳ සාකච්ඡාවට අමතරව චිලී හි මුදල් ඇමති අන්ද්‍රේස් වෙලාස්කෝ (Andrés Velasco) විසින් සංවිධානයට ඇතුළත් වීමේ ක්‍රියාවලියේ පියවරක් ලෙස "වරප්‍රසාද සහ මුක්තීන් පිළිබඳ ගිවිසුමක්" ද (Protocol Privileges and Immunities) අත්සන් කළේය.

**දෙවන ධූර කාලය**

ඇයගේ දෙවන ධුර කාලය තුළ පළමු දෙ වසරෙන් පසුව, 2015 ඔක්තෝබර් 5 වන දින කෙටුම්පත් කරන ලද ට්‍රාන්ස්-පැසිෆික් හවුල්කාරිත්ව ගිවිසුම (The Trans-Pacific Partnership-TPP) අත්සන් කිරීම වැනි පැහැදිලි සාර්ථකත්වයන් කිහිපයක් අත්පත් කර ගත් අතර එය "චිලී රාජ්‍යයේ අභිලාෂයන් ආරක්ෂා කරගැනීමේ ජයග්‍රහණය" ලෙස බැචලේ විසින් හඳුන්වා දෙන ලදී. 2018 මාර්තු 8 වෙනිදා, චිලී දේශය ආසියා පැසිෆික් කලාපයේ තවත් රටවල් 10ක් සමඟ ට්‍රාන්ස්-පැසිෆික් හවුල්කාරිත්වය සඳහා වූ පුළුල් හා ප්‍රගතිශීලී ගිවිසුම (Comprehensive and Progressive Agreement for Trans-Pacific Partnership -CPTPP ) අත්සන් කරන ලදී. මෙය ආසියා පැසිෆික් කලාපයේ ඇති විශාලතම වෙළඳ ගිවිසුම වන අතර එය ලෝකයේ තුන්වන විශාලතම ආර්ථික ගිවිසුම යි.



*මිෂෙල් බැචලේ 2009 දී ආර්ථික සහයෝගිතාව හා සංවර්ධනය සඳහා වූ සංවිධානය අමතමින්*

## එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳව මහකොමසාරිස්වරිය ලෙස පත් වීමේ ගමන් මඟ

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහලේකම් ඇන්ටෝනියෝ ගුටරෙස් ( António Guterres) මහා මණ්ඩල අනුමැතියෙන් පසුව මිෂෙල් බැචලේ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහකොමසාරිස්වරිය ලෙස පත් කළේ ය. 2018 අගෝස්තු 10 වෙනි දා තනතුරෙන් නික්ම ගිය එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් සෙයිඩ් රාද් අල් හුසේන් (Zeid Ra’ad Al Hussein) විසින් ඔහු වෙනුවට මිෂෙල් බැචලේ පත් කිරීම ඉතා සාදරයෙන් පිළිගත්තේ ය. ඔහු කියා සිටියේ ධෛර්යය, නො පසුබට උත්සාහය, ආශාව සහ මානව හිමිකම් කෙරෙහි ගැඹුරු කැපවීම ආදිය සියලු ලක්ෂණ ඇයට ඇති බව ය.

1990 දශකයේ මුල් භාගයේ සිට බැචලේ බොහෝ ජාත්‍යන්තර සංවිධාන සමඟ සමීපව කටයුතු කළා ය. එමගින් ඇයට ජාත්‍යන්තර පද්ධතිය තුළ ක්‍රියාකාරිත්වය පිළිබඳ මනා අවබෝධයක් ලබා ගැනීමට හැකි විය. ඇය 2010 වසරේ දී ආර්ථිකය, ආරක්ෂාව සහ සමාජ සහජීවනය උත්තේජනය කිරීම සඳහා ලෝක කම්කරු සංවිධානය (International Labor Organization-ILO) සහ ලෝක සෞඛ්‍ය සංවිධානය (World Health Organization-WHO) ඒකාබද්ධව ආරම්භ කළ මූලික සමාජ ආරක්ෂණ උපදේශක කණ්ඩායමේ (Protection Floor Advisory Group) ප්‍රධානත්වය දැරී ය.

එමෙන් ම ඇය ජාත්‍යන්තර කාන්තා හා ගැහැණු ළමයින්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් සටන් කිරීම සඳහා කැප වූ සංවිධානයක් වන එක්සත් ජාතීන්ගේ කාන්තා සංවිධානයේ (UN Women) ප්‍රථම අධ්‍යක්ෂවරිය ලෙස එම වර්ෂයේ දීම නම් කෙරිණි. ඒ අනුව යමින් ඇය කාන්තාවන්ගේ ආර්ථික සවිබල ගැන්වීම සහ කාන්තාවන්ට එරෙහිව හිංසනය නැවැත්වීම ප්‍රමුඛ කාර්යභාරය ලෙස සැලකුවා ය. ඇය ස්ත්‍රී පුරුෂ සමාජ ශූරයකු (Gender Champion) ලෙස පෙනී සිටි අතර එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහකොමසාරිස් කාර්යාලය (Office of the United Nations High Commissioner for Human Rights-OHCHR) නියෝජනය කරමින් ජාත්‍යන්තර වේදිකාවල දී ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ඉහළ නැංවීම සඳහා මෙස ගර්ජනාවක් බඳු ව ජාත්‍යන්තර පොර පිටියට අවතීර්ණ විය.

ජනාධිපතිනිය ලෙස ඇගේ දෙවන වාරය 2018 මාර්තු මාසයේ දී අවසන් කිරීමෙන් පසු, රටවල් 192ක සහභාගීත්වයෙන් පිහිට වූ සංවිධාන 1000කට අධික සංඛ්‍යාවකගේ එකතුවක් වූ  මාතෘ, අලුත උපන් සහ ළමා සෞඛ්‍ය සඳහා හවුල්කාරිත්වයේ (Partnership for Maternal, Newborn and Child Health) සභාපතිනිය ලෙස ඇය නම් කරන ලදී.  ඉන් අනතුරුව සෑම කාන්තාවක් හා සෑම දරුවෙකු සඳහා ම ඉහළ පෙළේ මෙහෙයුම් කණ්ඩායමේ (The High-Level Steering Group for Every Woman Every Child) සම සභාපති ලෙස ද  ඇය පත් විය. අවසානයේ "තොටිල්ල පදවන අත ලොව පාලනය කරයි" යන වග සනාථ කරමින් බැචලේ 2018 සැප්තැම්බර් 1 දින එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමසාරිස්වරිය ලෙස සිය තනතුර භාර ගත්තා ය. අද වන විට ඇය චීනය, සෞදි අරාබිය, වෙනිසියුලාව හා ශ්‍රී ලංකාව මෙන් ම ඇගේ මව්බිම වන චිලී රාජ්‍යයට එරෙහිව පවා ඉතා ප්‍රබල වාර්තා ඉදිරිපත් කරමින් මානව හිමිකම් වෙනුවෙන් පෙනී සිටිමේ දැවැන්ත කාර්යභාරයක නිරතව සිටියි.

## <u>ගත හැකි ආදර්ශ</u>

ලෝක දේශපාලන තුළ ආදර්ශවත් කැපී පෙනෙන විශිෂ්ට නායිකාවක් ලෙස මිෂෙල් බැචලේ ප්‍රකට ය. ඇයගේ දේශපාලන ජීවිතය තුළ පමණක් නොව පෞද්ගලික ජීවිතය තුළින් ද ගම්‍යමාන වන්නා වූ විශිෂ්ටත්වය ලෝක දේශපාලනය තුළ අවධානය දිනා ගැනීමට සමත් වී ඇත. වර්ෂ 2002 දී ඇය චිලී රාජ්‍ය  ආරක්ෂක අමාත්‍යාංශයට  නායකත්වය දුන් පළමු කාන්තාව බවට පත් වීම තුළින් ඇය තුළ ඇති ශක්තිමත් බව, මනා මෙහෙයවීමේ හැකියාව හා නායකත්වය විශිෂ්ට ලෙස පෙන්නුම් කරයි.

කාන්තාවක් ලෙසට ජනාධිපති ධූරයක් හෙඹවීම තුළින් ගම්‍යමාන වන්නේ ඇය ශක්තිමත්, ඕනෑම අභියෝගයකට මුහුණදීමට සූදානම් චරිතයක් බවයි. ලෝක දේශපාලනය තුළ කාන්තාවන්ට නායකයෙකු ලෙස කටයුතු කිරීම අතිශයින් අභියෝගකාරී කර්තව්‍යයකි. එවන් වූ අභියෝගයක් සඳහා මුහුණ දීම තුළින් ඇයගේ පෞරුෂත්වය සහ  විශිෂ්ටත්වය මනාව පෙන්නුම් කරයි.

ස්ථිර දැක්මක් හා අරමුණක් තිබූ ඇය රටේ දුප්පතුන්ගේ අවශ්‍යතා සපුරාලීමටත්, කාන්තාවන්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීමටත්, විශ්‍රාම වැටුප් ක්‍රමය ප්‍රතිසංස්කරණය කිරීමටත් කටයුතු කළ අතර ආගමික අංශය කෙරෙහි ද වැඩි අවධානයක් ලබා දෙන ලදී. ඇය දික්කසාද වූ තිදරු මවක් නමුත්, දැඩි මානසික ශක්තියකින් තම රාජකාරිය හරියාකාරව ඉටු කළේ ඇය තුළ තිබූ විශ්වාසය නිසාවෙනි. ඇය ජනාධිපති ලෙස දිවුරුම් දීමෙන් අනතුරුව මාස කිහිපයකට පසුව රට තුළ අස්ථාවර ස්වභාවයක් මතු වූ අතර සිසුන්, කම්කරුවන් විසින් විවිධ වූ උද්ඝෝෂණ හා වර්ජන දියත් කරන ලදී. මෙතෙක් ඇය ගොඩනඟාගෙන තිබූ ජනප්‍රියතාවය මේ තත්වය තුළ කෙමෙන් කෙමෙන් පහව ගිය ද උත්සාහය හා තම අරමුණ අත් නොහළ ඇය අඛණ්ඩව තම පාලනය ගෙන ගියා ය.

තම නො පසුබට උත්සාහය නිසා ඇති වී තිබූ මූල්‍ය අර්බුදය සමනයට පත් කරමින් ඇය දරිද්‍රතාවය අවම කිරීම හා මුල් ළමාවිය අධ්‍යාපනය වැඩිදියුණු කිරීම යන ක්‍රියාවලීන් තුළ ගෞරවාදරයට පාත්‍ර විය. තම ධුර කාලය අවසන් වීමෙන් පසුව ද රාජ්‍යයේ සුබසිද්ධිය තකා ම වැඩකටයුතු කළ අග්‍රගණ්‍ය නායිකාවක් ලෙස මිෂෙල් බැචලේ සැලකිය හැකිය. මන්ද යත් ඇයගේ ධුර කාලය නිම වීමෙන් අනතුරුව ද ඇය සිදුකළ සමාජ කර්තව්‍යයන් හේතුවෙන් 2010 වර්ෂයේ දී පිහිටුවන ලද එක්සත් ජාතීන්ගේ කාන්තාවන්ගේ ආයතනයේ (The United Nations Entity for Gender Equility and the Empowerment of Women) ඇය ප්‍රධානියා බවට පත් කිරීමට ලෝක නායකයින් ක්‍රියා කළේ එබැවිනි.

තම ධූරකාලය තුළ නිසි ලෙස සේවය ඉටු නො කරන පාලකයින් සිටින වකවානුවක් තුළ මෙවන් වූ චරිත මුළු මහත් ලෝකයට ම මහත් ආදර්ශයකි. කාන්තාවක් යයි නො සිතමින් තමාට පැමිණි බාධක, අභියෝග සම සිතින් විඳ දරා ගනිමින් ඒ සියල්ලට ම නො බියව, නො පැකිළව හා සාර්ථකව මුහුණ දෙමින් කටයුතු කළ ඇය, මුළු මහත් ලෝක වාසී ජනතාවට ම ශ්‍රේෂ්ඨ ආදර්ශ ලබා දුන් අගනා චරිතයකි. රාජ්‍ය තුළ පවතින සියලුම ගැටලු දෙස දේශපාලනික දෘෂ්ටියෙන් පමණක් නොව, මානුෂික හදවතින් බලා ඒවාට නිසි පිළියම් ලබාදුන් බැචලේ තුළ පෘථුල දේශපාලන හා සමාජ දැනුමක් තිබිණි. තමා සතු දැනුම සහ දැක්ම උපයෝගී කරගනිමින් කුමන අසීරු අවස්ථාවක දී වුව ද, තම රාජ්‍යයට සහ පුරවැසියන් හට යහපත සහ සාර්ථකත්වය ළඟා කරදීමට බැචලේ සමත් විය. තමන්ට අහිමි වූ ජනප්‍රියතාවය පවා නැවතත් ඇය වෙත ළඟා වූයේ තම අනුගාමිකයින්ට මෙන් ම සමකාලීන නායකයින්

හට නිරන්තරයෙන් ම ආදර්ශවත් නායිකාවක් වූ නිසාවෙනි. කාන්තාවක් ලෙසට ඇය අවස්ථානුකූලව කටයුතු කරමින් තම රාජ්‍යය තුළ දේශපාලනික මෙන් ම ආර්ථික වශයෙන් ඇති වී තිබූ අස්ථාවරත්වය තුරන් කිරීමට කටයුතු කළා ය. තම පාලන කාලයන් තුළ විවිධ වූ අභියෝගවලට මෙන් ම මානසික අවපීඩනයන්ට මුහුණ දුන් ඇය මුළු මහත් ලෝකවාසී ජනතාවට ම පෙන්වූයේ "කාන්තාවක් වුව ද, පුරුෂයෙක් වුව ද තමා තුළ ශක්තිමත් දැක්මක්, නො සැලෙන මනසක් තිබේ නම් කළ නො හැක්කක් නැති තරම්, යන්නයි". පෞද්ගලික ජීවිතය තුළ මෙන් ම දේශපාලන ජීවිතය තුළ ද ශක්තිමත් චරිතයක් ලෙස කටයුතු කළ ඇය කිසිවිටෙකත් තම පෞද්ගලික ජීවිතයේ තිබූ ප්‍රශ්න දේශපාලන ජීවිතයට නො ගනිමින්, අවස්ථානුකූලව ක්‍රියා කරමින්, නො පසුබස්නා වීර්යයෙන්, නො සැලෙන මනසකින්, ශක්තිමත් දැක්මකින්, ඒකායන අරමුණකින් සමාජයේ ප්‍රගමනය වෙනුවෙන් කටයුතු කළ අප්‍රතිහත ධෛර්යයකින් යුක්ත ආදර්ශවත්, ප්‍රබල කාන්තා චරිතයකි.



*නිතරම සිනාමුසු මුහුණෙන් සිටි ඇය ඉතා නිහතමානී චරිතයක් විය*

## සාරාංශය

1951 සැප්තැම්බර් 29 වන දින චිලී රාජ්‍යයේ සැන්තියාගෝ හි උපත ලද මිෂෙල් බැචලේ චිලී හි සේවය කළ අග්‍රගණ්‍ය නායිකාවකි. චිලී රාජ්‍යයේ ප්‍රථම ජනාධිපතිනිය වූ ඇය පළමු ලතින් ඇමරිකානු කාන්තා ජනාධිපතිවරිය ද වූ අතර 2006 - 2010 සහ 2014 - 2018 වශයෙන් අවස්ථා දෙකක දී ජනාධිපති ධූරය හෙබවීය. 2002 වර්ෂයේ දී එරට සෞඛ්‍ය අමාත්‍යවරිය මෙන් ම චිලී සහ ලතින් ඇමරිකාවේ ප්‍රථම කාන්තා ආරක්ෂක අමාත්‍යවරිය ලෙස ද කටයුතු කළා ය. තම ජනාධිපති ධූරකාලය තුළ සියලුම දෙනාගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම උදෙසා කටයුතු කළ බැචලේ ශ්‍රේෂ්ඨ නායිකාවක පමණක් නොව, තම දරුවන්ට ද ආදර්ශවත්, දයාබර මවක් වූවා ය. ඇය විසින් කළ සේවාවන් අතර අධ්‍යාපනය නඟා සිටුවීම, බදු ප්‍රතිසංස්කරණ සහ මානව හිමිකම් පිළිබඳ ජාතික ආයතනය ගොඩනැඟීම මෙන් ම මතක හා මානව හිමිකම් කෞතුකාගාරය නිර්මාණය කිරීම කැපී පෙනේ. එසේ ම කාන්තා හා ස්ත්‍රී පුරුෂ සමානාත්මතා අමාත්‍යාංශය පිහිටුවීම, කාන්තාවන්ගේ දේශපාලන සහභාගීත්වය ඉහළ නැංවීම සඳහා කෝටා සම්මත කිරීම සහ සිවිල් සංගම් පනත අනුමත කිරීම, ප්‍රජාතන්ත්‍රවාදි පාලනයක් ගෙන යාම සහ එල්.ජී.බී.ටී.කියු. (lesbian, gay, bisexual, transgender and queer) අයිතිවාසිකම් ඉහළ නැංවීම යන කාරණා වැදගත් වේ. 1990 දශකයේ මුල් භාගයේ සිට බැචලේ බොහෝ ජාත්‍යන්තර සංවිධාන සමඟ සමීපව කටයුතු කර ඇත. මෙම වසරේ දී එරට ප්‍රජාතන්ත්‍රවාදයට මාරු වීමෙන් පසු ඇය සෞඛ්‍ය අමාත්‍යාංශයේ සහ ජාතික ඒඩ්ස් කොමිසම සඳහා සේවය කළ අතර පෑන් ඇමෙරිකානු සෞඛ්‍ය සංවිධානය, ලෝක සෞඛ්‍ය සංවිධානයේ ද සේවය කළා ය. 2010 දී ඇය ආර්ථික ආරක්ෂාව සහ සමාජ සහජීවනය උත්තේජනය කිරීම සඳහා වූ සමාජ ප්‍රතිපත්ති ප්‍රවර්ධනය කිරීමට උත්සාහ කළ ඒකාබද්ධ ජාත්‍යන්තර කම්කරු සංවිධානය (International Labor Organization) සහ ලෝක සෞඛ්‍ය සංවිධානය (World Health Organization) ආරම්භ කළ සමාජ ආරක්ෂණ බිම් උපදේශක කණ්ඩායමේ ප්‍රධානත්වය දැරීය. ළමා ශල්‍ය වෛද්‍ය විද්‍යාව සහ මහජන සෞඛ්‍ය පිළිබඳ විශේෂඥ වෛද්‍යවරියක් වූ ඇය, 2010 දී ජාත්‍යන්තරව කාන්තා හා ගැහැණු ළමයින්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් සටන් කිරීම සඳහා කැප වූ සංවිධානයක් වන එක්සත් ජාතීන්ගේ කාන්තා සංවිධානයේ ප්‍රථම අධ්‍යක්ෂවරිය ලෙස නම් කෙරිණි. ආර්ථික සවිබල ගැන්වීම සහ කාන්තාවන්ට එරෙහි හිංසනය නැවැත්වීම ඇයගේ පාලන කාලය තුළ වූ ප්‍රමුඛතාවයන් දෙකකි. ජාත්‍යන්තර

වේදිකාවල දී ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ඉහළ නැංවීම සඳහා කැප වූ මිෂෙල් බැචලේ වර්ෂ 2018 දී එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමසාරිස්වරිය ලෙස පත් වූ අතර එවකට එක්සත් ජාතීන්ගේ මහලේකම්වරයා වූ බෑන් කී මූන් බැචලේට පැවසුවේ, 'ඇයගේ නායකත්වය එක්සත් ජාතීන්ගේ කාන්තාවන්ට අවශ්‍ය විශිෂ්ට ආරම්භයක් ලබා දුන් බවයි.'

# මූලාශ්‍ර නාමාවලිය


Chile's Bachelet says good Bye, good riddance to 2015 - report. Google. Available at: https://www.google.com/amp/s/mobile.reuters.com/article/amp/idUKKBN0UC16E20151229 [Accessed August 15, 2021].

'Essential RIGHTS': CHILE'S President BACHELET introduces gay marriage bill. Google. Available at: https://www.google.com/amp/s/amp.theguardian.com/global-development/2017/aug/29/chile-president-michelle-bachelet-introduces-gay-marriage-bill [Accessed August 15, 2021].

Michelle Bachelet. Encyclopædia Britannica. Available at: https://www.britannica.com/biography/Michelle-Bachelet [Accessed August 15, 2021].

Ministry of Foreign affairs of Chile. *Ministry of Foreign Affairs of Chile - President Michelle Bachelet gives Public Account to the Nation and announces two new marine parks*. Available at: https://minrel.gob.cl/president-michelle-bachelet-gives-public-account-to-the-nation-and/minrel_old/2017-06-13/140421.html [Accessed August 14, 2021].

Michelle Bachelet is the former president of chile, Club MADRID MEMBER. Club de Madrid. Available at: http://www.clubmadrid.org/miembro/michelle-bachelet/ [Accessed August 15, 2021].

Michelle Bachelet. Michelle Bachelet | World Leaders Forum. Available at: https://worldleaders.columbia.edu/directory/michelle-bachelet [Accessed August 15, 2021].

Ms. Michelle Bachelet of Chile - United Nations High Commissioner for human Rights [Full announcement Following confirmation by General assembly] secretary-general. United Nations. Available at: https://www.un.org/sg/en/content/sg/personnel-appointments/2018-08-10/ms-michelle-bachelet-chile-united-nations-high [Accessed August 15, 2021].

High Commissioner - Michelle bachelet jeria. OHCHR. Available at: https://www.ohchr.org/en/aboutus/pages/highcommissioner.aspx [Accessed August 15, 2021].

Meet the new UN High Commissioner for Human Rights: Michelle Bachelet. United Nations Association. Available at: https://una.org.uk/meet-new-un-high-commissioner-human-rights-michelle-bachelet [Accessed August 15, 2021].

'Pioneering' former Chilean President Michelle BACHELET officially appointed new UN human rights Chief | | UN NEWS. United Nations. Available at: https://news.un.org/en/story/2018/08/1016782 [Accessed August 15, 2021].

2014. Life's work: Michelle Bachelet. Harvard Business Review. Available at: https://hbr.org/2011/09/michelle-bachelet [Accessed August 15, 2021].

Beryl Seiler and Ben Raderstorf | March 9, 2018, Michelle bachelet's Underappreciated legacy in Chile. Americas Quarterly. Available at: https://www.americasquarterly.org/article/michelle-bachelets-underappreciated-legacy-in-chile/ [Accessed August 15, 2021].

Bell,K.,2011. Life’s Work: Michelle Bachelet.Google.Available at: https://hbr.org/2011/09/michelle-bachelet (Accessed July 28,2021)

COLUMBIA UNIVERSITY World leaders forum, (2018). Michelle Bachelet. [Online] Available at: https://worldleaders.columbia.edu/directory/michelle-bachelet [Accessed 27 June. 2021].

Flavia, 2015. FOREIGN affairs En Español: MICHELLE BACHELET: A rendezvous with history. *Center for Latin American Studies (CLAS)*. Available at: https://clas.berkeley.edu/research/foreign-affairs-en-espa%C3%B1ol-michelle-bachelet-rendezvous-history [Accessed August 14, 2021].

Macmillan. P,(2016), Gender, Institutions, and Change in Bachelet’s Chile.Available at;
https://books.google.lk/books?id=b7TtCwAAQBAJ&dq=books+about+michelle+bachelet&hl=en&sa=X&ved(Accessed August 08,2021)

Meier.A, (2007), Michelle Bachelet(Modern World Leaders).Google. Available at: https://www.amazon.com/Michelle-Bachelet-Modern-World-Leaders/dp/0791095002 (Accessed August 05,2021)

Ministerio de Relaciones Exteriores de Chile, Bilateral relations. *Chile Abroad*. Available at: https://chile.gob.cl/peru/en/bilateral-relation/bilateral-relations/relaciones-bilaterales [Accessed August 14, 2021].

Perelló, L., 2020. Chilean President Michelle Bachelet RESHUFFLES her economic CABINET, AGAIN. Global Americans. Available at: https://theglobalamericans.org/2017/09/chilean-president-michelle-bachelet-reshuffles-economic-cabinet/ [Accessed August 15, 2021].

The editors of Encyclopaedia Britannica.(2021). Michelle Bachelet president of Chile. [Online] Britannica. Available at: https://www.britannica.com/biography/Michelle-Bachelet [Accessed 27 June. 2021].

(www.dw.com), D.W., Michelle BACHELET: From TORTURE survivor to UN human RIGHTS head: DW: 01.09.2018. DW.COM. Available at: https://www.dw.com/en/michelle-bachelet-from-torture-survivor-to-un-human-rights-head/a-45319900 [Accessed August 15, 2021].

# රෆායෙල් කොරයා




**කණ්ඩායම් සාමාජිකයන් :**

- අයි.පී.වීරසිංහ
- එල්.ආර්.ඒ.දිල්ෂානි
- ආර්.එස්.පී.රූපසිංහ
- එම්.එම්.ගයන්ති
- එස්.ජී.එම්.විජේරත්න

## හැඳින්වීම

ලතින් ඇමරිකානු දේශපාලනයේ කාර්යශූර හා අසහාය නායකයෙකු ලෙසට නම් ලත් ඉක්වදෝරයේ ජනාධිපතිවරයෙකු වූ රෆායෙල් කොරයා තම පරිපාලන කාල පරාසය තුළ තම රට වෙනුවෙන් අපරිමිත සේවයක් ඉටු කළ ගෞරවණීය පුද්ගලයෙකි. ඉක්වදෝරයේ 56 වන ජනාධිපති වූ මොහු වාමාංශික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමෙහි ලා පෙරමුණ ගත් අතර ඔහු විසින් ඉක්වදෝරය ද වාමාංශික ලතින් ඇමරිකානු රටක් බවට පත් කරන ලදි. ජාත්‍යන්තර තලය තුළ ඉක්වදෝරය යන නාමය බබළවමින් යහ පාලනයක් සමඟ පෙරගමන් කළේ ය. ධූරදර්ශී දේශපාලන නායකයෙකු වූ කොරයා ජාත්‍යන්තර දේශපාලනය තුළ ඉක්වදෝරයට නව මුහුණුවරක් ගෙන ඒමට නොපසුබට විය. එදා මෙදා තුර ඉක්වදෝරයේ පාලනය කළ නායකයන් අතර රෆායෙල් කොරයාගේ පාලන සමය දේශපාලන, ආර්ථික, සමාජීය හා අධ්‍යාපනික යනාදී සෑම ක්ෂේත්‍රයකින් ම කැපී පෙනෙන වර්ධනයක් පෙනනුම් කර ඇත.

කුඩා කල සිට දුෂ්කර දිවියක් ගත කළ රෆායෙල් කොරයා කටු කොහොල් මතින් අධ්‍යාපනයේ හිනිපෙත්තට ම ගමන් කළ අතර ආර්ථික විද්‍යා ආචාර්ය උපාධිය දක්වා ඔහු ලත් අධ්‍යාපනය ඉක්වදෝරය පීඩනයට ලක් කරමින් තිබූ ණය අර්බුදයෙන් මුදවා ගැනීම උදෙසා ප්‍රායෝගිකව යොදා ගැනීමට කටයුතු කරමින් ඔහුගේ පෞරුෂත්වය ජාත්‍යන්තරයට පෙන්වා දුන්නේ ය. ජාතික දේශපාලනය තුළ දී ඍජු තීරණවලට එළඹෙමින් රෆායෙල් කොරයා ජනතාවට පක්ෂව කටයුතු කළ ජනහිතකාමී නායකයෙකු බව පසක් කළ අවස්ථා ඔහුගේ පාලන සමය තුළ නොමැකෙන මතක සටහන් ඉතිරි කළේ ය . හියුගෝ චාවේස් (Hugo Chavez) , ඊවෝ මොරාලෙස් (Evo Morales) වැනි වාමාංශික නායකයින්ගේ ප්‍රතිපත්ති අනුගමනය කරමින් ඔවුන් සමඟ සමීප සබඳතා පැවැත්වූ කොරයා දූරදර්ශී පාලකයෙකු ලෙස ඉක්වදෝරයේ නව ඇරඹුමක් සනිටුහන් කිරීමට පියවර ගත්තේ ය.

කලාපීයව එක්සත් වීම පන්නරය කර ගනිමින් ධනවාදි මතවාදයන්ට එරෙහිව නැගී සිටි කොරයා වාමාංශික නායකයින් සමඟ හිතෛෂීව තම පාලනය ගෙන ගියේ ය. එවන් අසහාය අමරණීය පෞරුෂයක් හිමි රෆායෙල් කොරයාගේ ළමා කාලය, අධ්‍යාපන, දේශපාලන ගමන් මග මෙන් ම නායකත්වය කරා පිවිසීම, ජාත්‍යන්තර තලය සමඟ කටයුතු කිරීමේ දී අනුගමනය කළ ප්‍රතිපත්ති, ඔහුගේ පාලන

සමය තුළ ඔහු සිදු කළ අපරිමිත සේවාව සේ ම ඔහුගෙන් ගත හැකි ආදර්ශ පිළිබඳව මෙම සටහන තුළ නව මුහුණුවරකින් විග්‍රහ කරනු ලැබේ.

## ළමා කාලය, අධ්‍යාපනය, දේශපාලනයට පිවිසීම

1963 අප්‍රේල් 6 වන දින ඉක්වදෝර (Ecuador) රාජ්‍යයේ ගුවායාකිල් හි (Guayaquil) උපත ලද රෆායෙල් විසන්ට් කොරයා ඩෙල්ගාඩෝ (Rafael Vicente Correa Delgado) විසිඑක් වන සියවසේ සමාජවාදයේ මානව හිතවාදී දේශපාලන දර්ශනයකින් සිය කටයුතු මෙහෙය වන්නට සමත් වූ ප්‍රගතිශීලී දේශපාලනඥයෙක් මෙන් ම ආර්ථික විද්‍යාඥයෙකි. ඔහු ඉක්වදෝරයේ 56 වෙනි ජනාධිපතිවරයා වේ. ළමා කාලය, ඔහුගේ අධ්‍යාපනය, දේශපාලනයට පිවිසීම කොරයාගේ ජීවිත කාලයේ හැරවුම් ලක්ෂයක් බවට පත් විය.

**ළමා කාලය**

රෆායෙල් කොරයාගේ ළමා කාලය මව, පියා, සහෝදර සහෝදරියන් සමඟ දුක් කම්කටොලු මැද ජීවිතය ගත කළ අවධියක් විය. පියා රෆායෙල් කොරයා ඉකාසා (Rafael Correa Icaza) නම් වූ අතර මව නෝර්මා ඩෙල්ගාඩෝ රෙන්ඩන් (Norma Delgado Rendon) නම් විය. ඔහුට සහෝදර සහෝදරියන් ද කිහිපයකි. බර්නාඩිටා කොරයා (Bernardita Correa), ෆැබ්රිෂියෝ කොරයා (Fabricio Correa), පියරිනා කොරයා (Pierina Correa) ඒ අතර වූහ. පහළ මධ්‍යම පාන්තික පවුල් පසුබිමකින් පැමිණි කොරයා මුල් කාලයේ දී හැදී වැඩුණේ වෙරළබඩ නගරයක් වූ ගුවායාකිල් හි ය. කුඩා කල ලද ජීවන අත්දැකීම් තුළින් තම අභිමතයන් ඍජු ව ප්‍රකාශ කිරීමට ඔහු නිතර උත්සාහ කළේ ය.

**අධ්‍යාපනය**

කොරයා අධ්‍යාපනය කෙරෙහි වඩාත් ඇලුම් කළ අයෙක් වුවත් ආර්ථිකමය ප්‍රශ්න ඔහුගේ අධ්‍යාපනයට ප්‍රධාන ම බාධාව බවට පත් විය. ගුවායාකිල් හි දී ජීවත් වූ කාලයේ දී කොරයා නායකත්ව කුසලතා වර්ධනය කර ගැනීමට විවිධ වැඩසටහන්වලට නිරන්තරයෙන් සම්බන්ධ විය. රෆායෙල් කොරයාට වයස අවුරුදු

17 වන විට ඔහුගේ පවුලේ අයට මූල්‍යමය දුෂ්කරතා රැසකට මුහුණ දීමට සිදු විය. එම අභියෝගවලට මුහුණ දුන් කොරයා සිය අධ්‍යාපන කටයුතු නතර නොකළ අතර ඔහුට සිය සමීප මිතුරෙකු උදව් උපකාර කළේ ය. ඉන් පසු ද්විතීයික අධ්‍යාපනය ලබන සමයේ දී ඔහු ලසාලියානු (Lasallian) ශිෂ්‍ය සංස්කෘතික සංගමයේ සභාපතිවරයා බවට පත්විය. පසුව කොරයා ඉක්වදෝරයේ ගුවායාකිල් හි උසස් අධ්‍යාපන ආයතනයක් වන සන්තියාගෝ ද ගුවායාකිල් (Santiago de Guayaquil) කතෝලික විශ්ව විද්‍යාලයේ අධ්‍යාපනය සඳහා ශිෂ්‍යත්වයක් ලබා ගත්තේ ය. එමෙන් ම 1987 දී එම විශ්ව විද්‍යාලයෙන් ඔහු ආර්ථික විද්‍යාව පිළිබඳ උපාධියක් ලබා ගැනීමට ද සමත් විය.

සන්තියාගෝ ද ගුවායාකිල් කතෝලික විශ්ව විද්‍යාලයේ (University of Santiago de Guayaquil– UCSG) අධ්‍යාපනය ලබන අතරතුර ඔහු ආර්ථික විගණන හා පරිපාලන ශිෂ්‍ය සංගමයේ (Association of Students of Economy, Audit and Administration–AEAA) සභාපතිවරයා බවට ද පත්විය. පසුව එම අධ්‍යාපන ආයතනයේ ම ශිෂ්‍ය සම්මේලනයේ සභාපතිවරයා බවට පත්වීමට ද ඔහු සුදුසුකම් ලැබීය. 1986 දී ඉක්වදෝරයේ Private Universities Students Federation හි මුලසුන දැරීමට ඔහුට අවස්ථාව හිමි විය. සන්තියාගෝ ද ගුවායාකිල් කතෝලික විශ්ව විද්‍යාලයේ සිය අධ්‍යයන කටයුතු අවසන් කිරීමෙන් පසු කොරයා වසර 6 ක් කොටෝපැක්සි පළාතේ (Cotopaxi Province) පෙර පාසලක සේවය කළේ ය. එහි දී ඔහු කතෝලික ධර්මය හා ගණිතය ඉගැන්වීය. කතෝලික ධර්මය පිළිබඳ මිනිසුන් අතර විශ්වාසය වැඩි දියුණු කිරීමට ද ඔහු කටයුතු කළ අතර ඉක්වදෝරයේ ආදි වාසීන්ගේ භාෂාව වූ කෙචුවා භාෂාව (Quechua Language) සමාජගත කිරීමට කටයුතු කළේ ය.

පසුව ඔහු 1990 වසරේ බෙල්ජියමේ විශ්ව විද්‍යාලයක් වන කැතොලික් ද ලූවේන් විශ්ව විද්‍යාලයට (University of Catholique de Louvain) ඇතුළත් වූ අතර එහි දී 1991 ජුනි මාසයේ දී ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ගත්තේ ය. එසේ ම උර්බානා-ෂැම්පේන් (Urbana Champaign) හි ඉලිනොයිස් විශ්ව විද්‍යාලයෙන් ද (University Of Illinois) 1999 මැයි මාසයේ දී ආර්ථික විද්‍යාව පිළිබඳ තවත් ශාස්ත්‍රපති උපාධියක් ලබා ගත්තේ ය. කොරයා ජයග්‍රාහී ලෙස 2001

ඔක්තොම්බර් මස ආර්ථික විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධිය ලබා ගැනීමට ද සමත් විය. රෆායෙල් කොරයා බාධක, දුක් කම්කටොලු රැසක් මැද සිය අධ්‍යාපන කටයුතු සාර්ථක කර ගත් ධෛර්යමත් මෙන් ම ආදර්ශමත් නායකයෙකි.



*උර්බානා-ෂැම්පේන් (Urbana Champaign) හි ඉලිනොයිස් විශ්ව විද්‍යාලය (University Of Illinois)*

**දේශපාලනයට පිවිසීම**

ඉක්වදෝරයට ආපසු පැමිණි පසු කොරයා ක්විටෝ හි සැන් ෆ්‍රැන්සිස්කෝ විශ්ව විද්‍යාලයේ (University Of San Francisco in Quito) ආර්ථික විද්‍යා කථිකාචාර්යවරයෙකු ලෙස සේවය ආරම්භ කළේ ය. ඒ අතර ම ඔහු රාජ්‍යය හා ජාත්‍යන්තර ආයතනවල ආර්ථික උපදේශකවරයෙකු ලෙසට ද සේවය කළේ ය. මෙම කාලය තුළ ඉක්වදෝරය මූල්‍ය අර්බුදයකට මුහුණ දෙමින් සිටි කාල පරිච්ඡේදයක් විය. එවකට ඉක්වදෝරයේ ජනාධිපතිවරයා ලෙසින් කටයුතු කළ ජනාධිපති ජමිල් මහුවාඩ්ගේ (President of Jamil Mahuad) පාලන සමය තුළ ඉක්වදෝරියානු මුදල් ඒකකය වෙනුවට එක්සත් ජනපද ඩොලරය භාවිත කිරීම ආරම්භ කළේ ය. කොරයාගේ රජය මෙම ඩොලරීකරණ ප්‍රතිපත්තිය දැඩි ලෙස විවේචනය කළ අතර තර්ක විතර්ක ද ඉදිරිපත් කළේ ය. මේ ආකාරයට කොරයා සිය අදහස්, විවේචන, මතවාද ඉදිරිපත් කරමින් සහ ඔහුට අවශ්‍ය ප්‍රතිපත්ති අනුගමනය කරමින් දේශපාලනයට අවතීර්ණ විය.

වර්ෂ 1992 සිට 1993 දක්වා කාලය තුළ සික්ස්ටෝ ඩුරන් බැලන් (Sixto Duran Ballen) ජනාධිපති ධූර කාලය තුළ කොරයා ඉක්වදෝරයේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යංශයේ අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කළ අතර එහි දී ජාතික අධ්‍යාපන ක්‍රමය සඳහා පරිපාලන අධීක්ෂණය වැඩි දියුණු කිරීමේ වැඩසටහන් දියත් කළේ ය. 2005 දී ජනාධිපති ඇල්ෆ්‍රෙඩෝ පැලැසියෝගේ (Alfredo Palacio) රජයේ ආර්ථික හා මුදල් අමාත්‍ය ධූරයට කොරයා පත්කරන ලදි. පැලැසියෝ ජනපති වීමට පෙර ඔහුගේ උපදේශකවරයා ලෙස ද කටයුතු කර ඇත. කොරයා මුදල් අමාත්‍යවරයා වශයෙන් සිටිය දී ලතින් ඇමරිකානු ජනාධිපතිවරුන් ගණනාවක් හමු විය. ඒ අතර බ්‍රසීලයේ ලුයිස් ඉනාසියෝ ලූලා ද සිල්වා (Luiz Inacio Lula da Silva) ආර්ජන්ටිනාවේ නෙස්ටර් ක්‍රිච්නර් (Nestor Kirchner), වෙනිසියුලාවේ හියුගෝ චාවේස් (Hugo Chavez) වේ. එසේ ම ඔහු එක්සත් ජනපදය ප්‍රසිද්ධියේ විවේචනය කළ අතර එක්සත් ජනපද ජනාධිපති ජෝර්ජ් ඩබ්ලිව් බුෂ් (Jeorge W. Bush) දුර්වල පාලකයෙක් ලෙස ප්‍රකාශ කළේ ය.

ජනතාව විසින් ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අවශ්‍යය යැයි හඩනැගූ අවධියක එය ලබා දීමේ පොරොන්දුව මත කොරයා දේශපාලනයට පිවිසි අතර ජනාධිපති ධූරය සඳහා තරග කළේ ය. කොරයා දක්ෂ හා ප්‍රබුද්ධ දේශපාලන නායකයෙක් වූ අතර ප්‍රතිවාදී අපේක්ෂකයා වූ ඇල්වාරෝ නොබෝවා (Alvaro Noboa) පහසුවෙන් පරාජයට පත් කරමින් 2007 වසරේ දී ඉක්වදෝරයේ 56 වෙනි ජනාධිපතිවරයා ලෙස තේරී පත්විය. වර්ෂ 2007 දී ජනාධිපති ධූරයට පත් වූ රෆායෙල් කොරයා 2017 වසර දක්වා දෙවතාවක් ම ජනාධිපති ධූරය හෙබවීමට සමත් විය. මේ ආකාරයට ඔහු දේශපාලනයට පිවිසෙමින් සිය දේශපාලන මෙහෙවර ඉදිරියට දියත් කළ අයුරු අපූරු ය.

## <u>නායකත්වය කරා ගිය ගමන් මග</u>

ශිෂ්‍ය දේශපාලන ව්‍යාපාර හරහා වාමාංශික දේශපාලනයට මූලික අත්පොත් තැබූ රෆායෙල් කොරයා අභියෝග රාශියක් මධ්‍යයේ ජාත්‍යන්තර දේශපාලනයේ නොමැකෙන මතක සටහන් තැබූ නායකයෙකි. තම පෞද්ගලික ජීවිතයේ දී මුහුණ දුන් අභියෝග පන්නරය කොට ගනිමින් ඔහු නායකත්වය කරා ආ ගමන් මග අන්

සැමට වඩා සුවිශේෂී ස්ථානයක් ගනී. ජනතා අවධානය ඔහු කෙරෙහි යොමු වීමට එය මහත් පිටුවහලක් විය. ඔහු විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ අවසන් කාල සීමාව තුළ ස්වේච්ඡා සේවකයෙකු ලෙස ඇන්දිස් (Andes) කඳු භූමියේ පිහිටි උස් භූමීන් වල පදිංචි ව සිටි වැසියන් සමඟ එක්ව විවිධ සමාජ කටයුතුවල නිරත වූයේ ය. එහි දී ඔහු විසින් එම ප්‍රදේශයේ ජීවත් වෙමින් ස්වදේශීය භාෂාවන් මෙන් ම එම වැසියන්ගේ ජීවන රටාව පිළිබඳ ව මනා අවබෝධයක් ලබා ගන්නා ලදි. එක් එක් සමාජ පංතීන් මුහුණ දෙන්නා වූ විවිධ අභියෝගයන් හා රාජ්‍ය පාලනයේ පවතින දූෂණ හා වංචාවන් පිළිබඳ ව පෙන්වා දීමට සමත් වූ ඔහු එම ගැටළු වලට මුහුණ දුන් පිරිස හා එක්ව රෝමානු කතෝලික සංවිධානයක් පිහිටුවා ගත්තේ ය.

එමෙන් ම එය දේශපාලනික වශයෙන් රජයට බලපෑම් කිරීමට කදිම තෝතැන්නක් විය. එවන් එක් අවස්ථාවක් ලෙස ප්‍රාදේශීය වැසියන් විසින් මුහුණ දෙන්නා වූ මන්දපෝෂණය හා මූලික සෞඛ්‍ය පහසුකම් හි ඇඩි අවශ්‍යතාවය රජයට පෙන්වා දුන් අතර දේශපාලකයින්ට බලපෑම් කිරීමේ කටයුතුවල නිරත විය. 1992 වසර වන විට ආර්ථික විද්‍යා අංශයෙන් උපාධිය ලබාගත් කොරයා ඔහුගේ අධ්‍යාපන තත්ත්වය මත පදනම් වෙමින් අධ්‍යාපන අමාත්‍යංශයේ අධ්‍යක්ෂකවරයෙකු ලෙස පත්විය. එය ශිෂ්‍ය දේශපාලනයෙන් පසු නායකත්වය කරා යන ගමනේ ප්‍රබල අංගයක් විය. ඔහු එම තනතුරට සාධාරණයක් ඉටු කරමින් අධ්‍යාපන ක්ෂේත්‍රයේ නව ප්‍රතිසංස්කරණ රාශියක් ඉදිරිපත් කරමින් ජනතාවගේ ගෞරවයට පාත්‍රවිය. දීර්ඝ කාලීනව වාමාංශික ව්‍යාපාර හා ගැටුණු කොරයාගේ දේශපාලනික අදහස් හා පරිපාලකයෙකු ලෙස කටයුතු කිරීමෙන් ලත් අත්දැකීම් ඔහුට දේශපාලන නායකත්වය කරා යාමට අවශ්‍ය මගහසර විවර කළේ ය. ඔහු 2002 වසරේ දී වාමාංශික ව්‍යාපාරයේ නිරත වූ අතර ඉක්වදෝරයේ ඛනිජ තෙල් අපනයන හා බැඳි නව යෝජනා ද ඉදිරිපත් කළේ ය.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ උපදෙස් මත එවකට ඉක්වදොරයේ තෙල් ආදායම එකතු කර බෙදා හැරීම සඳහා නව අරමුදලක් පිහිටු වීමට කටයුතු කළේ ය. එම ප්‍රතිසංස්කරණ හරහා සියල්ලන්ට ම ඒවා සමානව බෙදී යා යුතු බව ඔහුගේ අදහස විය. එකල ඉක්වදෝරයේ ජනගහනයෙන් අඩකට වඩා දරිද්‍රතාවයේ ගිලී සිටියේ ය. කොරයා අවධාරණය කළේ එම බලපෑම් අවම කිරීම පිණිස රජය විසින් සමාජයීය ප්‍රවර්ධන වැඩසටහන් දියත් කළ යුතු බව ය. නමුත් ඉක්වදෝරයේ දේශපාලන අස්ථාවරත්වයක් පවතින බව පිළිබිඹු වූ අතර එම කාල පරාසයේ දී පාලකයින් දෙදෙනෙකුට තම තනතුරු වලින් ඉවත් වීමට සිදුවිය. ඊට පසුබිම නිර්මාණය කළේ

ගොඩ නැගෙමින් තිබූ සමාජ බලවේග හා සමාජ සංස්කෘතික අභියෝගයන් ය. ඉන් පසුව බලයට පැමිණි පැලැසියෝ (Palacio) ප්‍රචලිත දේශපාලන අස්ථාවරත්වයන් මග හැරීම සඳහා වාමාංශික කොටස්වල ද සහය ගත්තේ ය. එහි දී පැලැසියෝ හට ස්වේච්ඡා පදනමින් උපදෙස් දීමේ අවස්ථාව සිය මිතුරෙකු  වූ රූබන් බාබරන්ගේ (Ruban Babaran) සහය මත කොරයාට හිමිවිය. එය කොරයාගේ නායකත්වය කරා ගිය ගමන් මගට පිටුවහලක් විය.

කොරයා සතු වූ ආර්ථික විද්‍යාත්මක  දැනුම භාවිතා කරමින් එවකට වාමාංශික ව්‍යාපාරයේ උපසභාපති  වෙත මධ්‍යම හා  දකුණු  ඇමෙරිකානු කලාපයේ  ව්‍යාප්ත වෙමින් පැවති "ඩොලරීකරණය" මගින් ඇති වූ බලපෑම සහ තෙල් අරමුදල් සම්බන්ධව ලිපි කිහිපයක් ලියූ අතර එය ඔහුගේ නායකත්වය කරා යන ගමනේ ප්‍රබල සංධිස්ථානයක් විය. ඔහු සතු ආර්ථික විද්‍යාත්මක දැනුම මත පදනම් ව පැලැසියෝ විසින් කොරයා ආර්ථික හා මුදල් අමාත්‍යවරයා ලෙස පත්කරන ලදි. කොරයා එම තනතුරෙහි නියැලෙමින් ඉක්වදෝරයට ආර්ථික හා සමාජමය වශයෙන් වැදගත් වන ප්‍රතිසංස්කරණ රාශියක් හඳුන්වා දුන්නේ ය. නිදහස් වෙළඳාමට සිදුවන අභියෝගයන් ඇතුළත් "The Hidden Face of Free Trade Agreement" නම් කෘතිය ඇල්බර්ටෝ ඇකොස්ටා (Alberto Acosta) සමඟ එක්ව කොරයා විසින් රචනා කළ අතර නව වෙළඳ ගිවිසුම් වල ඇති අවාසිමය පැතිකඩ පෙන්වා දුන්නේ ය.

කොරයා වෙනිසියුලාවේ හියුගෝ චාවේස් (Hugo Chavez), බ්‍රසීලයේ ලූලා ද සිල්වා (Lula da Silva) ,ආජන්ටිනාවේ නෙස්ටර් (Nestor) වැනි නායකයින්  හා එක්ව ඇමෙරිකානු  දේශපාලනික, ආර්ථික බලපෑම් අවම කර ගැනීමට ක්‍රියාකර තිබේ. එමෙන් ම කොරයා විසින් විදේශීය තෙල් සමාගම් හි දුර්වල පරිසර කළමනාකරණය කිරීම දැඩි ලෙස විවේචනයට ලක් කරන ලදි. එසේ ම අනිකුත් රටවල්වල ගැටළු කෙරෙහි  මැදිහත් නොවෙමින් මධ්‍යස්ථව පැලැසියෝගේ ආණ්ඩුව පවත්වාගෙන යාම සඳහා කොරයා සහයෝගය දැක්වීය. ඉක්වදෝර රජයේ බැඳුම්කර 8.5% දක්වා අඩු කිරීමට කොරයා විසින් යෝජනා කළ අතර එම බැඳුම්කර වලින් හරි අඩක් වෙනිසියුලාවට විකිණීමට තීරණය කර තිබුණි. නමුත් කොරයාට ජනාධිපතිවරයාගේ සහය හිමි නොවූ අතර ආර්ථිකමය ප්‍රතිශෝධන දීර්ඝ කාලීන ව මෙහෙයවීමට නොහැකි විය. ඒ හේතුවෙන් 2005 දී කොරයා සිය අමාත්‍ය ධූරයෙන් ඉල්ලා අස්විය.

ඉක්වදෝරය වෙනස් කිරීමට නම් දේශපාලන බලය අත්‍යාවශ්‍ය බව කොරයාට පසක් විය. ඔහු එය සාර්ථක කර ගැනීම පිණිස නව්‍ය දේශපාලන බලවේගයක් පිහිටුවීමට ක්‍රියා කළ අතර එය සාර්ථක කර ගනිමින් පැයිස් සන්ධානය ( Patria Altiva I Soberana -PAIS Alliance) නම් පක්ෂයක් පිහිට වූයේ ය. ඒ හරහා කොරයා සක්‍රීය දේශපාලනයට පිවිසි අතර ජනතාවට ඔහු පිළිබඳව විශාල අවබෝධයක් නොතිබීම හේතුවෙන් තම ජනප්‍රියත්වය ඉහළ දැමීම සඳහා සහය ගැනිම පිණිස අල්වාරෝ (Alvaro) නමැති පුද්ගලයා සිය ප්‍රචාරණ කළමනාකරු ලෙස යොදා ගැනීමට ඔහුට සිදුවිය. කොරයා සිය දේශපාලනය ප්‍රභූ පැලැන්තිය සමඟ නොව ග්‍රාමීය හා මධ්‍යම පාන්තික පුද්ගලයින් සමඟ ගොඩනගාගත් අතර ඔහු නව ප්‍රතිපත්තීන් හරහා දේශපාලන පෞරුෂය වර්ධනය කර ගත්තේ ය. පවතින දේශපාලන පක්ෂ සමඟ නිතර අදහස් හුවමාරු කර ගත් ඔහු ඇමරිකානු අධිරාජ්‍යවාදයට එරෙහිව තම රට නිදහස් කර ගැනීමට සිදු කරන්නා වූ දෙවන නිදහස් ව්‍යාපාරය තම මැතිවරණ ක්‍රියාවලිය හඳුන්වා දුන්නේ ය. එසේ ම දූෂිත පාලක පැලැන්තියේ ස්වභාවය හා ඒවාට එරෙහිව කටයුතු කළ යුතු ආකාරය දක්වන ගීත හා සටන් පාඨ යොදා ගනිමින් ජනයා තමා වටා ඒකරාශි කර ගැනීමට ද කොරයා සමත් විය.

තව ද කොරයා වාමාංශික මතවාද දැරූ මධ්‍යම පාන්තික ප්‍රැට්‍රියා ඇල්ටිවා අයි සොබෙරෙනා (Patria Alativa Soberana) පක්ෂය එක්සත් කිරිමට ක්‍රියා කළේ ය. නමුත් පෙර පිහිටවූ පැයිස් සන්ධානය මගින් කිසිදු කොන්ග්‍රස් අපේක්ෂකයෙකු මැතිවරණයට ඉදිරිපත් නොකිරීමට වගබලා ගත්තේ ය. එයට හේතුව වූයේ පැවති ධනවාදී දේශපාලන ක්‍රමයට ඔහු විරෝධය පළ කිරීමයි. තවදුරටත් එම ව්‍යාපාරය අතරතුර කොරයා ප්‍රකාශ කළේ ජනතාව ඔහු තෝරා ගතහොත් ඉක්වදෝර ව්‍යවස්ථාව නැවත සකස් කිරීම සඳහා ව්‍යවස්ථාදායක සභාවක් පිහිටුවීමට ජනමත විචාරණයක් පවත්වන බවයි. විදේශීය තෙල් සමාගම් සමඟ පවතින කොන්ත්‍රාත්තු සැබෑ උගුලක් බවත් බහුජාතික සමාගම් නිපදවන සෑම තෙල් බැරල් 5කින් 1ක් පමණක් ඉක්වදෝරය සඳහා ලබා දීම පිළිගත නොහැකි බවත් නැවත එම කොන්ත්‍රාත්තු සියල්ල සංශෝධනය කළ යුතු බවත් කොරයා පැවසී ය. ඒ අනුව එම ඛනිජ තෙල් සංචිතවලින් වැඩි කොටසක් ඉක්වදෝරයට ලබා ගැනීම සඳහා නීති සම්පාදනය කරමින් නැවත එම කොන්ත්‍රාත් සංශෝධනය කළ යුතු බව ඔහුගේ මතය විය.

2006 ඔක්තොම්බර් මාසයේ දී ජනාධිපතිවරණය පැවැත්වූ අතර එහි දී 27%ක් ප්‍රතිවාදී අපේක්ෂකයා වූ ඇල්වාරෝ නොබෝවා (Alvaro Nobova) විසින් ලබාගත් අතර 23% කොරයාට ලබා ගැනීමට හැකි වුව ද ජනාධිපති ලෙස පත්වීමට අවශ්‍ය ප්‍රතිශතය ලබා ගැනීමට නොහැකි වීම නිසා නැවත මැතිවරණයක් පැවැත්වීමට සිදු විය. එම නිසා 2006 නොවැම්බර් මාසයේ නැවත මැතිවරණයක් පැවති අතර එහි දී 56%ක ජන්ද ප්‍රතිශතයක් ලබා ගනිමින් කොරයා ජනාධිපතිවරණය ජයග්‍රහණය කළේ ය. ඒ අනුව 2007 වසරේ දී නව ඉක්වදෝරියානු ජනාධිපති ලෙස කොරයා තේරී පත්විය. 1979 සිට ඉක්වදෝරය තුළ සහභාගීත්ව ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වීමෙන් පසුව ජනාධිපති ධූරයට පත් ප්‍රථම වාමාංශිකයා වුයේ කොරයා ය.




*රෆායෙල් කොරයා කියුටෝහි දී (Quito) ජනතාව අමතමින් (2013)*

## <u>නායකත්වය කරා පැමිණි පසු සිදුකළ සේවාව</u>

ඉතා දුෂ්කර කාලයක් ගත කරමින් සිය ජීවිතය ගොඩනගා ගත් රෆායෙල් කොරයා සිය ධෛර්යය තුළින් ම ඉදිරියට ආවේ ය. එහි ප්‍රතිඵලයක් වශයෙන් ඔහු දක්ෂ හා ආකර්ෂණීය දේශපාලන තරඟකරුවෙක් වූ අල්වාරෝ නොබෝවා (Alvaro Noboa) පරාජය කරමින් ජනාධිපතිවරණය ජය ගත්තේ ය. ඉන් පසුව උදා වූයේ

ඉක්වදෝරයේ වසන්තයයි. ඉක්වදෝරය නගා සිටුවීම වෙනුවෙන් කොරයා කළ කැප කිරීම් හා සිදුකළ සේවාවන් අති මහත් ය. ජනාධිපති ධූරයට පත් වීමෙන් පසු ඔහුගේ හුදු මහත් සේවාවන් කෙරෙහි මෙලෙස අවධානය යොමු කළ හැකිය. රෆායෙල් කොරයා 2007 සිට 2017 දක්වා කාලය තුළ ඇන්ඩියන් (Andean) ජාතියේ ජනාධිපතිවරයා විය. මැතිවරණ අධිකරණය විසින් නිල වශයෙන් 2006 දෙසැම්බර් 4 වන දින රෆායෙල් කොරයා ජනාධිපති ලෙස ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව 2007 ජනවාරි 15 වන දින ඉක්වදෝරයේ 56 වන ජනාධිපතිවරයා ලෙස රෆායෙල් කොරයා දිවුරුම් දෙන ලදි. එහි දී සිය හඬ අවදි කළ රෆායෙල් කොරයා ඉක්වදෝරයේ බහුතර ඡන්දය ම තමාට ලැබුණු බව කියා සිටියේ ය.

ඔහුගේ ජයග්‍රහනය නව ලිබරල්වාදයේ අවසානය බවත් සමාජවාදයේ ආරම්භයත් සනිටුහන් කරන නව සංධිස්ථානයක් බව කොරයා විසින් පවසන ලදි. රෆායෙල් කොරයා ජනාධිපති ධූරයට පත් වීමත් සමඟ එතෙක් පැවති ඉක්වදෝරය වෙනස් ම මගකට ගෙන ඒමට ඔහු ක්‍රියා කළේය. විශේෂයෙන් ම ඔහුගේ අවධානය යොමු වූයේ වර්ගවාදයට එරෙහිව නැගී සිටීමටයි. ඒ අනුව රෆායෙල් කොරයා කැබිනට් මණ්ඩලය පිහිටුවීය. එහි ලේකම් වශයෙන් ඉක්වදෝරියානු සමාජයේ බහු සංස්කෘතික ස්වභාවය පිළිබඳව වැඩි අවධානයක් යොමු කරමින් ක්‍රියා කළ කෙචුවා (Quechua) කාන්තාවක් පත් කළේ ය. එසේ ම අප්‍රිකානු ඉක්වදෝරියානු ජාතිකයෙකු සංස්කෘතික අමාත්‍යවරිය ලෙසත් පත් කළේ ය. කොරයා වැඩ භාර ගන්නා අවස්ථාවේ දී ඉක්වදෝරයේ රජයේ ආදායමෙන් 38%ක් බාහිර ණය ගෙවීම සඳහා වැය විය. ඔහු එම ප්‍රමාණය 75%කින් අඩු කිරීමට අදහස් කළ අතර අතිරේක මුදල් සෞඛ්‍ය හා අධ්‍යාපනය ආදී පොදු සේවාවන් සඳහා වැය කිරීමට සැලසුම් කළේ ය. ඔහුගේ මුල් මාස කීපය තුළ මාසික දරිද්‍රතා ආධාර ගෙවීම් ඩොලර් 30 දක්වා දෙගුණ කිරීමටත්, නිවාස සඳහා ණය දෙගුණ කිරීමටත්, අඩු ආදායම්ලාභීන් සඳහා විදුලි ගාස්තු අඩු කිරීමටත් පියවර ගන්නා ලදි.

ඔහු "21st Century Socialism" යන නමින් මෙම ධනය නැවත බෙදා හැරීමේ ප්‍රතිපත්තිය හැඳින්වූයේ ය. තවදුරටත් කොරයා කෘෂිකාර්මික සහනාධාර වැඩි කළ අතර සමාජ වැඩසටහන්, සෞඛ්‍ය හා අධ්‍යාපනය සඳහා අවශ්‍ය පහසුකම් ඉහළ නැංවීමට ද කටයුතු කළේ ය. ඔහුගේ මෙම ප්‍රතිසංස්කරණවාදී න්‍යාය බොහෝ ඡන්ද දායකයින්ගේ සිත් දිනා ගන්නා ලදි. ඉක්වදෝරයේ ධනපති පන්තීන් බිය ගන්වමින් සිය ඉදිරි ගමන සැලසුම් කරන්නට රෆායෙල් කොරයා සමත් විය. රෆායෙල්

කොරයාගේ රජය යටතේ 2007 දී ව්‍යවස්ථාදායක සභාවක් පිහිටුවීම සඳහා වූ මැතිවරණයක් පවත්වන ලදි. ඒ මඟින් 60% කට අධික ඡන්ද ප්‍රමාණයක් ලබා ගනිමින් කොරයාගේ පක්ෂය ජය ගන්නා ලදි. ඒ අනුව ඔවුහු නව ව්‍යවස්ථාවක් මඟින් ජනාධිපති සතු විධායක බලතල වැඩි කිරීමට පියවර ගන්නා ලදි. කොරයා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ ලෝක බැංකුව කෙරෙහි වෙනස් ම ආකාරයේ ප්‍රවේශයක් අනුගමනය කළේ ය.

ඒ අනුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට සිය ආර්ථික සැකැස්ම නිරීක්ෂණය කිරීමට ඉඩ සලසන ගිවිසුමකට තමා විසින් අත්සන් නොකරන බව තරයේ ප්‍රකාශ කළේ ය. 2007 අප්‍රේල් 15 දින ඔහුගේ මැතිවරණ ජයග්‍රහණයෙන් පසුව ඔහුගේ පරිපාලනයේ වසර හතර තුළ දී ඩොලරීකරණය පවත්වාගෙන යන බවට ඔහු පොරොන්දු වූ නමුත් එක් අවස්ථාවක දී ඇමරිකානු ඩොලර් වෙනුවට කලාපීය දකුණු ඇමරිකානු මුදල් ප්‍රතිස්ථාපනය කිරීමේ අදහස සඳහා සිය සහයෝගය ද දැක්වීය. ඔහු වඩාත් සමාජ සංවර්ධනය කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ නායකයෙකි. නමුත් එය රටේ ආර්ථිකය කෙරෙහි යම් බලපෑමක් ඇති කරනු ඇතැ යි ජනතාව බියෙන් පසු විය. කෙසේ වෙතත් අවසානයේ එම සියලු බාධා මග හරිමින් 2009 අප්‍රේල් මාසයේ දී නැවත වරක් ඉක්වදෝර ජනාධිපති ලෙස රෆායෙල් කොරයා පත්විය.

2006 වසරේ දී සෞඛ්‍ය අයවැය ඩොලර් මිලියන 561 ක් වූ අතර එය 2012 දී ඩොලර් මිලියන 1774 දක්වා වැඩි කර තිබේ. එසේම වෛද්‍යවරුන් සඳහා වැඩ කරන වේලාවන් සතියට පැය 40 ක් දක්වා වැඩි කළ අතර ඔවුන්ගේ වැටුප් ද වැඩි කරන ලදි. තව ද ජංගම රෝහල් ක්‍රියාත්මක කිරීම මෙන් ම ඉක්වදෝරියානු සංක්‍රමණිකයන් අතර වෛද්‍යවරුන්ගේ ආගමන අනුපාතය ඉහළ නැංවීමට ද පියවර ගත්තේ ය. රෆායෙල් කොරයාගේ තවත් විශේෂ සේවයක් ලෙස 2009 ඇති වූ ඉක්වදෝරියානු විදුලි අර්බුදයට එරෙහිව පියවර ගැනීම දැක්විය හැකිය. ඒ අනුව නොවැම්බර් 06 වන දින කොරයාගේ රජය විදුලි බල ක්ෂේත්‍රය තුළ හදිසි අවස්ථාවක් ප්‍රකාශයට පත් කළේ ය. ඒ හේතුවෙන් කොලොම්බියාව විසින් පැයකට මෙගා වොට් 5200 ක අතිරේක විදුලි බලයක් මිලදී ගැනීමට කොරයාගේ රජයට හැකි විය. රෆායෙල් කොරයා සිය පාලන කාලය තුළ උසස් අධ්‍යාපනය නගා සිටුවීම වෙනුවෙන් ද ක්‍රියා කර තිබේ. ඒ අනුව ශාස්ත්‍රපති සහ ආචාර්ය උපාධි සංඛ්‍යාව ඉහළ නැංවීම සඳහා ඉක්වදෝරියානු ජාතිකයන් ලොව පුරා ඉහළ පෙළේ විශ්ව

විද්‍යාලවල අධ්‍යන සඳහා යොමු කර වීමට අදාළව ශිෂ්‍යත්ව වැඩසටහන් ආරම්භ කළේ ය.

රෆායෙල් කොරයා විසින් ජනතාව වෙත කළ සේවාව නිසා නිරන්තරයෙන් වඩාත් කැපී පෙනෙන චරිතයක් බවට පත්විය. එහි විශේෂ අවස්ථාවක් ලෙස පැවති ආර්ථික පසුබෑමට විසඳුමක් වශයෙන් කප්පාදු පියවර හඳුන්වාදීම දැක්විය හැකිය. 2010 සැප්තැම්බර් මස 20 වැනි දින රජයේ සේවකයින්ගේ ප්‍රතිලාභ කප්පාදු කිරීමට එරෙහි විරෝධතාවයක් පැවැත්වීය. එම විරෝධතාවය අතරතුර දී රෆායෙල් කොරයා කඳුළු ගෑස් ප්‍රහාරයකට ද ලක් විය. සියලු බාධා හමුවේ නොබියව නැගී සිටි රෆායෙල් කොරයා 2011 මැයි මාසයේ දී පැවැති ජාතික ජනමත විචාරණයේ දී විශාල දේශපාලන ජයග්‍රණයක් ලබා ගත්තේ ය. එම ජයග්‍රහණයත් සමඟ රටේ අධිකරණ පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා කොමිසමක් පත්කිරීමට ජාතික සභාව යොමු කිරීමට අනුමැතිය ලබා දුන්නේ ය. 2011 වසරේ දී කොරයා සිය පරිපාලනය වෙනස් ම මගකට ගෙන ගියේ ය. ඔහු පවුල් සැලසුම්කරණය හා නව යොවුන් ගැබ් ගැනීම වැළැක්වීම සඳහා වු ජාතික මට්ටමේ වැඩ පිළිවෙලක් දියත් කරන ලදි. එහි ප්‍රතිඵල ලෙස එනිප්ලා (Anipla) ආයතනය පිහිට වු අතර එයින් වසර හතරක් තුළ අවුරුදු 11-14ත් අතර කාන්තාවන්ගේ ගැබ් ගැනීම 18%කින් අඩු විය. පසුව 2014 දී එනිප්ලා (Anipla) ආයතනය වෙනුවට Plan Familiar එනම්, පවුල පදනම් කර ගැනීමෙන් වැළැකී සිටීම සඳහා වු වැඩසටහනක් ප්‍රතිස්ථාපනය කළේ ය.

රෆායෙල් කොරයා සිය රජය යටතේ ඉක්වදෝරයේ ආරක්ෂක පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ද කටයුතු කළේ ය. මේ සඳහා චීනය ඉක්වදෝරයට ඩොලර් මිලියන 240ක් ණයට දුන්නේ ය. මෙය ECU 911 ඒකාබද්ධ ආරක්ෂක සේවාව ලෙස නම් කර තිබේ. එයට සෑම තාක්ෂණයක් ම කළමනාකරණය කිරීම සඳහා නව නිරීක්ෂණ කැමරා, ඩ්‍රෝන යානා, ස්වයංක්‍රීය සාක්ෂි සැකසුම් පද්ධති ඇතුළත් විය.




*චීන ජනාධිපති ෂී ජින්පින්ග් (Xi Jinping) ECU 911 ඒකාබද්ධ ආරක්ෂක සේවාව අගයමින් (2016)*

පරිසරය ආරක්ෂා කිරීම සඳහා හරිත රජයක් පිහිටුවීමට කටයුතු කළ කොරයා තල්මසුන් දඩයම් කිරීම වැළැක්වීම සඳහා ජාත්‍යන්තර තල්මසුන් කොමිසම (International Whaling Commission) වෙත යාමට ද කටයුතු කර තිබේ. ඔහු වටිනා ලී වර්ග නිස්සාරණය කිරීම ද තහනම් කළේය. එසේ ම 2013 දී ඉක්වදෝරය යසුනි (Yasuni) ස්වභාවික රක්ෂිතයේ හෙක්ටයාර මිලියන තුනකට අධික ප්‍රමාණයක් චීන තෙල් සමාගම් වෙත වෙන්දේසි කරන බව නිවේදනය කරන ලදි. ඉක්වදෝරියානු රජය යසුනි (Yasuni) ජාතික වනෝද්‍යානයේ තෙල් නිධි සංවර්ධනය කිරීම සඳහා චීන රාජ්‍ය සංස්ථා සමඟ රහසිගතව සාකච්ඡා පවත්වා ඇති බව 2014 දී හෙළි වේ. ඒ සමඟ ම වනෝද්‍යානයේ තෙල් කැණීම සඳහා ඩොලර් බිලියන 3.6ක මුදලක් අරමුදල් වශයෙන් කොරයා ඉල්ලා සිටියේ ය.

ඉක්වදෝරය තුළ පහත වැටෙමින් තිබූ තෙල් මිලට ප්‍රතිචාර වශයෙන් කොරයාගේ රජයට රාජ්‍ය වියදම් කපා හැරීමට සිදු විය. මෙය ඒ වන විට පැවැති කොරයාගේ ජනප්‍රියතාව අඩු වීම කෙරෙහි මහත් සේ බලපෑම් කර තිබේ. කෙසේ වෙතත් 2015 වන විට දී පොරොන්දු වූ පරිදි ව්‍යවස්ථාමය කරුණු 15ක් සම්මත කර තිබුණු බැවින් 2017 දී කොරයා විසින් ජනාධිපතිවරණය ප්‍රතික්ෂේප කරන ලදි. කෙසේ වෙතත් ව්‍යවස්ථාමය සංශෝධන හේතුවෙන් ඔහුට නැවත වරක් ජනාධිපතිවරණයට ඉදිරිපත් වීමට අවස්ථාව ලැබුණි. 2017 ජනාධිපතිවරණයේ දී කොරයාට මූලික වශයෙන් හිටපු උප සභාපති ලෙස කටයුතු කළ ලෙනින් මොරෙනෝ (Lenin Moreno) විසින් සහයෝගය ලබා දුන්නේ ය. 2017 අප්‍රේල් මාසයේ දී මොරෙනෝ ජයග්‍රහණය කළ ද අනෙක් පසින් තරඟ කළ ගිලර්මෝ ලාසෝ (Guillermo Lasso) එය වංචාවක් බවට චෝදනා එල්ල කළේ ය.

කෙසේ වෙතත් මැතිවරණයෙන් කලකට පසු එනම්, මැයි මාසයේ දී කොරයා සිය බිරිඳගේ මව්බිම වූ බෙල්ජියම වෙත පදිංචියට ගියේ ය. කොරයා විසින් සමහර ප්‍රතිපත්ති ආපසු හැර වීමට ක්‍රියා කළ අතර 2017 නොවැම්බර් මස අග දී මොරෙනෝ විසින් ඉදිරිපත් කරන ලද ව්‍යවස්ථාදායක ජනමත විචාරණයකට ඉක්වදෝර ජනාධිපතිවරුන් ධූර කාල දෙකකට සීමා කිරීමට සක්‍රීයව විරුද්ධ විය. නමුත් අවාසනාවකට 2018 පෙබරවාරි 04 වන දින ඉක්වදෝර වැසියන්ගෙන් තුනෙන් දෙකක් ම ජනමත විචාරණයට පක්ෂව ඡන්දය දුන් අතර එය 2021 දී කොරයාව බලයට ගෙන ඒමට ගත් උත්සාහය ව්‍යර්ථ විය.

දේශපාලන සහ ආර්ථික විද්‍යාඥයෙකු වන රෆායෙල් කොරයා ජනහිතකාමී නායකයෙකු ලෙස ඉක්වදෝර වැසියන්ගේ හදවත් දිනා ගත්තේ ය. ඔහු සාම්ප්‍රදායික දේශපාලඥයෙකු ලෙස ලොවට නිරාවරණය නොවුවත් පැමිණි සියලු අභියෝගයවලට නොබියව මුහුණ දුන් අතර දිළිඳුකම තුරන් කිරීමටත් ඉක්වදෝර සමාජ තත්ත්වය වැඩි දියුණු කිරීමටත් විදේශීය සමාගම් වලට ඇඟිලි ගැසීම් සීමා කිරීමටත් දූරාචාරයට එරෙහිව සටන් කිරීමටත් රටේ සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමටත් පියවර ගත්තේ ය.

## විදේශ ප්‍රතිපත්තිය

2005 සිට 2017 දක්වා ඉක්වාදෝරයේ ජනාධිපති ලෙස විශාල සේවයක් කළ රෆායෙල් කොරයා සිය ධූරකාලය තුළ ඉක්වදෝරය අන් කවරදාටත් වඩා නගා සිටුවීම සඳහා ගෙන ගිය විදේශ ප්‍රතිපත්තිය කෙසේ ද යන්න මෙලෙස දැක්විය හැකිය. ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදියෙකු වූ කොරයා ඔහුගේ පරිපාලනය ශක්තිමත් කිරීමේ දී වාමාංශික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම කෙරෙහි අවධානය යොමු කළ නායකයෙකි. ජාත්‍යන්තර දේශපාලනය තුළ දැවැන්ත චරිතයක් හිමි වූ රෆායෙල් පැහැදිලි නායකත්වයක් මූර්තිමත් කළ ලතින් ඇමරිකාවේ අසහාය පෞරුෂත්වයක් හිමි තැනැත්තෙක් විය. ඔහු කලාපයේ වඩාත් ජනප්‍රිය නායකයෙකු විය. කලාපයේ විශ්ලේෂකයන් පවසන පරිදි රෆායෙල් කොරයා ලතින් ඇමරිකානු නායකත්වය නව මාවතක් කරා ගෙන යමින් ඒ අනුව විදේශ ප්‍රතිපත්තිය ද හැසිර වූ නායකයෙකි.

රෆායෙල් කොරයා විසින් තම ධූර කාලය තුළ ව්‍යවස්ථාදායක සභාව බල ගන්වා නව ව්‍යවස්ථා සංශෝධනයක් ගෙන එමින් දේශපාලනය ගැඹුරු වෙනසක් කළේ ය. ඒ අවස්ථාවේදී ඔහු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අමතරව ඉක්වදෝරයේ විදේශ ප්‍රතිපත්ති සැලසුමක් ද අන්තර්ගත කිරීමට අමතක නොකළේ ය. නව අණ්ඩුක්‍රම ව්‍යාස්ථාවට අනුව ජනාධිපතිවරයාට විදේශ ප්‍රතිපත්ති නිර්වචනය කිරීම, ජාත්‍යන්තර සබඳතා මෙහෙයවීම, ජාත්‍යන්තර ගිවිසුම් අත්සන් කිරීම හා අනුමත කිරීම ජාතික කොංග්‍රසයේ අනුමැතිය සහිතව සිදු කිරීමට අවසර ලැබුණි. එමඟින් ඔහුට ධූර කාලය තුළ ජාත්‍යන්තර වේදිකාවේ අමතක නොවන පෞරුෂයක් වීමට හැකියාව ලැබුණි. විද්‍යාව හා තාක්ෂණය අතින් දියුණු රටවල් සමග සමීප සහයෝගීතාවක් ඇති කර ගැනීම මගින් රට තුළ පවතින විද්‍යාත්මක හා තාක්ෂණික හිඩැස් පිරවිය හැකි බව කොරයා විශ්වාස කළේ ය.

එම නිසා ඉක්වදෝරයේ විදේශ ප්‍රතිපත්තිය විවිධාංගීකරණය කරන ලදි. ඒ අනුව වෙනිසියුලාව හා බ්‍රසීලය සමඟ තිබූ විදේශ සබඳතා බිඳ නො දමමින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කෙරිණි. බ්‍රසීලයේ සබඳතාවන්ට වඩා වෙනිසියුලාව සමඟ සබඳතා පැවැත්වීමට පහසු යැයි රෆායෙල් කොරයාගේ විශ්වාස කළ ද හියුගෝ චාවෙස් (Hugo Chavez) සමඟ විදේශ සබඳතා පැවැත්වීම එතරම් පහසු කටයුත්තක් නොවන බව කල්යත් ම කොරයාට තේරුම් ගියේ ය. මේ හේතුව නිසා කොරයාගේ විදේශ සබඳතා රුසියාව හා ඉරානය දෙසට හැරුණි. ඔහුගේ අරමුණ වූයේ ඉක්වාදෝරියානු සංවර්ධන වැඩසටහන් සඳහා රුසියාවෙන් හා ඉරානයෙන් විකල්ප මූල්‍ය ප්‍රභවයන් සපයා ගැනීමයි. ගෝලීයකරණය සමඟ කටයුතු කිරීම මඟින් තම රටට හා කලාපයට වැදගත්කමක් ලබා ගැනීමට හැකිවන බව කොරයා අවධාරණය කළේ ය.

එහි දී වඩාත් ඵලදායී ලෙස ඔහු දුටුවේ කලාපීය ඒකාබද්ධතාවයයි. එහි ප්‍රතිඵලයක් ලෙස හියුගෝ චාවෙස් බලයට පැමිණ දසවන සංවත්සරය සැමරීම සඳහා කැරකට් හිදී (Karoket) සංවිධානය කළ හමුවට ආරාධනා ලද එකම ජනාධිපතිවරයා වූයේ රෆායෙල් කොරයා ය. අතීතයේ ඉක්වාදෝරය අනුගමනය කළ විදේශ ප්‍රතිපත්තියට වඩා වෙනස්කම් සහිත විදේශ ප්‍රතිපත්තියක් රෆායෙල් කොරයා විසින් ඉක්වාදෝරය පාලනය කිරීමේ දී අනුගමනය කළේ ය. වෙනිසියුලාවේ ජනාධිපතිව සිටි හියුගෝ චාවේස්, බොවේලියානු නායක ඒවෝ මොරාලෙස් වැනි නායකයන්ගේ විදේශ ප්‍රතිපත්තිවලට රෆායෙල් කොරයාගේ විදේශ ප්‍රතිපත්තිය බෙහෙවින් සමාන විය.

කොරයා එක්සත් ජනපදය සමඟ ද ගැටුම්කාරී ප්‍රවේශයක් අනුගමනය කළ අතර 2009 දී මැන්ටා ගුවන් කඳවුර (Manta Air Base) අලුත් වැඩියා කිරීම පවා ප්‍රතික්ෂේප කළේ ය. එපමණක් නොව ඔහු ඉක්වදෝරයේ විදේශීය හමුදා කඳවුරු පිහිටුවීම තහනම් කිරීම සඳහා ව්‍යවස්ථාව ද වෙනස් කළේ ය. ඉක්වදෝරය එක්සත් ජනපදය සමඟ ඇති සබඳතා විශේෂයෙන් වැදගත් වූයේ 2007 දී ඉක්වදෝරියානු අපනයනවලින් 41.9%ක්ම හා ආනයන වලින් 23.7%ක්ම එක්සත් ජනපදය සතු වූ බැවිණි. ඒ අනුව ඉක්වදෝරයේ විශාලතම වෙළඳ හවුල්කරුවා එක්සත් ජනපදය විය. නමුත් කොරයාගේ පාලනයේ ප්‍රතිඵලයක් ලෙස එක්සත් ජනපදයේ සෘජු විදේශ ආයෝජන සැළකිය යුතු ලෙස පහත වැටුණු අතර සමාගම් සඳහා පැහැදිලි නීති රීති නොමැතිකම හේතුවෙන් ඇමරිකාව ඉක්වදෝරයේ ආයෝජනය නැවැත්වූ බව නිවේදනය කළේ ය.

නමුත් බැරැක් ඔබාමා (Barack Obama) ඇමරිකානු ජනාධිපති වීමත් සමඟ තම රටට එක්සත් ජනපදය සමඟ සහෝදර සබඳතා බෙහෙවින් අවශ්‍ය බව කොරයා පවසා ඇත. එම නිසා එක්සත් ජනපදය හරහා ඉක්වදෝර විදේශ ප්‍රතිපත්තියේ ස්වාධීනත්වය හා ස්වෛරීභාවය නැවත තහවුරු කර ගැනීමට කොරයාට අවශ්‍ය විය. එසේ ම මොහු චීනය සමඟ සබඳතා ඇති කර ගැනීම යහපත් මෙන් ම උපාය මාර්ගික කරුණක් බව විශ්වාස කොට ඇත. මෙය චීනය සමඟ ඛනිජ තෙල් වෙළෙඳාම කිරීමට මොහු පෙළඹීමට හේතු විය. 2010 වසරේ දී රෆායෙල් හා මහජන චීන සමූහාණ්ඩුවේ සභාපති වූ හූ ජින්තාඕ (Hu Jintao) දෙරට අතර රාජ්‍ය තාන්ත්‍රික සබඳතා ඇතිකර ගැනීමේ 30 වන සංවත්සරය සැමරීම සඳහා සුබ පැතුම් පණිවිඩයක් ද හුවමාරු කොටගෙන ඇත. 2012 දී ඉක්වදෝරයේ ආරක්ෂක පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා චීනය විසින් ඩොලර් මිලියන 240 ක් ණයට ලබා දී තිබේ.

රෆායෙල් කොරයා කොළොම්බියාව කෙරෙහි අනුගමනය කළ විදේශ ප්‍රත්පත්තිය සාධනීය නොවීය. ඔහු 2008 මාර්තු මස මුල දී සිදු වූ ඇන්ඩියන් රාජ්‍ය තාන්ත්‍රික අර්බුදයෙන් පසුව එරට දේශ සීමාවට හමුදාව යෙදවීමට නියෝග කොට ඇත. එමෙන් ම කොළොම්බියාවේ බොගොටා හි (Bogota) පිහිටි සිය රජයේ තානාපතිවරයා ද ඉවත් කරන්නට කටයුතු කොට ඇත. එම කාල සීමාව තුළ කොළොම්බියාව හා ඉක්වදෝරය අතර රාජ්‍ය තාන්ත්‍රික සබඳතා බිඳ වැටී ඇති අතර නැවතත් දෙරට අතර සබඳතා ඇතිකර ගැනීමට නම් සපුරාලිය යුතු කොන්දේසි 5ක්

පිළිබඳව රෆායෙල් කොරයා දක්වා ඇත. වෙනිසියුලාව හා ඉක්වදෝරියාව ද්විපාර්ශවික සහයෝගීතා රැසකට ම අත්සන් තබමින් දෙරට අතර විදේශ සබඳතා වැඩිදුරටත් ශක්තිමත් කර ගත්හ.

2007 ජනවාරි මාසයේ දී බොරතෙල් හුවමාරු කර ගැනීමේ එකඟතාවයකට ද මොවුන් අවතීර්ණ විය. එමෙන් ම දෙරට අතර 2008 වසරේ දී බලශක්ති, වානේ හා වෙළෙඳ යන ක්ෂේත්‍රයන්ට අදාළවන ගිවිසුම් 5ක් අත්සන් කරන ලදි. මෙලෙස ඉක්වදෝරය හා වෙනිසියුලාව විසින් ආහාර, කාර්මික හා නිෂ්පාදන අංශවල ස්වාධීනත්වය උදෙසා නව ගිවිසුම් අත්සන් තබන ලදි. කොරයා 2007 දී විවෘත කරන ලද ජල විදුලි බලාගාරයක් ඉදි කිරීම සඳහා බ්‍රසීලයානු සංවර්ධන බැංකුවෙන් ඩොලර් මිලියන 243ක ණය මුදලක් ලබා ගැනීම උදෙසා බේරුම්කරණය ඉල්ලා සිටිය ද එම කොන්ත්‍රාත්තුව උල්ලංඝණය විය. මෙම සිද්ධිය හේතුකොටගෙන බ්‍රසීලය විසින් ඉක්වදෝරයේ සිටි සිය තානාපතිවරයා නැවත කැඳවන ලදී. එම ආරවුල විසඳුන ද බ්‍රසීල තානාපතිවරයා නැවත ඉක්වදෝරය වෙත නො පැමිණියේ ය. මෙම අමනාපකම් හේතුවෙන් බ්‍රසීලය විසින් ඉක්වදෝරය සමඟ පැවති විවිධ සහයෝගීතා ව්‍යාපෘති අත්හිටුවන ලදි.

ඒ හේතුවෙන් ඉරානය හා රුසියාව සමඟ රෆායෙල් කොරයා යම් යම් එකඟතාවන්ට එළඹුණේ ය. ඔහු 2008 වසරේ දෙසැම්බර් මස ඔපෙක් හවුල්කරුවන් වූ මෙම රටවල් ද්විත්ත්වය සමඟ සබඳතා ශක්තිමත් කර ගැනීම උදෙසා විදේශ සංචාරවල ද නිරත විය. මෙම සන්දර්භය තුළ ඔහු අපේක්ෂා කළේ නැවත ඛනිජ තෙල් අපනයනය කරන රටවල් විසින් සංවිධානය කරගත් ඔපෙක් සංවිධානය (Organization of the Petroleum Exporting Countries-OPEC ) හා සම්බන්ධ වීමට ය. එය කාලෝචිත උපායමාර්ගයක් ලෙස ජනාධිපතිවරයා හැඳින්වූයේ ය.



*කුයිටෝහි දී (QUITO) ඔපෙක් (OPEC) සංවිධානයේ මහලේකම් හා රෆායෙල් කොරයාගේ හමුවීම (2016 නොවැම්බර්)*

කොරයාගේ විදේශ ප්‍රතිපත්ති අනුව ඉක්වදෝරියානු රාජ්‍ය තාන්ත්‍රිකභාවය ක්‍රම ක්‍රමයෙන් වෙනස් වීමට පටන් ගත්තේ ය. එනම් රෆායෙල් කොරයා ඉක්වදෝරයේ විදේශ ණය ගෙවීම සීමා කළ අතර විදේශ තෙල් කොන්ත්‍රාත් පිළිබඳ යළිත් සාකච්ඡා කිරීමට පටන් ගත්තේ ය . එමෙන් ම ඔහු මැන්ටා (Manta)හි පිහිටි එක්සත් ජනපද ගුවන් කඳවුරු වසා දැමීමට තීරණය කර ඇත. රෆායෙල් කොරයාගේ මෙම දැඩි තීරණ හේතුවෙන් 20 වන සියවස අවසානය තාක්ෂණ හා නිෂ්පාදන කාර්යයන් බොහෝමයක් තිබියදීත් භාණ්ඩ හා සේවා නිෂ්පාදනයේ දී රට මන්දගාමී ස්වභාවයක් දක්නට ලැබුණි. රජයේ බලපෑම හා මැදිහත්වීම වැඩි වීම මත ඉක්වදෝරයට විදේශ ආයෝජන නොමැතිකම මීට එක් හේතුවක් විය.

කෙසේ නමුත් රෆායෙල් කොරයාගේ පාලන තන්ත්‍රය තුළ ඔහු විදේශ සබඳතා යහපත් ආකාරයෙන් පවත්වා ගැනීමට උත්සුක වූයේ ය. එහි ප්‍රතිඵලයක් ලෙස ජාතික දේශපාලනයේ පමණක් නොව ජාත්‍යන්තර දේශපාලනයේ ද ඔහුගේ නම අමරණීය විය.

## <u>ගත හැකි ආදර්ශ</u>

ජනාධිපති කොරයා බලයට පත් වූයේ සාම්ප්‍රදායික තෙල් හා භාණ්ඩ අපනයනය මත යැපෙන ධනවත් ප්‍රභූ පැලැන්තියක් විසින් ඉක්වදෝරය පාලනය කරන ලද කාලයක ය. එය සෞභාග්‍යය පිරුණු ඉක්වදෝරයේ වසන්තය නොවේ. දේශපාලනය තුළ

බහුශ්‍රැතයෙකු නොවූ කොරයා ඔහු ලත් අධ්‍යාපනය මඟින් අ්‍ර්ථිකය ව්රධනය කොට රටේ සංව්රධනයට මෙන් ම අසංව්රධිත ප්‍රදේශවලට ද සම ව වාසි ලබා දුන් අතර දුප්පත් ජනතාවට සමාජය තුළ වැදගත්කමක් ලබා දුන්නේ ය. එබැවින් ඔහු බලයට පත් වූවායින් පසු සිදු වූ වෙනස හේතුවෙන් ඉක්වදෝරය සංවර්ධනයේ මාවත කරා යොමු වූ බව කිව හැකිය. මේ නිසා දේශපාලනඥයෙකු, ආර්ථික විද්‍යාඥයෙකු, සමාජවාදියෙකු මෙන්ම ලොව දිනූ චරිතයක් ලෙස ද ඔහුගෙන් ගත හැකි ආදර්ශ බොහෝ ය.

ඉතා දිළිඳු පවුලක උපත ලද මොහු තම ඉරණම වෙනස් කළ පුද්ගලයෙක් ලෙස අගය කළ හැකිය. ඔහු තම දෛවය වෙනුවට උත්සාහය විශ්වාස කළේ ය. අධ්‍යාපනයේ වටිනාකම හොඳින් අවබෝධ කරගෙන සිටි ඔහු රටේ අධ්‍යාපන මට්ටම ඉහළ නැංවීමට කළ කැපකිරීම් ආදර්ශමත් ය. තමාට කුඩා කල මුහුණ පෑමට සිදු වූ දුෂ්කරතා තම රටේ දරුවන්ට මුහුණ පෑමට සිදු නොවන පරිදි ඔහු වගබලා ගත්තේ ය. පාලකයෙක් සතුව මෘදු ගුණාංග මෙන් ම ඍජු ගුණාංග ද තිබිය යුතුය. කොරයා වැඩි වශයෙන් ඍජු ගුණාංග ප්‍රකට කළ ද එයින් ඉක්වදෝරයට සිදු වූයේ ඉමහත් සේවාවකි. 2006 දී රෆායෙල් කොරයා ජනාධිපති ධූරයට පත්වීමත් සමඟ ඉක්වදෝරියානු රජයේ ප්‍රතිපත්ති ධනාත්මක ලෙස වෙනස් වීමට බලපෑවේ කොරයාගේ ඍජු තීරණ වේ. තම රට ණය උගුලකට හසු කරගැනීමට ජාත්‍යන්තර ණය ලබාදෙන්නන් කටයුතු කරන බව ලොවට හඬ ගා කිව්වේ කොරයා ය. ජාත්‍යන්තර උසාවිවල ණය දෙන්නන් සමඟ සටන් කිරීමට පොරොන්දු වූයේ ද මොහු ය. එබැවින් බැඳුම්කර හිඟ මුදල් 60%කට වඩා අඩුකර ගැනීමට ඔහු සමත් විය. ලෝක බලවතුන්ට ගැති වූ බොහෝ රාජ්‍ය පාලකයන්ට ආදර්ශයක් වෙමින් කොරයා තනිවම ඔවුන්ට විරුද්ධව නැගී සිටියේ ය. එමඟින් ඔහුගේ පෞරුෂත්වය ද ඉස්මතු විය.

2006 සහ 2016 අතර කාලය තුළ දරිද්‍රතාවය 36.7% සිට 22.5% දක්වා අඩු වූ අතර වාර්ෂික ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදනය 1.5% ක් (පෙර දශක දෙකේ 0.6% ට සාපේක්ෂව) විය. ඒ සමඟ ම ගිනි සංගුණකය (The Gini Coefficient) මඟින් මැන බැලූ අසමානතාවයන් 0.55% සිට 0.47% දක්වා අඩු විය. දේශපාලන බහුශ්‍රැතයෙකු නොවූ කොරයා ඉක්වදෝරයේ සංවර්ධනය ඇති කිරීමට සමත් විය. ඒ අනුව ඔහු උගත් දැනුම මනාව හැසිරවීමට ඔහුට තිබූ හසල හැකියාව මෙහිදී ගම්‍ය වේ. ඉක්වදෝරයේ ආර්ථික වර්ධනය කලාපයේ හොඳම රටවල් අතර පමණක් නොව රටේ දුප්පතුන්ට ද වාසි ලබා දී ඇති අතර කොරයා සමාජ ආර්ථික අසමානතාවය

අඩු කළ නායකයෙකු ලෙස සඳහන් කළ හැකිය. ඔහුගේ ජනහිතකාමී පරාර්ථ චර්යාව ඔහු තුළින් නිරන්තරව ඉස්මතු වූ ගුණාංගයක් විය. ප්‍රභූවරුන් විසින් දුප්පත් මිනිසුන් පීඩාවට පත්කර ඔවුන් වෙත අධික බදු පටවා දුප්පතුන්ගේ ජීවන මට්ටම දිනෙන් දින පහත දැමුව ද කොරයා දුප්පත්කමට එරෙහිව සටන් කිරීම සඳහා සමාජ වැඩසටහන් දියත් කළේ උඩුගම්බලා පිහිනනවා හා සමාන දුෂ්කරතා උසුලා ගනිමිනි. එබැවින් ඔහු සත්‍යවශයෙන් ම දේශප්‍රේමියෙකි. ජනතා හිතෛෂී  නායකයෙකි.



*රෆායෙල් කොරයා කැරොන්ඩෙල්ට්හි දී (Carondelet) ජනතාව සමඟ (2012)*

විචක්ෂණශීලීව තීන්දු තීරණ ගැනීම මොහුගෙන් ගත හැකි තවත් ආදර්ශයකි. 2009 නොවැම්බර් මාසයේ ඉක්වදෝරය විදුලි අර්බුදයකට මුහුණ දුන් අවස්ථාව නිදසුන් ලෙස ගත හැකිය. මෙය සාර්ථක නොවූ බව බොහෝ විචාරකයන් පෙන්වා දුන්න ද අවස්ථාවට උචිත ලෙස කොරයා සිදුකළ කාර්යභාරය අගය කළ යුතු ය. එසේම ඔහු දියත් කරන ලද සෞඛ්‍ය සත්කාර වැඩසටහන් මාලාව ඇමරිකාවට පවා අභියෝගයක් විය. පුරවැසියන්ට ඔවුන්ගේ සෞඛ්‍ය අයිතිවාසිකම් උපරිම ලෙස ලබා දීමට ගත් ක්‍රියාමාර්ග ඉතා වැදගත් ය. එපමණක් නොව කොරයා දක්ෂ පරිසරවේදියෙක් ලෙස ද ආදර්ශමත් ය. මක් නිසා ද යත් ඔහුගේ පාලන සමයේ ඉක්වදෝරයේ පාරිසරික විනාශය අඩකටත් වඩා වැඩි වශයෙන් අඩු වී ඇති බැවිනි.

එමෙන් ම එක් දිනක් තුළ සිට වූ ගස් සංඛ්‍යාව පිළිබඳ ගිනස් වාර්තාව බිඳ දැමීමට ද එම රට සමත් විය. සංචාරක කර්මාන්තයේ ඔස්කාර් සම්මානය ලෙස සැලකෙන ලෝක සංචාරක සම්මාන ප්‍රදානයෙන් ඉක්වදෝරය අඛණ්ඩව සිව්වන වරටත් “World’s Leading Green Destination 2016” සම්මානයෙන් පිදුම් ලැබීය. මෙම සැම දෙයක්ම ඉක්වදෝරයට හිමි වූයේ ජනාධිපති රෆායෙල් කොරයා ආදර්ශමත් ලෙස ඔහුගේ පාලන සමය ගත කළ බැවිනි. එබැවින් රෆායෙල් කොරයා

ඉක්වදෝරයේ කටෝර පොළොවට වට අනෝරා වැස්සක් මෙන් එහි සෑම ක්ෂේත්‍රයක්ම පාහේ සංවර්ධනය කරා ගෙන ගියේ ආදර්ශ රැසක් ජාත්‍යන්තර වේදිකාවේ පෙළගස්වමිනි.

## සාරාංශය

දකුණු ඇමරිකාවේ සිව්වන කුඩාම රට වූ ලෝකයේ ස්වභාව සෞන්දර්ය අතින් පොහොසත් ඉක්වදෝරය තව තවත් බබලවමින් ජාත්‍යන්තර තලය මත සෑම ක්ෂේත්‍රයක් පාහේ ම ජයගැනීමට මංපෙත එළිය කළ නායකයෙක් ලෙස රෆායෙල් කොරයා ජනහිත දිනා ගත්තේ ය. සාරවත් අතීත සංස්කෘතියකට උරුමකම් කී ඉක්වදෝරයේ නායකයා වූයේ මනා පෞරුෂත්වයක් හිමි අයෙකු ලෙස ජාත්‍යන්තර තලය තුළ ඍජු ලෙස තම සිතැඟි ඉදිරිපත් කළ රෆායෙල් කොරයා ය. ඔහුගේ පරිපාලනය තුළ ඉක්වදෝරයේ අර්බුද රැසකට සාධනීය විසඳුම් ලබා දෙමින් ජනතාවට සිතැඟි නායකත්වයක් හොබවන්නට ඔහුට හැකියාට ලැබුණේ ය. මනා ලෙස තම නායකත්වය හසුරුවමින් ජාත්‍යන්තරය තුළ ඉක්වදෝරයේ නාමය අමරණීය කිරීමට ඔහු ගත් උත්සහය පිළිබඳව නොමැකෙන මතක සටහන් අදටත් ඉතිරිව පවතින්නේ ඔහුගේ හිතුවක්කාර, ඍජු දූරදර්ශී පාලනය පිළිබඳව මනා කොට දක්වමිනි. තම ජීවිත කාලය තුළ දී ලත් අත්දැකීම් පාදක කොට ගනිමින් ඒවායෙන් උගත් පාඩම් අවැසි මොහොතේදී තම ජනතාව මුදවා ගැනීමට ඔහු හැම විටම නොපැකිලිව යොදා ගත්තේ ය. ඔහුගේ නායකත්වය තුළ ජාතික දේශපාලනයට පමණක් නොව ජාත්‍යන්තර දේශපාලනයේ මහා බලවතුන්ට පවා උගත හැකි පාඩම් බොහෝමයක් අදටත් ශේෂව පවතී.

## මූලාශ්‍ර නාමාවලිය

AFP in Brussels, 2018. *Ecuador's ex-president Rafael Correa requests asylum in Belgium.* [Online] Available at: https://amp-theguardian-com.cdn.ampproject.org/v/s/amp.theguardian.com/world/2018/nov/08/rafael-correa-ecuador-ex-president-asylum-belgium?amp_js_v=a6&amp_gsa=1&usqp=mq331AQHKAFQArABIA%3D%3D#aoh=16203633249660&referrer=https%3A%2F%2Fwww.google.com&amp_tf=
[Accessed 14 August 2021].

BBC NEWS, 2010. *Profile: Ecuador's Raffael Correa.* [Online] Available at: https://www-bbc-com.cdn.ampproject.org/v/s/www.bbc.com/news/world-latin-america-11449110.amp?amp_js_v=a6&amp_gsa=1&usqp=mq331AQHKAFQArABIA%3D%3D#aoh=16203639698179&referrer=https%3A%2F%2Fwww.google.com&amp_tf=From%20%251%24s&ampshare=https%3A%2F%2Fwww.bbc
[Accessed 27 September 2021].

Britannica, T. E. o. E., 1999. *Rafael Correa President of Ecuador.* [Online] Available at: https://www.google.com/url?sa=t&source=web&rct=j&url=https://www.britannica. com/biography/Rafael-
[Accessed 13 August 2021].

Correspondent, H. & Quito, 2012. *Key facts about Ecuador and its president Rafael Correa.* [Online] Available at: https://www-hindustantimes-com.cdn.ampproject.org/v/s/www.hindustantimes.com/world/key-facts-about-ecuador-and-its-president-rafael-correa/story-eg281Xz0xO9mbEu7ik2G4H_amp.html?amp_js_v=a6&amp_gsa=1&usqp=mq331AQHKAFQArABIA%3D%3D#aoh=16203636698131&referre
[Accessed 1 September 2021].

Editors, TheFamousPeople.com, n.d. *Rafael Correa Biography.* [Online] Available at: https://www.thefamouspeople.com/profiles/rafael-correa-5741.php
[Accessed 02 september 2021].

globalsecurity.org, n.d. [Online]
Available at:
https://www.globalsecurity.org/military/world/ecuador/president-correa.htm
[Accessed 25 October 2021].

Malamud, C. & Calvo, C. G., 2009. *Ecuador's Foreign Policy:Presidential Interests and Ideology,* Latin America: Real Intituto Elcano.

Miroff, N., 2014. *Ecuador's popular, powerful president Rafael Correa is a study in contradictions.* [Online]
Available at: https://www.washingtonpost.com/world/ecuadors-popular-powerful-president-rafael-correa-is-a-study-in-contradictions/2014/03/15/452111fc-3eaa-401b-b2c8-cc4e85fccb40_story.html
[Accessed 30 August 2021].

newleftreview.org, 2012. *Rafael Correa Ecuador's Path.* [Online]
Available at: https://newleftreview.org/issues/ii77/articles/rafael-correa-ecuador-s-path
[Accessed 04 September 2021].

Smith, S., 2017. *Ecuador's Accomplishments under the 10 Years of Rafael Correa's Citizen's Revolution.* [Online]
Available at: https://www.coha.org/ecuadors-accomplishments-under-the-10-years-of-rafael-correas-citizens-revolution/
[Accessed 5 September 2021].

Subasinghe, H., 2018. *roarmedia.* [Online]
Available at: https://roar.media/sinhala/main/features/the-country-of-ecuador/amp
[Accessed 18 October 2021].

sunsigns.org, 2017. *Rafel Corea Biography,Life,Interesting Fact.* [Online]
Available at: https://www.sunsigns.org/famousbirthdays/profile/rafael-correa/
[Accessed August 2021].

Torre, C. d. l., 2013. In the Name of the People: Democratization,Popular Organizations,and Populism in Venezuela,Bolivia,and Ecuador. *JSTOR,* October, 47(111), pp. 27-48.

# හියුගෝ රෆායෙල් චාවේස්



**කණ්ඩායම් සාමාජිකයින් :**

- ඉසුරි උදාරා ඊශ්වර
- ජී.ඩබ්. අංජනී සකුණිකා
- බී.වී.ලක්ෂිකා දිල්ශානි
- ඒ.එම්. ජුලාංජලී ඉශංකා
- ජී.ඩී. සජිනි පියුමා ගම ඇතිගේ

# හැඳින්වීම

ලෝක ඉතිහාසය අධ්‍යයනය කරන විට ජාතික සමගිය, ජාතික ආරක්ෂාව, ජනතා අභිවෘද්ධිය වැනි නොයෙකුත් සාධක වෙනුවෙන් ජීවිත පරදුවට තබා මහඟු සේවාවන් කළ ලෝක නායකයින් පිළිබඳ අපට අසන්නට දකින්නට ලැබේ. ඒ අතරින් වෙනිසියුලානු ජනතාව හා රාජ්‍යය වෙනුවෙන් දිවි හිමියෙන් ඇප කැප වූ වඩාත් ආකර්ෂණීය නායකයකු පිළිබඳ වෙනිසියුලානු දේශපාලන ඉතිහාසය විමසීමේ දී අපට දැකගත හැකි ය. වෙනිසියුලාව ලෝකයේ දීප්තිමත්ව බැබළෙන රාජ්‍යයක් ලෙස නිර්මාණය කිරීමේ පරමාර්ථයෙන් කටයුතු කළ මෙතුමා එරට 45 වන ජනාධිපතිවරයා වේ. ඔහු නමින් "හියුගෝ රෆායෙල් චාවේස් ෆ්‍රියාස්" ( Hugo Rafael Chavez Frias ) වන අතර හියුගෝ චාවේස් නම් කෙටි නාමයෙන් ඔහුව ආමන්ත්‍රණය කරනු ලබයි.

1954 ජූලි 28 වන දින වෙනිසියුලානු ජනාධිපති හියුගෝ චාවේස් සබනේටා (Sabaneta) නම් ගමෙහි උපත ලැබී ය. එතැන් පටන් ඔහුගේ ළමා කාලය ගෙවීගිය ආකාරය, ප්‍රාථමික, ද්විතීයික හා උසස් අධ්‍යාපනය ලබාගත් ආකාරය යනාදිය පිළිබඳ රසවත් තොරතුරු රැසක් නොයෙක් මූලාශ්‍ර තුළින් හමුවේ. පාසල් අධ්‍යාපනයෙන් පසු මෙතුමාගේ දේශපාලන ගමන්මඟ ආරම්භ වූයේ 1997 දී ය. එතැන් සිට ආරම්භ කළ දේශපාලන ගමන, අවසානයේ වෙනිසියුලාවේ ජනාධිපති ධූරය දක්වා ඒමට මගපෑදී ය.

වෙනිසියුලාවේ අනාගත අභිවෘද්ධිය වෙනුවෙන් කළ මහඟු සේවයේ වටිනාකම එතුමාගේ ජීවිත කතාව අධ්‍යයනය කරන විට මනා ලෙස පැහැදිලි වෙයි. වෙනිසියුලාවේ ස්වාධීනත්වයට හානි නොවන අයුරින් දැඩි ව, කාර්යශූර ව හා අධිෂ්ඨානශීලී ව දේශීය ආර්ථිකය, දේශපාලනය මෙන් ම සාමාජීය ක්ෂේත්‍රයන් ගොඩනංවාලීමට දැරූ උත්සාහය ඉතා අගනේ ය. චාවේස් සිය දේශයේ අඩු ආදායම්ලාභී හා දුගී පැල්පත් ජනතාව වෙනුවෙන් සහන ලබා දුන් අතර දේශීයත්වය ඔප්නංවාලීමට හා නගාසිටුවීමට කටයුතු කළ සැබෑ දේශප්‍රේමියෙකු ලෙස ජනාදරයට පාත්‍ර වූයේ ය.

නොයෙකුත් බාධක හා අභියෝගවලට නොසැලී දිවි හිමියෙන් දේශයේ අනාගත අභිවෘද්ධිය වෙනුවෙන් ඉතා ශක්තිමත්ව කටයුතු කිරීමට ඔහු ගත් උත්සාහය අගනේ

ය. ලෝකයේ බොහෝ රටවල් සමඟ ඉතා සමීපව හා මිත්‍රශීලීව කටයුතු කළ මෙතුමා සැම විටම උත්සාහ කළේ තම දේශයේ නාමය ජාත්‍යන්තරය තුළ ද නොමඳ වටිනාකමක් ඇති රාජ්‍යයක් බවට පත් කිරීමට ය. ඒ සඳහා ඔහු විසින් ගත් ක්‍රියාමාර්ගයන් හා එහි සාර්ථකත්වයන් පිළිබඳව මෙම දිගහැරුමෙන් මනාව පැහැදිලි වනු ඇත.

මෙලෙස වෙනිසියුලාවේ අභිවෘද්ධිය උදෙසා කටයුතු කළ චාවේස් සිය ළමා කාලය ගත කළ ආකාරය, දේශපාලන ගමන් මඟ, දේශපාලන ප්‍රතිපත්ති සහ සිදු කළ සේවාවන් මෙන් ම සැබෑ දේශප්‍රේමී දේශපාලඥයෙකු වශයෙන් අපට ඔහුගේ දිවියෙන් ගත හැකි ආදර්ශයන් පිළිබඳව ද මෙතුළින් දිගහැරෙනු ඇත.

## ළමා කාලය, අධ්‍යාපනය හා දේශපාලනයට පිවිසීම

වෙනිසියුලාවේ 45 වැනි ජනාධිපතිවරයා බවට පත්වූ "හියුගෝ රෆායෙල් චාවේස් ෆ්‍රියාස්" (Hugo Rafael Chavez Frias) 1954 ජූලි 28 වැනිදා වෙනිසියුලාවේ බරිනාස් (Barinas) ප්‍රාන්තයේ සබනේටා (Sabaneta) නම් කුඩා ගොවි ගම්මානයේ උපත ලැබීය. බරිනාස් යනු වෙනිසියුලාවේ, කොලොම්බියානු දේශසීමාව අසල පිහිටි ප්‍රාන්තයකි. චාවේස්ගේ පියා "හියුගෝ ඩී. ලොස් රෙයස් චාවේස්" (Hugo de Los Reyes Chavez) ය. මව "එලේනා ෆ්‍රියාස් ඩි. චාවේස්" (Elena Frias de Chavez) ය. චාවේස්ගේ මව හා පියා යන දෙදෙනාම ගුරුවරුන් වූහ. චාවේස් එම පවුලේ දරුවන් සත් දෙනාගෙන් දෙවෙනියා විය. චාවේස්ගේ පරම්පරාව ආමේනියානු ඇෆ්‍රෝ - වෙනිසියුලානු (Armenian Afro – Venuzuelan) සහ ස්පාඤ්ඤ සම්භවයකට අයත් විය.

චාවේස් තම මූලික අධ්‍යාපනය ජුලියන් පිනෝ (Julian Pino School) ප්‍රාථමික පාසලෙන් ලබා ගත්තේ ය. මෙකල වනවිට වෙනිසියුලාවේ දේශපාලන හා ආර්ථික බලය ධනවත් ඉඩම් හිමියන් සහ කර්මාන්තකරුවන්ගේ අතේ පැවතුණ හෙයින් වෙනිසියුලාවේ ජනගහනයෙන් වැඩි පිරිසකට සිය අවශ්‍යතා ඉටුකර ගැනීමට මුදල් ලබා ගැනීමට මහත් පරිශ්‍රමයක් දැරීමට සිදුවීම සාමාන්‍ය තත්ත්වයක් විය. මෙහි බලපෑම චාවේස් පවුලට ද ඒ ආකාරයෙන් ම අදාළ විය. මන්දයත් චාවේස්ගේ දෙමාපියන් ගුරුවරුන් වුව ද පැවති ආර්ථික දුෂ්කරතා හේතුවෙන් අනෙකුත් මධ්‍යම

පාන්තිකයන් හට මෙන් ම ආර්ථික අගහිඟකම් සඳහා මුහුණ දීමට චාවේස් පවුලට සිදු වූ අතර ජීවිත අරගලය ඉදිරියට රැගෙන යාමට මහත් පරිශ්‍රමයක් දැරීමට සිදු විය. එමනිසා ඔවුන්ගේ සියලු දරුවන්ට උපකාර කිරීමට ප්‍රමාණවත් මුදලක් නොතිබූ නිසාවෙන් චාවේස් සිය වැඩිමල් සොයුරු ඇඩන් සමඟ බරිනාස් නගරයේ තම ආච්චි අම්මා වූ "රෝසා ඉනීස් චාවේස්" (Rosa Ines Chavez ) ගේ නිවස වෙත ගියහ.

ඉන්පසු චාවේස් සිය වැඩිමල් සොයුරු "ඇඩන්" (Adan) සමඟ ද්විතීයික අධ්‍යාපනය ලබා ගැනීමට බරිනාස්හි ඩැනියෙල් ෆ්ලොරෙන්සියෝ ඕ´ලෙයරි (Daniel Florencio O'Leary High School) උසස් විද්‍යාලයට ඇතුළත් විය. ඔහු උසස් විද්‍යාලයේ ඉගෙනුම ලබන අතර චිත්‍ර හා ගායනය වැනි විනෝදාංශ කෙරෙහි ද අවධානය යොමු කළේ ය. යෞවනයෙකු වූ චාවේස් බේස්බෝල් රසිකයෙක් ද විය. ඔහු බේස්බෝල් ගැන වැඩි උනන්දුවක් දැක්වූවේ ය. බේස්බෝල් ක්‍රීඩකයෙකු වීමට සිහින මැව්වේ ය. ඔහුගේ ළමාවියේ සිහිනවලින් එකක් වූයේ ඔහුගේ වීරයා වන වෙනිසියුලානු බේස්බෝල් ක්‍රීඩක ඊසාස් "ලැටිගෝ" චාවේස් (Isaias "Latigo" Chavez) ගේ අඩිපාරේ යමින් බේස්බෝල් ක්‍රීඩකයෙකු වීමයි. නමුත් වෙනිසියුලානු ඉතිහාසයේ සිදුවූ දෙවන දරුණුතම ගුවන් අනතුරින් 1969 මාර්තු 16 වන දින ලැටිගෝ මියගිය අතර එම සිදුවීම චාවේස්ට මහත් ශෝකයක් ඇති කළ සිද්ධියක් විය. කෙසේ නමුත් දිගින් දිගටම කැපී පෙනෙන ලෙස බේස්බෝල් ක්‍රීඩා කළ චාවේස් වෙනිසියුලානු ජාතික බේස්බෝල් ශූරතාවලියට පවා ක්‍රීඩාකර ජයග්‍රහණ ලබා ගන්නා ලදි. ඔහු ඉතිහාසය හා දේශපාලනය කෙරෙහි ද විශේෂ ඇල්මක් මෙකල දැක්වීය. චාවේස් වෙනිසියුලාවේ කම්කරු පන්තියේ දරිද්‍රතාව කෙරෙහි සිය අවධානය බැරෑරුම් ලෙස යොමු කළේ ඇකඩමියේ අධ්‍යාපනය ලැබූ කාලය තුළ දී ය. එසේම උසස් විද්‍යාලයේ ගත කරන කාලය තුළ චාවේස් ඉතිහාසඥයෙකු හා ලේඛකයෙකු මෙන් ම දැඩි කොමියුනිස්ට්වාදියකු වූ "ජෝස් එස්ටෙබන් රූයිස් ගුවේරාගේ"(Jose Esteban Ruiz Guevara) පුතුන් දෙදෙනෙකු සමඟ මිත්‍ර විය. ඔවුහූ දැඩි ලෙස ම චාවේස්ගේ දේශපාලන දර්ශනය කෙරෙහි බලපෑම් කළහ. ඔවුන් නිවසේ එකට ආහාර ගන්නා අවස්ථාවලදී මෙන් ම එකට කාලය ගත කරන අවස්ථාවලදී ද සිදුකරන කතාබස්වලින් චාවේස්ට ඔවුන් තුළ ඇති අදහස් සමාන බව පෙනී ගියේ ය. ඔවුන්ගේ සාකච්ඡා අතරට කොමියුනිස්ට්වාදයේ පියෙකු වූ ජර්මානු දාර්ශනික ‘‘සයිමන් බොලිවර්’’ (Simon Bolivar ) හා ‘‘කාල් මාක්ස්’’ (Karl Marx) ගේ ඉගැන්වීම් ද,

ඇතුළත් විය. ඔහු ‘‘කාල් මාක්ස්’’ සහ ‘‘ව්ලැඩිමීර් ලෙනින්’’ (Vladimir Lenin) ගේ මෙන් ම අනෙකුත් කොමියුනිස්ට් දර්ශනය පිළිබඳ අධ්‍යනය කළ කතුවරුන්ගේ කෘති ද කියවා දැන හඳුනා ගත්තේ ය. මෙම අදහස් චාවේස්ගේ සිතේ තැම්පත් වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස ඔහුගේ දේශපාලන දර්ශනය හා පාලන විලාසය කෙරෙහි මෙම වාමාංශික අදහස් පැහැදිලි බලපෑමක් සිදු කළේ ය. පසුකාලීනව සයිමන් බොලිවර් චාවේස්ගේ පරමාදර්ශය බවට ද පත්විය. ඊට අමතරව 1960 කාලවකවානුවල දී වෙනිසියුලානු රජයට එරෙහිව සටන් කිරීමට පටන් ගත් කොමියුනිස්ට් ගරිල්ලා කැරැල්ල වන ජාතික විමුක්ති සන්නද්ධ හමුදාව (ෆුවර්සාස් ආමදාස් ඩි. ලිබරේෂන් නැෂනල්; Fuerzas Armadas De. Liberation National- FLAN) ද චාවේස්ගේ දේශපාලන දර්ශනය කෙරෙහි බෙහෙවින් බලපෑවේ ය. මේ සඳහා කියුබානු නායක "ෆිදෙල් කැස්ත්‍රෝ" (Fidel Castro) සහය දැක්වූ අතර ඉන්පසු කැස්ත්‍රෝ ද චාවේස්ගේ තවත් එක් පරමාදර්ශී චරිතයක් බවට පත්විය.

මෙලෙසින් කාලය ගෙවීයත්ම 17 හැවිරිදි චාවේස් විසින් 1971 දී වෙනිසියුලාවේ අගනුවර වන කැරකස්හි වෙනිසියුලානු හමුදා විද්‍යා ඇකඩමියට (Venezuelan Academy of Military Sciences )ඇතුළත් වීමට කටයුතු කරන ලදි. ඔහු ඇකඩමියට ඇතුළත් වූයේ සොල්දාදුවෙකු වීමට අවශ්‍ය නිසා නොව කුඩාකල සිටම වෘත්තීය බේස්බෝල් ක්‍රිඩකයෙකු වීමට සිහින මැවූ නිසාත්, ඇකඩමිය තුළ දක්ෂ බේස්බෝල් පුහුණුකරුවන් සිටි නිසාත් ය. එසේ වුවත් චාවේස් ලබාගත් අඩු ලකුණු නිසා විශ්වවිද්‍යාලය විසින් ඔහු ප්‍රතික්ෂේප කරනු ලැබීය. නමුත් වාසනාවකට මෙන් ඔහු දක්ෂ බේස්බෝල් ක්‍රීඩකයෙකු වීම සහ බේස්බෝල් ක්‍රීඩාව සඳහා දැක්වූ දක්ෂතා හේතුවෙන් ඇකඩමිය තුළට ඇතුළත් වීමට ශිෂ්‍යත්වයක් ලබා ගත්තේ ය. ඒ අනුව ඔහු ශිෂ්‍යභටයෙකු ලෙස ඇකඩමියට ඇතුළත් විය. ඔහු ඇකඩමිය තුළ සිටියදී කවි ලියුවේ ය. චිත්‍ර ඇන්දේ ය. එලෙසම බේස්බෝල් ක්‍රිඩාවේ ද නිරත විය. ඔහු දක්ෂ බේස්බෝල් වමත් පිතිකරුවෙකු වුව ද වෘත්තීය වශයෙන් ක්‍රීඩා කිරීමට තරම් දක්ෂ නොවූ හෙයින් ඔහු සිය අධ්‍යයන කටයුතු තවදුරටත් ඉදිරියට කරගෙන ගියේ ය. ඊට අමතරව ඔහු මිලිටරි ක්‍රමෝපායන් හා උපක්‍රම පිළිබඳව ද හැදෑරීමක් සිදු කළේ ය.

චාවේස් විශ්වවිද්‍යාලය තුළ සිටින කාලය තුළ දී පවා ඔහු දේශපාලනය හා සම්බන්ධ පොත් කියවීම, දේශපාලන ක්ෂේත්‍රය හැදෑරීම කෙරෙහි වැඩි වශයෙන් අවධානය

යොමු කළේ ය. මේ නිසා ඔහුට විශ්වවිද්‍යාල කාලය තුළ වාමාංශිකයන් ඇසුරු කිරීමේ අවස්ථාව හිමිවිය. ඇකඩමියේ ඉගෙනුම ලබන කාලය තුළ චාවේස්ගේ ජීවිතයේ තවත් වැදගත් සිදුවීමක් විය. එනම් 1971 සිට 1973 දක්වා කාලය තුළ පැනමියානු (Panamian) හමුදා ශිෂ්‍ය භටයින් පිරිසක් චාවේස්ගේ ඇකඩමියට පැමිණීම ය. ඔවුන්ගෙන්, චාවේස් මුලින්ම පැනමාවේ නායක "ඕමාර් ටොරිජෝස්" (Omar Torrijos) සහ එසමයෙ හි වාමාංශික පැනමියානු විප්ලවය ගැන දැන ගත්තේ ය. එමෙන් ම පේරු නිදහස් සටනේ දී සිදු වූ අයකුචෝ (Ayacucho) සටනේ 150 වන සංවත්සරය සැමරීම සඳහා 1974 දී හමුදා විද්‍යා ඇකඩමිය විසින් සිසුන් යැවූ අතර එයට 20 හැවිරිදි චාවේස් ද ඇතුළත් විය. එම සැමරුමේදී රාජ්‍ය නායක " ජුවාන් වේලාස්කෝ අල්වරාඩෝ" (Juan Velasco Alvarado) සභාව ඇමතුවේ ය. පාලක පන්ති දූෂිත බැවින් කම්කරු පන්තියේ අවශ්‍යතා සඳහා මිලිටරි ක්‍රියාමාර්ගයක අවශ්‍යතාවය පිළිබඳව ජනාධිපතිවරයා කළ කතාවෙන් විසි හැවිරිදි හියුගෝ චාවේස් දැඩි ලෙස පුදුමයට පත් විය. වේලාස්කෝ සහ ටොරිජෝස් ආභාසය හියුගෝගේ දේශපාලන අදහස් තවදුරටත් වර්ධනය වීමට හේතු විය. එලෙසම ඇමෙරිකානු විප්ලවවාදී දේශපාලන චින්තනය, මාක්ස් විප්ලවවාදී අදහස් ආදිය ගැන උනන්දුවක් දැක්වූ චාවේස්, චේ ගුවේරාගේ 1928-1967 චරිතාපදානය ඇතුළත් දිනපොත කියවා විප්ලවීය අදහස් තම සිතේ ධාරණය කර ගත්තේ ය. ඇකඩමියේ ඉගෙනුම ලබන චාවේස් ජාතික වීර ජෙනරාල් සයිමන් බොලිවර්ගේ ජීවිතය හා දේශපාලන චින්තනය ගැන තවදුරටත් උනන්දු විය. එහිදී චාවේස් වෙනිසියුලානු කම්කරු පන්තිය මුහුණ දෙන දරිද්‍රතාව කෙරෙහි අවධානය යොමු කළ අතර අනාගතයේ දී මෙම සමාජ අසාධාරණය වෙනස් කිරීමට තීරණය කළේ ය. මෙය ඔහුගේ දේශපාලන දර්ශනය හා පාලන විලාසය ගොඩනැගීමට ප්‍රධාන විය. මේ කාලය වනවිට චේ ගුවේරා (Che Guevara), ෆිදෙල් කැස්ත්‍රෝ, සයිමන් බොලිවර් යනාදීන් චාවේස්ගේ පරමාදර්ශ බවට පත් වී තිබුණි. විශ්වවිද්‍යාල කාලය තුළ දී මේ අයුරින් චාවේස් දේශපාලන අදහස්, මතවාදවලින් පෝෂණය විය.

1975 දී 21 වියැති චාවේස් යුධ හමුදා විද්‍යාලයෙන් උපාධිය ලබා ගත්තේ ය. අනතුරුව ඔහු හමුදාවට බැඳුණු අතර දෙවැනි ලුතිනන්වරයෙකු ලෙස වෘත්තීය දිවිය ආරම්භ කරන ලදි. ඒ අතර ඔහු ඉහළ පෙළේ පැරෂුට් ඒකකයක ප්‍රධානියා බවට ද පත්විය. එමෙන්ම ඔහු තම පැරණි පාසල වන වෙනිසියුලානු හමුදා විද්‍යා ඇකඩමියේ උපදේශකයෙකු ලෙස ද කාලයක් කටයුතු කළේ ය. ලුතිනන්වරයෙකු ලෙස පත් වූ

චාවේස්ට කිරීමට සිදු වූ පළමු පැවරුම වූයේ කලින් ඇතිවූ ගරිල්ලා කැරැල්ලෙන් ඉතිරි වූ සෙසු වාමාංශික ගරිල්ලන්ට විරුද්ධව සටන් කිරීමයි.

එක් වැසි දිනක රාත්‍රී කාලයේ මුර සංචාරයේ යෙදී සිටිය දී හමුදා පිරිස් විසින් සැකකටයුතු ගරිල්ලන් පිරිසක් ගෙනවිත් ඔවුන්ට පහර දෙන ලදි. එම අවස්ථාවේ චාවේස් විසින් සොල්දාදුවන් නැවැත් වූ අතර එසේ කිරීමේ වරද හේතුවෙන් ඔහු උසාවියට ගෙන යනු ලැබීය. දින කිහිපයකට පසු ගරිල්ලා පිරිස් විසින් සැඟවී සිට සොල්දාදුවන් පිරිසක් මරා දමා ඇති ආකාරය ඔහු දුටුවේ ය. එහිදී ඔහුට තේරුම් ගියේ මෙය ප්‍රචණ්ඩත්වය පිළිබඳ දෘෂ්ටිවාදයට වඩා සමාජ පන්තිය හේතුවෙන් ඇතිවන කැරැල්ලක් බවයි. මන්ද එක් පැත්තකින් හමුදා නිල ඇඳුමින් සැරසුන පිරිස් ගරිල්ලන්ට වධහිංසා කරන අතර අනෙක් පැත්තෙන් ගරිල්ලන් විසින් සොල්දාදුවෝ මරා දමනු ලබති. කෙසේ නමුත් මේ සියලු සිද්ධි දාමයන්ගේ අවසානයේ චාවේස් තේරුම් ගත්තේ රජය තුළ පමණක් නොව සමස්ත හමුදාවේ ද දූෂණයක් ඇති බවයි. වෙනිසියුලාවේ තෙල් ධනය පාලනය කරන ධනවත් දේශපාලන ප්‍රභූන් මෙම තත්ත්වයට හේතුවන සැබෑ සතුරන් බවත්, වෙනිසියුලාවේ දුප්පතුන් තෙල් සම්පතින් ප්‍රතිලාභ නොලබන බවත් ගරිල්ලන් යැයි හඳුන්වන මෙම පිරිස සැබැවටම හොඳ ජීවන තත්ත්වයක් සඳහා සටන් කරන අහිංසක ගොවීන් පිරිසක් බවත් ඔහු අවබෝධ කර ගත්තේ ය. ඉන් සංවේදී වූ ඔහු රටේ පවතින තත්ත්වය දැක කළකිරීමට පත්විය.

මේ අතරතුර 1977 වනවිට චාවේස් තම වැඩිමල් සොයුරු ඇඩන් කැරලිකරුවන් සමඟ රහසිගතව කටයුතු කරන බව දැනගත් විට තවත් කළකිරීමට පත්වී හමුදාවෙන් ඉවත් වීමට සූදානම් විය. නමුත් එම අවස්ථාවේ වෙනිසියුලානු විප්ලව පක්ෂයේ ( පාර්ටිඩෝ ඩි ලා රිවොලුසියන් වෙනිසෝලානා; Partido de la Revolucion Venezolana-PRV) ප්‍රධානියා වන ඩග්ලස් බ්‍රාවෝ (Douglas Bravo) ආශ්‍රය කිරීමට හැකිවිය. දශකයකට ආසන්න කාලයක් ඔවුන් දෙදෙනා සමීපව කටයුතු කළ අතර චාවේස් බ්‍රාවෝගෙන් බොහෝ දේ ඉගෙන ගත්තේ ය. බ්‍රාවෝගේ ඉල්ලීම පරිදි චාවේස් ඔවුන්ගේ විප්ලවවාදී දෘෂ්ටිවාදය හමුදාව තුළ ව්‍යාප්ත කිරීමට පටන් ගත්තේ අවසානයේ කුමන්ත්‍රණයකින් බලය අල්ලාගෙන සිවිල් හා හමුදා නායකයින්ගේ සම්මිශ්‍රණයකින් රට මෙහෙයවීමේ අරමුණෙනි. ඔහුගේ නව උපදේශකයාගේ දිරිගැන්වීම මත, චාවේස් සිය හමුදා ජීවිතයේ ඉතිරි කාලය ගත කළේ තම අයිතිවාසිකම් වෙනුවෙන් සටන් කළ ගරිල්ලන් සමඟ කුමන්ත්‍රණය කිරීමට හා ඒ පිළිබඳව ඉගෙන ගැනීමට ය. සමස්ත වෙනිසියුලානු සමාජයේ විශාල වශයෙන්

අල්ලස් හා දූෂණ සාමාන්‍යකරණය වී තිබූ අතර, 1982 දී චාවේස් සහ තවත් සෙසු හමුදා නිලධාරීන් සිය විප්ලවවාදී අදහස් පැතිරවීමට "බොල්වේරියානු විප්ලවවාදී ව්‍යාපාරය" ( Movimiento Bolivariano Revolucionario 200 ; MBR 200) නම් රහසිගත සංවිධානයක් පිහිටුවා ගත්තේ ය. ඔවුන්ගේ ඉලක්කය වූයේ සිවිල්-හමුදා කුමන්ත්‍රණයකින් බලය ලබා ගැනීමයි.

මින් වසර කිහිපයකට පසු, එනම් 1989 දී "කාලෝස් ඇන්ඩ්‍රෙස් පෙරෙස්" (Carlos Andres Perez ) රටේ ජනාධිපති ධුරයට පත් වූ අතර ඔහු පැවති දූෂිත තත්ත්වයන් නවතන බවට ඡන්දදායකයින්ට පොරොන්දු විය. කෙසේ වෙතත්, යථාර්ථය නම් පෙරෙස් ඊටත් වඩා නරක ප්‍රතිපත්ති අනුගමනය කිරීමට යොමු වීමයි . එහිදි කප්පම් ගැනීම්, අල්ලස් ලබා ගැනීම් ආදිය ද සිදු වූ අතර මේ නිසා වැඩි කල් නොගොස් වෙනිසියුලානු ජාතිකයන් රජය විවේචනය කරමින් විරෝධතා දක්වමින් පාරට බැස්සේ ය. කෙසේ වෙතත්, කාලෝස් ඇන්ඩ්‍රෙස් පෙරෙස්ගේ නියෝගය පරිදි සියලු පෙළපාලි හමුදාව විසින් අමානුෂික ලෙස මර්දනය කරන ලදි. මේ අවස්ථාවේ දී, සිදු වන කුරිරුකම් ගැන දැනගත් චාවේස් හමුදා කුමන්ත්‍රණයක් සංවිධානය කිරීමේ අවශ්‍යතාවයක් ඇති බව තේරුම් ගත්තේ ය. මෙලෙස ජනාධිපති කාලෝස් ඇන්ඩ්‍රෙස් පෙරස්ගේ දූෂිත වෙනිසියුලානු දේශපාලනය ගැන පිළිකුලට පත්ව සිටි බොහෝ වෙනිසියුලානු ජාතිකයන්ගෙන් සහ හමුදා නිලධාරීන්ගෙන් එක් අයෙකු වූයේ චාවේස් ය. තම අදහස ඒ හා සමානව දරණ නිලධාරීන් සමඟ චාවේස්, පෙරස්ව බලහත්කාරයෙන් නෙරපා හැර ආණ්ඩුව පෙරළා දැමීමට තීරණය කළේ ය. චාවේස්ගේ එම උත්සාහයේ උච්චතම අවස්ථාව උදා වූයේ 1992 වසරේ දී ය. ඒ අනුව 1992 පෙබරවාරි 04 වැනිදා උදෑසන 38 හැවිරිදි චාවේස් පක්ෂපාතී මිලිටරි නිලධාරීන් කණ්ඩායමක් හා 12,000 කට අධික හමුදා නිලධාරීන් සමඟ ජනාධිපති කාලෝස් ඇන්ඩ්‍රෙස් පෙරෙස්ට එරෙහිව කැරකස් (Caracas) වෙත ගෙනගිය අතර එහිදී ජනාධිපති මන්දිරය, ගුවන් තොටුපොළ, ආරක්ෂක අමාත්‍යාංශය සහ හමුදා කෞතුකාගාරය ඇතුළු වැදගත් ස්ථානවල පාලනය අල්ලා ගැනීමට ඉලක්ක කෙරිණි.

නමුත් අවාසනාවකට මෙන් චාවේස්ගේ සැලැස්ම ඉක්මනින් බිඳ වැටිණි. කැරලිකාර නායකයන් ඔවුන් ඉලක්ක කරගත් නගරවල පාලනය සාර්ථකව යටත් කර ගත්ත ද, චාවේස්ගේ මෙහෙයුම වූ ජනපති පෙරෙස් අල්ලා ගනිමින් කැරකස් සිය පාලනය යටතට නතුකර ගැනීම අසාර්ථක විය. ජනපති මන්දිරය අසල හමුදා

කෞතුකාගාරයේ සිරවී සිටි චාවේස් තවදුරටත් සටන් කිරීම නිශ්ඵල ක්‍රියාවක් බව වටහා ගත්තේ ය. ඔහු තම ක්‍රියාකලාපය පැහැදිලි කිරීම සඳහා "රූපවාහිනියෙන් තම පාක්ෂිකයන් ඇමතීමට අවසර දිය යුතුය" යන කොන්දේසිය මත යටත් වීමට එකඟ විය. ඔහු කැමරාව ඉදිරිපිට සිටගෙන සෙසු සහෝදරවරුන්ට පවසා සිටියේ කණගාටුවෙන් වුව ද, "දැනට" බලය ලබා ගැනීමේ ඉලක්කය සපුරාගත නොහැකි අතර තවදුරටත් ලේ වැගිරවීම් වළක්වා ගැනීම සඳහා ආයුධ බිම තබන ලෙස ය. විනාඩි දෙකකටත් අඩු කාලයක් ඔහුගේ කතාව පැවතිය ද, එම කතාව ජනතාව අතර "පෝර් අහෝරා" (por ahora) හෙවත් "දැනට" යන අර්ථයෙන් යුතු කථාව ලෙස ප්‍රසිද්ධියට පත් වූ මෙම සිදුවීම ජාත්‍යන්තර අවධානය ද දිනා ගත්තේ ය.



*පෝර් අහෝරා මාධ්‍ය සාකච්ඡාව අතරතුර අවස්ථාවක්*

"නමුත් චාවේස් අමතක නොවන රූපවාහිනී සාකච්ඡාවකින් ජනරජයේ සදාචාරාත්මක හා ආර්ථික පරිහානිය විවේචනය කළේ ය. ඔහු ක්ෂණික වීරයෙකු බවට පත්විය" ("but not before Chaves, in an unforgettable televised jeremiad, denounced the moral and economic rot at the heart of that once - so - hopeful republic. He became an immediate hero.") යනුවෙන් නිව්ස්වීක් ඉන්ටර්නැශනල් (Newsweek Interntaional) හි "බෙන්ජමින් මෝසර්" (Benjamin Moser) සඳහන් කර තිබීම තුළින් පැහැදිලි වනු ඇත. එලෙස 1992 සිදු වූ මෙම සිදුවීම නිසා දේශපාලඥයෙකු ලෙස චාවේස්ගේ දිවියේ ඇරඹුම සනිටුහන් විය.

## නායකත්වය කරා ගිය ගමන් මග

පෙර පැවසුවාක් මෙන් චාවේස්ගේ "දැනට" නමින් ප්‍රසිද්ධ වූ මාධ්‍ය ඇමතීම ඔහුගේ දේශපාලන දිවියේ හැරවුම් ලක්ෂය විය. ඔහු දේශපාලනයට පිවිසීමේ මූලික අඩිතාලම දමනු ලැබුවේ මේ සිදුවීමත් සමඟිනි. මන්ද, බොහෝ වෙනිසියුලානු ජාතිකයන් ඒ වන විට සිටි රාජ්‍ය නායකයා ගැන කලකිරීමට පත් වූ අතර රට ප්‍රතිසංස්කරණය කිරීම සඳහා චාවේස්ගේ එඩිතර අදහස් වලට ඔවුන් ප්‍රශංසා කළහ. චාවේස්ගේ කතාවෙන් පසු ඔහු නැවත කවදා හෝ එන බවට වෙනිසියුලානු ජනතාව අපේක්ෂාවෙන් සිටියහ. කෙසේ වෙතත් 1992 දී චාවේස් කුමන්ත්‍රණයට තැත් කිරීම සම්බන්ධයෙන් කිසිඳු උසාවි නියෝගයක් නොමැතිව වසර 6කට සිරගත කරන ලදි.

සිරගෙයි සිටින කාලය අතරතුර ජනපති පෙරෙස් සාපරාධි අරමුණු සඳහා භාණ්ඩාගාරය අයථා ලෙස පරිහරණය කිරීම් හා වංචා කිරීම් මෙන් ම නොයෙකුත් දූෂණ චෝදනා ලැබ ධූරයෙන් ඉවත් කළ අතර, ඉන් පසුව 1994 වසරේ දී වෙනිසියුලාවේ ජනාධිපති වශයෙන් "රෆායෙල් කල්දේරා" ( Rafael Kaldera) පත් වූයේ ය. කල්දේරාගේ පොරොන්දුවක් වූයේ නායකත්වයට පැමිණි පසු චාවේස් සියලු චෝදනාවලින් නිදොස්කොට නිදහස් කරන බවයි. එහි ප්‍රතිඵලයක් වශයෙන් සය අවුරුද්දකට සිරගත වූ චාවේස්, ජනපති කල්දේරාගේ නායකත්වයත් සමඟ වසර දෙකකින් සියලු චෝදනාවලින් නිදොස් වී නිදහස් විය. නමුත් ඔහු නිදහස ලබා ගැනීමට ප්‍රථම සිරගෙයි සිටි කාල සීමාව තුළදී දේශපාලන න්‍යායවාදීන්ගේ පොතපත කියවන්නට පටන් ගත්තේ ය. ඒ අතර "ඇන්ටෝනියෝ නෙග්රි" ( Antonio Negri ) යන අයගේ දෘෂ්ටිවාදී පොත්පත් ද විය.

සිරගෙයින් නිදහස් වී පැමිණි චාවේස් කුමන්ත්‍රණය මගින් දේශපාලන බලය අත්පත් කර ගැනීම ප්‍රතික්ෂේප කර නීත්‍යානුකූල මාර්ගයෙන් දේශපාලන බලය ලබා ගැනීමට තීරණය කළ ද, මැතිවරණයට පිවිසීමට ඔහු තුළ කැමැත්තක් නොවූයේ ය. මන්දයත්, ඒ වන විට වෙනිසියුලාවේ පැවති පැරණි දේශපාලන ක්‍රමය නැවතත් ප්‍රතිසංස්කරණය කළ නොහැකි තරම් දූෂිත වී තිබූ බැවිනි. එසේම එම ක්‍රමය අලුතින් දේශපාලනයට පිවිසෙන්නන්ට දොරගුළු දමා තිබීම ද ඔහුගේ අකමැත්තට තවත් හේතුවක් විය. මේ හේතුව නිසා චාවේස් දේශපාලන දැනුම ලබාගැනීම මෙන්ම තම අදහස් සාමාන්‍ය ජනතාවට ප්‍රකාශ කිරීම සඳහා මිතුරන් සමඟ රට පුරා සංචාරය

කළේ ය. එම සංචාරය අතරතුර දී සිය දේශපාලන හා දෘෂ්ටිවාදාත්මක ස්ථාවරය පෙරට වඩා පැහැදිලිව ඉදිරිපත් කිරීමට හැකි වූ අතර මෙය ඔහුගේ දීර්ඝකාලීන දේශපාලන වැඩසටහනේ තවත් එක් සන්ධිස්ථානයක් විය. ඒ අනුව චාවේස් සිය මැතිවරණ ඉලක්ක කරා යොමු වීමේ ක්‍රියාවලිය "සයිමන් බොලිවර් ජාතික ව්‍යාපෘතිය" (Simon Bolivar National Campaign) ලෙස නම් කළේ ය. මීට අමතරව බොලිවියානු ව්‍යාපාරයට විදේශයන්හි සහාය ලබා ගැනීමට චාවේස් ලතින් ඇමරිකාව පුරා සංචාරය කළ අතර ආජන්ටිනාව, උරුගුවේ, කොලොම්බියාව, කියුබාව යන රටවල්හි ද සංචාරය කළේ ය. මේ අතරතුර කාලයේදී රටේ නව ප්‍රධානියා වූ රෆායෙල් කල්දේරා ද, ඔහුගේ පූර්වගාමීන් ට වඩා වෙනස් නොවන බව වැඩිකල් නොගොස් චාවේස් ට පැහැදිලි විය.

එම සංචාරය අතරමග දී කැස්ත්‍රෝ මුණ ගැසුණු අතර ඔහු සමග මිත්‍රත්වයක් ගොඩනගා ගැනීමට ද චාවේස් සමත් විය. කොලොම්බියාවේ සිටි කාලය තුළ ඔහු ගරිල්ලා පුහුණුව ලබා ගැනීමට ද අමතක නොකළේ ය.



*හියුගෝ චාවේස් සිය දේශපාලන මතවාදයන් ජනතාව වෙත ගෙනයමින් ජනයා සමග සුහදශීලීව කතාබහ කරන අවස්ථාවක්*

මේ අතරවාරයේදී MBR 200 නව සාමාජිකයන් ප්‍රවර්ධනය කර ගැනීමට කටයුතු කරන ලදි. නාගරික මෙන්ම ප්‍රාදේශීය මට්ටමින් සම්බන්ධීකාරකවරු බිහි වූ අතර

වෙහෙස මහන්සි වී වැඩ කිරීමට කැමති ඕනෑම පුද්ගලයෙකුට මෙහි සාමාජිකත්වය ලබා ගැනීමට හැකිවිය. ඒ අනුව, 1996 දී "ලුයිස් ඩාවිල" (Luis Dávila), "ෆ්‍රෙඩී බර්නාල්" (Freddy Bernal) යන අය සහ සිවිල් වැසියන් දෙදෙනෙකුගේ අධ්‍යක්ෂක මණ්ඩලයකින් ද මෙය සමන්විත වන ලදි.

චාවේස්ගේ ජීවන වෘතාන්තය අධ්‍යනයේ දී විවාහයන් ද්විත්වයක් පිළිබඳ ව සඳහන් වේ. ඔහු පළමු වරට විවාහ වූයේ වයස අවුරුදු 23 දී, එනම් ඔහු හමුදාවට බැඳී කර්නල්වරයකු ලෙස කටයුතු කළ සමයේ ය. "නැන්සි කෝල්මනෙරස්" (Nancy Colmenares) සමඟ විවාහ වූ ඔහුට දරුවන් තිදෙනෙක් විය. ඔවුහු නමින් "රෝසා වර්ජිනියා" (Rosa Virginia) , "මරියා ගැබ්රියෙලා" (Maria Gabriela), "හියුගෝ රෆායල්" (Hugo Rafael) නම් වූහ. පළමු විවාහය අසාර්ථක වන චාවේස් නැවතත් 1997 වර්ෂයේ දී ගුවන් විදුලි මාධ්‍යවේදිනියක් ලෙස සේවය කළ "මරිසබෙල් රොඩ්‍රිගුස්" (Marisabel Rodriguez) සමඟ දෙවන වරට විවාහ වූ අතර ඇයව මුණ ගැසී ඇත්තේ බන්ධනාගාරයෙන් නිදහස් වීමෙන් පසුව ය. 2004 වර්ෂය වන තෙක් පැවති මෙම විවාහයෙන් චාවේස්ට "රොසින්ස්" (Rosines) නම් දියණියක් ද සිටියේ ය.

එලෙසම 1997 වන විට පැවති දූෂිත දේශපාලන තත්ත්වය හේතුවෙන් ජනතාවගෙන් බහුතරයක් දරිද්‍රතාවයෙන් පෙළීම නිසා චාවේස්ට මැතිවරණයට සහභාගී වීමට තිබූ අකමැත්ත පහව ගොස් දේශපාලනයට පිවිසීමේ අවශ්‍යතාවයක් ඇති වීමට පටන් ගත්තේ ය. ඔහුට සාමාන්‍ය ජනතාවගේ කැමැත්තෙන් හා සහභාගිත්වයෙන් කොංග්‍රසය විසුරුවා හැරීමේ අවශ්‍යතාවයක් ඇති විය. එහි ප්‍රතිඵලය වූයේ 1997 වසරේ අප්‍රේල් මාසයේ දී වෙනිසියුලාවේ ජනාධිපති වීමේ අභිප්‍රාය ඔහු ප්‍රකාශ කිරීමයි . ඒ අනුව 1997 දී MBR 200 නව මුහුණුවරකින් "වෙනිසියුලානු පස්වන ජනරජය සඳහා වූ ව්‍යාපාරය" (Political Party Movement Of the Fifth Republic Of Venezuela) ලෙස කරළියට පැමිණි අතර පසුකාලීනව මෙම පක්ෂය "වෙනිසියුලානු එක්සත් සමාජවාදී පක්ෂය"(United Socialist Party Of Venezuela) බවට පත් විය.

1998 වනවිට වෙනිසියුලානු ජනගහනයෙන් අඩකට වඩා වැඩි ප්‍රමාණයක් දරිද්‍රතාවයෙන් පෙලුණි. එමෙන්ම තෙල් මිල ද දැඩි ලෙස පහත වැටෙමින් තිබුණි. මේ හේතුවෙන් සාමාන්‍ය ජනතාව සාම්ප්‍රදායික දේශපාලන පක්ෂ ප්‍රතික්ෂේප කළ

අතර එම අවස්ථාවේ දී චාවේස් රට දූෂණයෙන් මුදා ගැනීමටත්, දුප්පතුන්ට උදව් කිරීමටත්, ප්‍රභූ දේශපාලන බලය අඩු කිරීමටත් ක්‍රියා කරන බවට දේශපාලන වේදිකාවල දී පොරොන්දු වූයේ ය. එලෙසම පැවති පැරණි ව්‍යවස්ථාව වෙනස් කොට නව ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීමත්, වෙනිසියුලාවේ ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රතිනිර්මාණය කිරීමත් ඔහුගේ පොරොන්දු අතර විය. මෙවැනි ප්‍රතිපත්තීන් චාවේස් ජනතාව අතර ජනතාවාදී පුද්ගලයකු ලෙස නිරූපණය වීමට හේතු විය. මීට පෙර චාවේස් 1992 වසරේ දී කුමන්ත්‍රණයෙන් අත්කරගත නොහැකි වූ දේ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලිය තුළින් යථාර්ථයක් බවට පත් කර ගත්තේ ය. ඒ අනුව 1998 වසරේ දෙසැම්බර් මස පැවැත් වූ වෙනිසියුලානු ජනාධිපතිවරණයෙන් 56% ක ඡන්ද ප්‍රතිශතයක් ලබා ගනිමින් ජයග්‍රහණය කළ චාවේස්, 1999 වසරේ පෙබරවාරි මාසයේ දී වෙනිසියුලාවේ හතලිස් පස්වන ජනාධිපතිවරයා වශයෙන් දිවුරුම් දුන්නේ ය.

නැවත වරක් ඔහු 2002 වසරේ දී ජනාධිපතිවරණයට ඉදිරිපත් වී විශිෂ්ට ජයග්‍රහණයක් ලබා ගත්තේ ය. එතැනින් නොනැවතුණු ඔහු නැවතත් 2006 වර්ෂයේ පැවති ජනාධිපතිවරණයෙන් 63% ක විශිෂ්ට ඡන්ද ප්‍රතිශතයක් ලබා ගනිමින් වසර හයක කාලසීමාවක් සඳහා තේරී පත්වූයේ ය. ඉන්පසු 2012 වර්ෂයේ ඔක්තෝම්බර් මස පැවති මැතිවරණයෙන් හතරවැනි වරට ද වෙනිසියුලාවේ ජනාධිපති වශයෙන් තේරී පත් වූ චාවේස් ඉන් මාස තුනකට පසු එනම් 2013 මාර්තු 5 වන දින අවාසනාවන්ත ලෙස මිය ගියේ ය. මිය යන විට ඔහුට වයස අවුරුදු පනස් අටක් විය. 1999 - 2013 දක්වා වසර 14 ක කාලසීමාව තුළ ඔහුගෙන් සිදුවුණු සේවය අතිමහත් වන අතර ඔහු වෙනිසියුලානු දේශපාලන ඉතිහාසය තුළ නොමැකෙන නායකයෙක් බවට පත් වූයේ ය.

## <u>නායකත්වයට පැමිණීමෙන් පසු සිදුකළ සේවාව</u>

වෙනිසියුලාවේ ව්‍යවස්ථාව සම්පාදනය කිරීමට මෙන් ම අධිකරණය ප්‍රතිව්‍යුහගත කිරීමට තම දායකත්වය ලබා දුන් අසහාය නායකයෙක් ලෙස චාවේස් පෙන්වා දිය හැකිය. චාවේස් වෙනිසියුලාවේ දේශපාලන, ආර්ථික හා සමාජීය යන සෑම අංශයකම ප්‍රතිසංස්කරණ සැලසුම් කළ අතර මේ හේතුවෙන් ඔහු බොහෝ දෙනෙකුගේ පැසසුමට ලක් වූයේ ය.

**ආර්ථිකමය සේවාවන්**

චාවේස් බලයට පත්වීමෙන් පසු සිදු කළ සේවාවන් අතර ආර්ථික ක්ෂේත්‍රයට සිදු කළ සේවය වැදගත් ය. මන්දයත්, වෙනිසියුලාව යනු ප්‍රධාන බොරතෙල් නිෂ්පාදකයකු වන අතර එය එරට ආර්ථිකයේ සුවිශේෂී සන්ධිස්ථානයක් වනු ඇත. හියුගෝ චාවේස් ජනාධිපති සමයෙහි එරට බොරතෙල් සඳහා වටිනා මිලක් හිමි වූ අතර එය රටේ ආර්ථික වර්ධනයට ප්‍රධාන හේතුවක් විය. චාවේස් යුගය තුළ වඩා හොඳ ආර්ථිකයක් පෙන්නුම් කරනු ලබන්නේ ඔවුන් විසින් තෙල් මිල පාලනය කිරීමත් සමග 90% කට වඩා වැඩි ආදායමක් වෙනිසියුලාවට හිමි වීමෙනි. අනෙක් අතට රජයේ ආදායමෙන් 50%ක් පමණ දායකත්වයක් හිමි වූයේ ඛනිජ තෙල් කර්මාන්තයෙනි. මේ ආකාරයට ලැබෙන තෙල් ආදායම භාවිතා කරමින් ආර්ථික, සංස්කෘතික හා සමාජ තත්ත්වයන් නංවාලීම සඳහා "බොලිවේරියානු" දූත මණ්ඩල නිර්මාණය කරන ලදි. බොලිවේරියානු දූත මණ්ඩල ඇති කිරීමේ එක් ප්‍රධානතම අරමුණක් වනුයේ ආර්ථික ක්‍රියාකාරකම් ප්‍රජාතන්ත්‍රීකරණය කිරීමයි.

විප්ලවකාරී නායකයෙකු වන චාවේස් බලයට පැමිණීමෙන් පසු ඛනිජ තෙල් අපනයනය ඉතා සීඝ්‍රයෙන් ඉහළ ගොස් ඇති ආකාරයක් දැක ගත හැකි අතර 2008-2009 ආර්ථික අර්බුදය හමුවේ පවා බොරතෙල් නිෂ්පාදනය ස්ථාවර මට්ටමක පවත්වාගෙන යාමට හැකි වී ඇත. 1998 වර්ෂයේ එනම් කල්දේරාගේ පාලන සමයේ දී ඛනිජ තෙල් අපනයනය 20.92% ක ප්‍රතිශතයක් ගත් අතර එය 2005 වර්ෂය වන විට 39.66% ක ප්‍රතිශතයක් දක්වා වර්ධනය කර ගැනීමට චාවේස්ගේ පාලන සමයේ දී හැකියාව ලැබී ඇත.

එය වෙනිසියුලාවේ හිටපු පෞද්ගලීකරණය පිළිබඳ ඇමති "ගර්වර් ටොරස්" (Minister For Privatization "Gerver Torres"Of Venezuela) වරක් පවසා සිටියේ; "1998 දී වෙනිසියුලාවේ තෙල් අපනයනයෙන් 77% ක් නියෝජනය කළ නමුත් 2011 වන විට තෙල් අපනයනය 96%ක් දක්වා වර්ධනය විය. එම වර්ෂයේ අනෙකුත් 4% නියෝජනය වූයේ තෙල් නොවන නිෂ්පාදන තුළිනි." (Former minister Gerver Torres points out that in 1998 oil represented 77 percent of Venezuela's exports but by 2011 oil represented 96 percent of exports. That means today only around 4 percent of the goods that Venezuela exports are non-oil products.)


කෙසේ වුව ද, වෙනිසියුලාවේ සමස්ත දළ දේශීය නිෂ්පාදන වටිනාකම පිළිබඳව විමසා බැලීමේ දී එහි සීඝ්‍ර වර්ධනය වීමක් දැකගත හැකිය. එනම් 1998 වර්ෂයට පෙර පැවති රෆායෙල් කල්දේරාගේ පාලන සමයේ වෙනිසියුලාවේ දළ දේශීය නිෂ්පාදනයේ සමස්ත වටිනාකම ඇමරිකානු ඩොලර් බිලියන 91.33 ක් වූ අතර 2013 වන විට එහි සමස්ත වටිනාකම ඇමරිකානු ඩොලර් බිලියන 371.01 ක් දක්වා වර්ධනය කර ගැනීමට චාවේස් බලයට පැමිණීමෙන් පසුව සමත්ව ඇත. එය වෙනිසියුලානු ආර්ථිකයේ සුවිශේෂී සන්ධිස්ථානයකි.

විරැකියාව රටක සංවර්ධනයට විශාල අවහිරතාවයකි. එම නිසා රටේ මිනිසුන්ගේ සමාජ කටයුතු සඳහා රජයට විශාල මුදලක් දැරීමට සිදු වේ. 1998 වර්ෂයේ දී එනම් රෆායෙල් කල්දේරාගේ පාලන සමය තුළ 11.15% මට්ටමක පැවැති විරැකියාව ජනපති චාවේස් බලයට පැමිණීමෙන් පසු 2009 වනවිට 6.10% ක් දක්වා පහත හෙළූ අතර ඒ සමඟ ම වෙනිසියුලානු තරුණ තරුණියන්ට රැකියා අවස්ථාවන් රැසක් උදා විය. මෙලෙස රැකියා අවස්ථාවන් උත්පාදනය වීමත් සමඟ වෙනිසියුලාවේ නිෂ්පාදන ක්‍රියාවලිය තුළ වර්ධනය වීමක් දක්නට ලැබිණි. 1998 වර්ෂයේ ඇමරිකානු ඩොලර් බිලියන 17.38 ක්ව පැවැති නිෂ්පාදන ක්‍රියාවලිය චාවේස් බලයට පත්වීමෙන් පසු එනම් 2010 පමණ වන විට ඇමරිකානු ඩොලර් බිලියන 46.79 දක්වා වර්ධනය කර ගැනීමට හැකි විය. එමෙන් ම නිෂ්පාදන ක්‍රියාවලියේ වර්ධනය හේතුවෙන් එරට ආර්ථිකය ඉහළ මට්ටමකට ගෙන ඒමට හැකියාව ලැබුණි.

ජනාධිපති චාවේස්ගේ තෙවැනි ධූර කාලය, එනම් 2006 දී සමාජ නිෂ්පාදන සමාගම් (Social Production Companies) ආරම්භ වීමේ වර්ධනයක් සිදු විය. එසේ ම ඉදිකිරීම්, ගෑස් බෙදාහැරීම්, පොදු ප්‍රවාහනය හා සිමෙන්ති බ්ලොක් ගල් නිෂ්පාදන වැනි ආයතන ද ආරම්භ කරන ලදි. එසේ ම සමුපකාර ව්‍යවසායන් යටතේ ආරම්භ වී වඩාත් ප්‍රසිද්ධියට පත්ව ඇති බටහිර කැරකස් හි පිහිටි “ෆැබ්‍රිසියෝ ඔජේඩා” (Fabricio Ojeda) නම් රෙදිපිළි කර්මාන්තය ද මෙහි දී වැදගත් වේ. වෙනිසියුලාව ඛනිජ තෙල්වලින් ස්වයංපෝෂිත රටක් වුවද, රට තුළ තෙල් මිල ඉහළ යාමත් සමඟ දරිද්‍රතාවය ඉතා ඉහළ මට්ටමකට ළඟා වීම හේතුවෙන් රජයට දැරීමට සිදු වූ වියදම අධික වූ අතර එම ක්ෂේත්‍ර ලෙස; දුප්පතුන්ගේ සෞඛ්‍යය රැකවරණය, අධ්‍යාපනය, සෞඛ්‍ය ආරක්ෂණ ප්‍රතිලාභ යන මේවා කැපී පෙනුණි. චාවේස් යුගය තුළ විවිධ සමාජ ආරක්ෂණ වැඩසටහන් මගින් දරිද්‍රතා මට්ටම අවම කිරීමට කටයුතු කර ඇත. චාවේස් යුගයේ එනම්, 2002-2003 වර්ෂයන් හි දී සිදු වූ තෙල් වැඩ වර්ජනයෙන් පසු

දරිද්‍රතා මට්ටම 50% කින් ද, අන්ත දරිද්‍රතාවය 70% කින් ද පහත වැටී ඇති ආකාරයක් දක්නට ලැබේ.

*(හියුගෝ චාවේස් කාලසීමාව තුළ කාර්යය සාධනය)*




Source: Banco Central de Venezuela

මෙම ප්‍රස්ථාරය මගින් සමස්ත දළ දේශීය නිෂ්පාදිත වර්ධනය මෙන් ම ඒක පුද්ගල ආදායම් වර්ධනය පෙන්නුම් කරන අතර එය චාවේස්ගේ පාලන සමයට පෙර එනම්, වර්ෂ 1986-1999 කාලසීමාව තුළ ද, චාවේස් ජනපති ධුරයේ සිටි කාලසීමාව එනම්, 1999-2012 සහ වැඩ වර්ජන සමයෙන් පසු එනම්, 2004 වර්ෂයෙන් පසු සිදු වූ වෙනස්කම් ආදිය මින් නිරූපණය කරනු ලබයි.

මෙලෙස සමබර ආර්ථිකයක් හසුරවමින් තම දේශය වෙනුවෙන් කැප වූ නායකයෙකු ලෙස චාවේස් හැඳින්විය හැකි ය.

**දේශපාලන සේවාවන්**

වෙනිසියුලානු විප්ලවවාදී රාජ්‍ය නායකයෙකු මෙන් ම දේශපාලනඥයෙකු වන චාවේස් පස්වන ජනරජ ව්‍යාපාරයේ සභාපති වූ අතර ඔහු දේශපාලන කටයුතු ඉදිරියට කරගෙන යාම සඳහා තවත් දේශපාලන පක්ෂ කිහිපයක් සමඟ සම්බන්ධ විය. ඔහු ජනාධිපති ධූරය දැරූ පළමු ධූර කාලය තුළ බොහෝ වැදගත් ප්‍රතිසංස්කරණ සිදු කළේ ය. චාවේස්ගේ උපදෙස් පරිදි, එරට වැසියන්ට නොමිලේ වෛද්‍ය ප්‍රතිකාර සඳහා රෝහල් ද, ප්‍රවාහනය සඳහා ක්‍රමවත් මාර්ග පද්ධතියක් ද ඉදිකරනු ලැබුවේ ය.

එසේම ආදිවාසීන් ආරක්ෂා කිරීම සඳහා ද නීති සම්මත කරන ලදි. සෑම සතියකම "හෙලෝ ජනාධිපති" (Hello President) නමින් වැඩසටහනක් පවත්වාගෙන ගිය චාවේස්, එහිදී ඕනෑම දේශපාලන ගැටලුවක් පිළිබඳ සාකච්ඡා කිරීමට එරට සාමාන්‍ය ජනතාවට අවස්ථාව හිමි කර දුන්නේය.



*හියුගෝ චාවේස් "හෙලෝ ජනාධිපති" වැඩසටහන අමතමින්*

ජාතික ව්‍යවස්ථාදායකය තෝරා පත්කර ගැනීම සඳහා මැතිවරණ කටයුතු ප්‍රවර්ධනය කිරීමට චාවේස් බලයට පැමිණීමෙන් පසු ක්‍රියා කළේ ය. 2000 වර්ෂයේ දී නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ස්ථාපිත කිරීමත් සමග චාවේස්ගේ දිගුකාලීන සාර්ථකත්වයට එය හේතුවක් විය. පෙර පැවති දූෂිත දේශපාලනයන් හමුවේ අල්ලාගනු ලැබූ ඉඩම් හා ධනය නැවත බෙදා හැරීමේ අරමුණින් නීති සම්මත කිරීම සඳහා ජනපති චාවේස් 2001 වසරේදී නව පනතක් ස්ථාපිත කරනු ලැබීය. චාවේස් 2005 වර්ෂයේ දී ග්‍රාමීය දුප්පතුන්ට ප්‍රතිලාභ සැලසීම සඳහා ඉඩම් ප්‍රතිසංස්කරණ පිළිබඳ නියෝගයක් ඇති කරමින් එයට අත්සන් කරනු ලැබීය.

තම දේශයේ ආරක්ෂාව වෙනුවෙන් 2006 වර්ෂයේ ජූලි මස දී ජනපති චාවේස් රුසියාව සමඟ ඩොලර් බිලියන 3 ක ආයුධ ගිවිසුමකට අත්සන් කරනු ලැබූ අතර එය වෙනිසියුලාවේ අවි සැපයුම් ක්ෂේත්‍රය නව දිශානතියකට යොමු කර වීය. 2007 වර්ෂයේ දී ප්‍රධාන බලශක්ති හා විදුලි සංදේශ සමාගම් මාස 18ක සක්‍රීය කිරීමේ පනත යටතේ ජනසතු කිරීම මෙන්ම 2008 වර්ෂයේ දී වෙනිසියුලාව සහ රුසියාව සමඟ

තෙල් හා ගෑස් සහයෝගිතා ගිවිසුමක් අත්සන් කළ අතර චාවේස්ගේ මෙවැනි ගිවිසුම් එරට දේශපාලන ස්ථාවරත්වයට මෙන් ම ආර්ථික ප්‍රවර්ධනයට ද හේතු විය.

**සමාජ සේවාවන්**

ජනපති චාවේස් විසින් සිදුකරන ලද සමාජ ප්‍රතිසංස්කරණ අතර සමාජ සාධාරණත්වය, සමාජ සුබසාධනය, දරිද්‍රතාවයට එරෙහි වීම, අධ්‍යාපනික හා හමුදා බඳවාගැනීම් කෙරෙහි අවධානය යොමු කිරීම මෙහි දී වැදගත් වේ. 1980 දශකයේ හා 2000 දශකයේ මුල් භාගයේ ඛනිජ තෙල් මගින් ලද අරමුදල් භාවිතා කරමින් චාවේස් 2003 දී බොලිවේරියානු දූත මණ්ඩල නිර්මාණය කළ අතර එය මුලින් කෙටිකාලීන ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක විය. එමෙන් ම වෙනිසියුලාව මුහුණ දුන් සමාජ, ආර්ථික ගැටලු සමනය කිරීම සඳහා බොලිවේරියානු දූත මණ්ඩලය කැපවිය. 1999 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ජාතියේ දේශපාලන ක්‍රමය "සහභාගීත්ව ප්‍රජාතන්ත්‍රවාදය" (Participatory democracy) ලෙස අර්ථ දැක් වූ චාවේස් සමාජ ප්‍රතිපත්ති සඳහා වැඩි අවධානයක් යොමුකර ප්‍රතිපත්ති සම්පාදනය, බල ගැන්වීම හා ප්‍රවර්ධනය කිරීම සිදු කළේය. "නව තල්ලුව" (new push forward) යන සටන් පාඨය යටතේ චාවේස් සමාජ වැඩසටහන් පුනර්ජීවනය කිරීමටත්, අලසකම ජය ගැනීමටත් එමගින් නව්‍යකරණයන් හඳුන්වා දීමටත් කටයුතු කර ඇත.

ජනාධිපති චාවේස්ගේ තෙවැනි ධූර කාලය 2006 දී ආරම්භ වූ අතර ඔහු සමාජ නිෂ්පාදන සමාගම් බිහි කරනු ලැබුවේ ය. 2011 වසරේදී "මහා නිවාස මෙහෙයුම" (Great houshing mission) දියත් කිරීමත් සමඟ වාර්ගික සභා බලතල පුළුල් විය. එමගින් නව නිවාස සඳහා ගොඩනැගිලි ද්‍රව්‍යවල ප්‍රතිලාභීන් තෝරා පත් කරගනු ලැබූ අතර එහි වැඩි අවධානය යොමු වූයේ වැඩිහිටියන්, තනිකඩ ගර්භණී කාන්තාවන්, ආපදාවන්ට ගොදුරු වූවන් හා ආබාධිත පුද්ගලයන් වේ. චාවේස් විසින් ප්‍රවර්ධනය කරන ලද තවත් වැඩසටහනක් ලෙස කම්කරු සමූපකාර ව්‍යාපාරය වැදගත් වන අතර එය 2004 සිට 2006 දක්වා කාලය තුළ පෙරට වඩා සක්‍රීය විය. එසේ ම සමූපකාර පිහිටුවීමට උනන්දුවක් දක්වන අයගේ කුසලතා වර්ධනය කර ගැනීම සඳහා මාස 6 සිට 24 දක්වා "වුල්වන් කැරස්" (Vuelvan caras) නමින් පුහුණු සැසි වැඩසටහනක් ස්ථාපිත කරන ලද අතර 2007 වන විට ක්‍රියාකාරී සමූපකාර 48000 ක් පමණ විය. චාවේස් විසින් සිදුකරන ලද තවත් වැදගත් සමාජ ක්‍රියාවලියක් ලෙස අධ්‍යාපන මෙහෙවර වැඩසටහන් (The educational mission programmes) ආරම්භ

කිරීම වැදගත් වන අතර උසස් අධ්‍යාපන ආයතන (Mission Ribas), විශ්වවිද්‍යාල (Mission Sucre) ආදිය හඳුනා ගත හැකිය.

මෙවන් සමාජ මෙහෙවරක් ද සිදු කරනු ලැබූ චාවේස් ඉතා ශ්‍රේෂ්ඨ පාලකයෙකු ලෙස හඳුනාගත හැකිය. 1999 වර්ෂයේ සිට වර්තමානය වනතුරුත් වෙනිසියුලානු දේශපාලන ඉතිහාසයේ චාවේස්ගේ පාලනය අද්විතීය මෙහෙවරක් සිදු කළ පාලන සමයක් ලෙස වැදගත් වනු ඇත.

## විදේශ ප්‍රතිපත්ති

සෑම රාජ්‍යයක් ම විදේශ ප්‍රතිපත්ති අනුගමනය කිරීමේ දී ඒ සඳහා ජාත්‍යන්තර මෙන්ම ජාතික දේශපාලනය, තානාපති සබඳතා, අන්තර් ආණ්ඩු සංවිධාන සහ ආර්ථික සබඳතා යනාදී නොයෙකුත් ක්ෂේත්‍රයන් අන්තර්ගත වනු ඇත. මෙහිදී විදේශ ප්‍රතිපත්ති නිසි ලෙස ක්‍රියාවට නැංවීම රාජ්‍ය පාලනය කරනු ලබන නායකයා සතු දේශපාලන දර්ශනය හා අනෙකුත් රාජ්‍යයන් සමඟ ඇති සම්බන්ධතා මත පදනම් වනු ඇත. ලොව පවත්නා සෑම රාජ්‍යයකට ම සාර්ථක විදේශීය ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම සඳහා බලපාන ප්‍රධාන සාධකයක් ලෙස රාජ්‍ය නායකත්වය සඳහන් කළ හැකිය. මෙය වෙනිසියුලාවට මෙන්ම ලෝකයේ සෑම රාජ්‍යයකට ම පොදු සාධකයකි.

වරෙක හියුගෝ චාවේස් "මගේ හිත රිදෙන ප්‍රධානම කාරණය වන්නේ දුප්පත්කමයි. මා කැරලිකාරයෙක් වූයේ ඒ නිසයි"(What hurts me most is poverty, and that's what led me to become a rebel.) යන්න වඩාත් සංවේදී සිතින් ප්‍රකාශ කර ඇත. මෙසේ ප්‍රකාශ කිරීමට පසුබිම සකස් වී ඇත්තේ චාවේස් දැඩි සමාජවාදියෙකු මෙන්ම ඇමරිකානු විරෝධී විදේශ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම හේතුවෙනි. එසේම චාවේස් පළමු ධූර කාලය තුළ ම විදේශ ප්‍රතිපත්තියේ මධ්‍යස්ථභාවය සනිටුහන් කරනු ලැබූ අතර දේශීය ප්‍රතිපත්තිය නඟා සිටුවීමට අවධානය යොමු කරන ලදි.

චාවේස්ගේ ලතින් ඇමෙරිකානු විදේශ ප්‍රතිපත්තිය ඔහුගේ ගෝලීය ක්‍රියාකාරීත්වයට වඩා ප්‍රායෝගික විය. ලතින් ඇමෙරිකානු රටවල් සමඟ ඇතිකරගත් විදේශ ප්‍රතිපත්තීන් අතර බ්‍රසීලයෙන් අවි ආයුධ මිලදී ගැනීම, කියුබාව සමඟ විශේෂඥ දැනුම සඳහා වෙළඳ විධිවිධාන සකස් කිරීම, කොලොම්බියා රාජ්‍යයට වට්ටම් සහිත

ස්වභාවික ගෑස් සැපයීම, ආජන්ටිනාව සමඟ තෙල් වෙනුවට මස් හා කිරි හුවමාරු කර, ඛනිජ තෙල් මගින් මුදල් අහිමි වූ ජනතාවට සහනාධාර ලබාදීම සඳහා විධිවිධාන ආරම්භ කිරීම ඒ අතරින් ප්‍රමුඛස්ථානයක් ගනී. 2005 වර්ෂයේදී ආජන්ටිනාවේ පැවති සිව්වන ඇමරිකන් සමුළුවේදී චාවේස් තම රටට වාසි ලබාගැනීමට කටයුතු කළ අතර එහිදී ඔහු ඇල්බා (ALBA) ව්‍යාපෘතිය වෙනුවෙන් කථාවක් පවත්වන ලදි. චාවේස්ගේ ඇල්බා ව්‍යාපෘතියේ මූලික අදහස යුරෝපීය සංගමයට සමාන විය. කියුබාවේ හවානා (Havana) හිදී චාවේස් හා කැස්ත්‍රෝගේ ඒකාබද්ධ ප්‍රකාශයට අත්සන් කිරීමෙන් අනතුරුව 2004 දෙසැම්බර් 14 වන දින මෙම ඇල්බා ව්‍යාපෘතිය නිල වශයෙන් ක්‍රියාත්මක කරන ලදි. එහි ප්‍රධාන අංගයක් වූයේ ලිබරල්කරණය වෙනුවෙන් පෙනී නොසිටීම හා රාජ්‍ය සේවා පුද්ගලීකරණය කිරීමයි.

ඇමරිකාවේ නිදහස් වෙළඳ ප්‍රදේශය (Free Trade Area Of The American), ඩොමිනිකන් ජනරජය – මධ්‍යම ඇමරිකා නිදහස් වෙළඳ ගිවිසුම (Dominican Republic – Central America Free Trade Agreement) සහ උතුරු ඇමරිකානු නිදහස් වෙළෙඳ ගිවිසුම (The North American Free Trade Agreement) වැනි විධිවිධාන පිළිබඳ ව 2005 සැප්තැම්බර් 15 වන දින එක්සත් ජාතීන්ගේ වොෂින්ටන් සම්මුතිය (Washington Summit) තුළ ප්‍රකාශ කළ නමුත් ඉහත සඳහන් ක්ෂේත්‍ර ඇතැම් පිරිස් විවේචනයට ලක් කළ ද, ඒවාට නොසැලී කටයුතු කිරීමට චාවේස් අදිටන් කර ගත්තේය. ඔහු ගෝලීය පාරිසරික තර්ජන පිළිබඳව දැඩි ලෙස සාකච්ඡා කර ඇති අතර ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම හා හයිඩ්‍රොකාබන් ක්ෂය වීම මානවයාට බලපාන්නේ කෙසේද, යන්න පිළිබඳව පුළුල් ලෙස එක්සත් ජාතීන්ගේ සහශ්‍ර සංවර්ධන අරමුණු (United Nation Sustainable Development Goals) යටතේ සාකච්ඡා කළේ ය.

බොරතෙල් නිධි වෙනිසියුලාවේ ප්‍රධාන ආර්ථික ආදායම් මාර්ගයක් වන අතර විදේශ ප්‍රතිපත්තිමය ක්‍රියාවලිය තුළ ලතින් ඇමෙරිකාව ප්‍රධාන ස්ථානයක් ගනු ලබන්නේ, චාවේස්ගේ "බොරතෙල් රාජ්‍ය තාන්ත්‍රිකභාවය" (Crude Oil Diplomacy) ඇතුළු ද්විපාර්ශික වෙළඳාම සහ අන්‍යෝන්‍ය ආධාර ගිවිසුම් ඇතිකර ගැනීම හේතුවෙනි. චාවේස් පෙර පැවති සෝවියට් සමූහාණ්ඩුවේ බෙලරුස් ජනරජයේ ජනපති " ඇලෙක්සැන්ඩර් ලූකෂෙන්කා" (Alexander Lukashenka) සමඟ ඩොලර් බිලියන 19.4 ක් සහිත වටිනාකමකින් යුත් ගණුදෙනුවක් සිදු කිරීමට වර්ෂ 2011 සිට වසර

තුනක කාලයක් දක්වා තෙල් ටොන් මිලියන 30 ක් සැපයීමට එකඟත්වයක් පළ කළේ ය. ඒ වන විටත් චාවේස් බෙලරුස් හි කිසිඳු ආර්ථිකමය හෝ මිලිටරිමය ගිවිසුමක් අත්සන් කර නොමැත. එපමණක් නොව, චාවේස් කියුබාව සමඟ ද තම බොරතෙල් රාජ්‍යතාන්ත්‍රික සබඳතා පවත්වාගෙන යන ලදි. ඔහු තෙවන වරට ජනපති ලෙස 2006 දී තේරී පත්වීම කියුබාව සහ වෙනිසියුලාව අතර බොරතෙල් හුවමාරු කර ගැනීමේ සම්බන්ධතා පවත්වාගෙන යාම සඳහා හේතුවක් විය. කියුබාව සිය බොරතෙල් සැපයුමෙන් වැඩි ප්‍රමාණයක් ආනයනය කරනු ලබන්නේ වෙනිසියුලාවෙන් වන අතර 2000 වර්ෂයේ දී දැඩි සහනාධාර අනුපාතයක් සහිත ගිවිසුමක් යටතේ මෙය සිදු විය. වෙනිසියුලාව සමාජ සංවර්ධන ආධාර සඳහා දිනකට බොරතෙල් බැරල් අනූ පන්දහසක් පමණ කියුබාවට අපනයනය කරන ලදි. මෙහි දී සුවිශේෂී සාධකයක් වූයේ දෙරටේ නායකයින් ඇමරිකානු විරෝධී ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමයි.

වෙනිසියුලාව හා සසඳන විට බොලීවියාව සම්පත් අතින් දුර්වලය. බොලීවියාවේ ප්‍රධාන අපනයනය ඛනිජ තෙල් වායුව වන අතර වෙනිසියුලාවට ලොව විශාලත ම බොරතෙල් සංචිතය හිමිව තිබීම හේතුවෙන් බොලීවියාවට හා අනෙකුත් අසල්වාසී රාජ්‍යන් වෙත ප්‍රතිලාභ ලබා දීමට චාවේස් තෙල් සම්පත භාවිතා කළේ ය. එමෙන් ම මධ්‍යම ඇමරිකාව හා කැරිබියන් දූපත්වල පිහිටි රාජ්‍යයන්ට ද තෙල් සහනාධාර යැවීම සඳහා කටයුතු කරන ලදි. චාවේස්ගේ පාලන කාලසීමාව තුළ බ්‍රසීලය සහ වෙනිසියුලාව අන්‍යෝන්‍ය ද්විපාර්ශවික යටිතල පහසුකම් ඉදිකිරීම් කටයුතු සිදුකරන ලදි. එය උද්දීපනය වන අවස්ථාවක් ලෙස පර්නාම්බුකෝ (Pernambuco) හි තෙල් පිරිපහදු මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා 2010 වර්ෂයේදී කටයුතු කරන ලදි. එසේම ඔරිනොකෝ (Orinoco) ගඟ හරහා පාලමක් ඉදිකර එය 2006 වසරේදී විවෘත කරන ලදි.

ඉරාන ජනපති "මහමුද් අහමඩ් නෙජාඩ්" (Mahmoud Ahamadinejad) සහ වෙනිසියුලාව අතර පවත්වාගෙන යන අන්‍යෝන්‍ය සහසම්බන්ධතාවය හේතුවෙන් දෙරට එක්ව ඉන්දුනීසියාවේ තෙල් පිරිපහදු මධ්‍යස්ථානයක් ද ඉදි කරනු ලැබීම විශේෂත්වයක් ගනු ලබයි. වෙනිසියුලාවේ ඉරාන ආයෝජනය 2005 වසරේ දී ඩොලර් බිලියන 1ක් පමණ වූ අතර එයින් වැඩි ප්‍රමාණයක් යොමු වී තිබුණේ බලශක්ති ඉදිකිරීම් සහ ඉංජිනේරු ව්‍යාපෘති සඳහා ය.

වසර ගණනාවක් කොලොම්බියාව සහ වෙනිසියුලාව අතර තිබූ අස්ථාවර සම්බන්ධතා 2005 වර්ෂයේ සිට යළි ස්ථාවර තත්ත්වයකට පත් වීමට පටන් ගන්නා ලදි. මෙයට නිදසුනක් ලෙස; වෙනිසියුලානු මිල පාලනයන් හේතුවෙන් ගොවීන්ට ඉහළ යන දේශීය ඉල්ලුම සපුරාලීමට නොහැකි වූ අතර කොලොම්බියානු ගොවීන් වෙනිසියුලාවේ මූලික ආහාර ද්‍රව්‍ය හිඟය සපුරාලීම සඳහා සහයෝගය දැක්වීම පෙන්වා දිය හැකිය.

වර්ෂ 2006 දී හියුගෝ චාවේස් රුසියානු ජනාධිපති "ව්ලැඩිමීර් පූටින්" (Vladimir Putin) සමඟ ඩොලර් බිලියන 2.9ක 24SU – 30MK2 ගුවන් යානා 24 ක සහ රුසියානු හමුදා හෙලිකොප්ටර් 53 ක ආයුධ ගිවිසුමක් අත්සන් කරන ලදි. චාවේස් රුසියාව සමඟ ඇතැම් වාසිදායක ගණුදෙනු ද සිදු කර ඇත. ඒ අතරින් වෙනිසියුලාවේ AK-103 රයිෆල් කම්හලක් ඉදිකිරීම සඳහා සිදු කළ ආයෝජනය වාසිදායක විය.



*වර්ෂ 2006 දී හියුගෝ චාවේස් රුසියානු ජනාධිපති ව්ලැඩිමීර් පූටින් සමඟ ආයුධ ගිවිසුම අත්සන් තැබූ අවස්ථාව*

චාවේස් වියට්නාමය සමඟ ද විදේශ සබඳතා පවත්වාගෙන ගොස් ඇති අතර මෙයට නිදසුනක් ලෙස; වියට්නාම ජනාධිපති "ගුයින් මිං ට්‍රෙයට්" (Nguyen Minh Triet) සමඟ තෙල්, ගෑස්, පතල් සහ කෘෂිකාර්මික අංශ සඳහා ද්විපාර්ශවික සම්බන්ධතාවයක් 2008 වර්ෂයේ දී ඇතිකර ගැනීමට කටයුතු කරන ලදි. චාවේස්ගේ පාලන කාලයේ සිට වර්තමානය දක්වා බලශක්ති සහයෝගීතාව වෙනිසියුලානු විදේශ ප්‍රතිපත්තියේ ප්‍රධාන මෙවලමක් වී ඇත.

පෙර පැවති පාලන සමයන් මෙන් නොව, බොහෝ රටවල් සමග මිත්‍ර සබඳතා පවත්වා ගැනීම සඳහා චාවේස් තම විදේශ ප්‍රතිපත්ති යොදා ගන්නා ලදි. එමගින් පැහැදිලි වන්නේ, වර්ෂ 1999 සිට චාවේස් වෙනිසියුලාවේ විදේශ ප්‍රතිපත්ති වර්ධනය කරමින් තම දේශයට මහගු සේවාවක් සිදු කිරීම සඳහා අඛණ්ඩ මෙහෙයුමක යෙදුණු බවයි. දේශීය සහ ජාත්‍යන්තර මතභේද, කුමන්ත්‍රණ සහ ප්‍රතිකුමන්ත්‍රණ ඉදිරියේ සිය ජීවන ගමනින් සමුගන්නා තෙක්ම තම දේශයේ පැවැත්ම උදෙසා කටයුතු කළ විමුක්තිකාමී නායකයෙකු වූ චාවේස් සියලු ජනතාවගේ නොමඳ ගෞරවයට පාත්‍ර විය.

## ගතහැකි ආදර්ශ

වෙනිසියුලානු දේශපාලන ඉතිහාස කතාවේ තම දේශය වෙනුවෙන් අසහාය, අද්විතීය මෙහෙවරක් කළ වෙනිසියුලානු නායක ධූරාවලියේ එන ඉතා සුවිශිෂ්ට පාලකයෙකු ලෙස හියුගෝ චාවේස් පෙන්වාදිය හැකිය. වෙනිසියුලාවේ පවත්නා පීඩාකාරී අර්බුදයන්ගෙන් ජනතාව ගලවා ගැනීම උදෙසා චාවේස්ගේ කැපවීම, උත්සාහය, අධිෂ්ඨානය ඉතා අගනේය. මොහුගේ ජීවිත කතාව අධ්‍යයනයට ලක් කරන විට ගත හැකි ආදර්ශ ගණනාවක් වේ. එය මෙතුමාගේ කුඩාකල පටන් මරණය දක්වාම සුවිශේෂී සංධිස්ථානයන් හිදී විවිධාකාරයෙන් උද්දීපනය වී තිබේ.

චාවේස්ගේ ජීවිතාන්දරය අධ්‍යනය කිරීමේ දී ගතහැකි සුවිශේෂී ආදර්ශයක් ලෙස; තම දිවියේ දී මුහුණදීමට සිදුවන විවිධාකාරයේ බාධකයන්ට ජීවිතාධිෂ්ඨානයෙන්, විශ්වාසයෙන් යුක්තව මුහුණදුන් ආකාරය ඔහුගේ කුඩා කාලයේ සිටම දැකගත හැකි ගුණාංගයක් වේ. දුප්පත්කමින් පීඩිත වූ දිවියක් කුඩා කාලයේදී මොහුට හිමි වූ අතර මේ හේතුවෙන් චාවේස්ට සහ ඔහුගේ වැඩිමහල් සොහොයුරු ඇඩන් හට තම දෙමාපියන්ගෙන් ඈත්ව අත්තම්මා සමග යොවුන් විය ගත කිරීමට සිදු විය. දෙමාපියන් ළඟ නොමැති වූවත් තම අරමුණ අතපසු නොකර ගනිමින් ද්විතීක අධ්‍යාපනය සඳහා 'බරිනාස් හි ඩැනියෙල් ෆ්ලොරේන්සියෝ ඕ' ලෙයරි හයි ස්කූල් ' (Daniel florencio O' leary High school) වෙත ඇතුළු වීමෙන් ඔහු අධ්‍යාපනයට දැක් වූ කැමැත්ත මෙන්ම නොයෙකුත් බාධක හමුවේ වුව ද අධ්‍යාපනයට මුල් තැන දී කටයුතු කළ පුද්ගලයෙක් ලෙස කැපීපෙනෙයි. හුදෙක් කුඩා කාලයේදී පමණක් නොව ඔහු නායකත්වයට පිවිසීමේ ගමන්මගෙ හි දී නොයෙක් ආකාරයේ බාධාවන්ට විවිධ අවස්ථාවන් හි දී මුහුණ දෙන ලදී. ඒ අතුරින් කැපී පෙනෙනුයේ මොහු එවකට

වෙනිසියුලානු ජනපති කාලෝස් ඇන්ඩ්‍රෙස් පෙරෙස් ගේ නොමනා දේශපාලනයට එරෙහිව 1999 පෙබරවාරි 04 දින සිදුකරනු ලබන කැරැල්ලෙන් පසු මොහු කැරැලිකරුවෙකු ලෙස සිරගත විය. කෙසේ නමුත් මෙම බාධාවන් අභිමුව පවා නොසැලෙන අධිෂ්ඨානයෙන් හා විශ්වාසයෙන් කටයුතු කරනු ලැබූ අද්විතීය නායකයෙක් ලෙස චාවේස් වැදගත් වේ.

චාවේස් නායකත්වය කරා පැමිණි ගමන් මඟෙහි දී කැපීපෙනෙන ගුණාංගයක් ලෙස කැපවීමෙන් ක්‍රියා කිරීම පෙන්වා දිය හැකි අතර එයට කදිම නිදසුනක් වනුයේ මොහු කැරලිකරුවෙකු ලෙස සිරගත වුව ද ජනතා අවශ්‍යතා උදෙසා ක්‍රියා කිරීමයි. මොහු සිරෙන් නිදහස් වූ වහාම රටපුරා සංචාරය කරමින් මිනිසුන් සමඟ තම අදහස් බෙදාගනිමින් මිනිසුන්ගේ දුක පිළිබඳ සොයා බැලූ නායකයෙකි. එමෙන්ම නායකයෙකු වීමට ප්‍රථම ඊට අවැසි මූලික අඩිතාලම තමා විසින් ශක්තිමත් කර ගැනීමට ලතින් ඇමෙරිකාව පුරා එනම්; උරුගුවේ, ආර්ජන්ටිනාව, චිලී, කොලොම්බියා වැනි රටවල සංචාරය කරන ලදි.

හුදෙක් මෙපමණක් නොව චාවේස් මනා සංවිධානයක් සහිතව කටයුතු කළ පුද්ගලයෙකි. මොහු පිහිට වූ MBR 200 නම් පක්ෂයට නාගරික මෙන් ම ප්‍රාදේශීය මට්ටමින් සම්බන්ධීකාරකවරු එකතු කරගනිමින් රට තුළ වැඩ කරන ඕනෑම පුද්ගලයෙක් හට මෙහි සාමාජිකත්වය දීමට කටයුතු කරන ලදි. මෙම පක්ෂය කොතෙක් දුරට සංවිධානාත්මක අයුරින් ගොඩනැගුනේ ද යත්, 1996 දී ලුයිස් ඩාවිල, ෆ්‍රෙඩී බර්නාල් යන අය සහ සිවිල් වැසියන් දෙදෙනෙකුගේ අධ්‍යක්ෂක මණ්ඩලයකින් ද මෙය සමන්විත විය. මෙපරිද්දෙන් බලන කළ චාවේස් ඉතා කැපවීමෙන්, උත්සාහයෙන් මෙන් ම මනා සංවිධානයෙන් යුතුව ක්‍රියා කරනු ලැබූ අසහාය නායකයෙක් ලෙස වැදගත් ය. මොහුගේ මෙම සියලු කැපවීම් මල්ඵල ගන්වමින් 1999 වර්ෂයේදී චාවේස් වෙනිසියුලාවේ ජනාධිපති ධුරයට පත් විය. මොහුගේ ජීවිත කතාව දෙස අවධානය යොමු කිරීමේදී තම දේශය පිළිබඳ අසීමිත ආදරයක්, ගෞරවයක් සහිත උදාර පාලකයෙක් ලෙස කැපී පෙනේ. චාවේස්ගේ චරිතය පුරාවට කැපීපෙනෙන සුවිශේෂී ආදර්ශය මෙයයි. මන්දයත්, තරුණ වියේ සිට ම තම දේශය වෙනුවෙන් අසීමිත ආදරයෙන් යුතුව කැරැලි ගසමින් දේශය රැක ගැනීමට මහගු කැපකිරීමක් සිදු කරන ලදි. මොහු කැරලි ගැසීමට පෙළඹුනේ තම දේශයේ දුප්පත් ජනතාවට සිදුවන අයුක්ති, අසාධාරණකම් දුරලීමට මොහු තුළ උපන් අසීමිත දේශාභිමානය නිසාවෙනි. හුදෙක් චාවේස් නායකත්වයට පැමිණීමෙන් පසු තමා හට

ලද අවස්ථාවෙන් දේශය වෙනුවෙන් සේවය කිරීමට අමතක නොකරන ලදි. මොහු රට වෙනුවෙන් සිදු කළ සේවාවන් අතර නොමිලේ රෝහල් පහසුකම් තම දේශයේ ජනතාවට ලබාදීම, ආදිවාසීන් ආරක්ෂා කර ගැනීමට නීති සම්මත කර ගැනීම, මෙන්ම ජනතාවගේ ගැටළු පිළිබඳව සාකච්ඡා කිරීමට සෑම සතියකට වරක්ම " හෙලෝ ජනපති" නමින් වැඩසටහනක් ද ක්‍රියාත්මක කරන ලදි.

දුප්පතුන්ගේ දුක දන්නා, දුප්පත්කම තුරන් කිරීමට ප්‍රබලවම කැප වූ මොහු ජනතාවගේ ඉඩම් නැවත ඔවුනට ලබා දෙමින් ප්‍රතිසංස්කරණ පිළිබඳ නියෝගයක් 2005 දි ඇති කළ අතර එමගින් ජනතාවට සහන ලබාදීමට ක්‍රියා කරන ලදි. හුදෙක් මෙපමණක් නොව, තම රට වෙනුවෙන් චාවේස්ගේ පාලන සමය තුළ අසහාය මෙහෙවරක් සිදුකරන ලදි. ඒ අතර බොහෝ සේවාවන් ජනසතු කිරීම කැපීපෙනේ. නිදසුනක් ලෙස; බලශක්ති හා විදුලි සංදේශ සමාගම් මාස 18ක් සඳහා ජනසතු කිරීම මෙහිදී වැදගත් ය. එමෙන්ම චාවේස් සමාජ සේවකයෙක් වන අතර සමාජ අසාධාරණත්වය, සමාජ සුබසාධනය, දරිද්‍රතාවයට එරෙහිවීම, අධ්‍යාපනික අංශ දියුණු කිරීම හා හමුදාවට නව බඳවාගැනීම් වර්ධනය කිරීම ආදිය තුළින් සමාජයට කැපීපෙනෙන අයුරින් තම සේවය සැපයූ නායකයෙකි. මෙලෙස සිදුකළ සමාජ සේවාවන් අතර කැපීපෙනෙන ප්‍රධානතම සේවාව නම් "මහා නිවාස මෙහෙයුම" යි. මෙහි ප්‍රතිලාභ මහළු පුද්ගලයින්, වැඩිහිටියන්, ගර්භනී කාන්තාවන්ට ආදී පාර්ශවයන්ට ලබාදීමට කටයුතු කළ අතර කම්කරු සමූපකාර ව්‍යාපාරය මගින් ජනතාවට සහන සලසන ලදි.

චාවේස් පැහැදිලි දැක්මක් සහිතව ක්‍රියාකළ අද්විතීය පාලකයෙක් ලෙස පෙන්වාදිය හැකිය. මොහු ජනපතිව සිටින සමය තුළ තම ජනතාව හට ආර්ථික වාසි ලබාදීමට උපක්‍රමශීලිව ක්‍රියාකරන ලදි. හුදෙක් එපමණක් නොව, චාවේස් ජනතාවගේ නිදහස, අයිතිවාසිකම් පිළිබඳ මනා වැටහීමක් හා පැහැදිලි දැක්මක් සහිතව ක්‍රියා කරමින් ජනතාවට සහන සලසමින් ඔවුන්ගේ ආර්ථිකය සවිමත් කිරීමට උපරිම කැපවීමක් හා පැහැදිලි දැක්මකින් ක්‍රියා කළ සුවිශිෂ්ට පාලකයෙක් ලෙස පෙන්වා දිය හැකිය. චාවේස් දේශහිතෛෂී ගිවිසුම්වලට යමින් තම දේශයේ දුප්පත්කම දුරලීමට උත්සාහ ගන්නා ලදි. මෙයට කදිම නිදසුනක් ලෙස ආර්ජන්ටිනාව සමඟ ඛණිජ තෙල් වෙනුවට මස් හා කිරි හුවමාරු කර ඛණිජ තෙල් මගින් මුදල් අහිමි වූ ජනතාවට ලබා දීම මෙන්ම කියුබාව සමඟ විශේෂඥ දැනුම සඳහා වෙළඳ විධිවිධාන සකස් කිරීම මෙහිදී කැපී පෙනේ. හුදෙක් මෙපමණක් නොව, තම දේශයේ ආරක්ෂාව පිළිබඳව

දැඩිව අවධානය යොමු කළ මොහු 2006 වර්ෂයේ දී රුසියානු ජනපති පුටින් සමග ඩොලර් බිලියන 2.9 ක 24 SU - 30 MKZ ගුවන්යානා 24 ක් හා රුසියානු හමුදා හෙලිකොප්ටර් 53 ක ආයුධ ගිවිසුමකට අත්සන් තබන ලදි. මෙතුළින් උද්දීපනය වනුයේ ඔහු තම දේශයේ ආරක්ෂාව වෙනුවෙන් කැප වූ නායකයෙක් බවයි.

'හියුගෝ චාවේස් ' චරිතය තුළින් ඉස්මතු වන ආදර්ශ අතුරින් නායකයෙකු වශයෙන් දේශපාලන, ආර්ථික, සෞඛ්‍ය ආදී අංශයන්ගේ සංවර්ධනයට කටයුතු කරන ලදි . එය ඔහුගේ විදේශ ප්‍රතිපත්තීන් අධ්‍යනයට ලක් කිරීමේ දී මනාව ඉස්මතු වේ. පාලකයෙකු ලෙස සිටින කාලසීමාවේ දී මෙන් ම නායකත්වය කරා පැමිණි ගමන් මගෙහිදී ද, චාවේස් අසල්වැසි රාජ්‍ය සමග මිත්‍රශීලි ලෙස කටයුතු කරන ලදි. මෙය ඔහුගේ චරිතය තුළ ඉස්මතුවන සුවිශේෂී ලක්ෂණයකි. චාවේස් කියුබාව, රුසියාව, බ්‍රසීලය වැනි රටවල් සමග පවත්වා ගනු ලැබූ මිත්‍ර සබඳතාවන්ගෙන් මෙය මනාව උද්දීපනය වේ. හුදෙක් මෙපමණක් නොව, චාවේස් පරිසරයට ආදරය කළ පුද්ගලයෙකි. එය පිළිබිඹු වන අවස්ථාවක් ලෙස ගෝලීය පාරිසරික තර්ජනය පිළිබද දැඩිලෙස සාකච්ඡා සිදුකොට ඇති අතර ඒ අතුරින් ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම හා හයිඩ්‍රොකාබන් ක්ෂය වීම මානවයාට බලපාන්නේ කෙසේද යන්න පිළිබද පුළුල් ලෙස එක්සත් ජාතීන්ගේ සහශ්‍ර සංවර්ධන අරමුණු යටතේ සාකච්ඡා කරන ලදි.

එමෙන්ම කළගුණ සැලකීම පිළිබද මනා අවබෝධයක් සහිත චාවේස් ,තම අධ්‍යාපනය ලැබූ හමුදා විද්‍යා ඇකඩමියේ උපදේශකයෙකු ලෙස කටයුතු කළේ ය. ඉන් උද්දීපනය වනුයේ තමා අධ්‍යාපනය ලද පාසලට සේවය කිරීමෙන් ඔහු සතුව පවත්නා කළගුණ සැලකිමේ ගුණයයි. චාවේස් ඉතා සංවේදී මෙන් ම හිංසනයට අකමැති වූ නායකයෙකි. හමුදාවේ සේවය කරන කාලයේදී ගරිල්ලා සටන්කරුවන් පිරිසකට හමුදාවෙන් පහර දෙන විට එලෙස ලේ වැගිරෙනු බලා සිටීමට නොහැකි ව එය නැවැත්වීමට ක්‍රියා කිරීම තුළින් ම චාවේස් හිංසනයට අකමැති පුද්ගලයෙක් යන්න මනාව පිලිබිඹු වේ.

වෙනිසියුලාවට මෙතරම් සේවයක් කළ "හියුගෝ චාවේස්" නම් අසහාය පාලකයා වසර 2013 මාර්තු 5 වන දින තම දිවියෙන් සමුගන්නා ලදි. මෙපරිද්දෙන් බලන කළ "හියුගෝ චාවේස්" චරිතය තුළින් ගතහැකි ආදර්ශයන් ගණනාවක් ඔහුගේ කුඩාකල පටන් මරණය දක්වා ජීවිත කතාව අධ්‍යයනයට ලක්කිරීම තුළින් ගත හැකි වේ.

## සාරාංශය

වෙනිසියුලාවේ අභිමානය ලොවට ගෙනගිය අද්විතීය නායකයෙකු වෙනිසියුලානු දේශපාලන ඉතිහාස කතාවේ හමුවේ. ඔහු නමින් හියුගෝ චාවේස් ය. 1954 ජූලි 28 වෙනිදා වෙනිසියුලාවේ බරිනාස් ප්‍රාන්තයේ සබනේටා නම් කුඩා ගොවි ගම්මානයේ උපත ලද මෙතුමා මූලික අධ්‍යාපනය ජූලියන් පිනෝ (Julian pino school) ප්‍රාථමික පාසලෙන් අධ්‍යාපනය ආරම්භ කළේ ය. වරින් වර විවිධ වූ බාධාවන් හමුවේ තම පාසල් අධ්‍යාපනය අත්නොහළ මොහු 1971 දී වෙනිසියුලාවේ අගනුවර වන කැරකස් හි වෙනිසියුලානු හමුදා විද්‍යා ඇකඩමියට (Venezuelan academy of military sciences) ඇතුලත් වෙන ලදි. මොහු එහිදී විප්ලවකාරී අදහසින් සුපෝෂිත වෙමින් තම රට ජාතිය වෙනුවෙන් කැපවිය. 1982 දී බොලිවියානු විප්ලවවාදී ව්‍යාපාරය-200 (MBR200) පිහිටුවා ගනිමින් දේශපාලන දිවියට පිවිසීමේ මූලික පියවර තබන ලදි. 1992 පෙබරවාරි 04 දින ජනපති කාලෝස් ඇන්ඩ්‍රෙස් පෙරෙස් එරෙහිව සිදු කරන ලද කැරැල්ල අසාර්ථක වීමෙන් පසු මොහු සිරගත කිරීමට ආරක්ෂක අංශ කටයුතු කළහ. මෙහිදී සිදුවූ විශේෂම සිදුවීම වුයේ සිරගතවීමට මොහොතකට පෙර ඔහු ජනතාව අමතා සිදුකරනු ලබන "පෝර් අහෝරා" නම් කතාව තුළින් මෙතුමා ජනතාවගේ සිත්තුළ අමරණීය චරිතයක් බවට පත්වීමයි. කෙසේ නමුත් 1994 දී සිරෙන් නිදහස් වන චාවේස් තම දේශය පුරා සංචාරය කරමින් ජනතාව සමඟ තම අදහස් බෙදාගන්නා ලදි. ඉන්පසු 1999 වසරේදී මොහු ජනපති ධූරයේ දිවුරුම් දෙන ලදි. නායකයෙකු වශයෙන් මෙතුමා ඉතා විශාල සේවාවක් තම දේශය වෙනුවෙන් සිදු කළේ ය. චාවේස් නායකත්වයට පැමිණීමෙන් පසු තම දේශයේ ජනතාවගේ දුප්පත්කම දුරලීමට, විරැකියා අර්බුදය අවම කිරීමට, නිවාස අහිමි ජනතාවට නිවාස ලබාදීම වැනි ව්‍යාපෘතීන් ගණනාවක් සිදු කළේ ය. එමෙන්ම තම දේශයේ ආරක්ෂාව පිලිබඳව සිතු චාවේස් දේශයේ දියුණුව හා අභිවෘද්ධිය උදෙසා විවිධ රටවල් සමඟ ගිවිසුම් පිහිටුවා ගන්නා ලදි. සෞඛ්‍ය සේවය ජනසතු කරමින් ජනතාවට මහඟු සහනයක් ලබාදුන් චාවේස් ජනතාවගේ හදවතට ආමන්ත්‍රණය කළ නායකයෙකි. එතුමාගේ විදේශ ප්‍රතිපත්තිය ද සැබැවින්ම තම රාජ්‍යයට වාසිදායක අයුරින් නිර්මාණය විය. එබැවින් අසල්වැසි රාජ්‍යයන් සමඟ මිත්‍රශීලී සබඳතා ගොඩනගා ගැනීමට ඔහුට හැකි විය. එය මානව උද්දීපනය වනුයේ රුසියාව, කියුබාව, බ්‍රසීලය වැනි රටවල් සමඟ පවත්වාගෙන යනු ලැබූ මිත්‍ර සම්බන්ධතාවන්ගෙනි. සැබැවින්ම මෙතුමාගේ ජීවිතය දෙස බැලීමේදී කැපවීම, අධිෂ්ඨානය, දූරදර්ශි තීරණ ගැනීමේ

හැකියාව, පැහැදිලි දැක්මකින් යුක්ත වීම වැනි වූ ආදර්ශ රාශියක් හඳුනා ගත හැකිය. ඒ අනුව චාවේස් තම දේශය වෙනුවෙන් දිවිහිමියෙන් කැපවූ උදාර නායකයෙකු ලෙස සියලු ලෝක ජනතාවට ආදර්ශමත් වී ඇති බව කිවමනා ය.

## මූලාශ්‍ර නාමාවලිය

Vqronline.org. (2021). The Education of Hugo Chávez: Unraveling Venezuela's Revolutionary Path | VQR Online. [online] Available at: https://www.vqronline.org/essay/education-hugo-ch%C3%A1vez-unraveling-venezuela%E2%80%99s-revolutionary-path.

"Hugo Chavez: The Definitive Biography of Venezuela's Controversial President." (2007). Wall Street Journal. [online] 1 Sep. Available at: https://www.wsj.com/articles/SB118849995314413748 [Accessed 16 Oct. 2021].

Ph. D., S., M. A., S. and B. A., S. (n.d.). Learn About the Life and Legacy of Hugo Chavez. [online] ThoughtCo. Available at: https://www.thoughtco.com/hugo-chavez-venezuelas-firebrand-dictator-2136503.

SYLVIA, R.D. and DANOPOULOS, C.P. (2003). The Chávez phenomenon: political change in Venezuela. The world Quarterly, [online] 24, pp.63–76. Available at: https://library.fes.de/libalt/journals/swetsfulltext/15630735.pdf [Accessed 2 Jun. 2021].

SAGARZAZU, I. and MOURON, F. (2017). HUGO CHAVEZ'S POLARIZING LEGACY: CHAVISMO, MEDIA, AND PUBLIC OPINION IN ARGENTINA'S DOMESTIC POLITICS. Revista de ciencia política (Santiago), 37(1), pp.147–175.

Victoria, A. (2018). Venezuela - Hugo Chavez Rise to Power. [online] ResearchGate. Available at: https://www.researchgate.net/publication/326669177_Venezuela_-_Hugo_Chavez_Rise_to_Power [Accessed 3 Jun. 2021].

Nelson, B.A. (2019). Hugo Chavez | Biography, Facts, & Death. In: Encyclopædia Britannica. [online] Available at: https://www.britannica.com/biography/Hugo-Chavez.

Bulmer, V. (2013). How hugo chavez changed venezuela. BBC news. [online] 6 Mar. Available at:

https://www.google.com/amp/s/www.bbc.com/news/world-latin-america-15240081.amp [Accessed 27 Jun. 2021].
Venezuela profile - Timeline. (2019). BBC news. [online] 25 Feb. Available at: https://www.google.com/amp/s/www.bbc.com/news/world-latin-america-19652436.amp [Accessed 28 Jun. 2021].

www.wilsoncenter.org. (n.d.). The Domestic and Foreign Policies of Venezuelan President Hugo Chavez | Wilson Center. [online] Available at: https://www.wilsoncenter.org/event/thse-domestic-and-foreign-policies-venezuelan-president-hugo-chavez.

Sagarzazu, I. and Thies, C.G. (2018). The Foreign Policy Rhetoric of Populism: Chávez, Oil, and Anti-imperialism. Political Research Quarterly, 72(1), pp.205–214.

# ඊවෝ මොරාලෙස්



**කණ්ඩායම් සාමාජිකයින් :**

- එස්.ඩී.ඒ.එච්.ආර්.එස්. දසනායක
- වයි.එස්.ඒ. වික්‍රමසිංහ
- එන්.කේ. පුබුදු මාලිංග මදුශාන්
- කේ. ජනිත් මධුෂාන් ලක්ප්‍රිය
- වයි.සී.එච්. ගුණවර්ධන

# හැඳින්වීම

යටත් විජිත පාලන සමයේ සිට සියවස් ගණනාවක් තිස්සේ හිංසාපීඩා සහ සූරාකෑම් විඳ දරා ගත් දකුණු ඇමෙරිකානු රටක් ලෙස බොලිවියාව හඳුන්වා දිය හැකිය. බොලිවියාවේ ජනගහනයෙන් බහුතරයක් වන ස්වදේශිකයන් දුප්පතුන් වූ අතර ඔවුන්ට අර්ථවත් නියෝජනයක් නො මැති විය. නමුත් විසි එක්වන සියවස ආරම්භයත් සමඟ එරට ආදිවාසීන්, ගොවීන් සහ නාගරික දුප්පතුන් විසින් එක්ව නව ලිබරල් ප්‍රතිපත්තිවලට එරෙහිව දැවැන්ත ජනතා විරෝධතා මාලාවක් ගෙනගිය අතර ඒ තුළින් 2006 දී බොලිවියාවේ 'පළමු ස්වදේශික ජනාධිපතිවරයා' ලෙස ජනාධිපති ඊවෝ මොරාලෙස් (Evo Morales) තෝරා පත්කර ගන්නා ලදී. එමගින් රටේ දේශපාලන පරිසරයේ වෙනසක් සිදුවිය. බොලිවියාව තුළ ප්‍රතික්ෂේපව සිටි දුප්පත් ජනතාව නියෝජනය කරන බව කියා සිටි මොරාලෙස් තම රජය විසින් 'සංස්කෘතික ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයක්' ආරම්භ කරන බවට පොරොන්දු විය. ඔහු ඉතිහාසයේ පළමු ස්වදේශික ජනාධිපති වූ අතර ඔහුගේ ජයග්‍රහණය ආදිවාසීන්ගේ ජයග්‍රහණයක් ලෙස සලකන ලදි. ඊළඟ වසර තුළ දී ම, ඊවෝ මොරාලෙස් විසින් ව්‍යවස්ථාව නැවත ලිවීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයක් කැඳවා බොලිවියාවට යහපත් මඟක් පැදෙන 'වෙනස් වීමේ ක්‍රියාවලියක්' සඳහා මූලික අඩිතාලම දැමීය.

මොරාලෙස්ගේ ජීවිතය සහ දේශපාලන අනන්‍යතාවය තුළ, ස්වදේශිකත්වයෙන් සංලක්ෂිත වූ ජාතිය හා පන්තිය අතර සංකීර්ණ මංසන්ධි දැකගත හැකි විය. ඔහු හැදී වැඩුණේ අයිමාරා(Aymara) භාෂාව කතා කරන දුප්පත් ගොවි පවුලක වුවත් , ඔහු තම ජීවිතයේ වැඩි කාලයක් ගත කළේ පහතරට පළාතේ චාපාරේ (Chapare) ප්‍රදේශයේ වන අතර එහිදී ඔහු කොකා (Coca) වගා කරන්නන්ගේ සංගමයේ සභාපතිවරයා බවට පත්වෙමින් ප්‍රථම නායකත්ව අත්දැකීම් උකහා ගැනීමට සමත් විය. කොකාලේරා (Cocolera) නායකයෙකු වශයෙන් ඔහු මුලින් ම අවධාරණය කළේ පන්ති භේදය සහ අධිරාජ්‍ය විරෝධී භාවය යන මාතෘකා පිළිබඳවයි. මොරාලෙස් ජනාධිපති ධූරයට පත්වීමෙන් පසුවත් ස්වදේශිකත්වය ඔහු විසින් පෞද්ගලික ජීවිතයේ සහ දේශපාලන න්‍යාය පත්‍රයේ ද කේන්ද්‍රීය අංගයක් බවට පත්කර ගන්නා ලදි. ඔහු නායකත්වයට පැමිණීමත් සමඟඅවතැන් වූ ස්වදේශික ජනතාවගේ, ගොවීන්ගේ සහ දුප්පත් නාගරික වැසියන්ගේ පොදු ජීවිත අත්දැකීම් සමඟ සම්බන්ධ වෙමින් දේශීය දේශපාලනයට 'නව ප්‍රකාශන බලයක්' ලබා දුනි. එයින් නො නැවතී

ඔහුගේ ස්වදේශිකත්ව ලක්ෂණ දේශීය දේශපාලනයෙන් ඔබ්බට ගෙන ගොස් ජාත්‍යන්තරය තුළ ද ජාතික අනන්‍යතාවයක් නිර්මාණය කිරීමට ජනාධිපති මොරාලෙස් කටයුතු කළේ ය. මොරාලෙස් තම කලාපීය අසල්වැසි රටවල් සමග යහපත් විදේශ සබඳතා ගොඩනගා ගත් අතර කලාපීය නො වන වෙනත් රටවල් සමග විවිධ අංශ ඔස්සේ සහයෝගිතා ගිවිසුම් ඇති කර ගැනීමට සමත් විය. නමුත් එක්සත් ජනපදයේ තිබූ අධිරාජ්‍යවාදී ව්‍යාපෘතිවලට ඍජුව ම විරුද්ධ වූ අයෙකු නිසාවෙන් ජනාධිපති මොරාලෙස්ට දෙරට අතර යහපත් සබඳතාවයක් ගොඩනඟා ගැනීමට අසීරු විය. ඔහු ජාත්‍යන්තරයේ කිසිඳු රටකට ගැති නොවී තම ජාතික අවශ්‍යතා සපුරා ගැනීමට හැකියාව තිබූ ඉහළ පෞරුෂයකින් හෙබි නායකයෙක් විය. මේ ආකාරයට මොරාලෙස් කොතරම් කාලයක් බොලිවියාව පාලනය කර ඇත් ද කිවහොත් එරට විශ්ලේෂකයන් පවසන්නේ මොරාලෙස් නො මැති බොලිවියාවක් සිතාගත නො හැකි බවයි. කෙසේ වෙතත්, මොරාලෙස් කෙතරම් ජනප්‍රිය වූයේ ද කිවහොත් බොලිවියාවේ ඕනෑම සංචාරක පරිශ්‍රයක් තුළ හෝ යටත්විජිත දෙව්මැදුරු තුළ හෝ තැපැල්පත්වල හෝ කාන්තාරය අසලින් ඇවිද යන විට හෝ ඔබට ඔහුව නිසැකව ම පෙනෙනු ඇත.

## <u>ළමා කාලය, අධ්‍යාපනය හා දේශපාලනයට පිවිසීම</u>

විවිධ බාධක මතින් දිගු ගමනක් පැමිණි ඊවෝ මොරාලෙස් ජනාධිපතිවරයා 1959 ඔක්තෝබර් 26 දින  බටහිර බොලිවියාවේ ඔරුරෝ (Oruro) පළාතේ ඔරුනොකා කැන්ටන් (Orunoca Canton) හි කුඩා ගම්මානයක් වන ඉසල්ලාවී (Isallawi) හි උපත ලැබුවේ ය. මොරාලෙස් චොක් (Morales Choque) හා මාරියා අයිමා මාමානී (Maria Ayma Mamani) හට දාව උපන් දරුවන් හත් දෙනාගෙන් එක් අයෙක් විය. මොරාලෙස් හා ඔහුගේ සහෝදරයෙකු හා සහෝදරියක වන ඒස්තර් (Esther ) හා හියුගෝ (Hugo) හැර අනෙක් සහෝදර සහෝදරියෝ කුඩා අවධියේ දී ම මිය ගියහ. මොරාලෙස්ගේ ළමාවිය සාම්ප්‍රදායික ඇඩෝබ් (Adobe) පරිසරයක ගත විය. ඔහු හැදී වැඩුණේ අයිමාරා භාෂාව  කතා කරන සමාජයක් තුළ ය.

මොරාලෙස් පවුලේ ප්‍රධාන ජීවනෝපාය කෘෂි කර්මාන්තය විය. කුඩා අවධියේ සිට ම වගාකිරීම්, අස්වනු නෙළීම් මෙන් ම ඔවුන්ගේ ලාමා හා බැටළුවන් රංචු රැකබලා

ගැනීමට ඔහුට සිදුවිය. මොරාලෙස්ට කුඩා අවධියේ දී ම අධ්‍යාපනය ලබා ගැනීමට අවස්ථාව හිමි විය. කෙටි කාලයක් ඔහුව ඔරිනොකාස් ප්‍රිපර්ටොරි (Orinoca's prepartory) නම් පාසලකට ඇතුළත් කෙරිණි. ඉන් අනතුරු 5 වැනි වියේ දී ඉසල්ලාවි හි ප්‍රාථමික පාසලක අධ්‍යාපනය ලබා ගැනීමට ඉඩකඩ ලැබිණි. වයස අවුරුදු 6 පමණ වන විට පවුලේ සියලු දෙනා සමඟ ආර්ජන්ටිනාවට (Argentina) යාමට ඔහුට සිදුවිය. එහිදී ඔහුට උක් වගා කටයුතු කරන අතර අයිස්ක්‍රීම් අලෙවි කිරීමට ද සිදුවිය. ඒ අතරතුර ඔහු කෙටි කලකට ස්පාඤ්ඤ භාෂා පාසලකට ඇතුළත් විය. මොරාලෙස් කුඩා අවධියේ දී තම පියා සමඟ ලුණු හා අර්තාපල් මිලදී ගැනීම සඳහා බඩඉරිඟු හා කොකා විකිණීමට කොචබම්බාවේ (Cochabamba) අරනි (Arani) පළාතට නිතිපතා පා ගමනින් ගමන් කළේ ය.

මොරාලෙස් කුඩා අවධියේ සිට ම පා පන්දු ක්‍රීඩාවට දැඩි සේ ඇලුම් කළේ ය. වයස අවුරුදු 13 දී ඔහු විසින් පා පන්දු කණ්ඩායමක් නිර්මාණය කර ගන්නා ලදී. එසේම ඔහු එහි නායකයා විය. වසර කීපයකට පසුව ඔහු කලාපය තුළ ප්‍රධාන පුහුණුකරු වශයෙන් තේරී පත් වීමට අවස්ථාව හිමි විය. එය ඔහු නායකයෙකු ලෙස අත්දැකීම් ලබා ගත් වටිනා අවස්ථාවක් විය. ප්‍රාථමික අධ්‍යාපනය අවසන් කිරීමත් සමඟ මොරාලෙස් ඔරිනොකා හි ගොවිජන මානව හිතවාදී තාක්ෂණ ආයතනයට (ITAHO) ඇතුළත් විය. එහිදී අවසන් වසර හැරෙන්නට අනෙක් සියල්ල සම්පූර්ණ කිරීමට ඔහුට හැකි විය. එයින් පසු ඔහු උපාධිය හැදෑරීමට ඔරුරෝ වෙත පැමිණියේ ය. 1977 වන විට ඔහු එම කටයුතු අවසන් කර තිබුණි. ඉන්පසුව ආර්ථික අවශ්‍යතා මත ගඩොල් සාදන්නෙකු , බේකරිකරුවෙකු හා කම්කරුවෙකු ලෙසත් රාජකීය සංගීත කණ්ඩායමේ ට්‍රම්පට් වාදකයකු ලෙසත් කටයුතු කළ මොරාලෙස් තුළ මුල් කාලයේ සිට ම පුවත්පත් කලාව කෙරෙහි ආශාවක් පැවතිය ද එය වෘත්තිය මට්ටමෙන් පවත්වා ගෙන යාමට ඔහුට නො හැකි විය.

මොරාලෙස් 1977 සිට 1978 දක්වා බොලිවියානු හමුදාවේ සේවය කළේ ය. මුල දී කොචබම්බා හි විශේෂ හමුදා උපදේශන මධ්‍යස්ථානයේ කටයුතු කළ අතර බොලිවියාවේ හමුදා මධ්‍යස්ථානයේ සිව්වන ඉන්ගාවි (Ingavi) අශ්වාරෝහක රෙජිමේන්තුවේ රාජකාරි සිදු කළේ ය. මේ වන විට බොලිවියානු දේශපාලන තත්වය ඉතා ම අස්ථාවර මට්ටමක පැවතිණි. වසර දෙකක කාල පරිච්ඡේදයක් තුළ ජනාධිපතිවරු පස්දෙනෙකු පත් වූ අතර පිළිවෙළින් ජනරාල් හුආන් පෙරේඩා

(General Juan Pereda) හා ජනරාල් ඩේවිඩ් පැඩිලා (General David Padila) යටතේ හමුදා කුමන්ත්‍රණ දෙකක් ක්‍රියාත්මක වී තිබුණි. එහිදී මොරාලෙස් කෙමාදෝ (Qumado) හි ජනාධිපති මන්දිරයේ ආරක්ෂකයෙකු වශයෙන් පත් කොට තිබුණි.




*මොරාලෙස් වෘත්තීය සමිති නායකයෙකු ලෙස කටයුතු කරන අවස්ථාවක දී සහ හමුදා නිලධාරියෙකු ලෙස කටයුතු අවස්ථාවක දී ලබා ගත් ඡායාරූප*

1978 දී මොරාලෙස් හමුදා සේවයෙන් ඉවත් වී කෘෂිකාර්මික කටයුතු වල නිරත විය. 1980 වසරේ ඇති වූ එල්නිනෝ (Elnino) කුණාටුව හේතුවෙන් තම කෘෂිකර්මාන්ත කටයුතු විනාශ වී ගිය පසු ඔහු පවුලේ සියලු දෙනා සමඟ කොචබම්බා ප්‍රදේශයට පදිංචිය සඳහා පැමිණියේ ය. එහිදී විවිධ කෘෂි බෝග වගා කරමින් ජීවත් වීමට ඔවුන්ට සිදුවිය. මොරාලෙස් එහි ස්වදේශීය භාෂාව වන කෙච්චා (Quecha) භාෂාව ඉගෙන ගත්තේ ය. බොලිවියානු වැසියෝ බොහෝ දෙනෙක් කොකා වගා කරමින් ජීවත් වූහ. විශේෂයෙන් එහි මිල අඛණ්ඩව ඉහළ යාම නිසාත් වසරකට සිව් වතාවක් වගා කළ හැකි නිසාත් මෙම කොකා වගාවට ඔවුහු වඩාත් නැඹුරු වූහ. ඇන්ඩියන් (Andian) සංස්කෘතියේ භාවිත කරන මෙම කොකා ශාකවල ඇති ප්‍රධාන සංඝටකයන් විදේශයට අලෙවි කරන ලදී.

මොරාලෙස් පාපන්දු ක්‍රීඩාව සඳහා දැක් වූ ආශාව දිගින් දිගට ම පවත්වාගෙන ගියේ ය. විවිධ පාපන්දු ක්‍රීඩා තරඟවලට සහභාගි වෙමින් ජයග්‍රහණය කරා තම කණ්ඩායම් මෙහෙයවී ය. ඒ අතරතුර ඔහු එල් චපාරේ (El Chapare) හි කොකාලෙරොස් වගාකරුවන්ගේ වෘත්තිය සමිති සාමාජිකයෙකු බවට පත් විය. එහිදී ඔහු විසින් වෘත්තීය සංගම් සාමාජිකයන් සමඟ විවිධ පාපන්දු තරඟ සංවිධානය කරන ලදී. වෘත්තිය සමිති සාමාජිකයන් අතර ඔහුට විශාල පිළිගැනීමක් හිමි විය. සංගමයේ සාමාජිකයන් ඔහුව 'තරුණ ක්‍රීඩකයා' (The young ball player) යන අන්වර්ථ නාමයෙන් හඳුන්වනු ලැබීය. 1980 දී ජනරාල් ලුයිස් ගර්ෂියා මේසා (General Luis Garcia Meza) හමුදා කුමන්ත්‍රණයකින් රාජ්‍ය බලය අල්ලා ගනිමින් අනෙකුත් සියලුම දේශපාලන පක්ෂ තහනම් කළේ ය. මොරාලෙස් දේශපාලනය සමඟ බැඳීමක් ඇති කර ගැනීමට හේතු වූ මූලික සිදුවීම් අතර මෙය ප්‍රධාන වේ. එම කුමන්ත්‍රණ රජය විසින් කොකා ජාවාරමක් බවට පත් කරනු ලැබීය. තව ද කොකා වගාකරුවන්ට විවිධ පහරදීම් සිදු කරන ලදී. කොකා වගාකරුවන් මරා පුළුස්සා දමන ලදී.

එම කාල කාලවකවානුව තුළ බොහෝ නීති විරෝධී හා ප්‍රජාතන්ත්‍රවාදී නො වන කටයුතු සිදුවිය. ආර්ථික වශයෙන් උද්ධමනය ඉහළ ගියේ ය. රටේ විරැකියාව 25%ක් දක්වා ඉහළ ගියේ ය. 1982 සිට 1983 දක්වා කාලය තුළ මොරාලෙස් වෘත්තීය සමිතිය තුළ ඉතා ක්‍රියාකාරීව කටයුතු කළේ ය. මොරාලෙස් ප්‍රාදේශීය සැන්ෆ්‍රැන්සිස්කෝ වාණිජ මණ්ඩලයේ (Local San Francisco) ලේකම්වරයා ලෙස කටයුතු කළේ ය. මත්ද්‍රව්‍ය විරෝධී අර්බුද හේතුවෙන් එක්සත් ජනපද රජය විසින් කොකා නිෂ්පාදනය වැළැක්වීම තුළින් කොකේන් වෙළඳාම නවතා දැමීමට බලාපොරොත්තු විය. එම අර්බුද නිමාකරවන ලෙස බොලිවියානු රජයට නිරන්තරයෙන් බලපෑම් සිදු කෙරුණි. බොලිවියානු හමුදාව කොකා වගාකරුවන්ට නිරන්තරයෙන් පහර දුන්නේ ය. මෙම පසුබිම තුළ මොරලෙස් වෘත්තීය සමිති ව්‍යාපාර සමඟ කටයුතු කරන්නට විය. කොකා වගා කරන ලද සෑම අක්කරයකට ම ඇමරිකානු ඩොලර් 25000ක වන්දියක් ලබා දෙන ලදී. නමුත් මොරාලෙස් එම වන්දිය ප්‍රතික්ෂේප කළේ ය. ඔහු විසින් අවධාරණය කරන ලද්දේ කොකා නිෂ්පාදනය සංස්කෘතිය සමඟ බද්ධ වූ කිසිදා වෙන් කළ නො හැකි සාධකයක් වශයෙනි. එසේ ම දීර්ඝ කාලයක් තිස්සේ පවත්වාගෙන යමින් තිබූ මෙම වගාවන් වඩාත් ලාභදායී ජීවනෝපායක් බවට පත් වී තිබුණි.

මෙම අර්බුදය ජාතික ස්වෛරීභාවය පිළිබඳ බලවත් ගැටළුවක් නිර්මාණය කර තිබුණි. මොරාලෙස් ඇතුළු වෘත්තිය සමිති නායකයන් නිරන්තරයෙන් පැවසූවේ "

කොකාට දීර්ඝායුෂ! යැන්කිස්ට මරණය!" ("Long live coca! Death to the Yankees!") යනුවෙනි. 1984 සිට 1985 දක්වා මොරාලෙස් එම ව්‍යාපාරයේ වාර්තා පිළිබඳ ලේකම්වරයා ලෙස කටයුතු කළේ ය. 1985දී එහි දෙවන මූලස්ථානයේ මහලේකම් බවට පත් විය. 1984 සිට 1991 කාල පරිච්ඡේදය තුළ කොකා වගාව මෙම බලහත්කාරයෙන් මුදා ගැනීම උදෙසා විවිධ විරෝධතා සංවිධානය කෙරිණි. මෙම සියලුම විරෝධතා සංවිධානය කිරීම සඳහා මොරාලෙස් ඍජුව ම මැදිහත් විය. 1985 කාල පරිච්ඡේදයේ සිට ඔහු තම ක්‍රියාකාරී දේශපාලනය ආරම්භ කළේ ය. 1988දී මොරාලෙස් නිවර්තන කලාපීය සම්මේලනයේ විධායක ලේකම් තනතුරට තේරී පත් විය.

1989දී ප්‍රාදේශීය පොලීසිය විසින් කොකා වගාකරුවන් 11 දෙනෙකු මරා දමා වසරක් සම්පූර්ණ වන සමරු උත්සවයට මොරාලෙස් සහභාගි වී කතාවක් සිදු කළේ ය. එදිනට පසු දවසේ කඳුකර ප්‍රදේශයක දී මොරාලෙස් මරා දැමීමට පොලිසිය විසින් උත්සාහ ගන්නා ලදී. නමුත් වෘත්තිය සමිති සාමාජිකයන් විසින් ඔහු එයින් බේරා ගන්නා ලදී. එක් අවස්ථාවක මොරාලෙස් විසින් ඉදිරිපත් කරන ලද කතාවක් තුළ ඔහු කොකා කොළය (Coca leaf) දැක්වූයේ එක්සත් ජනපද අධිරාජ්‍යවාදයෙන් පීඩනයට ලක් වී සිටින ඇන්ඩියන් සංස්කෘතියේ සංකේතයක් වශයෙනි. ඔහුගේ අදහස වූයේ එක්සත් ජනපදය දේශීය කොකේන් භාවිතය සමඟ ගැටලු ඇති කර ගනිමින් විවිධ ආකාරයේ මැදිහත්වීම්වලින් ඉවත් විය යුතු බව යි. ඇන්ඩියන් සංස්කෘතිය තුළ කොකේන් සුලබ භාවිතයන් සහිත නීත්‍යානුකූල නිෂ්පාදනයක් වන බවත් කිසිසේත් එය ඉවත් කිරීමට කිසිවකුට අයිතියක් නො මැති බවත් මොරාලෙස්ගේ අදහස විය.

එක් අවස්ථාවක දී මොරාලෙස් මාධ්‍යවේදීන්ට පැවසුවේ තමා මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවෙකු නො වන බවත් ස්වභාවික කොකා වගාකරුවකු පමණක් වන බවත් කොකේන් වලින් කිසිදු මත්ද්‍රව්‍යක් නිපදවා නැති බවත් ස්වභාවිකව නිපදවා වෙළඳපොළේ දී එය විකුණූ පසු තම වගකීම එතැනින් අවසන් වන බවත් ය. ලිබරල් ආර්ථික ප්‍රතිසංස්කරණ හරහා ස්වදේශීය වගාකරුවන් බලවත් පීඩනයකට ලක් විය. සැබැවින් ම එය සියලු දෙනාගේ ප්‍රජාතන්ත්‍රවාදී කැමැත්තෙන් තොර වූවක් විය. වෘත්තීය සමිති හා විවිධ සමාජ ක්‍රියාකාරකම් හරහා මොරාලෙස් ක්‍රියාකාරී චරිතයක් වශයෙන් සමාජය තුළ ඉස්මතු විය. ඉන්පසු මොරාලෙස් විසින් ව්‍යාකූල සහ කටුක දේශපාලන ගමනක් ආරම්භ කරන ලදී.

## නායකත්වය කරා ගිය ගමන් මග

මොරාලෙස්ගේ දේශපාලනික ආගමනයෙන් පසු බොලිවියාව තුළ පැවති පැරණි දේශපාලන සංස්කෘතිය වෙනස් කොට නව දේශපාලනික චින්තනයක් බොලිවියානු රාජ්‍යය තුළ ස්ථාපිත කිරීමට ඔහුට හැකි විය. 1980 මුල් භාගයේ දී කලාපීය කොකා වගාකරුවන්ගේ සංගමය ක්‍රියාකාරී සාමාජිකයෙකු වූ අතර 1980 දී ලේකම් බවට පත් විය. එලෙස ආරම්භ කරන ලද දේශපාලන ගමන ඔහු අඛණ්ඩව පවත්වාගෙන යාමට කටයුතු කළේ ය. 1986 දී සින්ඩිකැටෝ (sindicato) සමාජ ව්‍යාපාරයේ සාමාජිකයින් දේශපාලන වේදිකාවට පිවිසීමට ඔහුට යෝජනා කළේ ය. 1989දී නව දේශපාලන පක්ෂයක් පිහිටුවීම සඳහා මොරාලෙස් දායකත්වය ලබාදුන් අතර එය පිහිටුවීමට පක්ෂව එකඟතාවයන් ඇති වූයේ 1993දී පමණ ය. ඉන්පසු 1995 දී බොලිවියාවේ ග්‍රාමීය කම්කරුවන්ගේ 7වන 'යුනික් කොන්ෆිඩරේෂන්' (Unique Confederation) සමුළුවේ දී පිහිටුවන ලද දේශපාලන පක්ෂය 'ජනතා පරමාධිපත්‍යය සඳහා වන සභාව' (Asamblea por la Sobernía de los Pueblos – ASP) ලෙස නම් කෙරුණි. සී.එස්.යු.ටී.සී.බී. හි ගොවීන් පතල්කරුවන් හා ආදිවාසීන් නියෝජනය කරමින් තවත් බොලීවියානු සමිති තුනක් සමඟ ඒ.එස්.පී. හි පළමුවන සමුළුව පවත්වන ලදී.




*කොචබම්බාවේ සී.එස්.යු.ටී.සී.බී. පක්ෂය ආරම්භ කරන අවස්ථාවේ දී*

1992 දී මොරාලෙස් රටවල් කිහිපයක සංචාරය කරන ලදී. ඔහු විසින් කියුබාවේ පැවැති සම්මන්ත්‍රණයක දී කොකා වගාකරුවන් මුහුණ පා ඇති අර්බුද පිළිබඳව ජාත්‍යන්තරය දැනුවත් කරන ලදී. 1993 මහ මැතිවරණයෙන් පසු මෙම අභියෝග වඩාත් වර්ධනය විය. එම මැතිවරණයෙන් මධ්‍යම විප්ලවවාදී ජාතික ව්‍යාපාරය (Centrist Revolutionary Nationalist Movement) ජයග්‍රහණ ලබමින් ගොන්සාලෝ සැන්චෙස් ද ලොසාඩා (Gonzalo Sánchez de Lozada) ජනාධිපතිවරයා බවට පත් විය. ඔහු විසින් තවදුරටත් රාජ්‍ය සම්පත් පෞද්ගලීකරණය කිරීම සිදු කර ගෙන යන ලදී. එයින් සිදු වූයේ බොලිවියානු කොකා වගාකරුවන් පීඩනයට ලක් වීමයි. 1994 මාර්තු මාසය වන විට කොකේන් අක්කර 12500 විනාශ කර දැමීමට බොලිවියානු රජය පියවර ගන්නා ලදී. ඊට එක්සත් ජනපදය විසින් ඩොලර් මිලියන 20ක ආධාර ලබාදෙන බව ප්‍රකාශ කර තිබුණි. මෙම පියවරයන්ට මොරාලෙස් ඇතුළු වෘත්තීය ව්‍යාපාරය තරයේ විරුද්ධ විය. 1996 අගෝස්තු මස දී මොරාලෙස් අත්අඩංගුවට ගනු ලැබීය. එම අවස්ථාවේ දී මාධ්‍යවේදීන් වාර්තා කර තිබුණේ මොරාලෙස්ට විවිධ ආකාරයේ වධහිංසා පමුණුවා තිබූ බවයි. අත්අඩංගුවට ගෙන සිර කඳවුරකට ගෙන ගොස් දැමූ අවස්ථාවේ මොරාලෙස් විසින් තමාට වූ අසාධාරණය වෙනුවෙන් උපවාසයක් ආරම්භ කරන ලදී. එහිදී ජනතාව 3000 පමණ විලා ටුනාරි (VillaTunari) සිට ලා පාස් (la Paz) දක්වා සැතපුම් 360ක් පාගමනින් පැමිණියහ. 1994 සැප්තැම්බර් 7 මොරාලෙස් සිරකඳවුරින් නිදහස් කරන ලදී. 1995 දී ඔහු නැවත අත්අඩංගුවට ගන්නේ කොකා නිෂ්පාදනයන්ගේ ඇන්ඩියන් කවුන්සිලයේ රැස්වීම් අතරතුර කරන ලද වැටලීමක දී ය. නැවත වරක් කුමන්ත්‍රණ චෝදනා එල්ල කරමින් ඔහු අත්අඩංගුවට ගන්නා ලදී. එහිදී චෝදනා ඔප්පු කිරීමට නො හැකි වීම හේතුවෙන් සතියක පමණ කාලයක් තුළ ඔහුට නිදහස හිමි විය. 1995 දී මොරාලෙස් විමුක්ති අරගලය පිළිබඳ සම්මන්ත්‍රණයට සහභාගි වීම උදෙසා ආර්ජන්ටිනාව වෙත යන ලදි. එසේම 1996 දී කොචබම්බාහි නිවර්තන කලාපීය, හයේ සම්මේලනයේ (Six Federations) සභාපතිවරයා ලෙස මොරාලෙස් පත් කෙරුණු අතර ඔහු එම ධුරයේ 2006 වන තෙක් රැඳී සිටියේ ය.

කෙසේ වෙතත් ඒ.එස්.පී. සංවිධානයට බොලිවියාවේ ජාතික මැතිවරණ උසාවිය විසින් සිදුකළ යම් යම් ප්‍රතික්ෂේප කිරීම් හේතුවෙන් ඔවුන්ට ඒ.එස්.පී. සංවිධානය යටතේ තරඟ කිරීමට නො හැකි වුවත් ඔවුන් බොලිවියාවේ කොමියුනිස්ට් පක්ෂයේ නායකත්වය දරන වාමාංශික පක්ෂයක් වන 'එක්සත් වාම' (United Left-IU) පක්ෂය

යටතේ 1997 දී මැතිවරණයට ඉදිරිපත් විය. එලෙස එක්සත් වාම පක්ෂයෙන් තරග කිරීමෙන් නාගරික මන්ත්‍රීවරු 49ක් සහ නගරාධිපතිවරු 11ක් සමඟ එම පක්ෂය විශිෂ්ට ජයග්‍රහණයක් ලැබූ අතර ප්‍රාදේශීය ඡන්ද මගින් 71%ක් ලබා මොරාලෙස් 'එල් චාපාරේ' (El Chapare) හි නියෝජිතයකු ලෙස ජාතික කොංග්‍රසයේ නියෝජිත මණ්ඩලයට තේරී පත්විය. පවතින දේශපාලන ක්‍රමය මත විශ්වාසය තැබූ දේශපාලනික හස්තයන් එලෙස තේරී පත් වූ නව දේශපාලනික අදහස් ඇති නායකයන්ට එරෙහිව අභ්‍යන්තරික ගැටුම් මගින් බලපෑම් ඇති කිරීම ආරම්භ විය. කෙසේ වෙතත් බොලිවියානු රජය විසින් 'ප්‍රජාතන්ත්‍රවාදය හා යහපාලනය' අනුගමනය කරන බව පෙන්නුම් කළ අතර එය ජාත්‍යන්තර ආයෝජකයන්ගේ ඉමහත් පිළිගැනීමට හේතු වූ කරුණක් විය. එසේම සාම්ප්‍රදායික දේශපාලන බලවේගයන්ගේ ආධිපත්‍යයට එරෙහිව නෛතික රාමුවක් තුළ අභියෝගයන් වර්ධනය කිරීමට 'ජනප්‍රිය සහභාගීත්ව නීතිය' පිළිබඳ (Law of Popular Participation - LPP) සංවිධානය හරහා සමාජ ව්‍යාපාරයන් විසින් පදනමක් ගොඩනැගූ අතර මොරාලෙස් ගොඩනැගූ 'ප්‍රජාතාන්ත්‍රික විප්ලවය' එයට සැබෑ සාක්ෂියක් විය.

මෙලෙස මැතිවරණයන් තුළින් ලැබූ ජයග්‍රහණයන් සමඟ ඒ.එස්.පී. නායකත්වය උදෙසා එලෙජෝ වේලිස් (Alejo Véliz) සහ මොරාලෙස් අතර තියුණු තරඟයක් ඇති විය. මෙම ගැටුමත් සමඟ මොරාලෙස් සහ ඔහුගේ ආධාරකරුවන් ඒ.එස්.පී. තුළින් ඉවත් වී ඔවුන්ගේ ම දේශපාලන පක්ෂයක් පිහිටුවීමට කටයුතු කළහ. එය 'ජනතාවගේ ස්වෛරීභාවය සඳහා වූ දේශපාලන සංවිධානය' (Instrumento Político por la Soberanía de los Pueblos – IPSP) ලෙස නම් කරන ල දී. අයි.පී.එස්.පී. පිහිටුවීමත් සමඟ ඒ.එස්.පී. හි බලය බිඳ වැටුණු අතර ඇලෙජෝ වේලිස් සහ ඉතිරි වූ ඒ.එස්.පී. සාමාජිකයන්, මධ්‍ය-දකුණු නව රිපබ්ලිකන් පක්ෂයට එකතු වූහ. ඉන්පසු මොරාලෙස් විසින් 'සමාජවාදය සඳහා වූ ව්‍යාපාරය' (Movement for Socialism -MAS) නමින් ලියාපදිංචි වී ඇති ෆැලන්ගිස්ට් (Falangist) පක්ෂයේ නායකයා වූ ඩේවිඩ් අන්යෙස් පේද්‍රාසා (David Añez Pedraza) සමඟ අනාගත දේශපාලනික සැලසුම් සඳහා ගිවිසුම් ගත විය. මෙම ගිවිසුමට අනුව මොරාලෙස් හට තම දේශපාලන කටයුතු සඳහා මෙම ෆැලන්ගිස්ට් පක්ෂයේ නාමය භාවිතා කිරීමට හැකියාව ලැබුණු අතර පේද්‍රාසා විසින් 'MAS' යන කෙටියෙදුම සහ එහි

වර්ණ භාවිතා කළ යුතු බවට කොන්දේසි නිකුත් කළේ ය. එම එකඟතාවය නිසා මාස් ව්‍යාපාරය ‘ජනතාවගේ ස්වෛරීභාවය සඳහා වූ දේශපාලන සංවිධානය’ ලෙස ප්‍රකට විය.

එසේම මෙම කාලවකවානුවේ බොලිවියාවේ පැවති රාජ්‍ය පාලනය ග්‍රාමීය හා දුප්පත් නාගරික ප්‍රදේශවල ජීවත් වන ජනතාවගේ ඉමහත් අප්‍රසාදයට ලක් වූ අතර රාජ්‍ය විරෝධී පක්ෂයක් ලෙස මාස් ව්‍යාපාරය ජනතාවගේ ප්‍රසාදයට ලක් විය. මෙය තම වාසියට හරවා ගනිමින් මොරාලෙස් සිය දේශපාලන රැලි තුළ දී MAS ව්‍යාපාරය සාම්ප්‍රදායික දේශපාලන වේදිකාවෙන් වෙනස් ලෙස උලුප්පා දැක්වීමට කටයුතු කළේ ය. එහිදි කොකා වගාවන් සිදු කිරීමට එහා ගිය ඉතා වගකීම් සහගත පක්ෂයක් ලෙස MAS ව්‍යාපාරය වර්ධනය විය. 2000 දී ඇති වූ ‘ජල යුද්ධය’ (The Water War) තුළ දී ග්‍රාමීය හා නාගරික ප්‍රදේශවල යෝජිත ජලය එකතු කිරීම හා බෙදාහැරීම පෞද්ගලීකරණය කිරීමට එරෙහිව මොරාලෙස් ප්‍රධාන භූමිකාවක් ඉටු කළේ ය. මෙම ක්‍රියාමාර්ග හේතුවෙන් ඔවුන්ගේ දේශපාලන ව්‍යාපාරය ඉතා ශක්තිමත් සහ සාර්ථක විය. කෙසේ වෙතත් ඇමෙරිකානු තානාපති වූ මැනුවෙල් රොච් (Manuel Roch) නිවේදනයක් නිකුත් කර කියා සිටියේ මාස් ව්‍යාපාරය විසින් 2002 මැතිවරණය ජයග්‍රහණය කළහොත් එක්සත් ජනපදය විසින් බොලිවියාවට ලබාදෙන ආධාර කපා හරින බවයි. එම ප්‍රකාශනය සිදු කිරීමත් සමඟ ම මොරාලෙස් වටා තිබූ ජනතා සහයෝගය සීඝ්‍රයෙන් ඉහළ ගිය බවට මැතිවරණ නිරීක්ෂකයන් ප්‍රකාශ කර ඇත. 2002 දී ජනාධිපතිවරණයේ ජාතික ඡන්ද වලින් 30%කට ආසන්න ඡන්ද ප්‍රමාණයක් ලබා ගනිමින් MAS ව්‍යාපාරය බොලිවියාවේ දෙවන විශාලතම පක්ෂය බවට පත්විය. මෙම පක්ෂය සෙනට් සභාවේ ආසන 8ක් සහ නියෝජිත මණ්ඩලයේ ආසන 27ක් දිනා ගත්තේ ය. එය මොරාලෙස්ගේ දේශපාලන ගමනේ ඉතාමත් ම සුබදායී හැරවුම් ලක්ෂයක් වූ අතර ඔහු විපක්ෂ නායකයා බවට පත් විය.

2002 මැතිවරණ ප්‍රතිඵලය බොලිවියාවේ සමාජ ව්‍යාපාරයන් විසින් දේශපාලන බලවේගයන් හි සමතුලිතභාවය ඇති කිරීම සඳහා වූ පැහැදිලි ලකුණක් ලෙස ඉතිහාසඥයන් හඳුනාගෙන ඇත. එසේ ම විද්වත් මතවාදවලට අනුව 2002 මැතිවරණයෙන් පසු මොරාලෙස් සහ පේද්‍රාසා විසින් ආරම්භ කළ දේශපාලන ගමන් මඟ, මොරාලෙස් කොකලේරො සංවිධානයේ නායකයා ලෙස කටයුතු කළ සමයේ ඔහු විසින් මෙහෙය වූ විප්ලවවාදී මහජන බලමුළු ගැන්වීමේ දේශපාලන ක්‍රියා

පටිපාටියට වඩා හාත්පසින් ම වෙනස් ස්වරූපයක් ගනු ලැබීය. එහිදී ඔහු බලමුළු ගැන්වීමේ ක්‍රියාපටිපාටියට වඩා පාර්ලිමේන්තු පද්ධතියේ යම් යම් වෙනස්කම් සිදු කිරීමට හා නව ප්‍රතිසංස්කරණයන් වෙනුවෙන් පෙනී සිටීමට පටන් ගත් බවක් දක්නට ලැබිණි. මෙලෙස මොරාලෙස් තම රැඩිකල් දේශපාලනයේ හිණිපෙත්තට ම පැමිණි අතර ඔහු බොලිවියාවේ විප්ලවවාදී ව්‍යාපාර වල නායකත්ව තනතුර පවා තම විරුද්ධවාදියෙකු වූ ෆිලිපේ කිස්පේ (Felipe Quispe) හට ලබා දීමට කටයුතු කළේ ය. එසේම ඔහුගේ දේශපාලන ස්ථාවරත්වය හා කැපී පෙනෙන ස්වභාවය වැඩි වීමත් සමඟ ජනරැලි හා මාර්ග බාධක වැනි ඔහුගේ පැරණි දේශපාලන උපායමාර්ග නවතා දැමීය. එය ඔහුගේ දේශපාලන සාර්ථකත්වයට සියුම් ප්‍රවේශයක් විය. කෙසේ වෙතත් මොරාලෙස් සහ මාස් ව්‍යාපාරය විසින් බොලිවියානු දේශපාලනයේ ස්වරූපය පෙර නො වූ විරූ ලෙස පරිවර්තනය කළේ ය. නව ලිබරල්වාදී ක්‍රමයන්ගෙන් බොලිවියානු දේශපාලනය මුදා ගැනීමට ඔවුන්ගේ දායකත්වය නො මඳව ලැබී ඇත.

එසේම ඔහු අවස්ථා කිහිපයකදී ම දේශපාලන නායකයන් සමඟ සාකච්ඡා පැවැත්විය. එවකට බොලිවියාවේ ජනාධිපති වූ සැන්චෙස් ද ලොසාඩා (Sánchez de Lozada) සමඟ ද දේශපාලන හමුවීම් කිහිපයක් ම සිදු වූ අතර ප්‍රථම වරට වෙනිසියුලාවේ ජනාධිපති හියුගෝ චාවේස් (Hugo Chávez) සමඟ ද 2002 දී හමුවීමක් පැවතිණි. එසේ ම 2003 දී කියුබානු ජනාධිපති ෆිදෙල් කැස්ත්‍රෝ (Fidel Castro) හා මොරාලෙස් අතර හමුවක් හවායි හි දී පැවැත් වූ අතර ඉන්පසුව ආර්ජන්ටිනාවේ ජනාධිපති වූ නෙස්ටර් කර්චනර් (Nestor Kirchner) සමඟ ද දේශපාලන හමුවීමක් සිදු විය.

2003 දී බොලිවියානු ‘ගෑස් ගැටුමේ’ (The Bolivian gas conflict) ආරම්භය සිදුවිය. එහිදී සිවිල් වැසියන් හා පොලිසිය සමඟ ඇති වූ ගැටුම් හේතුවෙන් සිවිල් වැසියන් 58 දෙනෙකු ඝාතනය වූහ. මුල් භාගයේ මොරාලෙස් මෙය ‘සාමකාමී විප්ලවයක්’ ලෙස අර්ථ දැක්වුව ද මොරාලෙස් එකල බොලිවියාවේ ජනාධිපති වූ ලොසාඩාගෙන් කළ ඉල්ලීමත් සමඟ මොරාලෙස්ගේ නායකත්වයෙන් යුතුව මාස් සහ අනෙකුත් ක්‍රියාකාරී කණ්ඩායම් මෙන් ම මධ්‍යම පාන්තිකයන්ගේ සහයෝගය ද ලබා ගනිමින් බොලිවියාවේ ගැටුම් හේතුවෙන් ඇති වන මරණ සංඛ්‍යාව අඩු කර ගැනීමට සහයෝගය දැක්වීය. මෙලෙස මොරාලෙස්ගේ දේශපාලන ගමන් මඟ ඉතා ශක්තිමත් ආකාරයෙන් ඉදිරියට යාමත් සමඟ ම 2004 මහ නගර සභා මැතිවරණයේ දී

බොලිවියාවේ මන්ත්‍රී ආසන 28ක් ලබා ගනිමින් මාස් ව්‍යාපාරය එම වර්ෂයේ බොලිවියාවේ විශාලතම ජාතික පක්ෂය බවට පත් විය.

2005 දී ඇති වූ කොකලේරෝ මාර්ග බාධක, කැරලි කෝලාහල සහ මොරාලෙස් ඇතුළු කණ්ඩායම විසින් ඇති කරනු ලැබූ පීඩන සමඟ එවකට බොලිවියානු ජනාධිපති වූ මේසා (Mesa) ඉල්ලා අස්විය. මෙහිදී සිවිල් ගැටුම් නැවත ඇතිවේ යැයි හටගත් බිය හේතුවෙන් මේසාගෙන් පසු ජනාධිපති බවට පත් වූ එදු(අ)ර්ඩෝ රොඩ්රිගස් වෙල්ට්සි (Eduardo Rodríguez Veltzé) හදිසි මහ මැතිවරණයක් නිවේදය කළේ ය. එම මැතිවරණයෙන් වැඩිම ඡන්ද ප්‍රතිශතයක් ලබා ගනිමින් මොරාලෙස් 2006 දී නව ආණ්ඩුවේ ජනාධිපතිවරයා බවට පත්විය.

## <u>නායකත්වයට පැමිණීමෙන් පසු සිදු කළ සේවාව</u>




*මොරාලෙස් 2006 බොලිවියාවේ ජනාධිපති ලෙස පත් වූ අවස්ථාවේ*

2006 ජනවාරි 22 පැවති ජනමත විචාරණයේ දී ඊවෝ මොරාලෙස් බොලිවියාවේ ජනාධිපති බවට පත්විය. විශේෂයෙන් අප මොහු ගැන සලකා බැලීමේදී කාල පරිච්ඡේද තුනක් යටතේ සාකච්ඡාවට භාජනය කරයි. එනම් ඔහු ජනපති ලෙස ධූර දැරූ කාල සීමාවන් වේ.

2006-2009

2009-2014

2014-2019

මොරාලෙස්ගේ ජනාධිපතිධූර කාලවල දී ඔහු විසින් සුවිශේෂී වැඩසටහන් හා ක්‍රියාමාර්ග හඳුන්වා දීමට කටයුතු කරන ලදී. එහිදී ප්‍රථම හා දෙවන ධූර කාලයන් හි දී ඔහු බොලිවියාව වෙනුවෙන් වැඩි ම කාර්යයන් ප්‍රමාණයක් ඉටු කිරීමට සමත් විය. ඒ තුළ ආර්ථික, සමාජ, ව්‍යවස්ථාමය ප්‍රතිසංස්කරණ සිදු කිරීම සුවිශේෂි අවස්ථාවන් ලෙස දැකගත හැකි ය.

## <u>පළමු ජනාධිපතිධූරය</u>

### ආර්ථික වැඩසටහන

මොහු බොලිවියාවේ ජනාධිපති ලෙස පත් වන අවස්ථාවේ බොලිවියාව යනු දකුණු ඇමරිකාවේ දුප්පත් ම රට ලෙස හැඳින්විය. මොහුගේ රජය විසින් බොලිවියාවේ ආර්ථික ව්‍යුහය වෙනස් කිරීමට මුල් කාල වකවානුවේ උත්සහ නො කළ අතර 2006 සිට 2010 දක්වා ඔවුන්ගේ ජාතික සංවර්ධන වැඩසටහන පෙර පැවති ලිබරල් ආකෘතියකට අනුව අනුගත වූයේ යැයි කීම වරදක් නො වේ. මොරාලෙස් සිය මැතිවරණ පොරොන්දු ඉෂ්ට කිරීමට හයිඩ්‍රොකාබන් කර්මාන්තයේ වැඩි පාලනයක් තම රජය වෙත පවරා ගත්තේ ය. මීට පෙර කර්මාන්තයෙන් රජයට හිමිවූයේ 18%ක පමණ ලාභයක් වූ අතර මොරාලෙස් තම රජය වෙත ලබා ගැනීමෙන් පසු 82%ක ලාභයක් රජයටත්, 18%ක ලාභයක් සමාගම් වලටත් හිමි වන ලෙස වෙනස් කිරීම සිදු කළේ ය. එහි ප්‍රතිඵලයක් ලෙස බොලිවියාවේ හයිඩ්‍රොකාබන් නිස්සාරණ යේ ආදායම 2002 දී ඩොලර් මිලියන් 173 සිට 2006 වන විට ඩොලර් බිලියන 1.3ක් දක්වා ඉහළ ගියේ ය. එලෙෂ ම 2006 ජුනි මාසයේ දී මොරාලෙස් විසින් පතල්, විදුලිය, දුම්රිය මාර්ග ජනසතු කිරීමේ සැලැස්ම ඉදිරිපත් කළේ ය. 2007 පෙබරවාරියේ දී රජය විසින් වින්ටෝ (Vinto) ලෝහ කම්හල ජනසතු කරන ල දී. මොරාලෙස් යටතේ බොලිවියාව පෙර නො වූ විරූ ලෙස ආර්ථිකමය වශයෙන් ශක්තිමත් වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස බොලිවියානු මුදලේ වටිනාකම වැඩි විය. මෙය බොලිවියාවේ වසර තිහක ඉතිහාසය තුළ මුදලේ අගය වැඩි වු පළමු අවස්ථාව වන අතර මොරාලෙස්ගේ පළමු ධූර කාලය තුළ බොලිවියාවට කිසිදු මූල්‍යමය හිඟකමක් නො වීය. ඒ පිළිබඳ කදිම

නිදසුනක් ලෙස 2007- 2008 තුළ සිදු වූ ගෝලීය මූල්‍ය අර්බුද අවස්ථාවේ වුව ද බොලිවියාව ලෝකයේ ඉහළ ම ආර්ථික වර්ධනයක් පවත්වා ගෙන යාම දැක්විය හැක. ආර්ථික ශක්තිය මත රට පුරා සංවර්ධන අවස්ථාවලට ද රජය ඉඩ ලබා දුන්නේ ය. විශේෂයෙන් ම ඔවුන්ගේ ප්‍රමුඛතාවය හිමි වූයේ ප්‍රජා අවකාශයන් නිර්මාණය කරනවා සේ ම ග්‍රාමීය වශයෙන් යටිතල පහසුකම් දියුණු කිරීමට යි. එසේම ඔහුගේ මෙන් ම ඇමතිවරුන්ගේ වැටුප 57%කින් මසකට ඩොලර් 1,875 දක්වා අඩු කළ අතර කොංග්‍රස් සාමාජිකයින්ටත් එසේ කරන ලෙස ඉල්ලා සිටියේ ය.

එසේම මොරාලෙස්ගේ රජයේ ප්‍රකාශිත අභිප්‍රාය වූයේ බොලිවියාවේ පැවැති උග්‍ර දරිද්‍රතා මට්ටමින් එනම් 35% සිට 27% දක්වාත් සමස්ත දරිද්‍රතා මට්ටම 58.9% සිට 49% දක්වාත් වසර පහක කාලසීමාව තුළ අඩු කිරීම යි. මෙහිදී වයස්ගත පුද්ගලයන් සඳහා විශ්‍රාම වැටුප් ක්‍රමයක් හඳුන්වා දීම, මව්වරුන්ට ගෙවීම් ක්‍රමයක් නිර්මාණය කිරීම සහ ඒ තුළින් දරුවන්ව සෞඛ්‍ය පරීක්ෂාවන්ට මෙන් ම පාසල් කරා යොමු කිරීමට ද දිරි ගැන්වීය. එලෙස ම නොමිලේ ට්‍රැක්ටර් සිය ගණන් ලබා දීම, බොහෝ ආහාර ද්‍රව්‍යවල මිල පාලනය කිරීම, දේශීය ආහාර නිෂ්පාදකයන්ට අපනයන නිෂ්පාදන වලට වෙළඳපොළේ වඩා වැඩි ඉඩකඩක් සලසාදීම සහ සහන මිල ගණන් යටතේ ආහාර බෙදා හැරීමට ද කටයුතු කරන ලදී. මොරාලෙස්ගේ පළමු ධූර කාලය තුළ බොලිවියාව ලෝක බැංකුවේ සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ආධිපත්‍යයෙන් මිදී කටයුතු කළේ ය. 2007 මැයි මාසයේ දී මොවුන් ආයෝජන ආරවුල් සමථයකට පත් කරන ජාත්‍යන්තර මධ්‍යස්ථානයෙන් (The International Center for the Settlement of Investment Disputes) ඉවත් වූ ලොව ප්‍රථම රට වූ අතර මොරාලෙස් ප්‍රකාශ කර සිටියේ ආයතනය සිය විනිශ්චයන් තුළ දී බහුජාතික සමාගම්වලට නිරන්තරයෙන් වැඩි අනුග්‍රහයක් දක්වන බවයි. මොරාලෙස්ගේ පරිපාලනය මුහුණ දුන් ප්‍රධාන උභතෝකෝටිකය වූයේ සමාජ වැඩසටහන් සඳහා අරමුදල් සැපයීම හා රැකියා සැපයීම සඳහා කර්මාන්ත පුළුල් කිරීම සහ එම කර්මාන්ත නිසා රටේ ඇති වන පරිසර දූෂණය වළක්වා ගැනීමයි.

**ජාත්‍යන්තර පෙනී සිටීම**

2006 සැප්තැම්බර් මාසයේ දී එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩල සැසිවාරයට සහභාගිවීම සඳහා ප්‍රථම වතාවට මොරාලෙස් ඇමෙරිකානු එක්සත් ජනපදයට ගියේ ය. එහිදී එක්සත් ජනපදයේ හිටපු ජනාධිපතිවරුන් වන බිල් ක්ලින්ටන් (Bill

Clinton) හා ජිමි කාටර් (Jimmy Carter) මෙන් ම ස්වදේශික ඇමෙරිකානු කණ්ඩායම් ද හමුවිය. එලෙස ම දෙසැම්බර් මාසයේ දී බොලිවියාවට පැමිණෙන එක්සත් ජනපද පුරවැසියන්ට වීසා බලපත්‍රයක් ලබා ගතයුතු බවට ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නියෝගයක් නිකුත් කරන ලදී. මෙම හේතුව පාදක කොටගෙන දෙරට අතර සබඳතා තවදුරටත් අඩාල විය. මීට අමතරව බොලිවියාව එක්සත් ජනපද සොල්දාදුවන්ට නීතිමය රැකවරණය ලබා දීම ඔහුගේ රජය ප්‍රතික්ෂේප කළ බැවින් එක්සත් ජනපදය තම රටට ලබාදුන් මිලිටරි සහය 96%කින් අඩු කළේ ය. 2006 දෙසැම්බර් හි දී ඔහු නයිජීරියාවේ අබුජා (Abuja) හි පැවති පළමු දකුණු - දකුණු සමුළුවට (South-South Conference) සහභාගි වූ අතර එහිදී ලිබියා නායක මුවම්මර් ගඩාෆි (Muammar Gaddafi) හමුවිය. ඔහුගේ රජය විසින් මොරාලෙස්ට මානව හිමිකම් සඳහා අල් ගඩාෆි (Al-Gaddafi) ජාත්‍යන්තර ත්‍යාගය ප්‍රදානය කරන ලදී. ඔහුගේ පරිපාලනය තුළ ඉරානය සමඟ රාජ්‍යතාන්ත්‍රික සබඳතා ඇති වූ අතර මොරාලෙස් ඉරාන ජනාධිපති මහමුද් අහමඩිනෙජාඩ් (Mahmoud Ahmadinejad) විප්ලවවාදියකු ලෙස වර්ණනා කළේ ය.

**සමාජ ප්‍රතිසංස්කරණ**

මොරාලෙස්ගේ රජය උත්සාහ කළේ "හොඳින් ජීවත් වීමට" (to live well) යන තේමාව පදනම් කොටගෙන සංවර්ධන ආකෘතියක් ඉදිරිපත් කිරීමටයි. මෙයට සමාජ සමගිය, සම්මුතිය, සමාජ අසමානතාව තුරන් කිරීම සහ ධනය යළි බෙදාහැරීම යන සාධක ද ඇතුළත් වේ. මැතිවරණයෙන් පසු බොලිවියාවේ නූගත්කම අනුපාතයක් වශයෙන් 16%ක් වූ අතර එය දකුණු ඇමෙරිකාවේ ඉහළ ම අගය විය. බොලිවියාව කියුබාවේ සහය ඇතිව සාක්ෂරතා වැඩසටහනක් දියත් කළ අතර වෙනිසියුලාව, බොලිවියානු උපාධිධාරීන් 5000කට වෙනිසියුලාවේ නොමිලේ අධ්‍යාපනය ලබා ගැනීමට ආරාධනා කළේ ය. කියුබාව විසින් බොලිවියාවේ වෛද්‍ය ප්‍රතිකාර සංවර්ධනයට ආධාර කිරීම, වසරකට බොලිවියානවන් ලක්ෂයකට නොමිලේ ප්‍රතිකාර කිරීම සඳහා රටේ අක්ෂි වෛද්‍ය මධ්‍යස්ථාන විවෘත කිරීම සහ බොලිවියානු සිසුන්ට කියුබාවේ වෛද්‍ය විද්‍යාව හැදෑරීම සඳහා ශිෂ්‍යත්ව 5000 ලබා දීම ද සිදු කරන ලදී. ඔවුන් උත්සහ කළේ බටහිර වෛද්‍ය විද්‍යාව හා බොලිවියානු සාම්ප්‍රදායික වෛද්‍ය විද්‍යාව යන දෙකම සමබරව පවත්වාගෙන යාමට යි. 2006 පමණ වන විට බොනෝ හුවන්සිටෝ පින්ටෝ (Bono Juancito Pinto) වැඩසටහන මගින් 80%කට වඩා තම

දරුවන් රජයේ පාසල් සඳහා රඳවා සිටින දෙමව්පියන්ට වසරකට ඇමරිකානු ඩොලර් 29ක් ලබා දී ඇත. 2008 දී රෙන්ටා ඩිග්නිඩැඩ් (Renta Dignidad) වැඩසටහන මගින් බෝනෝසෝල් (Bonosol) ජෝෂ්ඨයන්ගේ වැඩසටහන සඳහා සමාජ සුරක්ෂිතතාවය පුළුල් කළ අතර ම වසරක ගෙවීම ඩොලර් 344ක් දක්වා වර්ධනය කර නිර්දේශිත වයස 65 සිට 60 දක්වා අඩු කරන ලදී. 2009 දී බොනෝ හුවානා අසුර්ඩුයි (Bono Juana Azurduy) වැඩසටහන මගින් මීට පෙර පැවති මහජන මාතෘ රක්ෂණයක පුළුල් කළ අතර අඩු ආදායම්ලාභී මව්වරුන්ට මුදල් ලබා දෙමින් ඔවුන්ගේ දරුවන්ට පූර්ව හා පශ්චාත් වෛද්‍ය ප්‍රතිකාර ලබා දී ඇති බව ද පෙනේ. එලෙස ම තම රජය රටේ ආදිවාසීන්ට එරෙහිව වර්ගවාදය තුරන් කිරීමට ප්‍රමුඛත්වයක් ලබා දෙන බව මොරාලෙස් ප්‍රකාශ කළේය. මෙය සිදු කිරීම සඳහා සියලු සිවිල් සේවකයන් බොලිවියාවේ ස්වදේශික භාෂා තුනක් වන කෙචුවා, අයිමාරා හෝ ගුවරානි (Guaraní) භාෂාවලින් එකක් වසර දෙකක් ඉගෙන ගතයුතු බව ඔහු ප්‍රකාශ කළේ ය. එලෙස ම ඔහු ආදිවාසී සංස්කෘතික ව්‍යාපාර සංවර්ධනය කිරීම සඳහා දිරි දුන් අතර ආදිවාසීන්ට විශ්වවිද්‍යාලවලට යාමට ද අවස්ථාව ලබා දුන්නේ ය. 2008 වන විට බොලිවියානු විශ්වවිද්‍යාල 11කට ඇතුළත් වූ සිසුන්ගෙන් අඩක් ආදිවාසීන් යැයි ගණනය කොට ඇති අතර සහනාධාර ලබා දෙමින් ස්වදේශීය විශ්වවිද්‍යාල 3ක් පිහිටුවා ඇත. 2006 අන්තර්ජාතික කම්කරු දිනය වෙනුවෙන් මොරාලෙස් ජනපති නියෝගයක් නිකුත් කරමින් කියා සිටියේ පසුගිය නව ලිබරල් ආණ්ඩුව විසින් ක්‍රියාත්මක කළ ශ්‍රමය අවිධිමත් කිරීම පිළිබඳ කරුණු අහෝසි කරන බවයි. මෙය බොලිවියාවේ කම්කරු අයිතිවාසිකම් සම්බන්ධව සිදු වූ සංකේතාත්මක හැරවුම් ලක්ෂයක් යැයි කිව හැකිය. වෘත්තීය සමිති සමඟ දීර්ඝ ලෙස සාකච්ඡා කිරීම් තුළ ප්‍රතිසංස්කරණවල ප්‍රගතියට බාධාවක් වුව ද 2009 දී ඔහුගේ රජය අවම වැටුප් 50%කින් වැඩිකර විශ්‍රාම වැටුප් වයස අවුරුදු 65 සිට 60 දක්වාත් අඩු කළේ ය. මොහු විසින් කම්කරු පන්තියේ ජීවන තත්වය ඉහළ නැංවීමට ප්‍රතිපත්ති ගෙන එන ලදී. එලෙස ම 2006 මොහුගේ කෘෂිකාර්මික ප්‍රතිසංස්කරණ මගින් පුද්ගලයන්ට වඩා සාම්ප්‍රදායික ප්‍රජාවන්ට ඉඩම් බෙදා හැරීම සඳහා රජය විසින් නීතියක් සම්පාදනය කොට රජයට අයත් ඉඩම් නැවත ලබා දීමත් සිදු කරන ලදි. බොලිවියාවේ කාන්තා අයිතිවාසිකම් වැඩිදියුණු කිරීමට ද මොරාලෙස්ගේ රජය උත්සහ කළේ ය. කොකා " ඔව්" සහ කොකේන් (Cocaine) "නැත"යනුවෙන් ප්‍රතිපත්තියක් අනුගමනය කළ අතර ම ඒ තුළ කොකා වගාව නිත්‍යානුකූල කළ අතර බෝග නිෂ්පාදනයට හා

වෙළඳාමට අවශ්‍ය ක්‍රියාමාර්ග හඳුන්වා දෙන ලදි. එලෙස ම බොලිවියාවේ ආවේණික දූෂණ මැඩපැවැත්වීම සඳහා ද මොරාලෙස්ගේ රජය පියවර ගෙන තිබුණි. ආයතනික විනිවිදභාවය සහ දූෂණයට එරෙහිව සටන් කිරීමට අමාත්‍යාංශ නිර්මාණය කිරීම 2007 දී ඔහුගේ ප්‍රධානත්වයෙන් සිදුවිය.

**අභ්‍යන්තරික නොසන්සුන්තාවය හා නව ව්‍යවස්ථාව**

මොරාලෙස් තම ජනාධිපති ධූර දරන සමයේ දී දෙපාර්තමේන්තු සඳහා කලාපීය ස්වයංපාලන බලයක් ලබා දීම වැනි ඉල්ලීම් සඳහා ද සහයෝගය දක්වා ඇත. බොලිවියාවේ සැන්ටා කෘස් (Santa Cruz) , බෙනී (Beni), පැන්ඩෝ (Pando) සහ ටාරිජා (Tarija) යන නැගෙනහිර දෙපාර්තමේන්තු හතරෙන් පැමිණි ස්වයංපාලනයක් සඳහා වූ ඉල්ලීම් දෙස බලමින් ජනාධිපති වශයෙන් ඔහු සිය ස්ථාවරත්වය වෙනස් කළේ ය. කෙසේ වෙතත් 2006 ජූලි මාසයේ කලාපීය ස්වාධීනත්වය පිළිබඳව ජනමත විචාරණයක් පැවැත්වීමට ඔහු එකඟ විය. නැගෙනහිර දෙපාර්තමේන්තු 4න් ස්වයංපාලනයට පක්ෂව ඡන්දය ලබා දුන්න ද සමස්තයක් ලෙස බොලිවියාව එයට එරෙහිව 57.6%ක ඡන්දයක් ප්‍රකාශ කළේ ය. 2006 ජූලි මාසයේ දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදන මණ්ඩලයක් පිහිටුවීම සඳහා ද මැතිවරණයක් පැවැත් වූ අතර එය ඉතිහාසයේ මෙතෙක් වාර්තා වූ ඉහළ ම ඡන්ද ප්‍රකාශය විය. මාස් සිය ආසන 225න් 137ක් දිනාගත් අතර ඉන්පසු අගෝස්තු මාසයේ දී සභාව ආරම්භ කරන ලදී. නොවැම්බරයේ දී සභාව විසින් නව ව්‍යවස්ථාවක් අනුමත කරන ලද අතර එය බොලිවියා ජනරජය බහුජාතික රාජ්‍යයක් බවට පරිවර්තනය කරමින් එය "බහුත්වවාදී වාර්ගික හා සමාජ එක්සත් රාජ්‍යයක්" (Plurinational Communal and Social Unified State) ලෙස ප්‍රකාශයට පත් කළේ ය. මේ තුළ ස්වභාවික සම්පත්වල ස්වෛරීභාවය, පල්ලිය හා රාජ්‍ය වෙන් කිරීම, ජනපති ධූරය දෙවරක් පමණක් දැරිය හැකි වීම හා සීමිත ස්වයංපාලනයක් සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ අවධානය යොමු කරනු ලැබුවේ ය. සෑම බොලිවියානු ජාතිකයෙකුට ම ජලය, ආහාර, නිදහස් සෞඛ්‍ය සේවා, අධ්‍යාපනය හා නිවාස සඳහා ඇති අයිතිය ද එමගින් තහවුරු කර ඇත. 2008 මැයි මාසයේ දී නැගෙනහිර දෙපාර්තමේන්තු වැඩි ස්වයංපාලනයක් ඉල්ලා සිටි නමුත් මොරාලෙස්ගේ රජය එය ප්‍රතික්ෂේප කළේ ය. ඔවුන් මොරාලෙස් නැවත කැඳවීම සඳහා ජනමත විචාරණයක් ඉල්ලා සිටි අතර එහිදී ප්‍රකාශිත ඡන්ද 83%ක ප්‍රතිශතයක් වාර්තා වූ අතර මොරාලෙස් විසින් 67.4%ක ඡන්ද ප්‍රතිශතයක් ලබා ගන්නා ලදී.

නැගෙනහිර පළාත්වල ස්වයංපාලන හිතවාදී දෙපාර්තමේන්තු රජයන්ට යූ.එස්.ඒ.අයි.ඩී. (USAID) හි සංක්‍රාන්ති ආරම්භක කාර්යාලයෙන් (Office of Transition Initiatives) ඩොලර් මිලියන 4.5ක් ලබා දී ඇති බව හෙළිදරව් වීමෙන් පසු, 2008 සැප්තැම්බරයේ දී මොරාලෙස් බොලිවියාවේ එක්සත් ජනපද තානාපති පිලිප් ගෝල්ඩ්බර්ග්ට (Philip Goldberg) ප්‍රජාතන්ත්‍රවාදයට එරෙහිව කුමන්ත්‍රණය කළ බවට හා සිවිල් ජනතාව අතර නො සන්සුන්තාවක් ඇති කළ බවට චෝදනා කළ අතර ම, රට හැර යන ලෙස ද නියෝග කළේ ය. එක්සත් ජනපද රජය ඊට ප්‍රතිචාර දැක්වූයේ එක්සත් ජනපදයේ බොලිවියානු තානාපති ගුස්ටාවෝ ගුස්මාන් (Gustavo Guzman) නෙරපා හැරීමෙනි. බොලිවියාව පසුව එක්සත් ජනපද මත්ද්‍රව්‍ය බලාත්මක කිරීමේ පරිපාලනය (Drug enforcement administration) රටින් නෙරපා දැමූ අතර එක්සත් ජනපදය ඊට ප්‍රතිචාර දැක්වූයේ සාම බලකාය ඉවත් කර ගනිමිනි. එක්සත් ජනපද තානාපති පැට්‍රික් ඩඩී (Patrick Duddy) තම රටෙන් ඉවත් කිරීමට නියෝග කිරීමෙන් හා එක්සත් ජනපදයේ වෙනිසියුලානු තානාපතිවරයා ඉවත් කර ගැනීමෙන් චාවේස් බොලිවියාවට සහය දැක්විය. දකුණු ඇමෙරිකානු ජාතීන්ගේ සංගමය බොලිවියානු තත්වය සාකච්ඡා කිරීමට විශේෂ රැස්වීමක් කැඳවා මොරාලෙස්ගේ රජයට පූර්ණ සහය ප්‍රකාශ කළේ ය. 2008 දී ස්වයංපාලන ප්‍රචණ්ඩත්වය මැඩපැවැත්වීමට නො හැකි වුව ද, මොරාලෙස්ගේ රජය හදිසි තත්වයන් ප්‍රකාශ කිරීම ප්‍රතික්ෂේප කළ අතර ස්වයංපාලනයක් මගින් ඔවුන් එසේ කිරීමට පොළඹවන බව ප්‍රකාශ කළේ ය. ඒ වෙනුවට ඔවුන් පාර්ලිමේන්තුව තුළ විපක්ෂය සමඟ කතා කරමින් සම්මුතියක් ඇති කර ගැනීමට තීරණය කළහ. එහි ප්‍රතිඵලයක් ලෙස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 411න් 100ක් ම වෙනස් කළ අතර දෙපාර්ශවය ම යම් යම් කාරණා සම්බන්ධව සම්මුතයික් ඇති කර ගත්හ. ව්‍යවස්ථාව 2009 ජනවාරියේ ද ජනමත විචාරණයකට ඉදිරිපත් කළ අතර 61.4%ක ඡන්ද දායකයන් විසින් එය අනුමත කරන ලදී.

**දෙවන ජනාධිපතිධූරය 2009-2014**

මොරාලෙස් සිය දෙවන ධූර කාලය තුළ බොලිවියාවේ අනාගතය සඳහා ඔහු අපේක්ෂා කළ දෘෂ්ටිවාදය ලෙස "සාමූහික සමාජවාදය" ගැන විවෘතව කතා කිරීමට පටන් ගත්තේ ය. ඔහු විසින් බොලිවියාව තුළ පළමු වරට 50%ක කාන්තාවන්ගෙන් සමන්විත වන කැබිනට් මණ්ඩලයක් නිර්මාණය කරන ලදී. නමුත් 2012 වන විට එය

1/3ක් දක්වා පහත වැටිණි. මොහුගේ රජයට කිරීමට සිදු වූ ප්‍රධාන කාර්යය වූයේ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇති අයිතිවාසිකම් සඳහා නීති සම්පාදනය කිරීම යි. 2013 දී කාන්තාවන්ට සිදුවන ගෘහස්ථ හිංසනය මැඩ පැවැත්වීම සඳහා රජය විසින් නීතියක් සම්මත කළේ ය. 2009 දී මොරාලෙස් ඩෙන්මාර්කයේ කොපන්හේගන්හි (Copenhagen) පැවති එක්සත් ජාතීන්ගේ දේශගුණික විපර්යාස සමුළුවකට සහභාගි වූ අතර එහිදී ධනවාදය මත දේශගුණික විපර්යාසයන් ඇති වූ බවට දොස් පැවරූ අතර දේශගුණික විපර්යාස අවම කර ගැනීම සඳහා පාරිසරික හායනයන් මත ගනුදෙනු බද්දක් ඉල්ලා සිටියේ ය. අවසානයේ සමුළුව අසාර්ථක යැයි සිතූ ඔහු 2010 අප්‍රේල් මාසයේ දී කොචබම්බා නගරයෙන් පිටත දේශගුණික විපර්යාස සහ පෘථිවි මවගේ අයිතිවාසිකම් පිළිබඳ ලෝක ජනතා සමුළුව (The World's People Conference on Climate Change and the Rights of Mother Earth) සිය මූලිකත්වයෙන් අධීක්ෂණය කළේ ය. නේටෝ හමුදාව (NATO) විසින් 2011 දී ලිබියාවේ මිලිටරි මැදිහත් වීමට එක්සත් ජනපදය සහාය දුන් පසු මොරාලෙස් විසින් ඔබාමාව හෙළාදුටු අතර ඔහුගේ නොබෙල් සාම ත්‍යාගය අහෝසි කරන ලෙස ඉල්ලා සිටියේ ය. 2012 ඔක්තෝම්බර් හි දී ඇමෙරිකානු රජය විසින් ජාන වෙනස් කරන ලද ජීවීන් (Genetically Modified Organisms) තහනම් කරන පෘථිවි මාතාවගෙන් (The Law of Mother Earth) නීතියක් සම්මත කරන ලදී. මෙය පරිසරවේදීන්ගේ පැසසුමට ලක් වූ අතර දේශීය සෝයා වගාකරුවන් විසින් විවේචනයට ලක් කරන ලදී. ඔවුන් කියා සිටියේ ගෝලීය වෙළඳපොළ තුළ අඩු තරඟකාරීත්වයක් ඇති කරනු ලබන බවයි.

### තෙවන ජනාධිපතිධූරය 2014-2019

2007 ජනමත විචාරණයේ දී මොරාලෙස් ප්‍රකාශ කළේ 2014 මහ මැතිවරණය සඳහා නැවත ඉදිරිපත් නො වන බවයි. 2009 බොලිවියානු ව්‍යවස්ථාව තුළ ජනාධිපතිධූරය ධූර කාල සීමා දෙකකට නියම කර ඇත. කෙසේ වෙතත් බහුජාතික ව්‍යවස්ථා අධිකරණය (Plurinational Constitutional Court) විසින් 2013දී දුන් තීන්දුවකට අනුව මොරාලෙස්ගේ පළමු වාරය ධූර කාල සීමාවක් සඳහා ගණන් නො ගන්නේ එය 2009 ව්‍යවස්ථාව අනුමත කිරීමට පෙර සිදු වූ නිසා ය. විපක්ෂ දේශපාලනඥයන් විසින් විවේචනය කරන ලද අධිකරණ තීන්දුව නිසා මොරාලෙස්ට තෙවන වරටත් ජනාධිපතිධූරයට තරඟ කිරීමට අවස්ථාවක් ලබා දුනි. නැවත මැතිවරණයක් සඳහා

පෙනී සිට ජයග්‍රහණය ප්‍රකාශ කිරීමෙන් පසු මොරාලෙස් විසින් එය "යටත්විජිත විරෝධී හා අධිරාජ්‍ය විරෝධී" ජයග්‍රහණයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලදී. කෙසේ වෙතත් 2014 වන විට බොලිවියාව නූගත්කමෙන් තොර බව යුනෙස්කෝව (UNESCO) ප්‍රකාශ කළේ ය. ලෝක බැංකුව ප්‍රකාශ කළේ 50% නූගත්කම අඩු වී ඇති බවයි. එලෙස ම 2016 දි එල් .ජී. බී. ටී. (LGBT) අයිතිවාසිකම් සඳහා නෛතික පිළිගැනීමක් සහ ජුනි 28 වන දින රටේ "සුළුතර ලිංගික අයිතිවාසිකම් දිනය" ලෙස ප්‍රකාශ කළේ ය. මීට අමතරව, සමලිංගික තේමාවක් සහිත රූපවාහිනී වැඩසටහන් රාජ්‍ය නාලිකාවේ ස්ථාපිත කිරීමට ද දිරිගැන්විය. 2015 ඔක්තෝබර් මස 17 වන දින මොරාලෙස්, ඇන්ඩ්‍රසේඩ් සැන්ටා කෘස්ගේ (Andres De Santa Cruz) වසර 9, මාස 8 සහ දින 24ක වාර්තාමය ධූර කාලය ඉක්මවා ගොස් දීර්ඝ කාලයක් සේවය කළ ජනාධිපති බවට පත්විය. කෙසේ වෙතත් ඔහු සිව්වන වරටත් ජනාධිපති වීමට ව්‍යවස්ථාව තුළ හා නීතිමය වශයෙන් යම් යම් සංශෝධන කටයුතු සිදු වුවද අවසානයේ දි මොරාලෙස් 2019 නොවැම්බර් 10 දින ජනාධිපති ධූරයෙන් ඉල්ලා අස්විය.

## විදේශ ප්‍රතිපත්තිය

ඊවෝ මොරාලෙස් ජනාධිපති ධූරයට පත්වීම සිදු වූයේ නව ලිබරල්වාදී ව්‍යාපෘතිය ප්‍රතික්ෂේප කිරීම හා සම්බන්ධ කලාපීය සන්දර්භයක් තුළ වන අතර එය බොලිවියානු විදේශ ප්‍රතිපත්තිය ප්‍රතිසංස්කරණය කිරීම  සඳහා දායක විය. මෙම සන්දර්භය තුළ නව බොලිවියානු විදේශ න්‍යාය පත්‍රය  එක්සත් ජනපදය සමඟ යහපත් සබඳතාවයකින් ඉවත් වෙමින් ප්‍රතිදිශානතියක් කරා ගමන් කළේ ය. විදේශ ප්‍රතිපත්තිය මෙලෙස නව දිශාවකට කේන්ද්‍රස්ථාන වූයේ දකුණු - දකුණු සහයෝගීතාව සහ කලාපීය ඒකාබද්ධ කිරීමේ ව්‍යාපෘති ශක්තිමත් කිරීම සඳහා ය. එය වෙනිසියුලාවටත් වඩා අනෙකුත් වාමාංශික ලතින් ඇමරිකානු රජයන් සමඟ වැඩි ශක්තිමත් සබඳතාවයක් සලකුණු කරනු ලැබීය. එපමණක් ම නොව, අප්‍රිකාවේ සහ ආසියාවේ සිටින සිය සාම්ප්‍රදායික නො වන හවුල්කරුවන් අතර සිය රාජතාන්ත්‍රික සබඳතා විවිධාංගීකරණය කර ගැනීමට මොරාලෙස්ගේ රජය බලාපොරොත්තු විය. මොරාලෙස් රජය එලෙස රාජ්‍ය තාන්ත්‍රික සබඳතාවල ධාරිතාවය පුළුල් කිරීම සිදු කළේ අභ්‍යන්තර සංවර්ධන ව්‍යාපෘති හා සම්බන්ධව

සාම්ප්‍රදායික හවුල්කරුවන් මත යැපීම අඩු කිරීම සඳහා ය. මොරාලෙස් එරට පළමු ස්වදේශික ජනාධිපතිවරයා බවට පත්වෙමින් එරට සම්ප්‍රදායන්ට සහ දේශීය සංස්කෘතියට සිදුකරන ලද ආයතනික ප්‍රතිසංස්කරණයන් ස්ථාපිත කිරීම රටේ ස්වෛරීභාවයට වැඩි වටිනාකමක් ලබා දෙන බවට ජනතාවට පිළිබිඹු විය. එයින් බොලිවියානු ආදිවාසීන්ගේ ආරක්ෂාව තහවුරු වූවා පමණක් නොව පෙර නො වූ විරූ ලෙස බොලිවියානු මෘදු බලය (Soft Power) ජාත්‍යන්තරය තුළ කැපී පෙනෙන්නට විය.

**කලාපීය ඒකාබද්ධ ව්‍යාපෘති සහ සබඳතා**

වෙනිසියුලාව සහ කියුබාව සමඟ සුවිශේෂී වූ සමීප සබඳතා පවත්වා ගැනීමට බොලිවියාව උත්සහ කළේ ය. කැරිබියන් දූපත (Caribbean Island) සම්බන්ධයෙන් ගත් කල, එහි වැදගත්කම වන්නේ එහි මතවාද සහ සංකේතාත්මක අංශයන් කියුබානු විප්ලවය හා සම්බන්ධ වීමයි. විශේෂයෙන් කියුබාවේ ගරිල්ලා නායක අර්නස්ටෝ චේ ගුවේරාගේ (Ernesto Che Guevara) මරණින් පසු මෙන් ම අධ්‍යාපනය හා සෞඛ්‍ය සඳහා වූ කියුබානු සාම්ප්‍රදායික සහයෝගීතාවය තුළින් කියුබාව බොලිවියාව සමඟ සම්බන්ධ විය. වෙනිසියුලාව සම්බන්ධයෙන් ගත් කල, චාවේස් රජය සමඟ තිබූ දේශපාලන බැඳීම මෙන් ම බොලිවියාවට ලබාදුන් තාක්ෂණික හා මූල්‍යමය සහයෝගය තීරණාත්මක විය. එය වශයෙන් ම මොරාලෙස්ගේ පරිපාලනයේ පළමු වසර දෙක තුළ වෙනිසියුලාව විසින් ව්‍යාපෘති මාලාවකට සහ කුඩා ඉදිකිරීම් වැඩ කටයුතු කීපයක් සඳහා අරමුදල් සැපයීම බොලිවියාවේ සංවර්ධනයට ඉතා වැදගත් වීම නිසාය. මෙම පෙළගැස්ම 2006 දී "අපේ ඇමරිකාවේ ජනතාව සඳහා බොලිවේරියානු සන්ධානය" (The Bolivarian Alliance for the Peoples of our America - ALBA) බවට පරිවර්තනය විය.

නව ලිබරල් යාන්ත්‍රණයක් ලෙස සැලකෙන පැසිෆික් සංවිධානය හැර ALBA සහ අනෙකුත් සියලු ම කලාපීය යාන්ත්‍රණයන් සමඟ බොලිවියාවේ සහභාගීත්වය දැඩි හා ගැඹුරු කිරීමට මොරාලෙස් පාලන සමයේ ක්‍රියාත්මක වූ විදේශ ප්‍රතිපත්තිය තුළින් උත්සාහ ගන්නා ලදි. 2006 දී ඇන්ඩියන් ප්‍රජාවෙන් (CAN) වෙනිසියුලාව ඉවත් වුවත් බොලිවියාව එහි රැඳී සිටිමින් විදේශ ප්‍රතිපත්තියෙහි වැදගත්කම ආරක්ෂා කළේ ය. පසුව එම සංවිධානය 2008 දී දකුණු ඇමෙරිකානු සංගමයට (UNASUR) සහ 2012

දී ලතින් ඇමෙරිකානු සහ කැරිබියන් රටවල් සමූහයට (CELAC) සම්බන්ධ විය. එපමණක් නොව, 2012 දී බොලිවියාව සිය සහයක තත්වයේ සිට පූර්ණ සාමාජිකයකු ලෙස වෙනස් කරන මෙන් ඉල්ලා සිටි අතර 2015 දී අනෙකුත් රටවල් විසින් එය පිළිගනු ලැබීය. බොලිවියාව විසින් මෙම තීරණය ගනු ලැබුවේ විශාලතම සහ පැරණිතම දකුණු ඇමෙරිකානු ඒකාබද්ධ සංවිධාන දෙක අතර කේන්ද්‍රස්ථානයක් ලෙස ස්ථානගත කිරීම සහ සෘජු ආර්ථික අවශ්‍යතා සඳහා වූ දේශපාලන අභිලාෂ ඉෂ්ට කර ගැනීම සඳහා බොලිවියාව විසින් මෙම තීරණය ගනු ලැබීය. ඒ ආකාරයට බොලිවියාව සිය සාම්ප්‍රදායික රාජ්‍යතාන්ත්‍රික න්‍යාය පත්‍රය නැවත යාවත්කාලීන කිරීමට උත්සාහ කිරීම සහ මහද්වීපය තුළ 'සම්බන්ධතා ඇති රටක්' ලෙස ස්ථානගත වීමට විශේෂ අවධානයක් යොමු කරනු ලැබීය. කෙසේ වෙතත්, අසල්වාසී රටවල් සමඟ ඒකාබද්ධ වී කටයුතු කිරීම නිසා බොලිවියාව ආතතීන්ගෙන් නිදහස් නො කළේ ය. 2006 දී ආරම්භ වූ ගෑස් කර්මාන්තය තුළින් රාජ්‍යය ප්‍රකෘතිමත් වීම බොලිවියාව බ්‍රසීලය සමඟ ගැටුම් මාවතකට යොමු කළේ ය. නමුත් ජනාධිපති මොරාලෙස් සහ ජනාධිපති ලූලා අතර තිබූ මතවාදීමය සහ පෞද්ගලික හිතවත්කම් මෙම ආතතීන් යම් තාක් දුරකට අවම කරගැනීමට උපකාරී විය.

අනෙක් අතට, ඓතිහාසික ප්‍රතිවාදියා වූ චිලී රාජ්‍යය සමඟ සම්බන්ධය ගත්කල දහනව වන සියවසේ දී වෙරළ තීරය අහිමි වූ දා සිට දෙරට අතර පූර්ණ රාජ්‍ය තාන්ත්‍රික සබඳතා බිඳ වැටුණි. නමුත් මොරාලෙස් බොලිවියාවේ පාලනයට පැමිණීමෙන් පසු දෙරට අතර ද්විපාර්ශවික සබඳතා පුදුම සහගත ලෙස ධනාත්මක ආකාරයකින් වර්ධනය විය. ධූරයෙන් නික්ම යන චිලී ජනාධිපති රිකාඩෝ ලාගෝස්ගේ (Ricardo Lagos) ආරාධනයෙන් මොරාලෙස් 2006දී මිෂෙල් බැචලේගේ (Michelle Bachelet) පළමු වාරය සඳහා වූ සමාරම්භක උත්සවයට සහභාගී වූ අතර එම වසරේදී ම දෙරට අතර ද්විපාර්ශවීය අරමුණු මාලාවක් ප්‍රකාශයට පත් කරන ලදි. එය කරුණු 13 න්‍යාය පත්‍රය (The 13 Points Agenda) ලෙස හඳුන්වන ලදී. එයට භෞතික හා මායිම් ඒකාබද්ධ කිරීම, රාජ්‍ය ප්‍රතිපත්ති සහයෝගීතාව සහ බොලිවියාව විසින් පැසිෆික් කලාපය වෙත ප්‍රවේශය නැවත ලබා ගැනීම වැනි විවාදාත්මක ගැටලු සහ සිලාලාහී (Silala) ජලජ සම්පත් වල ස්වභාවය සහ එහි සූරාකෑම පිළිබඳ සාකච්ඡා කිරීම එහි අන්තර්ගත විය. සිය ඓතිහාසික ප්‍රතිවාදියා වූ චිලී රාජ්‍යය සමඟ ආතතීන් ක්ෂණිකව ආරම්භ වනු ඇතැයි විශ්ලේෂකයින් විසින් අපේක්ෂා කළ නමුත් චිලී සහ බොලිවියාව අතර දේශපාලන වාතාවරණය බෙහෙවින් ධනාත්මක ව පැවති

බැවින් සිලාලා ගේ ගැටලුව විසඳීම සඳහා ගිවිසුම් අත්සන් කිරීමට පවා දෙරට අතර එකඟත්වය ඇති විය. පසුව චිලී රජයේ සංක්‍රාන්තිය සහ 2010 දී මධ්‍යස්ථ මතධාරී සෙබෙස්තියන් පින්යේරාගේ (Sebastián Piñera) පැමිණීමත් සමඟ තවදුරටත් ද්විපාර්ශවික සබඳතා වර්ධනය විය. කෙසේ නමුත් 2014 දී චිලී ජනාධිපති ධුරයට බැචලේ නැවත තේරී පත්වීමත් සමඟ දෙරට අතර ද්විපාර්ශවික සබඳතා ගැටුම්කාරී මාවතකට යොමු විය. ඒ අතර කාලයේ දී ම, බොලිවියාව පේරු සමඟ ඉලෝ වරාය (Ilo Port) භාවිත කිරීමෙන් දෙරට යා කරන යටිතල පහසුකම් පුළුල් කිරීම සඳහා ඇති රාජ්‍ය තාන්ත්‍රික ගිවිසුම් සක්‍රීය කිරීමට කටයුතු කරන ලදී. එලෙස ම චිලී වරාය මත යැපීම අවම කිරීම සඳහා බොලිවියාව විසින් උරුගුවේ අත්ලාන්තික් වරායවල් භාවිතයට ගනු ලැබීය.

කෙසේ නමුත් බොලිවියාවට ස්වෛරී මුහුදු ප්‍රවේශය ලබා ගැනීම අරමුණු කර ගනිමින් විසිවන සියවසේ දී චිලී රාජ්‍යය විසින් ම සාකච්ඡා මාලාවක් දියත් කළ බව බොලිවියාව ප්‍රකාශ කළ අතර මෙම ඒකපාර්ශවීය වරප්‍රසාද ජාත්‍යන්තර අධිකරණයේ (ICJ) වගකීමක් බවට තර්ක කළේ ය. චිලී රාජ්‍යය මෙම ප්‍රශ්නය විසඳීමට උසාවියේ ඇති හැකියාව විමසීමට උත්සහ කළ අතර 2015 දී ජාත්‍යන්තර අධිකරණය මෙය ප්‍රතික්ෂේප කළ විට එය බොලිවියානු පාර්ශවයට හිතකර වු අතර චිලී හි ව්‍යාකූලත්වය ඉහළ යාමක් පෙන්නුම් කළේ ය. කෙසේ වෙතත් අවසන් තීරණය බොලිවියානු රාජ්‍ය තාන්ත්‍රිකභාවය කලකිරීමට පත් කළ නමුත් ආරවුල විසඳීම සඳහා දෙරට ම සංවාදයක් පැවැත්විය යුතු බවට අදහස් පළ කෙරුණි. සමුද්‍රීය ප්‍රශ්නයෙන් පලුදු වු ද්විපාර්ශවික සබඳතා වල ප්‍රතිඵලයක් වූයේ 2016 දී චිලී රාජ්‍ය විසින් සිලාලා ගඟේ ජලය සම්බන්ධයෙන් බොලිවියාවට එරෙහි නඩුවක් ගොනු කිරීම හා චිලී රාජ්‍ය විසින් ගඟේ ජලය සම්බන්ධයෙන් ජාත්‍යන්තර අයිතිය පිළිගන්නා ලෙස ඉල්ලා සිටියේ ය. චිලී රාජ්‍යයේ මෙම ඉල්ලීම පිළිබඳව බොලිවියානු රාජ්‍ය තාන්ත්‍රිකත්වයේ නිල අදහස වූයේ එය පිළිගැනීමට සහ ගැටුමේ නිශ්චිතව විසඳීම සඳහා අවස්ථාවක් ලෙස ය.

## බාහිර කලාපීය සබඳතා



*2018 ජූනි මාසයේදී බීජිං හි දී බොලිවියානු ජනාධිපති ඒවෝ මොරාලෙස් සහ චීන ජනාධිපති ෂී ජින්පින් ද්විපාර්ශ්වික සහයෝගිතා ගිවිසුමකට අත්සන් තැබීමේදී*

බොලිවියානු කලාපීය නො වන බාහිර සබඳතාහී දිශානති වූයේ හවුල්කාරිත්වය විවිධාංගීකරණය කිරීම සහ ඒ සමඟ ම දෘෂ්ටිවාදාත්මක හා ප්‍රායෝගික අරමුණු සාක්ෂාත් කර ගැනීම යි. එක් අතකින් කලාපීය දේශපාලන අන්‍යෝන්‍ය රැදියාව අඩු කිරීම සහ වොෂින්ටනයේ නියෝග සමඟ රට නිරායාසයෙන් ම අවනත වීමේ පීඩනයට එරෙහිව එයට මුහුණ දීම සඳහා සම්බන්ධතා ජාලයක් තහවුරු කර ගැනීමත්, ඒ තුළින් ස්වෛරීභාවය සහතික කරගැනීම කර ගැනීම අරමුණු කරගෙන තිබුණි. අනෙක් අතට විදේශීය වෙළඳපොළ කිහිපයක් මත පමණක් එහි ආර්ථික රැදියාව අඩු කිරීම සහ එමගින් එහි ස්වාධීනත්වය හා සංවර්ධන අවස්ථා වැඩි කිරීම අපේක්ෂා කෙරුණි. බොලිවියාව මොරාලෙස් පාලන සමයේ ඉරානය සහ ලිබියාව වැනි සමහර මැදපෙරදිග රටවල් සමඟ සමීප වුණි. එමෙන්ම රුසියාව සහ බෙලරුසියාව සමඟ විවිධ අංශවල සහයෝගිතා ගිවිසුම් ඇති කර ගැනීමට කටයුතු කරන ලදී. තවද ඉන්දියාව සමඟ වානේ නිෂ්පාදනයේ හවුල්කාරීත්වයක් ලබා ගැනීමට උත්සාහ කළ අතර සෙසු ලතින් ඇමෙරිකානු රටවල මෙන් චීන නියෝජනය ද බොලිවියාව තුළ වැඩි වෙමින් පැවතුණි. එපමණක් නොව ඉහත සඳහන් කළ පරිදි බ්‍රසීලය සමඟ පැවති ද්විපාර්ශවික සංවර්ධන ව්‍යාපෘති අඩපණ වූ හෙයින් ප්ලාස්ටික්, පොහොර සහ රසායනික අමුද්‍රව්‍ය නිෂ්පාදනය කරන ඛනිජ රසායනික කර්මාන්තයක් බොලිවියාව තුළ ස්ථාපිත කිරීම සඳහා දකුණු කොරියාව සමඟ කාර්මික ව්‍යාපෘතිවල

හවුල්කාරිත්වයක් ඇති කර ගත්තේ ය. එසේම පතල් කැණීම් අංශය සඳහා ද ජපන්, චීන සහ කොරියානු යන ආසියානු සහයෝගීතාවය තුළින් සිය ව්‍යාපෘති සඳහා අරමුදල් සපයා ගන්නා ලදී. එහිදී ලිතියම් (Lithium) සඳහා වන කාර්මීකරණ ව්‍යාපෘති කැපී පෙනුණි. ඊට අමතරව බොලිවියාව විසින් ජර්මන් සහ ප්‍රංශ සහයෝගය මෙන් ම අරමුදල් ද ලබා ගන්නා ලදී.

මොරාලෙස්ගේ විදේශ ප්‍රතිපත්තියේ තවත් කැපී පෙනෙන ලක්ෂණයක් වූයේ ස්වදේශීක ජනයාගේ හා පාරිසරික ප්‍රශ්න ජාත්‍යන්තර මට්ටමින් සාකච්ඡා කිරීමට උත්සහ කිරීමයි. විද්වතුන් පෙන්වා දෙනු ලැබුවේ බොලිවියාවේ මෙම ක්‍රියාවන් සම්බන්ධ වන්නේ විදේශ ප්‍රතිපත්තියේ අරමුණු වල විෂය පථයට අමතරව ජාත්‍යන්තරය තුළ නව ජාතික අනන්‍යතාවයක් ගොඩ නැගීමේ උත්සාහයක් ද ලෙසයි. බොලිවියාවේ 'ප්‍රථම ආදිවාසී ජනාධිපතිවරයා' යන චරිතය කේන්ද්‍ර කර ගනිමින් ස්වදේශීක ජනයාගේ ප්‍රශ්නය සහ 'පචාමාමා' (Pachamama) ආරක්ෂා කිරීමේදී පාරිසරිකවාදය සමඟ එහි ඇති සම්බන්ධය ජාත්‍යන්තර වාතාවරණය තුළ රට සහ එහි රජය ප්‍රක්ෂේපණය කිරීමේ තීරණාත්මක ලක්ෂ්‍යයක් මොරාලෙස් රජය යටතේ ඉදිරිපත් කෙරුණි. මෙම උපායමාර්ගය එහි සැබෑ ජාත්‍යන්තර භූ දේශපාලනික හෝ ආර්ථික වැදගත්කමට වඩා බොහෝ දුරට බොලිවියාවේ ජාත්‍යන්තර කැපී පෙනීම වැඩි වීමට හේතු විය. මේ ආකාරයට බොලිවියානු විදේශ ප්‍රතිපත්තියේ 'මෘදු බලය' ක්‍රියාකාරී අයුරින් භාවිත කරමින් වඩාත් බලවත් රාජ්‍ය තුළ බහුපාර්ශවික ආයතන පිහිටුවීමට හා ඒකාබද්ධතා ගිවිසුම් තුළින් සම්බන්ධතා ගොඩනගා ගැනීමට මොරාලෙස් ප්‍රමුඛ රජයට හැකි විය.

**එක්සත් ජනපදය සමඟ සබඳතා**

1988 දී එක්සත් ජනපදය විසින් පැන වූ කොකා නීතියට එරෙහිව යමින් බොලිවියාව විසින් අනුගමනය කළ කොකා වගාව ආරක්ෂා කිරීමේ ප්‍රතිපත්තිය දෙරට අතර ආතතීන් උත්සන්න කළේ ය. 2008 දී මොරාලෙස් සහ 'මීඩියා ලූනා' (Media Luna) ආණ්ඩුකාරවරුන් අතර දැඩි ආතතියක් ඇති වූ අවස්ථාවන් සඳහන් කිරීම වැදගත් වේ. විපක්ෂය සමඟ කුමන්ත්‍රණය කිරීමේ චෝදනාව යටතේ එවකට එක්සත් ජනපද තානාපති පිලිප් ගෝල්ඩ්බර්ග් බොලිවියාවෙන් නෙරපා හරින ලදි. මෙම අර්බුදය හේතුවෙන් ජෝර්ජ් ඩබ්ලිව්.බුෂ් (George W. Bush) විසින් ඇන්ඩියන් වෙළඳ ආරක්ෂාව සහ මත්ද්‍රව්‍ය තුරන් කිරීමේ පනතේ (ATPDEA) වාණිජමය ප්‍රතිලාභ

බොලිවියාවට ලැබීම අවලංගු කරන ලදී. නමුත් බොලිවියාව කොකා වගාවේ අවශ්‍යතා වලට අනුකූලව කටයුතු කළ අතර ඒවායේ ප්‍රතිලාභ ද පවත්වාගෙන යන ලදී. ඒ ආකාරයට බොලිවියාව මත්ද්‍රව්‍ය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතියෙන් කොකා කොළ තහනම ඉවත් කිරීමට උත්සාහ කළ අතර 2013 දී රාජ්‍ය තුළ අභ්‍යන්තර භාවිතයන්වල නීත්‍යානුකූලභාවය පිළිගැනීම හැර, එම සම්මුතිය අතහැර දැමීමට නො හැකි වූ හෙයින් බොලිවියාව පියවරක් පසුපසට තැබීය. බැරැක් ඔබාමා එක්සත් ජනපදයෙහි දිවුරුම් දීම ද්විපාර්ශවික සබඳතා වලට කිසිඳු වෙනසක් සිදු නො කළ අතර බොලිවියාව ATPDEA වෙතින් ඉවත් කිරීම තවදුරටත් පවත්වාගෙන යන ලදී. එලෙස ම තානාපතිවරුන් ආදේශ කිරීමට ද නො හැකි විය. 2011 දී රාජ්‍ය තාන්ත්‍රික සබඳතා සාමාන්‍යකරණය කිරීම සඳහා වූ ගිවිසුමකට පවා අත්සන් තැබූ නමුත් තානාපතිවරුන් පත් කිරීම වෙනුවෙන් දෝලනයක් දෙරට අතර ඇති විය. ගිවිසුම අත්සන් කිරීමෙන් වසර දෙකකට පසුව එනම් 2013 දී මොරාලෙස් විසින් එක්සත් ජනපද ජාත්‍යන්තර සංවර්ධනය (USAID) පිළිබඳ ආයතනය එරටින් නෙරපා හරිනු ලැබුවේ එය ව්‍යාපෘතිවලදී දේශපාලන අරමුණු ඇතිව කටයුතු කළ බවට චෝදනා එල්ල කරමිනි. එම වසරේ ම ජූලි මාසයේ දී රුසියාවේ පැවති ගෑස් අපනයනය කරන රටවල රැස්වීමකින් පසුව ජනාධිපති මොරාලෙස් නැවත මව්බිම කරා පැමිණෙන විට ඔහුගේ යානය වියානා (Vienna) හිදි හදිසි ගොඩබෑමක් සිදුකළේ ය. එලෙස එම ගුවන් යානයේ හදිසි ගොඩබෑමක් සිදුවූයේ ප්‍රංශය හා පෘතුගාලය විසින් ගුවන් අවකාශයට ඇතුළුවීම තහනම් කළ අවස්ථාවක නිසාවෙන් බොලිවියාව සහ එක්සත් ජනපදය අතර ආතතීන් නැවතත් උත්සන්න විය. රුසියාවෙන් පිටුවහල් කරනු ලැබූ ඇමෙරිකානු බුද්ධි ඒජන්තවරයා එඩ්වඩ් ස්නෝඩන් තම යානයේ සිටි බවට ඇති සැකය හේතුවෙන් යුරෝපා රාජ්‍යයන් එක්සත් ජනපද නියෝගවලට අනුව කටයුතු කළ බවට මොරාලෙස් චෝදනා කළේ ය. කෙසේ නමුත් 2008 දී බොලිවියාව සඳහා ATPDEA ප්‍රතිසංස්කරණය නො කළත් ජාත්‍යන්තර වෙළඳාම සම්බන්ධයෙන් ගත් විට එක්සත් ජනපදය වැදගත් අපනයන ගමනාන්තයක් ලෙස පැවතිණි. ගිවිසුම අවසන් වීමෙන් පසු කාලසීමාව තුළ දී පවා එහි අපනයන වල වටිනාකම ඉහළ මට්ටමකට පැමිණියේ ය. අපනයන ගමනාන්තයක් ලෙස චීනය ද එක්සත් ජනපදය හා සමාන මට්ටමකට පැමිණ තිබූ අතර 2018 වන තෙක් එය මන්දගාමී වුවත් ස්ථාවර වර්ධනයක් පෙන්නුම් කළේ ය. කෙසේ වෙතත් 2011 දී ආනයන ප්‍රභවයක් ලෙස එක්සත් ජනපදය අභිබවා ආසියානු

රට වල වැදගත්කම වඩාත් කැපී පෙනුණු අතර එතැන් සිට සැලකිය යුතු අඛණ්ඩ වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

## ගත හැකි ආදර්ශ

ලතින් ඇමෙරිකානු රටක් වන බොලිවියාවේ බිහි වූ අග්‍රගණ්‍ය දේශපාලන පෞරුෂයක් වශයෙන් ඊවෝ මොරාලෙස් හැඳින්විය හැකිය. මොරාලෙස් කුඩා අවධියේ පටන් ම පාපන්දු ක්‍රීඩාවේ යෙදී ඇත. එසේ ම ඔහු එහි නායකයා ද විය. එයින් ඔහු කුඩා කල පටන් ම ක්‍රියාශීලි පුද්ගලයෙකු විය. නායකයෙකු වශයෙන් පසුකාලීනව ඉස්මතු වීමට ඔහු ලද එම නායකත්ව ලක්ෂණ පිටුවහලක් වූ බව නිසැක ය. මුල්කාලීනව මොරාලෙස් විසින් විවිධ රැකියාවන් හි නිරත වන ලදී. ඔහු එමගින් ලද සමාජ පන්නරය ද නායකයෙකු වශයෙන් අත්දැකීම් සපුරාලීමට ඉවහල් විය. මොරාලෙස් ඉතා දක්ෂ කළමනාකරුවෙකු මෙන් ම අතිදක්ෂ සංවිධායකයෙකු ද විය. වෘත්තීය සමිතිවල ක්‍රියාකාරී සාමාජිකයෙකු වශයෙන් කටයුතු කළ ඔහු එම වෘත්තිය සමිති අතිදක්ෂ ලෙස මෙහෙයවී ය. අධ්‍යාපනය ම පමණක් නොව විෂය පරිබාහිර දැනුම ලබාගැනීමට ද මොරාලෙස් නො පසුබට විය. වෘත්තීය සමිති සාමාජිකයන් විසින් ඔහුව "තරුණ ක්‍රීඩකයා" යන අන්වර්ථ නාමයෙන් හඳුන්වනු ලැබීම තුළින් ඔහු සතුව පැවති තරුණ ජවය මනාව පිළිබිඹු වේ.

රැඩිකල්වාදී අදහස් දරාගත් මොරාලෙස් නිරතුරුව ම සිය ස්වදේශීය ජනතාව වෙනුවෙන් පෙනී සිටියේ ය. එතෙක් බොලිවියාව තුළ බිහි වූ ආදිවාසී ජන කණ්ඩායම නියෝජනය කළ ප්‍රථම ජනාධිපතිවරයා බවට පත්වීමට ඊවෝ මොරාලෙස්ට හැකි විය. ඔහු එලෙස පැමිණි ගමන් මග මල් ඇතිරිලි මතින් ආ ගමනක් නො වන අතර ඉතා දුෂ්කර කටුක අත්දැකීම්වලට මුහුණ දීම තුළින් ලද පන්නරය, අධිෂ්ඨානය, කැපවීම හා නො පසුබස්නා උත්සාහය යන ගුණාංගයන් නිසා ම ජනාධිපති ධූරය දක්වා ගිය පුද්ගලයෙකි. 2006 දී මොරාලෙස් ජනාධිපති ධූරය ලබා ගන්නා විට බොලිවියාව දකුණු ඇමරිකාවේ දුප්පත් ම රට ලෙස පැවතුණි. ඔහු ස්වදේශීය ජනතාව දුප්පත්කමෙන් මුදවා ගනු වස් ආර්ථිකමය හා දේශපාලනික ප්‍රතිසංස්කරණ ඉදිරිපත් කළේ ය. එතුළින් කෘෂි ආර්ථිකය, ගෑස් හා තෙල් යන සම්පත්වලින් යැපුණු ආර්ථිකය පෙර නො වූ විරූ ලෙස දියුණු කිරීමට මොරාලෙස් සමත් විය. මොරාලෙස්ගේ සුප්‍රකට කියමනක ඔහු මෙසේ සඳහන් කළේ ය. "නව

රජය පදනම් විය යුත්තේ විවිධත්වය, ගෞරවය සහ සැමට සමාන අයිතිවාසිකම් මත ය". මෙයින් ඔහු ස්වදේශීය ජනතාවට දැක් වූ ඇල්ම, පැවති ගෞරවය සහ මෘදුභාවය මැනැවින් ප්‍රකට කරයි. තවද මොරාලෙස් පරිපාලනය අවම එක්සත් ජනපද හිතකාමී ආණ්ඩුව විය. මොරාලෙස් ඇෆ්ගනිස්ථානය හා ඉරාකය අතර පැවති යුද්ධය පිළිබඳ චෝදනාව ඇමෙරිකානු ජනාධිපති ජෝර්ජ්.ඩබ්ලිව්.බුෂ්ට එල්ල කළ අතර ඔහුව ත්‍රස්තවාදියෙකු වශයෙන් හෙළා දැක ඇත. මෙය ඔහු තුළ නායකයෙකු වශයෙන් පැවැති ඍජුභාවය මැනවින් ප්‍රකට කරයි. ස්වදේශීය ජනතාව දහස් ගණනින් දිළිඳු බවෙන් මුදවාලීමට මොරාලෙස් සමත් විය. ඔහු තුළ පැවති මානව හිතවාදී හැඟීම් ඒ තුළින් මනාව ඔප් නැංවින. අසහාය පෞරුෂයකින් හෙබි මෙම මානව හිතවාදියා බොලිවියානු දේශපාලන ඉතිහාසය තුළ නො මැකෙන සලකුණක් වූ බව නො අනුමාන ය.

## <u>සාරාංශය</u>

යටත්විජිතවාදයට හසුව තිබූ දිළිඳු රටක් වූ බොලිවියාව නව මාවතකට යොමු කිරීමට මොරාලෙස්ගේ ආගමනය හේතු විය. කුඩා කල පටන් ම මොරාලෙස් සතුව පැවති නායකත්ව ගුණාංග ඔහුව ජනාධිපති ධූරය දක්වා ම රැගෙන ගියේ ය. විවිධ ආර්ථික අපහසුතා මධ්‍යයේ හැදී වැඩුණු ඔහු මුල් කාලයේ විවිධ වෘත්තීන්වල නියැලෙමින් නොයෙක් ජීවන අත්දැකීම් රාශියක් ලබා ගත්තේ ය. එවන් දුෂ්කර ජීවන කඩයිම් පසුකරමින් බාධා බිඳහෙළමින් රටක පුරවැසියෙකු ලබන ඉහළ ම පදවිය වන ජනාධිපති පදවියෙන් පිදුම් ලැබීමට මොරාලෙස් සමත් විය. අසාධාරණය වෙනුවෙන් කොන්දේසි විරහිතව පෙනී සිටි එතුමා කොකා වගාකරුවන් වෙත පෙර පැවති රජය විසින් පනවන ලද සීමාවන් ලිහිල් කර එම වගාකරුවන් දිරිමත් කළේ ය. එසේම දූෂණය වංචාවට එරෙහිව ඍජුව ම නැගී සිටීමට මෙතුමා නො පැකිලිව ඉදිරිපත් විය. ධනපති පාන්තිකයන්ට එතෙක් පනවා තිබූ බදු ප්‍රතිපත්තිය සංකීර්ණ කරමින් ඉහළ නැංවීමටත් දුගී දුප්පත් ස්වදේශීය ජනතාවට සහන සැලසීමටත් හෙතෙම ක්‍රියා කළේ ය. එසේම ඔහු නව ව්‍යවස්ථා සංශෝධන ඉදිරිපත් කරමින් ජනසතුකරණය හා ඉඩම් පුනර්ව්‍යාප්තිය සඳහා ද කටයුතු කළේ ය.

කොකා වගාකරුවන්ට එල්ල වූ දැඩි පීඩනයෙන් ඔවුන් මුදවා ගැනීමට කෘෂිකාර්මික පසුබිමකින් පැමිණි මොරාලෙස් මහත් උනන්දුවකින් ක්‍රියා කළේ ය. ඔවුන්

වෙනුවෙන් ගෙන ගිය වෘත්තිය අරගලයේ දී මොරාලෙස්ට සිරහාරයට පත් වීමට පවා සිදුවිය. ආර්ථික, සමාජ, දේශපාලන යන ක්ෂේත්‍රයන් හි නව ප්‍රතිසංස්කරණ රාශියක් ඇති කරමින් දේශීය ජනතාව දිළිඳු බවින් මුදවාලීමට මොරාලෙස් උත්සුක විය. එසේම එල්.ජී.බී.ටී. අයිතිවාසිකම් සඳහා නෛතික පිළිගැනීමක් ලබා දීමට ද හෙතෙම ක්‍රියා කළේ ය. කාන්තාවන්ට සිදුවන ගෘහස්ථ හිංසනය පිටුදැකීමට මොරාලෙස් රජය විසින් නීති සම්පාදනය කරන ලදී. මොරාලෙස් සිය තෙවන වර ජනාධිපති ධූරයට පත් වූ විට පවසා ඇත්තේ සිය ජයග්‍රහණය "යටත්විජිත විරෝධී හා අධිරාජ්‍ය විරෝධී" විජයග්‍රහණයක් වන බවයි. සිය ජනතාවට සමානාත්මතාවයෙන් යුතුව සැලකූ මොරාලෙස් නිවහල්භාවයෙන් යුතුව ද ක්‍රියා කළේ ය. ඇමෙරිකා එක්සත් ජනපදය හා එහි ක්‍රියා කලාපය සෘජුව ම විවේචනයට ලක් කිරීමට මොරාලෙස් ජනාධිපතිවරයා අභීත විය. ඔහුගේ ජනාධිපති ධූර කාල සීමාවන් තුන තුළ ම බොලිවියානු ඉතිහාසයේ අන් කවර කවරදාකවත් නො වූ විරූ ලෙස ජනතාව දරිද්‍රතාවෙන් මිදවීමට මොරාලෙස් ක්‍රියා කළේ ය. ඔහු විසින් සිදුකරන ලද ප්‍රතිසංස්කරණ ඒ සඳහා තදින් ම බලපෑවේ ය. නොයෙක් බාධාවන් මධ්‍යයේ වුව ද ඒ සියලු බාධා මැඩගෙන වසර 14ක කාලයක් ජනාධිපති ධූරය දැරීමට මොරාලෙස් භාග්‍යවන්ත විය. බොලීවියානු ඉතිහාසයේ ඉන්ද්‍රඛීලයක් බඳු ඊවෝ මොරාලෙස් ජන හදවත් තුළ සදා අමරණීය වනු නිසැක ය.

## මූලාශ්‍ර නාමාවලිය

André Luiz Coelho Farias de Souza, C. M. C. F. V. S., 2020. *Changes in the Foreign Policy of Bolivia and Ecuador: Domestic and International Conditions,* São Paulo : Associação Brasileira de Ciência Política.

Miller, M., n.d. *Brown University library.* [Online] Available at: https://library.brown.edu/create/modernlatinamerica/chapters/chapter-6-the-andes/moments-in-andean-history/the-rise-of-evo-morales/
[Accessed 13 September 2021].

Wallenfeldt, J., 2020. *Britennica.* [Online] Available at: https://www.britannica.com/biography/Evo-Morales [Accessed 14 September 2021].

2010. Evo Morales: President. [Online] Available at: https://info.handicraft-bolivia.com/Evo-Morales-President-a255-sm117

Bracy, M. R. S., n.d. Bolivian President Evo Morales: Biography & Quotes. [Online]
Available at: https://study.com/academy/lesson/bolivian-president-evo-morales-biography-quotes.html

Howard, R., 2019. Education Reform, Indigenous Politics, and Decolonisation in the Bolivia of Evo Morales. researchgate, pp. 583-593.

UNIVERSITY, C., 2008. Evo Morales Ayma. [Online] Available at: https://worldleaders.columbia.edu/directory/evo-morales-ayma

BBC (2016). Profile: Bolivia's President Evo Morales. *BBC News*. [online] 21 Feb. Available at: https://www.bbc.com/news/world-latin-america-12166905.

Brown University Libraryy (2008). *The Rise of Evo Morales | Modern Latin America*. [online] library.brown.edu. Available at: https://library.brown.edu/create/modernlatinamerica/chapters/chapter-6-the-andes/moments-in-andean-history/the-rise-of-evo-morales/.

Goats and Soda (2019). *How Evo Morales Made Bolivia A Better Place ... Before He Fled The Country*. [online] NPR.org. Available at: https://www.npr.org/sections/goatsandsoda/2019/11/26/781199250/how-evo-morales-made-bolivia-a-better-place-before-he-was-forced-to-flee.

NACLA (2019). *History at the Barricades: Evo Morales and the Power of the Past in Bolivian Politics (Excerpt)*. [online] NACLA. Available at: https://nacla.org/news/2019/10/08/evo-morales-bolivian-elections-dangl [Accessed 18 Nov. 2021].


NPR (2019). How Bolivia's Evo Morales Could Win A 4th Term As President. *NPR.org*. [online] 14 Oct. Available at: https://www.npr.org/2019/10/14/767967304/how-bolivias-evo-morales-could-win-a-4th-term-as-president [Accessed 18 Nov. 2021].

The Editors of Encyclopedia Britannica (2018). Evo Morales | Biography, Presidency, & Facts. In: *Encyclopædia Britannica*. [online] Available at: https://www.britannica.com/biography/Evo-Morales.

Graham, T. (n.d.). *The Internal Rift Threatening Bolivia's Left*. [online] Foreign Policy. Available at: https://foreignpolicy.com/2023/02/13/bolivia-politics-left-socialist-rift-morales-arce-president-election/ [Accessed 18 Nov. 2021].

Souza, A.L.C.F. de, Cunha Filho, C.M. and Santos, V. (2020). Changes in the Foreign Policy of Bolivia and Ecuador: Domestic and International Conditions. *Brazilian Political Science Review,* 14(3). doi:https://doi.org/10.1590/1981-3821202000030004.

# ෆිදෙල් කැස්ත්‍රෝ



**කණ්ඩායම් සාමාජිකයින් :**

- පූජ්‍ය රතන් අලෝ චක්මා (Rev. Ratan Alo Chakma)
- සමාධි එදිරිසිංහ
- මෙවුනා කහගොල්ල
- නවාංජනා කුමාරසිංහ
- ඉස්රත් මොහමඩ්

## හැඳින්වීම

''දැඩි පීඩනයක් එල්ල වූ දරුණුතම ඇමරිකානු අවහිර කිරීම් වලදී ෆිදෙල් නැගී සිට තම රට ශක්තිමත් කළේය.''

-මයිකල් ගොර්බචෙව්-

කියුබාවට ජාතික විමුක්තිය ගෙන දුන් විප්ලවයේ නායකයා මෙන්ම සමාජවාදී රටක නො සැලෙන නායකයා වූ ෆිදෙල් ඇලෙජැන්ඩ්‍රෝ කැස්ත්‍රෝ රූස් (Fidel Alejandro Castro Ruz), 20 වැනි සියවසේ ඉතිහාසයට එක් වූයේ වඩාත් විවාදාත්මක දේශපාලන චරිතයක් ලෙස ය. ඇතැමෙක් ෆිදෙල්ව හැඳින්වූයේ 'නිර්භීත- ආදරණීය වීරයෙකු' ලෙසට ය. අනෙක් අය ෆිදෙල්ව හැඳින්වූයේ, 'අවසාන කොමියුනිස්ට් ඩයිනෝසෝරයා' ලෙසට ය.

ෆිදෙල් කැස්ත්‍රෝ කියුබානු විප්ලවවාදියෙකු, නීතිඥයෙකු සහ දේශපාලනඥයෙකු වූ අතර 1959 සිට 2008 දක්වා කියුබාවේ නායකයා වූ අතර 1959 සිට 1976 දක්වා කියුබාවේ අගමැතිවරයා ලෙස ද 1976 සිට 2008 දක්වා ජනාධිපති වශයෙන් ද කටයුතු කළේ ය. ඔහු මාක්ස්-ලෙනින්වාදී සංවර්ධන මාදිලිය අනුගමනය කරමින් බටහිර අර්ධගෝලයේ ප්‍රථමයෙන් කොමියුනිස්ට් පාලනය, කියුබාව එක් පාර්ශීය සමාජවාදී රාජ්‍යයක් බවට පරිවර්තනය කළේ ය.

ගුදෙරා රෝසාස් පවසන පරිදි කැස්ත්‍රෝ බලයේ සිටි සමයේදී කියුබාව වෙත සැලකිය යුතු මානව හිමිකම් ජයග්‍රහණ රාශියක් අත්කර දුන්නේ ය. එමෙන්ම කැස්ත්‍රෝගේ නායකත්වය යටතේ සෞඛ්‍ය සේවා අංශ දියුණු කිරීම සඳහා අතිමහත් සේවයක් ඉටු කළ අතර ඔහු කියුබාවේ සාක්ෂරතාවය ඉහළ නැංවීම සඳහා පෙර නොවූ විරූ මෙහෙවරක් ඉටු කළේ ය.

ෆිදෙල් පිළිබඳව අදහස් දක්වන කියුබානු ජාතිකයන් ෆිදෙල්ව හඳුන්වා දෙන්නේ තරුණ, දැඩි අධිරාජ්‍ය විරෝධී සහ ඇමරිකානු විරෝධී, කතෝලික, කොමියුනිස්ට් විරෝධියෙකු ලෙසට ය. කියුබාවේ කොමියුනිස්ට්වාදීන්ට බැටිස්ටා (Fulgencio Batista) පරාජය කිරීමට ෆිදෙල් දැක් වූ දායකත්වය පිළිබඳව ඔවුහු ෆිදෙල්ට ගෞරව කරති. කැස්ත්‍රෝගේ ධනාත්මක ගුණාංගය නම් ඔහුගේ නො පසුබට ධෛර්යය, ශක්තිය සහ සංකීර්ණ ගැටලු විසඳීමට ඔහු පසුබට නො වීමයි. (ගාෆ්, 2019)

1959 ජනවාරි 8 වෙනි දා ෆිදෙල් ජයග්‍රාහී ලෙස හවානා (Havana) නගරයට ඇතුළු වූයේ, ''කියුබානුවනි, මම ඔබට නිදහස ගෙන ආවෙමි." යන වදන් පෙළක් සමගින් ය. එහි කැපී පෙනුන කරුණ වූයේ වසර 100 කට පසු මිනිසුන් කැස්ත්‍රෝ හට බලවත්, ශක්තිමත්, අනන්‍යතාවයක් ඇති ජාතියක් ගොඩනැඟීමේ ගෞරවය ගෞරවාන්විතව ලබා දීමයි.

## ළමා කාලය, අධ්‍යාපනය හා දේශපාලනයට පිවිසීම

'ෆිදෙල් ඇලජැන්ඩ්‍රෝ කැස්ත්‍රෝ රූස් (Fidel Alejandro Castro Ruz)' වර්ෂ 1926 අගෝස්තු මස 13 වන දින, නැගෙනහිර කියුබාවේ බිරෝන් (Biran) නම් කුඩා නගරයේ දී උපත ලැබීය. ඔහු කුඩා කාලයේ සිට ම ඉතාම ශක්තිමත් හොඳින් වැඩුණු ශරීරයකින් යුක්ත ඍජු ගතිගුණ ඇති තරමක් මුරණ්ඩු ස්වභාවයෙන් යුක්ත වූ අයෙකි. ඔහුගේ පියා 'ඒන්ජල් කැස්ත්‍රෝ වයි අගිස් (Ángel Castro Y Argiz)' ස්පාඤ්ඤ ජාතිකයෙකු වූ අතර එම ප්‍රදේශයේ ධනවත් උක් වගා හිමිකරුවෙක් විය. ඔහුගේ මව 'ලීනා රූස් ගොන්සාලෙස් (Lina Ruz González)' කැනේරියානු ජාතික කාන්තාවක් විය.



*කුඩා කාලයේ ෆිදෙල් කැස්ත්‍රෝ*

ෆිදෙල්ගේ පියා, වයස අවුරුදු 17 දී (1895) ස්පාඤ්ඤ යටත් විජිත හමුදාවට බැඳී, 1898 දී හමුදා සොල්දාදුවකු සේ කියුබාවට පැමිණි විදේශිකයෙකි. පසුව 1899 දී හවානා වෙත පැමිණෙන ඒන්ජල්, බොස්ටන්හි (Boston) පලතුරු සමාගමක කම්කරුවෙකු ලෙස සේවය කළේ ය. 1902 දී අත්සන් කරන ලද 'පැරිස් සාම ගිවිසුම (Paris Peace Treaty)' මගින් 'කියුබාව ස්වාධීන ජනරජයක්' ලෙසට ප්‍රකාශ කළ අතර, එම කාලයේ දී ඒන්ජල් කැස්ත්‍රෝ , බිරෝන් අසල උක්

වගාව සඳහා විශාල ඉඩමක් මිලදී ගත්තේ ය. ඔහු පසුව ක්‍රමක්‍රමයෙන් බිරෝන්හි ධනවත් උක් වගා හිමිකරුවෙකු බවට පත් විය.

ඒන්ජල් කැස්ත්‍රෝ 1911 මාර්තු මාසයේ දී ස්පාඤ්ඤ ජාතික පවුලකට අයත් 'මරියා අර්ගෝටා රීස් (María Luisa Argota Reyes)' සමඟ පළමු වරට විවාහ වූ අතර ඔවුන් දෙදෙනා හට දරුවන් පස් දෙනෙකු විය. එම විවාහය 1918 දි දෙදරා ගියේ ය. 1920 මැද භාගය වනවිට ඒන්ජල් තම ගෘහ සේවිකාව වූ කැනේඩියානු ජාතික 'ලීනා රූස්' හා විවාහ විය. ඒන්ජල් කැස්ත්‍රෝ 1941 දී කියුබානු පුරවැසි භාවය ලබාගත් අතර ඔවුන් නීත්‍යානුකූල ලෙස විවාහ වූයේ 1943 වර්ෂයේදී ය.

ලීනා සහ ඒන්ජල් හට දරුවන් හත් දෙනෙකු වූ අතර ඉන් තෙවන දරුවා වූයේ ෆිදෙල් කැස්ත්‍රෝ ය. ෆිදෙල් තම බාල සහෝදරයා වූ රාවුල් කැස්ත්‍රෝ (Raúl Castro) හට විශේෂ ආදරයක් දැක් වූ අතර, ෆිදෙල්ගේ දේශපාලන කටයුතුවලට රාවුල් නො මඳ සහයක් ලබා දුන්නේ ය.

ලීනා රූස් විසින් වයස අවුරුදු 4 දී කුඩා ෆිදෙල් හට අධ්‍යාපනය ලබා දීම සඳහා, තම ගොවිපළෙහි සේවකයින්ගේ දරුවන් සඳහා තිබූ  කුඩා පාසල වෙත යවන ලදී. එය ඉතා කුඩා වූ අතර පළමු වසරේ සිට පහ වසර දක්වා දරුවන් පේළි වශයෙන් එම පන්ති කාමරවල අධ්‍යාපනය ලැබූහ. ෆිදෙල් එහි සිටි කුඩා ම ළමයා වූ අතර ඔහු සඳහා පළමු පේළියේ, හරි මැද අසුන වෙන්කර තිබිණි.

ඉන් පසුව ඔහු වයස අවුරුදු 6 දී, තම ගුරුවරයා සමඟ සන්තියගෝ ද කියුබාවේ (Santiago de Cuba) පාසලකට යැවූ අතර ඔහුගේ දඩබ්බර හැසිරීම් නිසා ඔහු පාසලෙන් නෙරපන ලදී. එම සිද්ධියෙන් පසුව ඒන්ජල් කැස්ත්‍රෝ, ෆිදෙල්ව නිවසේ තබා ගත් අතර මේ පිළිබඳව අසතුටට පත් වූ ෆිදෙල් තමාව නැවතත් පාසල් යවන ලෙසට තම පියාට බල කර සිටියේ ය. ඉන් නො නැවතුණ ඔහු තම මව වන ලීනා රූස් හට පවසා සිටියේ, තමා පාසල් නො යවා සිටියහොත් නිවසට ගිනි තබනා බවයි. ෆිදෙල්ගේ මුරණ්ඩු ගතිපැවතුම දන්නා මව, ඔහුව පාසල් නො යැව්වහොත් නිසැකවම ඔහු නිවසට ගිනි තබනා බව හොඳින් ම දැන සිටියා ය. ඒ හේතුවෙන් ඔවුන් ෆිදෙල්ව රෝමානු කතෝලික පෞද්ගලික පාසලක් වෙත යවන ලදී.

ෆිදෙල් හට වයස අවුරුදු 12 පමණ වන විට දී, තම පියා ඔහුගේ සේවකයින්ට නිසි ලෙස වැටුප් නො ගෙවීම සම්බන්ධයෙන් දැඩි ලෙස විරුද්ධ වූ අතර ඒ වෙනුවෙන්

සටන් කිරීමට ගොවිපළෙහි සේවකයින් ඒකරාශී කොට ෆිදෙල්ගේ මෙහෙය වීම යටතේ කැරැල්ලක් සංවිධානය කරන ලදි. ෆිදෙල් හා ඔහුගේ පියා අතර තිබූ සම්බන්ධතාවය ගැන අවධානය යොමු කිරීමේදී, ෆිදෙල් තම පියාව හඳුන්වන්නේ 'වෙහෙස මහන්සි වී වැඩ කරන, නම්‍යශීලී, දූරදර්ශී පුද්ගලයෙකු' ලෙසයි. ෆිදෙල් තම පියාට ගරු කළ අතර, ඔවුන්ගේ පවුල පිළිබඳව මැනවින් විස්තර දන්නා පුද්ගලයින් පවසන්නේ, 'ෆිදෙල්, ඒන්ජල් කැස්ත්‍රෝගේ ප්‍රියතම පුත්‍රයා' බවයි. එයට හේතුව නම්, ෆිදෙල් හට ඒන්ජල් කැස්ත්‍රෝ මෙන් ඍජු ගතිගුණ හා මුරණ්ඩු ගතිගුණ පිහිටා තිබීමයි.

1940 දී ෆිදෙල් කැස්ත්‍රෝ (වයස අවුරුදු 14 දී) විසින් එවකට ඇමරිකානු ජනාධිපති වූ ෆ්‍රැන්ක්ලින් ඩී. රූස්වෙල්ට්ගේ (Franklin D. Roosevelt) පාලනයට සුභ පතා ඔහුට ලිපියක් යැවූ අතර එම ලිපිය මගින් ෆිදෙල් ඔහුගෙන් ඇමරිකානු ඩොලර් 10 ක නෝට්ටුවක් එවිය හැකි දැයි විමසා තිබුණි. එයට හේතුව වූයේ, ෆිදෙල් ඒ වන විටත් එම මුදල් නෝට්ටුවක් දැක නො තිබීමයි. 2007 වසරේ දී ෆිදෙල් ඉන්නේෂියෝ රමොනෙට් සමග පැවති සාකච්ඡාවක දී පවසා සිටියේ, තමා පිරිමි ළමයෙකුව සිටියදී ඔහුට දේශපාලන මතයක් නො තිබූ බව සහ අනෙක් සියලුදෙනා මෙන් චිත්‍රපටි බැලීමට, බටහිරකරණයට, තවත් දේවල් වලට කැමත්තෙන් සිටි බව හා ඒවා බැරෑරුම් කාර්යයන් ලෙස සිතූ බවයි.

ෆිදෙල් හට වයස අවුරුදු 15 දී ඔහු, හවානා වල පිහිටි කොලේජියෝ බෙලන් (Colegio Belen) වෙත ඇතුළත් වන ලදී. එහිදී ඔහු ඉතිහාසය, භූගෝලය යන විෂයන් සඳහා විශේෂ උනන්දුවක් දැක් වූ අතර බේස් බෝල් ක්‍රීඩාවේ කැපී පෙනෙන දක්ෂතා දැක්වීය. ඔහු 1943-1944 කාලයේ පාසලේ බේස් බෝල් කණ්ඩායම වෙනුවෙන් ක්‍රීඩා කළේ ය.

1945 දී කැස්ත්‍රෝ 'හවානා විශ්ව විද්‍යාලයේ' නීති විද්‍යාලයට ඇතුළත් වූ අතර, ඔහු දේශපාලනික වශයෙන් සවිඥානික පුද්ගලයෙකු බවට පත්වීමට පටන් ගත්තේ ය. ඔහු එහිදී, ඉක්මනින් ම කියුබානු ජාතිකවාදය, අධිරාජ්‍ය විරෝධී, හා සමාජවාදි දේශපාලන මත ඉගෙන ගත්තේ ය. ඔහු තම නීති උපාධිය 1950 දී අවසන් කොට සිය නීති පුහුණුව ආරම්භ කළ අතර ඒ වන විට ඔහු කියුබානු දේශපාලනයේ තම සලකුණු සනිටුවහන් කිරීමට ආරම්භ කර තිබුණේ ය.

## නායකත්වය කරා ගිය ගමන් මග

කුඩා කල සිට ම තමා විඳි අත්දැකීම් සහ තමන් ලැබූ අධ්‍යාපනයෙන් ෆිදෙල් කැස්ත්‍රෝ හට නායකත්ව ගති ලක්ෂණ නිතැතින් ම උරුම විය. විශේෂයෙන් ම තරුණ අවධියේ විශ්වවිද්‍යාල ශිෂ්‍යයකු ලෙස ක්‍රියාකාරී දේශපාලනයට එකතු වී සිටි ඔහු නිරායාසයෙන් ම නායකත්වය කරා මෙහෙය වනු ලැබී ය. හවානාහි නීති ශිෂ්‍යයකු ලෙස ඉගෙනුම ලබන විට කැස්ත්‍රෝ ශිෂ්‍ය දේශපාලනයට පිවිස නායකත්ව කුසලතාවයන් රැසක් ඔප්නංවා ගත්තේ ය.


1947 වසරේ දී දූෂණ විරෝධී ඕතඩොක්ස් පක්ෂයට (Orthodox Party) බැඳී වඩාත් නිදහස් දේශපාලන වාතාවරණයක් උදෙසා අරගල කළේ ය. එමෙන්ම ඔහු ඩොමිනිකන් වහලුන් හා කියුබානුවන් විසින් ගෙන ගිය ඩොමිනිකන් ජනරජය හා ජෙනරාල් ෆොයෙල් ට්‍රූජිලෝව (General Foyil Trujillo) නෙරපා දැමීමේ උත්සාහයකට ද තම දායකත්වය සැපයුවේ ය. මෙම කුමන්ත්‍රණය ඉතා ඉක්මනින් අසාර්ථක වුව ද ඔහු එයින් තවත් ධෛර්යමත් විය. දූෂණ හා වංචාව පිටු දැක නිදහස් දේශපාලන වාතාවරණයක් ගොඩනැගීමට ඔහු නිතරම නායකත්වය ගෙන කටයුතු කළ අතර බොහෝ දෙනාගේ අවධානය ඔහු වෙත එල්ල වීම නො වැළැක්විය හැකි කරුණක් විය. එමෙන්ම 1948 අප්‍රේල් මාසයේ දී කොලොම්බියාවේ බොගෝටාහි (Bogotá, Colombia) ඇති වුණු නාගරික කැරලි කෝලාහලවලට ද ඔහු තම දායකත්වය ලබා දුන්නේ ය.

1950 වර්ෂයේ දී ඔහු නීති උපාධිය ලබා ගත් පසු නීති පුහුණුව ආරම්භ කළ අතර නීති කාර්යාලයක් ද පිහිටු වීය. එහිදී ඔහු දුප්පතුන්ට මුල් තැන දෙමින් නඩු විභාග කළේ ය. මේ වන විට කැස්ත්‍රෝ ඕතඩොක්ස් පක්ෂයේ ප්‍රබල සාමාජිකයෙක් විය. ඔහු වසර 1952 ජුනි මාසයේ දී කියුබානු නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ අසුනක් සඳහා හවානා දිස්ත්‍රික්කයෙන් තරග වැදීමට තීරණය කළේ ය. නමුත් එම වසරේ මාර්තු මාසයේ දී ජෙනරාල් ෆුල්ජෙන්සියෝ බැටිස්ටා (Gen Fulgencio Batista) එවක රජය පෙරලා දමා නැවත බලයට පත් වූ නිසාවෙන් පැවැත්වීමට තිබූ මැතිවරණය අවලංගු කරන ලදී. ජෙනරාල් බැටිස්ටා මීට පෙර ප්‍රජාතන්ත්‍රවාදී ලෙස පත් වූ ජනාධිපතිවරයෙකු වුවද 1952 දී හමුදා කුමන්ත්‍රණයක් මගින් කියුබාවේ බලය නැවත අල්ලා ගත්තේය. එතැන් පටන් ඔහු ඉතා ආඥාදායක ලෙස කියුබාව පාලනය කළ අතර මැතිවරණ සියල්ල අවලංගු කිරීමට කටයුතු කළේ ය. එමෙන්ම රටේ

ජනතාවගේ බදු මුදල් තම ලාභ ප්‍රයෝජන උදෙසා යොදා ගනිමින් කියුබාව පුරා තම අණසක පැතිරවීය. මේ නිසා රටේ තැනින් තැන කැරලි ගැසීම්, අඩ දබර, ක්‍රමයෙන් උත්සන්න විය. බැටිස්ටාගේ මෙම ක්‍රියාවන් කැස්ත්‍රෝගේ දෝෂ දර්ශනයට ලක් විය. සාමකාමීව නොව බලය ලබාගත යුත්තේ බලහත්කාරයෙන් බව තීරණය කළ ඔහු බැටිස්ටාගේ රජය පෙරළා දමා කියුබාව බේරාගන්නා බවට ප්‍රකාශ කළේ ය. ඔහු ප්‍රසිද්ධියේ ම බැටිස්ටාව විවේචනය කළ අතර ජනාධිපතිවරයාට එරෙහි ව පෙළපාලි සංවිධානය කළේ ය. ඔහුගේ මෙම අරගලය කියුබානුවන්ගේ අවධානය දිනාගත් අතර බොහෝ පිරිසක් ඔහු සමඟ එකතු විය. ඔවුන් පොදුවේ 'ෆිදෙලිස්ටාස්' ලෙස හැඳින් වූ අතර කැස්ත්‍රෝගේ සහෝදරයා වූ රාවුල් ද මොවුන් සමඟ එකතු වී තම සහෝදරයා ගෙන ගිය විප්ලවයට සහාය දුන්නේ ය.

ෆිදෙල් කැස්ත්‍රෝ ගෙන ගිය මෙම සටන බොහෝ දෙනාගේ අවධානයට යොමු විය. චතුර ලෙස කථා කිරීමේ හැකියාවත් ගාම්භීර පෞරුෂයත්, නායකත්ව ගුණාංග වලිනුත් සපිරි ඔහුගේ ආකල්පය නිසා ඔහු ජනතාව අතර ඉතා ජනප්‍රිය විය. තම ඉදිරි පියවර ලෙස මොන්කාඩා හමුදා බැරැක්කවලට (Moncada Barracks) පහර දීමට කැස්ත්‍රෝ තීරණය කළේ ය. ඒ අනුව 1953 ජූලි 26 වන දින සන්තියාගෝහි මොන්කාඩා හමුදා බැරැක්කවලට පහර දීම උදෙසා ඔහු තම පිරිස මෙහෙය වීය. එහිදී ප්‍රබල පිරිසක් වූ හමුදා සොල්දාදුවන්ට එරෙහි ව නැඟී සිටීමට ඉමහත් ධෛර්යයක් ලබාදෙමින් කැස්ත්‍රෝ තම පිරිසට නියම නායකයකුගේ භූමිකාව රඟ දැක්වුවේය. නමුත් මෙම කැරැල්ල අසාර්ථක වූ අතර ෆිදෙලිස්ටාස්හි බොහෝ දෙනෙක් ඝාතනය විය. එමෙන්ම බැටිස්ටාගේ හමුදාව විසින් කැස්ත්‍රෝව අල්ලා ගනු ලැබූ අතර ඔහුට වසර 15ක සිර දඬුවමක් ද හිමි විය. ඔහු සමඟ ඔහුගේ සොහොයුරු රාවුල් ද සිරගත කෙරිණි. ඒ අනුව 1953 ඔක්තෝබර් 16 වන දින දඬුවම් ලබා දුන් කැස්ත්‍රෝව සහ ඔහුගේ සොහොයුරාව ද කියුබාවෙ දකුණු වෙරළට ඔබ්බෙන් වූ බන්ධනාගාරයක සිරගත කරන ලදී. බන්ධනාගාරයේ දී වුව ද ඔහු තම විප්ලවීය ක්‍රියා දිගටම ගෙන ගිය අතර තම දේශපාලන මතවාද ප්‍රචාරය කරමින් තමා වටා පිරිස එක්කර ගැනීමට ඔහු සමත් විය.

1955 මැයි 15 දින කැස්ත්‍රෝ හා සොහොයුරු රාවුල් දේශපාලන සමාව යටතේ නිදහස ලැබීය. නිදහස ලැබූ කැස්ත්‍රෝ එවක පැවති කියුබානු රජයට විරුද්ධව දිගින් දිගට ම තම විප්ලවීය සටන් මෙහෙය වූ අතර එම විප්ලවයට 'ජූලි 26 ව්‍යාපාරය (26th of July Movement)' නමින් නම් කරන ලදි. මොන්කාඩා බැරැක්කයේ කළ අරගලයේ දී මිය ගිය ෆිදෙලිස්ටාස්ලාට ගෞරවය පුද කිරීමක් වශයෙන් කැස්ත්‍රෝ විසින් නම් කරන ලදී. මේ කාලයේ දී කැස්ත්‍රෝගේ බොහෝ කතා පුවත්පත්වල පළ වූ අතර ඒවා ඉක්මනින් ම ජනතාව අතර ප්‍රචලිත විය. එහි දී කියුබානු රජය ඔහුට එරෙහිව පියවර ගැනීමට තැත් කළ අතර අනාරක්ෂිත හැඟීමක් දැනුණු කැස්ත්‍රෝ මෙක්සිකෝවට පලා ගියේ ය. එහිදී ඔහු රජය පෙරළා දැමීමට දැඩි ලෙස අධිෂ්ඨාන කරගෙන සිටි අතර ගරිල්ලා ක්‍රම ඇතුළු සටන් ක්‍රම හා යුද රහස් අධ්‍යයනය කිරීමට පෙළඹුණේ ය. කැස්ත්‍රෝගේ මෙම ආගමනය ඔහුගේ මෙන් ම විප්ලවීය ඉතිහාසයේ ඉතා වැදගත් සන්ධිස්ථානය විය. එනම් මෙක්සිකෝවේ දී ඔහුට ආර්ජන්ටිනාවේ සිට පැමිණි තරුණ වෛද්‍යවරයකු වූ ''චේ ගුවේරා (Che Guevara)'' මුණ ගැසීම යි. ඉතා කිට්ටු මිතුරන් බවට පත් වූ ඔවුන් තම දේශපාලන මතවාද පිළිබඳ කතා කළ අතර චේ ගුවේරා කැස්ත්‍රෝ සමඟ එකතු වීමට ද තීරණය කළේ ය. ඔහුගේ විචක්ෂණශීලී නුවණත්, කැස්ත්‍රෝගේ විශිෂ්ට නායකත්වයත්, එකට මුසු වී විප්ලවය සාර්ථකව කරගෙන යාමට ඔවුන්ට හැකිවිය.



*චේ ගුවේරා සමඟ ෆිදෙල්*

ඒ අනුව දෙසැම්බර් 2 වන දින කැස්ත්‍රෝ 81 දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් ද සමඟ ග්‍රැන්මා (Granma) නෞකාවෙන් කියුබාවට පැමිණි අතර එහිදී ෆිදෙල්, රාවුල්, චේ ගුවේරා, සහ තවත් 9 දෙනෙකු හැර ඉතිරි සියල්ලෝම ඝාතනය කරනු ලැබූ අතර ඔවුහු නැවතත් සන්නද්ධ වීම උදෙසා සියෙරා මාස්ට්‍රා (Sierra Maestra) වෙත ගියහ. මොවුන්ගේ මෙම විප්ලවීය ක්‍රියාකාරකම් හේතුවෙන් කියුබාව පුරා ද බැටිස්ටාගේ පාලනයට එරෙහිව කැරලි කෝලාහල නැගෙන්නට වූ අතර කැස්ත්‍රෝගේ පිරිසට තව තවත් එකතු වන්නන් වැඩි විය. 1957 මාර්තු 13 වන දින ශිෂ්‍යයින්ගෙන් සමන්විත කැරලිකාර කණ්ඩායමක් වන විප්ලවවාදී අධ්‍යක්ෂක මණ්ඩලය (The Revolutionary Directorate) හවානාහි ජනාධිපති මන්දිරයට පහර දුන්හ. මෙහිදී ඉතා විශාල ප්‍රමාණයක් මරණයට පත් වූ අතර කියුබාව පුරා ඉතා උණුසුම් යුධමය වාතාවරණයක් ඇවිලී ගියේ ය. එහිදී දේපල හා ගොවිබිම් විනාශ කිරීම, කර්මාන්ත විනාශ කිරීම, වරින්වර සිදුවන වැටලීම් ආදිය නිසා කියුබාව තුළ වියවුල්කාරී බවක් ඇති වී කියුබානු ආර්ථිකය පවා බිඳ වැටෙන්නට විය. මෙහිදී පාලක බැටිස්ටා මෙම විප්ලවීය ක්‍රියාකාරකම් දැඩි ලෙස මර්දනය කිරීමට උත්සාහ ගත්තේ ය. ඔහු කැස්ත්‍රෝගේ හමුදාවන්ට එරෙහිව ඉතා විශාල මිලිටරි මෙහෙයුමක් දියත් කළේ ය. එහිදී ඔහු සියෙරා මාස්ට්‍රා වෙත තම හමුදාව යැවූ අතර කැස්ත්‍රෝගේ පිරිස විසින් ඔවුන්ව නිමේෂයකින් ආපසු හරවා එවන ලදි. බැටිස්ටාගේ හමුදාව ක්‍රම ක්‍රමයෙන් අඩපණ වන්නට විය. ඇමරිකාව විසින් පැන වූ ආයුධ සම්බාධක හේතුවෙන් රජයේ හමුදාවට අවශ්‍ය තරම් අවි-ආයුධ හා පතොරම් හිඟ වීම කැස්ත්‍රෝගේ වාසියට හේතු විය. එමෙන්ම 1958 දෙසැම්බර් 27 වන දින චේ ගුවේරා මෙහෙය වූ කැරලිකාර හමුදාව සැන්ටා ක්ලාරි හි රජයේ හමුදාවන්ට අත්‍යවශ්‍ය ආයුධ හා පතොරම් සමඟ දුම්රියක් අල්ලා ගත් අතර කැස්ත්‍රෝගේ පිරිසට අවි ආයුධ ලැබීමත් සමඟ විප්ලවය තව තවත් දරුණු වන්නට විය. මෙම ප්‍රහාරය අගෝස්තු මස මුලදී සම්පූර්ණයෙන්ම නතර කරන ලදි.

එහිදී කැස්ත්‍රෝගේ නායකත්වයෙන් යුතු විප්ලවය ඉතා දරුණු වී රජයේ සන්නද්ධ හමුදාව ක්‍රමක්‍රමයෙන් පරාජය වී යනු දුටු බැටිස්ටා 1959 ජනවාරි 01 දින රටින් පලා ගියේ ය. මෙය කැස්ත්‍රෝගේ වසර ගණනක සිට ගෙන ගිය විප්ලවීය ව්‍යාපාරය ජයග්‍රහණය සනිටුහන් කළේ ය. ඒ අනුව විප්ලවයේ නායකයා වූ ෆිදෙල් කැස්ත්‍රෝ අවිවාදයෙන් ම කියුබාවෙ නායකයා බවට පත් විය. ඔහු එහි තාවකාලික ආණ්ඩුවේ ත්‍රිවිධ හමුදාවේ අණදෙන නිලධාරියා බවට පත් වූ අතර 1959 පෙබරවාරි මාසයේ දී

කැස්ත්‍රෝ අග්‍රාමාත්‍යවරයා බවට පත් වෙමින් කියුබානු රජයේ ප්‍රධානියා බවට පත් විය. බලයට පැමිණීමත් සමඟ ෆිදෙල් කැස්ත්‍රෝ තමන්ට ඉතා විශාල සහයෝගයක් ලබා දුන් චේ ගුවේරා හට කියුබන් ජාතිකයෙකු ලෙස හා ජනාධිපති තනතුර ඇතුළුව ඕනෑම රජයේ තනතුරකට සුදුස්සෙකු ලෙස ඉතා ඉහළ පිළිගැනීමක් ලබා දුන්නේ ය. සමාජ අසාධාරණයට එරෙහි වෙමින් නව සමාජවාදී කියුබාවක් ගොඩ නැගීමේ මහා විප්ලවය පිටුපස සිටින දැවැන්ත නායකත්ව චරිතය ෆිදෙල් කැස්ත්‍රෝ බව අවිවාදයෙන් ම පිළිගත යුතු ය. ඔහුගේ මනාව සැලසුම් කිරීමේ හැකියාවත්, දුරදක්නා නුවණත්, විප්ලවකාරී ස්වභාවයත් නිසා ජයග්‍රහණය තෙක් සටන ඉදිරියට ගෙන යාමට හැකි විය. මේ අනුව බලන කළ කුඩා අවධියේ සිට ම අත්දැකීම් රාශියක් ලබා ගනිමින් තරුණ අවධිය තම දේශපාලන දිවිය ආරම්භ කළ ෆිදෙල් කැස්ත්‍රෝ කියුබාවේ ප්‍රධානියා බවට පත් වීමේ ගමන් මාර්ගය පිළිබඳ විමසා බැලීමේ දී ඔහු නායකයකු වීමට ම උපන් අයකු ලෙස හැඳින්වීම නිවැරදිය.

## නායකත්වයට පැමිණීමෙන් පසු සිදු කළ සේවාව

විදේශීය අධිරාජ්‍ය විසින් ආධිපත්‍ය දැරූ ධනවාදී රාජ්‍යයක් වූ කියුබාව, මාක්ස්වාදියෙකු වූ කැස්ත්‍රෝ විසින් සමාජවාදී සමාජයක් බවටත් අවසානයේ කොමියුනිස්ට් රාජ්‍යයක් බවටත් පරිවර්තනය කිරීමට උත්සාහ කළේ ය. කැස්ත්‍රෝගේ රජය ජාතිවාදී වූ අතර කැස්ත්‍රෝ ප්‍රකාශ කළේ ''අපි මාක්ස් ලෙනින්වාදීන් පමණක් නොව ජාතිකවාදීන් සහ දේශප්‍රේමීන් ද වෙමු" යන්නයි. ඉතිහාසඥ රිචඩ් ගොට් (Richard Gott) සඳහන් කළේ කැස්ත්‍රෝගේ සාර්ථකත්වයේ එක් ප්‍රධාන කරුණක් වූයේ සමාජවාදය සහ ජාතිකවාදය යන ද්විත්ව තේමාවන් භාවිත කිරීමට සහ ඒවා නිමක් නැතිව ක්‍රියාවේ තබාගැනීමට ඔහුට ඇති හැකියාව බවයි. මෙහිදී කැස්ත්‍රෝ විසින් නායකත්වයට පැමිණීමෙන් පසු කියුබාවට කරන ලද සේවාවන් ඉතා වැදගත් වේ.

### ආර්ථික සේවාව

රාජ්‍යයක් දියුණුවීමට නම් විශේෂයෙන් ම එම රාජ්‍යයේ ආර්ථික තත්ත්වය යහපත් තත්ත්වයක තිබිය යුතු ය. කැස්ත්‍රෝ කියුබාව භාර ගැනීමේදී එහි ආර්ථික තත්ත්වය

පැවතියේ ඉතාමත් පහළ මට්ටමක ය. කෙසේ නමුත් ඔහු බලයට පැමිණීමෙන් පසු රටෙහි ආර්ථික තත්ත්වයට සිදු කළ සේවාව පහත පරිදි විස්තර කළ හැක.

ඔහු අගමැති ධූරයට පත් වීමෙන් පසු 1959 මැයි මාසයේ දී පළමු ගොවිජන ප්‍රතිසංස්කරණ නීතියට අත්සන් තැබූ අතර එක් හිමිකරුවෙකු සඳහා අක්කර 993 කට භූමි ප්‍රමාණයක් වෙන් කළ අතර විදේශිකයන්ට කියුබානු ඉඩම් හිමිකම් ලබා ගැනීම තහනම් කළේ ය. විශාල ඉඩම් කැඩී යාම නිසා ගොවීන් 200,000 කට පමණ හිමිකම් ඔප්පු ලැබිණි. අවුරුද්දක් ඇතුළත කැස්ත්‍රෝ සහ ඔහුගේ රජය ජාතියේ ධනයෙන් 15% එලදායි ලෙස නැවත බෙදා හැරියේ ය.

කැස්ත්‍රෝ විසින් තම රාජ්‍යයට විශාල ආර්ථික සේවාවක් සිදු කරන ලදි. සංචාරක, නිකල්, දුම්කොළ, සහ පැගිරි ආදී කර්මාන්ත රැසක විශාල වෙනසක් සිදු කිරීමට මොහුට හැකි විය. 1979 ඔක්තෝබර් මාසයේ දී එක්සත් ජාතීන්ගේ සංගමයේ 34 වන හමුවෙන් පසු පැමිණි කැස්ත්‍රෝ, කැනේඩියානු ආයතන හැර සෙසු විදේශීය සහ කියුබානු ප්‍රධාන කාර්මික සහ වාණිජ සමාගම් 550 ක් මෙන් ම විදේශීය බැංකු සියල්ල ම ජනසතු කරන ලදී. ඔක්තෝම්බර් 15 වෙනි දා ෆිදෙල් කැස්ත්‍රෝ රූපවාහිනිය මගින් තම ජනතාව අමතා කළ කතාවේ දී විප්ලවවාදී වැඩසටහන ක්‍රියාත්මක කරන බවට අවධාරණය කළේ ය. විප්ලවයෙන් වසර දෙකක් තුළ කියුබාවේ ධනවාදය ප්‍රායෝගිකව නැවතීම නතර කෙරිණි. මේ මගින් විශාල ඇමරිකානු ව්‍යවසායන්, සමාගම් සහ සම්මේලනයට ඩොලර් බිලියනයක පමණ වටිනා ආයෝජන අහිමි විය. ඇමරිකානු මාධ්‍ය ප්‍රකාශවලට අනුව ඔවුන් පැවසුවේ ඇමරිකානු මාෆියාවට පමණක් සංචාරක ව්‍යාපාරයේ තැන්පත් කර ඇති අරමුදල් වලින් ඩොලර් මිලියන 100ක පමණ මුදලක් අහිමි වී ඇති බවයි.


බලයට පැමිණීමේදී හොඳ කළමනාකරුවකු වශයෙන් ෆිදෙල් කැස්ත්‍රෝට තිබූ දැක්ම ප්‍රයෝජනයට ගනිමින් රට තුළ තිබූ දුෂ්කර ආර්ථික පසුබිම ඉවත් කිරීමට අවශ්‍ය කටයුතු මුලින් ම සකස් කර ගැනීමට ඔහු පෙළඹුණේ ය.

කැස්ත්‍රෝ විසින් විනිසුරුවන්, දේශපාලනඥයින් වැනි විශාල තනතුරු දැරූ පුද්ගලයන්ගේ වැටුප් අහිමි කොට බිම් මට්ටමේ රාජ්‍ය සේවකයන්ට වැටුප් ලබා දෙමින් ආර්ථිකය ස්ථිරසාර කර ගැනීමට කටයුතු කළේ ය. 1989 වසර වන විට කියුබානුවන් එහි තිස් වසරක ඉතිහාසයේ ඉහළ ම සංවර්ධන මට්ටමට පැමිණ තිබුණි. 1990 වන තෙක් කියුබානු වෙළඳාමෙන් 80% ක් කොමියුනිස්ට් රටවල් සහ සෝවියට්

සංගමය සමඟ සිදු කළ අතර ෆිදෙල් දුෂ්කර කාලයන්ට මුහුණදීමට රටේ ජනතාව සූදානම් කළේ ය.

පෙරෙස්ට්‍රොයිකා (Perestroika) හෙවත් ප්‍රතිව්‍යුහගත යුගයේ දී සෝවියට් සංගමය කියුබාවට සංචාරයකට ගිය අවස්ථාවේ දී බටහිර මාධ්‍ය රටට ප්‍රතිසංස්කරණය ගෙන ඒමට නො හැකි බව සඳහන් කරමින් ෆිදෙල් කැස්ත්‍රෝව විවේචනය කළහ. කෙසේ වෙතත්, කැස්ත්‍රෝ හට කුමන දුෂ්කර අවස්ථාවක වුවද  අඩුපාඩු හඳුනා ගැනීමේ හැකියාව ඔහු සතුව තිබුණි. එම නිසා කියුබානු දේශපාලන හා ආර්ථික පද්ධති තුළ තිබූ අඩුපාඩු ඉවත් කිරීමට හැකි නව ආකෘති සහ ක්‍රම ඔහු අධ්‍යයනය කළේ ය. ෆිදෙල් කැස්ත්‍රෝ නිවැරදි කිරීම් සහ ප්‍රකාශ කිරීම් වශයෙන් වෙනස්කම් සිදු කිරීමට ප්‍රධාන ක්‍රම දෙකක් විශේෂ සාම පරිච්ඡේද කාලය තුළ භාවිත කළේ ය.

ෆිදෙල්ගේ මෙම  ක්‍රියාකාරකම් වලින් පසුව එරට දළ දේශීය නිෂ්පාදනයේ සිදු වූ යම් යම් වෙනස්කම් පහත දැක්වෙන ප්‍රස්තාරය මගින් නිරූපණය වේ.




1993 දී ඇමෙරිකානු ඩොලරයක මිල කියුබානු  පෙසෝ 150 ක් වූ අතර 1996 දී අනුපාතයේ විශාල වෙනසකට භාජනය විය. එහිදී ඇමෙරිකානු ඩොලරයක මිල කියුබානු පෙසෝ 19 ක් විය. 1996 දී ශ්‍රම ඵලදායිතාව 8.5% ආයෝජනය 54% අපනයනය 33% සහ ආනයන 33.3% කින් වැඩිවිය. කියුබානු ජාතික මුදල් ඒකකය සැලකිය යුතු ලෙස ශක්තිමත් විය.

**දේශපාලන සේවාව**

කියුබාවේ පාලනය ලබාගත් කැස්ත්‍රෝ එම රටට විවිධ වූ සාර්ථකත්වයන් ළඟා කර ගැනීමට සමත් විය. ඔහු සිදු කළ දේශපාලනික සේවය පහත පරිදි වර්ග කොට විශ්ලේෂණය කළ හැක.

බොහෝ අංශයන්ගෙන් ගත්කළ, ඔහුගේ චිරකාලීන දේශපාලන ක්‍රියාකලාපය මවිතකර ය. සැකයකින් තොරව ම, ඔහුගේ පාලනය තුළ ලතින් ඇමෙරිකානු කෝඩියෝ (ආඥාදායකයින්) කොටස් අන්තර්ගත වූවා සේම, දේශපාලන විරුද්ධවාදීන් හා සතුරන් ලෙස දැකගත් අය සම්බන්ධයෙන් ඔහු දුෂ්ට පිළිවෙතක් ද ගෙන ගියේ ය. ඒ අතරම, කියුබාවේ පීඩිත ජනතාවගේ මෙන් ම, ජාත්‍යන්තරව බුද්ධිමතුන් හා රැඩිකලීකරණය වූ තරුණයින්ගේ පළල් ස්ථරයන්හි ආකර්ෂණය දිනාගත් මානවවාදී චරිත ලක්ෂණ සහ නො අනුමානව ම පුද්ගලික ජනකාන්තභාවයක් ඔහු සතුව තිබුණේ ය.

රටේ වඩාත් ම පීඩිත ජනතාවගේ සමාජ කොන්දේසි නඟා සිටුවීම සඳහා ක්ෂය වෙමින් පැවතියා වුව ද ප්‍රතික්ෂේප නො කළ හැකි සහයෝගයක් දිනාගත්, 1959 දී ඔහු නායකත්වය දුන් විප්ලවයෙන් පන්නර ගැන්වුනු සැලකිය යුතු මහජන පදනමක්, බලය අතහැරීමෙන් දස වසරකට පසුවත් දිවයින තුළ පවත්වා ගැනීමට කැස්ත්‍රෝ සමත් විය.

දේශපාලන මර්දනය පිළිබඳව කැස්ත්‍රෝ හෙළා දැකීම මත කේන්ද්‍රගත කෙරුනු එක්සත් ජනපද මාධ්‍ය වාර්තා, ඓතිහාසික සන්දර්භයක් තුළ තැබීම අවශ්‍ය ය. සියල්ලට පසුව ශතවර්ෂයක් පුරා දිවෙන කාලපරිච්ඡේදයක් තුළ එක්සත් ජනපදය, ලතින් ඇමෙරිකාව තුළ පමණක් මිනිසුන් ලක්ෂ සංඛ්‍යාවක් ඝාතනය කිරීම සඳහා වගකිවයුතුවන කෙළවරක් නැති ආඥාදායක පාලනයන්ට සහාය දී ඇත. කැස්ත්‍රෝ හා කැස්ත්‍රෝවාදය අවසානය මේ කටුක හා ලේ වැකි ඉතිහාසයේ නිෂ්පාදනය යි.

කැස්ත්‍රෝ සම්බන්ධයෙන් සැලකූ කල ඔහු, සෝවියට් කඳවුරේ සේවාදායකයෙක් වශයෙන් ද තමන්ගේ ම පාලනයේ ස්ථාවරත්වය ආරක්ෂා කිරීමට දැරූ ප්‍රයත්නය තුළ තත්‍ය දේශපාලනයේ ක්‍රියාධරයෙකු වශයෙන් ද කටයුතු කරමින්, ඔහු අභිබවා ගොස් පෙරලා දැමීමට වෑයම් කළ ඒ ලතින් ඇමෙරිකානු ආණ්ඩු සමඟම සබඳතා ගොඩ නඟා ගැනීමට වෑයම් කළේ ය. මෙසේ, චිලී රටේ ෆැසිස්ට්වාදීන් හා මිලිටරිය කම්කරු පන්තිය තලා දැමීමට සූදානම් වෙමින් සිටියදීත් ඔහු, "සමාජවාදය කරා

පාර්ලිමේන්තු මාවත" හුවා දක්වමින් 1971 දී එරට සංචාරය කළේ ය. පේරු හා ඉක්වදෝරයේ මිලිටරි පාලන තන්ත්‍රය අධිරාජ්‍ය විරෝධීන් යයි ප්‍රසංශා කල කැස්ත්‍රෝ, 1968 ශිෂ්‍යයින් සමූල ඝාතනය කිරීම දක්වා ගමන් කළ මෙක්සිකෝවේ පාලක පීආර්අයිහි දූෂිත තන්ත්‍රය වැළඳගැනීමට පවා ක්‍රියා කළේ ය.

කැස්ත්‍රෝගේ පිළිවෙත්වල සමස්ත බලපෑම මෙන් ම ඔහු හුවා දැක්වීමට මුල් වූ දේශපාලන පිළිවෙත්, සමස්ත අර්ධගෝලය පුරා සමාජවාදී විප්ලවය වැළැක්වීමට හේතු කාරක වී තිබේ. උක්ත කරුණු මගින් ඔහුගේ දේශපාලන සේවය පිළිබඳව සක්සුදක් සේ පැහැදිළි වනු ඇත.

**සමාජ සේවාව**

දේශපාලනික වශයෙන් මෙන් ම ආර්ථික වශයෙන් ද ඉතා විශාල සේවාවක් තමන් බලයට පත් වූ රාජ්‍යයට සිදු කළ රාජ්‍ය නායකයෙකු  ලෙස ඔහු හඳුන්වා දිය හැකි අතර සමාජයට ද වටිනා සේවාවන් රාශියක් සිදු කළ රාජ්‍ය බල නායකයෙකු ලෙස කැස්ත්‍රෝ හඳුන්වා දිය හැක. තම රාජ්‍යයේ සිටින ජනතාව වෙනුවෙන් සිදු කළ සමාජ සේවාවන් පහත පරිදි විශ්ලේෂණය කොට පෙන්වා දිය හැක.

ඔහු අධ්‍යාපනය කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ අතර කැස්ත්‍රෝගේ රජය මුල් මාස 30 තුළ පෙර වසර 30 ට වඩා පන්තිකාමර විවෘත කළේ ය. ඔහුගේ ප්‍රධාන අරමුණ වූයේ ජාතිය, පන්තිය හෝ ස්ත්‍රී පුරුෂභාවය නො සලකා සියලු පුරවැසියන් සඳහා සම අධ්‍යාපනයක් ලබාදීමයි. එහිදී කියුබානු ප්‍රාථමික අධ්‍යාපන ක්‍රමය මගින් විශේෂ අධ්‍යාපන වැඩසටහනක් ඉදිරිපත් කළ අතර එම වැඩසටහනෙන්  අඩක් පන්තිකාමරයේ ගත කළ අතර අනෙක් භාගය ඵලදායි ක්‍රියාකාරකමක යෙදුනි. මෙහිදී රජය ගුරු අධ්‍යාපනයට ප්‍රමුඛතාව දී අතිරේක දහස් ගණන් ගුරුවරු පුහුණු කිරීම ආරම්භ කළේ ය. ඔහු 1961 දී පෞද්ගලික පාසල් අහෝසි කළ අතර මෙම ක්‍රියාවලිය මගින් කියුබාවට 96% සාක්ෂරතා අනුපාතයට ළඟා වීමට හැකි විය.

කැස්ත්‍රෝ නොමිලේ වෛද්‍ය ආධාර ලබාදීම සඳහා ග්‍රාමීය සෞඛ්‍ය මධ්‍යස්ථාන සහ නාගරික බහු සායනයන් දිවයින පුරා විවෘත කිරීමත් සමඟ සෞඛ්‍ය සේවා ජනසතු කර පුළුල් කරන ලදී. ළමා රෝග සඳහා විශ්ව එන්නත ක්‍රියාත්මක කළ අතර, ළදරුවන්ගේ මරණ අනුපාතය ක්‍රමානුකූල ලෙස අඩු කරන ලදී. එමෙන්ම ඔහුගේ මෙම සමාජ වැඩපිළිවෙළේ තුන්වන අදියර වූයේ යටිතල පහසුකම් වැඩි දියුණු

කිරීමයි. කැස්ත්‍රෝගේ ආණ්ඩුවේ පළමු මාස හය 6 තුළදී දිවයින පුරා කි.මී.1000 ක මාර්ග ඉදි කර ඇති අතර ජලය සහ සනීපාරක්ෂක ව්‍යාපෘති සඳහා ඩොලර් මිලියන 300 ක් වැය කරන ලදී. ඔහුගේ පාලනයේ මුල් අවධියේ දී අවතැන්භාවය තුරන් කිරීම සඳහා සෑම මසකම නිවාස 800 කට වැඩි ප්‍රමාණයක් ඉදිකරන ලද අතර, ළමුන් සඳහා දිවා සුරැකුම් මධ්‍යස්ථාන සහ ආබාධිත හා වැඩිහිටියන් සඳහා වෙනත් මධ්‍යස්ථාන විවෘත කරන ලදී. 1961 දී ප්‍රථම වතාවට කියුබාවේ රැකියා වියුක්තිය බරපතළ ගැටළුවක් බවට පත් වූ බැවින් කැස්ත්‍රෝ රැකියා විරහිත තරුණ තරුණියන් වෙනත් රටවලට යැව්වේය. කැස්ත්‍රෝ ග්‍රෙනේඩයින් ජනාධිපති මොරිස් බිෂොප් (Grenada President Maurice Bishop) සමඟ මිත්‍ර වී එම රටේ සංවර්ධනයට ආධාර කිරීම පිණිස ගුරුවරුන්, වෛද්‍යවරුන් සහ කාර්මිකයන් යැවීය.

1985 ඔක්තෝබර් මාසයේ දී ඔහුට ලබා දුන් වෛද්‍ය උපදෙස් මත කැස්ත්‍රෝ කියුබානු සුරුට්ටු දුම් පානය කිරීම අතහැර දමා සෙසු ජනතාවට ආදර්ශමත් වීය. 2004 වර්ෂයේදී කැස්ත්‍රෝ විසින් "Mision Milagro" නම් ඒකාබද්ධ වෛද්‍ය ව්‍යාපෘති ආරම්භ කළ අතර එමඟින් සෑම ජාතියක ම පුද්ගලයින් 300,000 කට නොමිලේ අක්ෂි සැත්කම් ලබාදීම අරමුණ විය. 2005 මැයි මාසයේ දී කැස්ත්‍රෝ මිලියන 1.6 ක කම්කරුවන් සඳහා වූ අවම වැටුප දෙගුණයක් කළේ ය. එමෙන්ම විශ්‍රාම වැටුප් වැඩි කර කියුබාවේ දුප්පත් වැසියන්ට නව මුළුතැන්ගෙයි උපකරණ ලබා දුන්නේ ය.

මේ අනුව ඔහුගේ සේවා කාලය දෙස බැලූ විට අපට පෙනී යන්නේ රාජ්‍ය නායකයෙකු වශයෙන් තම ජනතාවට ඉමහත් සේවයක් සිදු කර ඇති බවයි. කියුබානු ජනතාව අදටත් ගෞරවයෙන් ඔහු සිහිපත් කරනුයේ එබැවිනි.

## විදේශ ප්‍රතිපත්තිය

කැස්ත්‍රෝ ප්‍රකාශ කළේ "ඇමරිකා එක්සත් ජනපදය සමඟ වෙළඳාම් කිරීමට අවශ්‍යතාවයක් නො මැති ලොව එකම රට කියුබාව පමණක්" බවයි.

ආරම්භයේ දී කියුබාව ඇමරිකා එක්සත් ජනපදයේ සගයෙකු වූ නමුත් කියුබානු විප්ලවයේ දී ඇමරිකානු ගැති රජය පෙරලා දමා කැස්ත්‍රෝ බලයට පත් විය. කැස්ත්‍රෝගේ පාලනය කියුබාව ස්වාධීන කිරීමත් සමඟ ඇමරිකාව කියුබානු සීනි මිලදී ගැනීම නැවැත්වුවේ ස්වාධීන කියුබාවක් සමඟ ඔවුන් සතුටු නො වීම

හේතුවෙනි. මෙය කියුබාවට විශාල ගැටලුවක් වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස කැස්ත්‍රෝ කියුබානු සීනි මිලදී ගැනීමට පටන් ගත් සෝවියට් සංගමය සමඟ මිත්‍රත්වයක් ඇති කරගත්තේ ය.

'බේ ඔෆ් පිග්ස්' නම් වූ (Bay of Pigs) ආක්‍රමණයෙන් පසු ඇමරිකානු තර්ජනය ගැන බිය වූ කැස්ත්‍රෝ, කියුබාව ආරක්ෂා කරන ලෙස සෝවියට් සංගමයෙන් ඉල්ලා සිටි අතර සෝවියට් සංගමය කියුබාව තුළ මිසයිල කඳවුරක් ඉදි කළ අතර මිසයිල රැගත් නැව් 114 ක් කියුබාව බලා පිටත් කර හැරීය. කැස්ත්‍රෝ විසින් අනුගමනය කරන ලද මෙම පෙරටුගාමී ප්‍රතිපත්තියේ ප්‍රතිඵලයක් වශයෙන්, එක්සත් ජනපද හමුදා සහ සෝවියට් හමුදා අතර උත්සන්න වූ ආතතිය හේතුවෙන් ඔවුහු යුද්ධයකට පවා සූදානම් වූහ.


1962 දී කියුබාව ඇමරිකානු ජනපද සංවිධානයෙන් නෙරපා හරින ලද අතර පසුව බොහෝ ජාතීන් කියුබාව සමඟ සබඳතා බිඳ දමන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස කියුබාව සෝවියට් දේශය සමඟ ශක්තිමත් වෙළෙඳ හා සහයෝගීතා සබඳතා ගොඩනගා ගත්තේ ය. 1960 පෙබරවාරි මාසයේ දී මිකෝයාන් (Mikoyan) සහ කැස්ත්‍රෝ දෙරට අතර ප්‍රථම වෙළඳ ගිවිසුමට අත්සන් තැබූ අතර, ඉදිරි වසර පහ තුළ දී වාර්ෂිකව සීනි ටොන් මිලියනයක් කියුබාවෙන් මිලදී ගන්නා බවට සෝවියට් සංගමය ඔවුන්ට පොරොන්දු විය. ඒ වෙනුවට සීනි ද්වීපතට (කියුබාව) තෙල් හා තෙල් නිෂ්පාදන, වානේ, කඩදාසි, ධාන්‍ය, ඛනිජ පොහොර සහ උපකරණ ලැබුණි. 1960 ජූනි මාසයේ දී රාවුල් කැස්ත්‍රෝ සෝවියට් දේශයට ගිය අතර නිකිටා කෘෂ්චෙව් (Nikita Khrushchev) සමඟ පැවති හමුවක දී පුළුල් මිලිටරි ආධාර වැඩසටහනක් සඳහා එගකත්වයක් ඇති කර ගන්නා ලදී. ජූලි 9 දා, ෆ්ලොරිඩාවේ වැඩි වෙමින් පවතින කඩාකප්පල්කාරී සිදුවීම් සහ කියුබාවට එල්ල වන ප්‍රහාරයක් ගැන පැතිර යන කටකතා වලට ප්‍රතිචාර වශයෙන් කෘෂ්චෙව් එක්සත් ජනපදයට මෙලෙස අනතුරු ඇඟවීය; "සෝවියට් සංගමය කියුබානු ජනතාවට ආධාර කිරීමට අත දිගු කර තිබෙන බැවින් අවශ්‍ය නම් සෝවියට් හමුදාවට කියුබානු ජනතාවට මිසයිල්වලින් ආධාර කළ හැකි ය." අනතුරුව කියුබාවට එකතු වූ තවත් සමාජවාදී රාජ්‍යයක් වූයේ මහජන චීන සමූහාණ්ඩුවයි. කියුබාව සමඟ ඇති කරගත් වෙළඳ ගිවිසුමට අනුව වසර 5ක් තුළ කියුබානු සීනි ටොන් ලක්ෂ 5 ක් ලෝක වෙළඳපොලේ මිලට, මිලදී ගැනීමට බීජිං පොරොන්දු විය.

කියුබාව සම්බන්ධයෙන් එක්සත් ජනපදය ආර්ථික සහ රාජ්‍යතාන්ත්‍රික හුදකලාව වීම යන ප්‍රතිපත්තිය ගෙනයාම නිසාවෙන් කැස්ත්‍රෝ සෝවියට් දේශය සහ අනෙකුත් රටවල් සමඟ හොඳ විදේශ සබඳතාවක් පවත්වාගෙන ගියේ ය. 1982 දී මධ්‍යම ඇමරිකාවේ සහ අප්‍රිකාවේ වාමාංශික සටන්කාමී කණ්ඩායම් සඳහා කියුබාවෙන් සහයෝගය ලබාගැනීම සඳහා ජනාධිපති රොනල්ඩ් රේගන් (Ronald Reagan) කියුබාව ත්‍රස්තවාදයේ රාජ්‍ය අනුග්‍රහකයෙකු ලෙස නම් කළේ ය. ජනාධිපතිවරුන් වන ජෝර්ජ් එච්. ඩබ්. බුෂ් (George H. W. Bush) සහ බිල් ක්ලින්ටන් (Bill Clinton) 1992 දී කියුබා ප්‍රජාතන්ත්‍රවාදී පනත (Cuban Democracy Act) සහ 1996 දී කියුබානු නිදහස සහ ප්‍රජාතන්ත්‍රවාදී සහයෝගිතා පනත (Cuban Liberty and Democratic Solidarity (LIBERTAD) Act) (එක්සත් ජනපද සම්බාධක ශක්තිමත් කළ 'හෙල්ම්ස්-බර්ටන් පනත (Helms-Burton Act)' ලෙසද හැඳින්වේ) අත්සන් කළ අතර කියුබාව කැස්ත්‍රෝ පවුල බැහැර කර මූලික නිදහස තහවුරු කරන ප්‍රජාතන්ත්‍රවාදයකට මාරුවන තුරු පැන වූ සම්බාධක එලෙසින් ම පවතින බව ප්‍රකාශ කළේ ය.

සෝවියට් සමාජවාදී සමූහාණ්ඩුව සමඟ සබඳතාව හැරුණු විට කියුබාවට මැදපෙරදිග රටවල්වල ඊජිප්තුවේ ගමල් අබ්දෙල් නසාර් (Gamal Abdel Nasser) සහ ලිබියාවේ මුවමර් ගඩාෆි (Muammar Gaddafi) වැනි අරාබිවරුන් සමඟ පොදු සම්මතවලට එළඹීමට හේතු තිබුණි. තවද, ලතින් ඇමරිකාවේ වාමාංශික කණ්ඩායම් සඳහා ෆිදෙල් අනුග්‍රහය දුන් අතර එහිදී ඔවුන් මාක්ස්වාදීන්ට සහායෝගය ලබා දුන් අතර නිකරගුවාවේ අනස්ටසියො සොමොසා (Anastasio Somoza) බලයෙන් පහ කිරීම සඳහා සැන්ඩිනිස්ටාස් (Sandinistas) වෙත ආධාර කළහ. ඔහු ලතින් ඇමරිකාව පුරා වාමාංශිකයින්ට දේශපාලන ආභාෂයක් ලබා දුන් අතර එහිදී තෙල් සහ වෙනත් භාණ්ඩ හුවමාරුවක් වෙනුවෙන් මිත්‍ර පාක්ෂිකයන්ට ආධාර කිරීම සඳහා වෛද්‍යවරුන් සහ හමුදා උපදෙස් ලබා දුන්නේ ය.

කියුබාව තවදුරටත් දහස් ගණන් වෛද්‍යවරුන්, ගුරුවරුන්, ඉදිකිරීම් අංශයේ සේවකයින් සහ වෙනත් වෘත්තිකයන් අසල්වැසි අප්‍රිකාව (Africa) වෙත යැවූ අතර නූතන සිම්බාබ්වේහි ගරිල්ලා හමුදාවන්ට පුහුණුව ද ලබාදුන්නේ ය. කියුබාව ද දකුණු අප්‍රිකාවේ වර්ණභේදවාදී හමුදාව පරාජය කිරීම මගින් නැමීබියාවට නිදහස දිනා දීමේ කොටසක්කරුවෙකු බවට පත්විය. මෙම පරාජය වර්ණභේදවාදීන්ට විශාල

බලපෑමක් ඇති කළ අතර එමගින් 'සුදු ජාතිකයන් පරාජය කළ නො හැකි බවට වූ මිථ්‍යාව' තුරන් විය. මෙම ජයග්‍රහණය ගැන නෙල්සන් මැන්ඩෙලා පැවසුවේ ''වර්ණභේදවාදී හමුදාව පරාජය කිරීම දකුණු අප්‍රිකාවේ අරගල කරන ජනතාවට මහත් ආශ්වාදයක් වූ බවයි.''



*නෙල්සන් මැන්ඩෙලා සමඟ ෆිදෙල් කැස්ත්‍රෝ*

නෙල්සන් මැන්ඩෙලා සඳහන් කළේ කියුබානු ජාත්‍යන්තරවේදීන් අප්‍රිකානු නිදහස සහ යුක්තිය සඳහා බොහෝ දේ කර ඇති බවයි. එපමණක් නොව කියුබානු භට පිරිස් යවා ඇත්තේ,

1. සෝමාලියාව සමඟ යුද්ධයේ දී ඉතියෝපියානු හමුදාවන්ට සහාය දැක්වීමට ය.

2. ඇන්ගෝලාවෙහි ඇමරිකා එක්සත් ජනපදය සමඟ සටන් කරමින් සිටිය දී ෆ්‍රිලීමෝ (FREELIMO) නම් කණ්ඩායමට සහාය වීම සඳහා ය.

එපමණක් නොව, විදේශ ප්‍රතිපත්තියේ කොටසක් ලෙස කියුබාව මොස්කව්වල ජ්‍යෙෂ්ඨ හමුදා කණ්ඩායමට (Senior Comrade) සමාව දී මොස්කව් සමඟ සබඳතාව යථා තත්ත්වයට පත් කළේ ය. 1996 දී රුසියානු විදේශ අමාත්‍ය යෙව්ජෙනි ප්‍රීමාකොව් (Yevgeny Primakov) කියුබාවේ සංචාරය මගින් දෙරට අතර සබඳතා යථා

තත්ත්වයට පත් කිරීම පහසු කරන ලද අතර, එම කාලය තුළ රාජ්‍යයන් අතර ආර්ථික සබඳතා වර්ධනය කිරීම සහ කියුබාව සම්බන්ධයෙන් එක්සත් ජනපද ප්‍රතිපත්තිය හෙළා දැකීම පිළිබඳ ප්‍රකාශයන් අත්සන් කරන ලදී. දිවයිනේ කොමියුනිස්ට්වාදීන් හා පූජකයන් අතර ක්‍රමානුකූල එකඟතාවයකට ගෙන ඒමේ ක්‍රියාවලිය හේතුවෙන් 1998 ජනවාරියේ දී දෙවන ජෝන් පෝල් පාප් වහන්සේ (Pope John Paul II) බැහැ දැකීමට හැකි විය.

ෆිදෙල් කැස්ත්‍රෝගේ පාලන කාලය තුළ ඔහුගේ ප්‍රධාන අරමුණ වූයේ කියුබාව ඇමරිකා එක්සත් ජනපදයේ කොටසක් නො වන බවට වග බලා ගැනීමයි. ඒ වෙනුවෙන් ඔහු සිය මුළු ජීවිතයම කැප කළේ ය. එම නිසා, ෆිදෙල් කැස්ත්‍රෝ එක්සත් ජනපදය සමඟ සම්බන්ධ නො වීමට තිබූ එකම අභිලාෂය නිසා වෙනත් රටවල් සමඟ විශේෂයෙන් ම විදේශීය සෝවියට් සංගමය සමඟ හොඳ විදේශ ප්‍රතිපත්ති සහ සබඳතා පවත්වා ගෙන යන ලදී. එයට හේතුව ඇමෙරිකා එක්සත් ජනපදය සමඟ එදිරිවාදිකම් පැවැතීමයි.

## ගත හැකි ආදර්ශ

කියුබානු සමාජවාදී විප්ලවය කියුබානු ඉතිහාසයේ ඉතා වැදගත් සන්ධිස්ථානයක් ලෙස සැලකිය හැකිය. එය අන් සමාජවාදී රටවල් මෙන් නොව ජනතාවගේ කැමැත්ත, දැනුවත්භාවය හා සහයෝගය මත අත් කරගත් ජයග්‍රහණයකි. කුරිරු පාලක බැටිස්ටාගේ රජය පෙරළා දමා සමාජවාදී කියුබාවක් බිහි කරගැනීමට ගෙන ගිය සටන සුළුපටු නො වුවකි. එකී ගමනේ පරාජයන්, ලේ වැගිරීම්, ඇද වැටීම් බොහෝ විය. මෙම දැවැන්ත විප්ලවීය උත්සාහය පිටුපස දැවැන්ත චරිතයක් වේ. ඔහු නමින් ෆිදෙල් කැස්ත්‍රෝ ය. ෆිදෙල් කැස්ත්‍රෝ කුඩා කල සිට ම අන් අයට උදව්-උපකාර කිරීමට හා අන් අයගේ යහපත පිළිබඳ සිත යොමු කළ පරාර්ථකාමී මිනිසෙකි. දුප්පතුන්ගේ ලෝකය පිළිබඳ මනා වැටහීමක් තිබූ ඔහු නිර්ධන පාන්තිකයින් වෙනුවෙන් කොන්දේසි විරහිතව ඉදිරිපත් වූයේ ය. විශේෂයෙන් ම කුඩා අවධියේ සිට ම පැවතුණු ඍජු ගතිගුණ මීට හේතු වී ඇත. තම ස්වාධීන කැමැත්තට අනුව ක්‍රියා කරන්නෙකු වශයෙන් මොහු අගය කළයුතු ය. කෙතරම් වූ අභියෝගයන් තම ජීවිතයට පැමිණිය ද නො පසුබස්නා උත්සාහයකින් යුතුව තම

ජයග්‍රහණයන් සඳහා නො බියව ඉදිරිපත් විය. ඔහු සිතුවේ එම අභියෝගයන් තමා වෙතට එන "දිරිගැන්වීම්" ලෙසිනි.

එමෙන්ම ඔහු නායකත්ව ගුණාංගවලින් හෙබි ඉතාමත් කාර්යශූර පුද්ගලයෙකු විය. තරුණ අවධියේ සිට දේශපාලන ක්‍රියාකරුවෙකු වශයෙන් නිදහස් දේශපාලන වාතාවරණයක් ගොඩනැඟීම වෙනුවෙන් කටයුතු කිරීම තුළින් ඒ බව මනාව පැහැදිලි වේ. විශේෂයෙන් ම 1948 අප්‍රේල් මාසයේ කොලොම්බියාවේ බොගෝටාහි ඇතිවුණු නාගරික කැරළි කෝලාහලවලට පෙරමුණ ගත්තේ මොහු ය. එපමණක් නොව කැස්ත්‍රෝ පුළුල් බුද්ධියකින් හා දුරදක්නා නුවණකින් යුක්ත වූවෙකි. මනා ලෙස අධ්‍යාපනය ලැබුවෙකු වන ඔහු පොතපතේ දැනුම පමණක් නොව සමාජීය දැනුම ද මනා ලෙස ලබා ගත්තේ ය. පොදු ජනතාවගේ අවශ්‍යතාවන් වෙනුවෙන් කැස්ත්‍රෝ තමා ලබාගත් දැනුම ජනතා හිතෛෂී ලෙස භාවිත කළේ ය. ඔහු ජාතිය, පන්තිය හෝ ස්ත්‍රී පුරුෂභාවය නො සලකා සියලු පුරවැසියන්ට සම අයිතිවාසිකම් වෙනුවෙන් ක්‍රියා කළේ ය. දිවයින පුරා ග්‍රාමීය සෞඛ්‍ය මධ්‍යස්ථාන විවෘත කරමින් සෞඛ්‍ය සේවාව ජනසතු කරමින් පොදු ජනතාව වෙනුවෙන් ම තම සේවය නො පිරිහෙලා ඉටු කළ ආදර්ශවත් නායකයකු ලෙස ෆිදෙල් කැස්ත්‍රෝ සඳහන් කළ හැකි ය.

එපමණක් නොව තම දේශපාලන ඉදිරි ගමන තව තවත් අර්ථවත් කරනු පිණිස කැස්ත්‍රෝ නීතිය පිළිබඳව ද උගත්තේ ය. තම අරමුණු සාක්ෂාත් කරගැනීමටත් තම අභිලාෂයන් සාධනීය කරගැනීම පිණිසත් ඔහු තම අධ්‍යාපන කටයුතු සිදු කළේ ය. 1945 දී කැස්ත්‍රෝ, හවානා විශ්වවිද්‍යාලයට ඇතුළත් වී ඉතා ඉක්මනින් ජාතිකවාදය, අධිරාජ්‍ය විරෝධී හා සමාජවාදයේ දේශපාලන මත ඉගෙන ගනිමින් තම දේශපාලන මතවාද පෝෂණය කළේ ය. මෙයින් ඔහුගේ දුරදක්නා නුවණ පිළිබඳ මනාව පැහැදිලි වේ.

ෆිදෙල් කැස්ත්‍රෝ කුඩා කල සිටම තම පියාට ගරු කළ අයෙකු විය. එබැවින් ෆිදෙල් කැස්ත්‍රෝ එන්ජල් කැස්ත්‍රෝගේ ප්‍රියතම පුත්‍රයා විය. ෆිදෙල් කැස්ත්‍රෝ තම අධ්‍යාපන කටයුතු කරන අතරතුර බාහිර කුසලතා ගොඩනැංවීම කෙරෙහි ද උනන්දුවක් දැක් වූ පුද්ගලයෙකි. විශේෂයෙන් ම මොහු බේස්බෝල් ක්‍රීඩාවට උනන්දුවක් දැක්විය. ඒ අනුව තම අධ්‍යාපනික දැනුම ලබා ගැනිමත් සමඟ බාහිර ක්‍රියාකාරකම් වෙත ද ඔහුගේ අවධානය යොමුව තිබුණි.

විශේෂයෙන් ම කැස්ත්‍රෝ දූරදක්නා නුවණකින් යුක්ත වන අතර චතුර ලෙස කථා කිරීම, ගාම්භීර පෞරුෂත්වය, ජනතා හිතෛෂී භාවය වැනි ලක්ෂණ ඔහු තුළින් මනාව පිළිබිඹු වේ. කැස්ත්‍රෝ තම කාර්යයන් මනා සංවිධානයකින් යුතුව සැලසුම් කොට තම කටයුතු මෙහෙයවන්නෙකු විය. කැස්ත්‍රෝ ඔහුගේ ආකල්පයන් නිසා ජනතාව අතර ඉතා ජනප්‍රියත්වයට පත් විය. සන්තියාගෝහි මොන්කාඩා හමුදා බැරක්කවලට පහර දීම උදෙසා පිරිස මෙහෙයවීම තුළින් කැස්ත්‍රෝගේ ගාම්භීර පෞරුෂය පිළිබිඹු වේ. එපමණක් නොව එවකට පැවති කියුබානු රජය පෙරළා දමා තම විප්ලවය සාර්ථකව දියත් කිරීමට ඔහු මුල සිට ම මනා ලෙස සැලසුම් කිරීම හරහා කැස්ත්‍රෝගේ සංවිධාන ශක්තිය පැහැදිලි වේ.

තවත් විශේෂ කරුණක් නම් ෆිදෙල් කිසි විටෙකත් වැරදිකරුවන්ට එරෙහිව කෝපයෙන් හඬ නො නැඟූ අතර ඔහුගේ ජයග්‍රාහී කතාවන්හිදී ඔහු පරාජයට පත් වූවන්ට වචනයකින් හෝ අවමන් කළේ නැත. පරාජිත සෙබළුන් හා නිලධාරීන් කෝප කළ හැකි හෝ ඔවුන්ගේ ගෞරවයට හානි වන ආකාරයේ එකදු වදනක්වත් පැවසුවේ නැත. දිගු කලක් බලා සිටි හා වෙහෙස මහන්සි වී ලබා ගත් ජයග්‍රහණය ගැන තම සගයින් කැඳවා ඔවුන්ට සුභ පැතූ අතර විප්ලවයට මුහුණ දෙන කාර්යයේ සංකීර්ණභාවය කියුබානුවන්ට කියා දී වෙහෙස නො බලා වැඩ කිරීම හැර වෙනත් විකල්පයක් ඉතිරි නො වූ බව ෆිදෙල් පෙන්වා දුන්නේ ය.

ෆිදෙල් කැස්ත්‍රෝ විප්ලවයේ මුල් දිනවල සිය දහස් ගණන් පුරවැසියන්ගෙන් තම තීරණ සඳහා කැමැත්ත ලබා ගැනීමට අලෙවිකරණ හා ප්‍රචාරක න්‍යාය අනුගමනය කළ අතර එය දශක ගණනාවක් තිස්සේ නිතර භාවිත කළේ ය. කැස්ත්‍රෝ මහජනතාව අමතා කළ කතාවේ දී බයිබලයෙන් පාඨ උපුටා දක්වමින් සේවකයාට සහ ගොවියාට තේරුම් ගත හැකි සරල භාෂාවක් භාවිත කළේ ය.

ෆිදෙල් කැස්ත්‍රෝ නිතර ම අන් අය සමඟ සහයෝගයෙන් කටයුතු කළ අතර අන් අයගේ මත වලට සවන් දෙමින් ඔවුන්ගේ ද අදහස් අනුව යමින් තම සැලසුම් ශක්තිමත් කළේ ය. විශේෂයෙන්ම චේ ගුවේරා වැනි දේශපාලන චින්තකයන්ගේ අදහස් සමඟ තම මතවාදයන් හුවමාරු කරගනිමින් කැස්ත්‍රෝ තම අරගලය සාර්ථකව මෙහෙය වූයේ ය. එපමණක් නොව ජනතා හිතවාදී, යහපත්, ආදර්ශවත් පුද්ගලයකු විය. එබැවින් ෆිදෙල් කැස්ත්‍රෝගේ මරණයෙන් පසුව ද එරට ජනතාව එතුමන්ව ගෞරවයෙන් සිහිපත් කරති.

## සාරාංශය

"මිනිසුන් ඉතිහාසය තනන අතර ඉතිහාසය මිනිසුන් තනයි" - ෆිදෙල් කැස්ත්‍රෝ

කියුබානු විප්ලවය පිටුපස සිටි දැවැන්ත චරිතයක් වූ ෆිදෙල් කැස්ත්‍රෝ තමන්ගේ සහෝදරයා වන රාවුල් හට තම කටයුතු පවරා දී 2016 නොවැම්බර් 25 දින මෙලොව හැර ගියේ ය. එකල කියුබාවේ පැවැති කුරිරු බැසිස්ටාගේ රජය පෙරලා දමා සමාජවාදී කියුබාවක් බිහි කිරීමට කැස්ත්‍රෝගේ නායකත්වය යටතේ ඉතා දිගු විප්ලවීය ගමනක් දියත් කරන්නට යෙදුණි. හෙතෙම තම ජීවිත කාලය තුළ කියුබානුවන්ගේ නිදහස වෙනුවෙන් සටන් කළ අතර බටහිර බලවේගයන්ට ගැති නොවී ඔවුන්ට විරුද්ධව නැගී සිටීමට කියා දුන් විශිෂ්ට නායකයෙකි.

ඔහුගේළමා කාලය පිළිබඳව සලකා බැලීමේදී පෙනී යන්නේ ඔහු කුඩා අවධියේ සිටම ඍජු ගති ගුණවලින් යුතු විප්ලවකාරී චරිතයක් බවයි. ෆිදෙල් කුඩා කාලයේ සිට හිතුවක්කාර ගති ස්වභාවයකින් යුක්ත වූව ද කිසිදා වැරදි ක්‍රියාවන් අනුමත නො කළේ ය.

හෙතෙම දේශපාලනයට පිවිසීමෙන් බලාපොරොත්තු වූයේ පිරිසිදු නිදහස් කියුබාවක් නිර්මාණය කිරීමයි. ඒ වෙනුවෙන් ඔහු විප්ලවීය සංග්‍රාමය තුළින් බටහිරට ගැති පාලනය අවසන් කරමින් දකුණු ඇමෙරිකාව තුළ එක්සත් ජනපදය සමඟ ගැටීමට ශක්තිසම්පන්න කොමියුනිස්ට්වාදී හෙවත් සමාජවාදී කියුබාවක් නිර්මාණය කිරීමට සමත් විය. කියුබානු විප්ලවය සාර්ථක කරගනිමින් සමාජවාදී වූ කියුබාවක් බිහිකිරීම සඳහා කැස්ත්‍රෝගේ ජව සම්පන්න නායකත්වය සහ නො පසුබස්නා උත්සාහය ප්‍රධාන වශයෙන් ම හේතු විය.

ඒ අනුව ඉතා දිගු විප්ලවීය ගමනක කෙළවර සියලු බාධක ජයගෙන, කැස්ත්‍රොගේ නායකත්වය යටතේ 1959 දී නව සමාජවාදී කියුබාවක් බිහිවිය. නායකත්වයට පත්වීමෙන් අනතුරුව අධිරාජ්‍යවාදය සහ ධනවාදය විසින් අරක්ගත් කියුබාව සමාජවාදී රාජ්‍යයක් බවට පත් කිරීමට කැස්ත්‍රෝ මූලිකත්වය ගෙන කටයුතු කරන ලදී. මොහුගේ නායකත්වය යටතේ කියුබාව තුළ සමාජීය, ආර්ථික, සහ දේශපාලනික වශයෙන් පෙරළියක් ඇති විය. කැස්ත්‍රෝ ආ ගමන් මඟ පිළිබඳව සලකා බැලීමේදී පැහැදිලි වන්නේ, රාජ්‍ය නායකයෙකුට සිය රාජ්‍යය සහ පුරවැසියන් වෙනුවෙන් ඉටු කළ හැකි උපරිම සේවය ඔහු විසින් ඉටුකර ඇති බවයි.

ෆිදෙල් කැස්ත්‍රෝ දේශිය පමණක් නොව විදේශිය මට්ටමින් ද යහපත්ව ක්‍රියා කළ විශිෂ්ට ගණයේ නායකයෙකි. ඔහුට අවශ්‍ය වූයේ එකල ජාත්‍යන්තර පද්ධතිය තුළ පැවති බටහිර ආධිපත්‍යයට ගැති නො වූ, ප්‍රබල රාජ්‍යයක මට්ටමට කියුබාව නගා සිටුවීමයි . ඒ සඳහා  විශේෂයෙන්ම ඔහු සෝවියට් සංගමයත් සමඟ කුළුපගව ක්‍රියා කළ අතර නෙල්සන් මැන්ඩෙලා වැනි ප්‍රසිද්ධ නායකයන් සමඟ ද කිට්ටු ඇසුරක් පැවැත්වීය. කැස්ත්‍රෝ බටහිරට ගැති නො වූ රාජ්‍ය පාලනයක් ගෙන ගිය, නිදහස්, ස්වාධීන කියුබාවක් වෙනුවෙන් සටන් කළ ශ්‍රේෂ්ඨ නායකයෙකි.

## මූලාශ්‍ර නාමාවලිය

Aleksandr Gugnin, G. O. Y. L., 2019. Fidel Castro as a leader, revolution manager, and marketer. [Online]
Available at: https://www.researchgate.net/publication/333575199_Fidel_Castro_as_a_leader_revolution_manager_and_marketer
[Accessed 30 Aug 2021].

BBC News, 26 November 2016. Fidel Castro, Cuba's leader of revolution, dies at 90. [Online]
Available at: https://www.bbc.com/news/world-latin-america-38114953
[Accessed 09 09 2021].

Britannica, T. E. o. E., Aug 9, 2021. Fidel Castro:political leader of Cuba. [Online]
Available at: https://www.britannica.com/biography/Fidel-Castro
[Accessed 05 09 2021].

Caistor, N., 2013. Fidel Castro. First ed. London ec1v 0dx, uk: Reaktion Books Ltd.

Sinclair, A. A., n.d. Che Guevara:Argentine-Cuban revolutionary. [Online]
Available at: https://www.britannica.com/biography/Che-Guevara
[Accessed 25 08 2021].

# ජොසේ මුජිකා



**කණ්ඩායම් සාමාජිකයින් :**

- අයේෂා ගිම්හානි
- චමිදි දයාරත්න
- ඉසුරු ප්‍රේමරත්න
- මිගාර මහෞෂධ

# හැඳින්වීම

"ජනාධිපති" යන නාමය ඇසූ කල්හි අප සිත් තුළ මැවෙන්නේ ඉතා බලසම්පන්න මෙන් ම සුඛෝපභෝගී ජීවිතයක් ගත කරනු ලබන පුද්ගලයෙකුගේ චිත්තරූපයකි. එහෙත් උරුගුවේ (Uruguay) ජනාධිපති අපගේ එම සංකල්පය නිතැතින් ම බිඳදමන අතර ලෝකයේ විසූ ජනාධිපතිවරුන් අතරින් ඉතා සරල දිවිපෙවතක් ගත කළ ජනාධිපතිවරයෙක් වශයෙන් ඔහුව හැඳින්විය හැක. ඔහු ජොසේ මුජිකා (Jose Mujica) නම් වේ. තවමත් මිහිපිට ජීවත්වෙන අතිශයින් ම පරමාදර්ශී චරිතයක් ලෙස ජොසේ මුජිකා හඳුන්වාදිය හැක.

ජොසේ මුජිකා අග්‍රගන්‍ය දේශපාලනඥයෙකි. කෙසේ නමුත් ඔහු, ලොව දිළිඳුම ජනාධිපතිවරයා (World's Poorest President) ලෙසද හැඳින්වේ. මොහු තම මාසික වේතනයෙන් 90% ක් පමණ අඩු ආදායම්ලාභී සහ කුඩා ව්‍යාපාර හිමියන් වෙත බෙදා දුන් අතර ඉතිරි 10% ක ප්‍රමාණය තම කුටුම්බයේ වියදම් උදෙසා වැය කරමින් ඉතා සරල දිවිපෙවතක් ගතකරන්නෙක් විය. දුප්පත් ගොවි පවුලක උපත ලද මුජිකා, ජනාධිපති තනතුර ලැබීමට පෙර සිට ම මානුෂවාදී ක්‍රියාකාරකම්වල නිරතවෙමින් ජනතාවගේ සුභ සිද්ධිය උදෙසා ක්‍රියා කළ අතර ජනාධිපති ධූරය ලැබූ පසුව ද එම ක්‍රියාපිළිවෙත අත් නොහල අපූර්ව නායකයෙකි.

ඉතා සරල සහ සෘජු මතවාද දරන මෙම විශ්මිත මිනිසා සතු ව තිබූයේ අවුරුදු 30 කට වඩා පැරණි මෝටර් රථයකි. ඔහුගේ ආරක්ෂාවට යොදාගනු ලැබුවේ ආරක්ෂක නිලධාරීන් දෙදෙනෙකු පමණි. මුජිකා රටේ දිළිඳු ජනතාවගේ සුභ සිද්ධිය සඳහා දීර්ඝ කාලයක් අරගල කළ සටන්කාමියෙකි, අවි දරා සිටි කැරලිකරුවෙකි. භෞතික ව දුප්පත් වුව ද ඔහු ආධ්‍යාත්මික ව පොහොසත් මිනිසෙකි. වසර එකොළහක් සිරගෙයක හුදෙකලාව ම කාලය වැය කළ ඔහු එම කාලය ඔහුගේ චින්තනය තීව්‍ර කරගැනීමට කටයුතු කළේය.

මෙවන් වටිනා පුද්ගලයෙකුගේ චරිතාපදානය සියලුම ලෝකවාසීන්ට වැදගත්වන හෙයින් මෙම පරිච්ඡේදය තුළින් උරුගුවේ ජනාධිපති ජොසේ මුජිකාගේ ළමා කාලය හා අධ්‍යාපනය, ඔහු දේශපාලනයට පිවිසීම, නායකත්වය කරා ගිය ගමන්මග,

නායකත්වයට පැමිණීමෙන් පසු සිදු කළ සේවාව, ඔහුගේ විදේශ ප්‍රතිපත්තිය සහ ඔහුගේ ජීවිතයෙන් ගත හැකි ආදර්ශ පිළිබඳ ව ගෙනහැර දක්වනු ලැබේ.

## ජොසේ මුජිකාගේ ළමා කාලය, අධ්‍යාපනය හා දේශපාලනයට පිවිසීම

**ළමා කාලය**

ජොසේ මුජිකා උපත ලබන්නේ විසිවන සියවසේ පළමු අර්ධය තුළයි. වර්ෂ 1840 දී පමණ ස්පාඤ්ඤයේ සිට උරුගුවේ වෙත සංක්‍රමණය වූ බැස්කුවේ පරම්පරාවට මුජිකා අයත් වේ. ඔහුගේ මුතුන් මිත්තන් ස්පාඤ්ඤයේ (Spain) මුජිකා නගර සභාවට අයත් බිස්කෝ (Bizco) සිට උරුගුවේ වෙත සංක්‍රමණය වී ඇත. මුජිකා වර්ෂ 1935 මැයි මස 20 වනදා උරුගුවේ මොන්ටිවිඩියෝ (Montevideo) අගනගරය ආසන්නයේ පාසො දෙ ලා අරිනා (Paso de la Arena) නම් නියම් නගරයේ දී උපත ලැබී ය. ඒ දිමිත්‍රියෝ මුජිකා (Demetrio Mujica) සහ ලුසී කොර්දානෝ (Lucy Cordano) නම් යුවළට දාව ය.

දිමිත්‍රියෝ කෘෂිකර්මාන්තය ප්‍රධාන ජීවනෝපාය කොටගෙන ජීවත් වූ අතර ඔහු සුළු ඉඩම් හිමි වැවිලිකරුවෙකු වේ. ගොවිපළ දියුණු කිරීමට වෙහෙස මහන්සි වී කටයුතු කළ දිමිත්‍රියෝ ඒ සඳහා බැංකු ණයක් ලබාගත්ත ද ගොවිපොළින් සිතූ තරම් ලාබ නොලැබීම හේතුවෙන් බංකොලොත්භාවයට පත් පත්වීමෙන් සිත් තැවුලට පත් ඔහු මුජිකාට අවුරුදු 5ක් වන විට මිය ගියේ ය. පියාගේ මරණයත් සමඟ මුජිකාගේ ළමාවිය මහත් දුෂ්කරතාවයන්ගෙන් පිරුණු කාලයක් විය. තම පවුලේ ජීවනෝපාය සරු කිරීම සඳහා සහය දැක්වීමට කුඩා මුජිකාට සිදුවිය. මේ හේතුවෙන් මුජිකාගේ ළමා කාලය ඉතා දුෂ්කර කාලපරිච්ඡේදයක් බවට පත්විය.

මුජිකාගේ අධ්‍යාපන පසුබිම සලකා බලන විට ඔහු තමා පදිංචි ව සිටි ප්‍රදේශයේ පිහිටි රජයේ පාසලකින් ප්‍රාථමික අධ්‍යාපනයත්, ද්විතියික අධ්‍යාපනයත් සම්පූර්ණ කර ඇති අතර ද්විතියික අධ්‍යාපනයෙන් පසු ඔහු උසස් අධ්‍යාපනය හැදෑරීම සඳහා නීති විද්‍යාලයට ඇතුළත් වුව ද ඔහුට නීති උපාධිය සම්පූර්ණ කිරීමට නොහැකි වුණි.

ජොසේ මුජිකා පාපැදි පැදීමට ඉතා දක්ෂයෙක් වූ අතර විවිධ පාපැදි සමාජවලට එකතු වී පාපැදි තරඟ සඳහා ඉදිරිපත් වී ජයග්‍රහණ අත්පත්කර ගැනීමට සමත් විය.

**දේශපාලනයට පිවිසීම**



*මුජිකා 1985 සිරගෙදරින් නිදහස්වූ දිනය*

ජොසේ මුජිකා දේශපාලනයට පිවිසියේ ඉතා ම තරුණ අවධියේ ය. ඇන්ගල් කොර්දානෝ (Angel Cordano) නම් ඔහුගේ මාමා මුජිකාගේ මව් පසින් නෑදෑයෙකු වූ අතර ජාතික පක්ෂයේ (Partido Nacional Party) සාමාජිකයෙකු ද විය. මුජිකා දේශපාලනය පිළිබඳ හැදෑරීමට අත්පොත් තැබුවේ ඔහුගේ මඟ පෙන්වීමෙනි. තරුණ මුජිකා ජාතික පක්ෂයේ ප්‍රබල මන්ත්‍රීවරයෙකු වූ එන්රික් ඒරෝ (Enrique Erro) හඳුනාගනු ලබන්නේ 1956 වර්ෂයේදී ය. මෙම හඳුනා ගැනීමත් සමඟ මුජිකා ජාතික පක්ෂයට සම්බන්ධ වී ක්‍රියාකාරී සාමාජිකයෙකු ලෙස කටයුතුකොට එම පක්ෂයේ තරුණ සංගමයේ මහ ලේකම් ධූරයට පත්විය.

ජාතික පක්ෂයේ සාමාජිකත්වයත් සමඟ ඔහු ක්‍රියාකාරී දේශපාලනයට පිවිසි අතර වර්ෂ 1962 දී මුජිකා හා ඒරෝ යන දෙදෙනා ම ජාතික පක්ෂයෙන් ඉවත් වී උරුගුවේ තිබූ සමාජවාදී පක්ෂය හා වෙනත් කුඩා දේශපාලන කණ්ඩායම් සමඟ එකතු වී දේශපාලන කටයුතුවල නිරත වූ අතර ඉන් පසවු ඔවුහු මෙම කණ්ඩායම් එකතුකොට දේශපාලන පක්ෂයක් පිහිටුවා ගත්හ. එම පක්ෂය ජනතා පක්ෂයයි. මෙම ජනතා පක්ෂය මගින් ජනාධිපතිවරණය සඳහා අපේක්ෂකයෙකු ඉදිරිපත් කළද ඔහුට ලබාගත හැකිවූයේ මුළු ඡන්ද ප්‍රමාණයෙන් 2% හෝ 3% ක ඡන්ද ප්‍රතිශතයක් පමණි.

ඉන්පසු මුජිකාගේ දේශපාලන දිවිය නවත ම මාවතකට යොමු විය. 1960 දශකයේ මුල් භාගයේ ආරම්භ කරන ලද විප්ලවවාදී සංවිධානයක් වූ ටුපමාරෝස් ජාතික විමුක්ති ව්‍යාපාරයට **(**Tupamaros National Liberation Movemen**t)** ජොසේ මුජිකා 1996 දී සම්බන්ධ වූ අතර එම ව්‍යාපාරය තුළින් ඔහු විප්ලවකාරී කැරලිකරුවෙකු බවට පත්විය. එම සංවිධානය මගින් උරුගුවේ තුළ පැවති දරුණු හා පීඩාකාරී මිලිටරි ආණ්ඩුවට එරෙහිව සටන් කළ අතර, මුජිකා ද මෙහි සාමාජිකත්වය ගැනීමෙන් පසු ආණ්ඩුවට එරෙහි ගරිල්ලා සටන් කිහිපයකට ම ක්‍රියාකාරී ව සහභාගි විය. ටුපමාරෝස් ජාතික විමුක්ති ව්‍යාපාරයේ සාමාජිකත්වය ගෙන වසර තුනකට පසු ඔහු පැන්ඩෝ  නගරය (Pando City) අත්පත් කර ගැනීමේ මෙහෙයුමේ දී එක් ගරිල්ලා භට කණ්ඩායමක් මෙහෙයවා තිබේ .

මෙහි දී භට කණ්ඩායම් හයක් එක් ව පැන්ඩෝ නගරයට පහර දුන් අතර මුජිකාට භාර ව තිබුණේ නගරයේ දුරකථන සන්නිවේදන හුවමාරු මධ්‍යස්ථාන අත්පත් කර ගැනීමයි. මෙම ක්‍රියාවලිය හේතුවෙන් මුජිකා පොලිස් අවධානයට ලක් වූ අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් ඔහුට සැඟවී සිටිමින් ටුපමාරෝස්හී ක්‍රියාකාරකම්වලට සම්බන්ධවීමට සිදුවිය. ටුපමාරෝස් සංවිධානය වසර කිහිපයක් තුළ උරුගුවේ රාජ්‍ය තුළ වඩාත් ප්‍රචලිත ව්‍යාපාරයක් බවට පත් විය. එමඟින් දේශපාලන පැහැරගැනීම් මෙන් ම  පොලිස් නිලධාරීන් ගණනාවක් හා විශේෂ සිවිල් පුද්ගලයින් ඝාතනය කිරීම ඇතුලු ප්‍රචණ්ඩ ක්‍රියා රාශියක් සිදුකිරීම නිසා රට තුළ මහත් ආන්දෝලනයට පත් දේශපාලන ව්‍යාපාරයක් බවට පත්වී තිබේ. මේ හේතුවෙන් එවකට ජොර්ජේ පැචේකෝ ඇරෙකෝගේ (Jorge Pacheco Areco) රජය යටතේ උත්සන්න වූ විමුක්ති සටන්කාමීන්ගේ ක්‍රියාකාරකම් මැඩපැවැත්වීම සහ රටේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා විශේෂ පනතක් සම්මත කරන ලදී. එහි මූලික අරමුණ වූයේ මෙම කැරලිකාරී සටන්වලට මුහුණ දීම සහ රජයේ ආර්ථික පිළිවෙළට එරෙහි ව පවත්වාගෙන ගිය වෘත්තීය සමිති අරගල මැඩපැවැත්වීමයි.

රජයේ මෙම ප්‍රතිපත්තිය යටතේ ක්‍රියාකාරී විමුක්තිකාමියෙකු වූ මුජිකා ද වරදකරුවෙකු වූ අතර ඔහු හය වතාවක්  මෙම ගරිල්ලා සටන් අතරතුර වෙඩිපහරවලට ලක් ව ජීවිතය බේරාගත්තේ ය. එසේම මුජිකා සිව්වරක් සිරභාරයට පත් වූ අතර එයින් දෙවරක් ම සිරගෙයින් පැන ගොස් සැඟ වී කටයුතු කළේ ය.

එහෙත් ඔහුට 1971 වර්ෂයේදී පොලිස් නිලධාරියෙකු ඝාතනය කිරීමේ වරදට වරදකරු වීම හේතුවෙන් වසර 13 ක කාලයක් සිර දඬුවම් විඳීමට සිදුවිය. 1973 ජුනි මාසයේ දී කුමන්ත්‍රණයකින් බලය අල්ලාගත් කුරිරු මිලිටරි ඒකාධිපති පාලකයන් ටුපාමාරෝස් විමුක්ති ව්‍යාපාරයේ නායකයින් සිරභාරයට ගෙන ප්‍රාණ ඇපකරුවන් ලෙස රඳවාගත් අතර, සිරභාරයේ සිටි මුජිකා ද ප්‍රාණ ඇපකරුවෙකු බවට පත්විය. මෙහි දී "යුධ අවි අතට ගෙන විමුක්ති ව්‍යාපාරය කටයුතු කළහොත් ප්‍රාණ ඇපකරුවන් මරා දමන බවට" රජය කළ තර්ජනය යටතේ ඔවුන් තනි තනිව සිරගෙවල්වල රඳවා ගත් අතර, එහිදී මුජිකා ඉතා කුරිරු වදහිංසාවලට ලක් විය. වසර දෙකකට අධික කාලයක් ළිඳක පතුලෙහි කාලය ගෙවීමට ඔහුට සිදු විය. මේ තුළින් මුජිකා දැඩි හුදෙකලා තත්වයකට පත්වූ අතර එය දරාගත නොහැකි ව ඔහුට ශාරීරික හා මානසික රෝගී තත්වයන්ගෙන් පීඩා විඳීමට සිදුවිය. මෙම තත්වයෙන් මිදීමට ඔහු දැඩි ප්‍රයත්නයන් දැරුවේය. මුජිකා තමාට ලැබෙන සුළු පාන් සලාකය වුවද එහි සිටි මීයන් සමඟ බෙදා ගනිමින් ඔවුන් තම මිතුරන් බවට පත් පත්කරගෙන තිබේ. මෙතුළින් සිරගෙය තුළ තිබූ හුදෙකලා බව යම්තාක් දුරට හෝ අවම කරගැනීමට ඔහුට හැකි විය. පසුකාලීන ව වෛද්‍ය නිර්දේශ මත මුජිකාට පොතපත කියවීමට අවකාශය සැලසුණි. එහි දී ඔහු වැඩි වශයෙන් භෞතික විද්‍යා පොත්පත් පරිශීලනය කිරීමට රුචිකත්වයක් දක්වා ඇත.

උරුගුවේ තුළ පූර්ණ ප්‍රජාතන්ත්‍රවාදය නැවත ස්ථාපිත කිරීම සඳහා වර්ෂ 1980 දී පවත්වන ලද ජනමත විචාරණය අසාර්ථක වීමත් සමඟම නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සඳහා වූ එක් පියවරක් බිඳ වැටුණි. ඉන් පසුව දිනෙන් දින වර්ධනය වන ආර්ථික අර්බුදයන් හේතුවෙන් 1985 දී පැවති පාලන රජය නැවත ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් ගෙන ඒමට සාකච්ඡා පැවැත්වීය. එම සාකච්ඡාවල ප්‍රතිඵලයක් ලෙස ඇති වූ ප්‍රජාතන්ත්‍රවාදී පසුබිමත් සමඟ 1962 ජනවාරි මස සිට සිදු කළ සියලු ම දේශපාලන, සාමාන්‍ය හා යුධ අපරාධවල වරදකරුවන්ට පොදු සමාවක් ලබා දීම සඳහා වර්ෂ 1985 ජනවාරි මස 8 වනදා නව නීතියක් පනවන ලදී. මෙම නීතිය යටතේ ජොසේ මුජිකා හා අනෙකුත් සියලුම දේශපාලන සිරකරුවන් හට නිදහස හිමිවිය.

සිරභාරයෙන් නිදහස ලැබූ පසු මුජිකා ඇතුළු අනෙකුත් විමුක්ති නායකයෝ එක් වී නව දේශපාලන පක්ෂයක් ආරම්භ කර එයට අනෙකුත් වාමාංශික දේශපාලන පක්ෂ ද එකතුකොට ජනතා සහභාගීත්ව ව්‍යාපාරය (Movement of Popular Participation) නමින් නව දේශපාලන පක්ෂයක් පිහිටුවී ය. මෙම පක්ෂය පසුව

පුළුල් සංධානයක් බවට පත් විය. 1985 දී ජාතික පක්ෂය බලයට පත් වූ අතර එහි මන්ත්‍රීවරයෙකු වූ එන්රික් ඊරෝ හට කම්කරු ඇමති ධූරය හිමිවිය. ඊරෝ සමග පැවති සුහදශීලිත්වය හේතුවෙන් මුජිකා අමාත්‍යාංශයේ සිවිල් සේවකයෙකු නොවූව ද අමාත්‍යවරයා සමඟ ඉතා සමීප ව කටයුතු කර තිබුණේ ය. මෙලෙස ක්‍රියාකාරී දේශපාලනය තුළ නිරත වූ මුජිකා 1994 මහ මැතිවරණයේ දී මොන්ට්වීඩියෝ අගනගරය නියෝජනය කරමින් මහජන මන්ත්‍රී මණ්ඩලයට තේරී පත්විය.

තම මාමාගේ අභාශය මත දේශපාලනයට අත්පොත් තැබූ මුජිකා, වසර කිහිපයක් තුළ රැඩිකල් වාමාංශික දේශපාලන ක්‍රියාකරුවෙකු බවට පත් වී සිදුකරන ලද සටන්කාමී ක්‍රියාකාරකම් හේතුවෙන් වසර 15 කට ආසන්න කාලයක් සිර දඬුවම් ද ලැබ අවසානයේ ඔහු උරුගුවේ ක්‍රියාකාරී ප්‍රධාන දේශපාලන ව්‍යුහය වෙතට සම්ප්‍රාප්ත විය.

## නායකත්වය කරා ගිය ගමන් මග

උරුගුවේ තුල ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන පරිසරයක් ඇති වූ පසු පැවැත් වූ ප්‍රථම මැතිවරණයේ දී ජනතා සහභාගීත්ව ව්‍යාපාරය (Movement of Popular Participation) නම් දේශපාලන පක්ෂයෙන් මුජිකා 1994 දී මොන්ට්වීඩියෝ අගනගරය නියෝජනය කරමින් මහජන මන්ත්‍රී මණ්ඩලයට තේරී පත්විය. එය ජොසේ මුජිකාගේ ජනාධිපතිධූරය කරා යාමේ ප්‍රථම පියවර විය. මුජිකා 1995 සිට 2000 දක්වා කාලයේ දී මහජන මන්ත්‍රී මණ්ඩලය තුළ සේවය කළේ ය. එහිදී මුජිකා සමාජය වෙනුවෙන් කළ සේවාව සහ ඔහු සතු ව ඇති මනා පෞරුෂය නිසා විශාල ජනතා ප්‍රසාදයක් හිමිකර ගැනීමට සමත් විණි. මෙම ප්‍රසාදය තම දේශපාලන ගමනට මනා පිටිවහලක් කරගත් මුජිකා වර්ෂ 1999 දී ඉහළ මන්ත්‍රී මණ්ඩලය වූ සෙනට් සභාවේ අසුනක් හිමි කරගත්තේය. මේ සමඟ ඔහුට අයත් දේශපාලන පක්ෂය වූ ජනතා සහභාගීත්ව පක්ෂය උරුගුවේ තුළ තම බලය පිහිටුවීමට අවශ්‍ය මූලික පාදම සකස්කිරීමට කටයුතු සිදු කරමින් සිටියේය.

මුජිකාගේ පක්ෂය මඟින් ඊළඟ මැතිවරණය ජයග්‍රහණයට අවශ්‍ය කටයුතු සකස් කරමින් සිටි නිසා 2004 වර්ෂයේ පැවති මහ මැතිවරණයෙන් මුජිකාගේ දේශපාලන

පක්ෂය ඡන්ද මිලියන තුනක ජයග්‍රහණයක් හිමිකරගත් අතර එය රටේ සමස්ත ඡන්ද ප්‍රමාණයෙන් ලැබූ වැඩි ම ඡන්ද ප්‍රතිශතය විය. මෙම මැතිවරණයේදී සමාජවාදී ටාබර් වාස්කස් (Tabaré Vázquez) නැමැත්තා ජනාධිපති අපේක්ෂකයා ලෙස මැතිවරණයට සහභාගී වූ අතර ජයග්‍රහණයෙන් පසු ඔහු ජනාධිපති ලෙස තේරී පත්විය. වාස්කස් විසින් මුජිකාව 2005 මාර්තු මස 09 වෙනිදා කෘෂිකර්ම සහ සත්ව පාලන ඇමති ධූරයට පත් කළේය. එම අමාත්‍යධූරය හිමිවීමට පෙර ඔහු පෙබරවාරි මාසයේදී සෙනෙට් සභාවේ නායකයා වශයෙන් දිව්රුම් දුන්නේ ය. මෙලෙස අවස්ථා කිහිපයක දී මුජිකා මහ සභාවේ සෙනෙට් සභිකයින්ගේ නායකයා වශයෙන් කටයුතු කළේ ය.

මෙම මැතිවරණයෙන් මුජිකා තම දේශපාලන පක්ෂයේ වැඩි ම ඡන්ද සංඛ්‍යාව හිමි ලැයිස්තුවේ ප්‍රථම ස්ථානයට තේරී පත් ව තිබුණි. ජොසේ මුජිකා අමාත්‍ය ධූරයට පත්වූ පසු ඔහුගේ උප අමාත්‍ය ධූරයට තේරී පත් වූයේ කෘෂි විද්‍යාව පිළිබඳව හසල දැනුමක් ඇති අර්නස්ටෝ ඇගසි ( Ernesto Agazzi ) ය. 2008 මාර්තු මස 03 වැනිදා වන තෙක් මුජිකා කෘෂිකර්මාන්ත, සත්ව පාලන හා ධීවර අමාත්‍යවරයා වශයෙන් කටයුතු කළේ ය. ඉන්පසු ඔහු තම අමාත්‍ය ධූරය උප ඇමතිවරයාට පවරා දී අමාත්‍ය ධූරයෙන් ඉල්ලා අස්විය. එහෙත් මුජිකා උරුගුවේ ව්‍යවස්ථාදායක බලය හිමි සෙනෙට් සභිකයෙකු ලෙස තමාගේ සේවය රට වෙනුවෙන් තවදුරටත් ලබා දුන්නේ ය.

මෙම ඉල්ලා අස්වීමත් සමඟ මුජිකා ජනාධිපතිවරණයට තරඟ වැදීමට සූදානම් වන බව මාධ්‍ය හා පුවත්පත් අනාවැකි පලකළ ද එවකට බලයේ සිටි වාස්කස් ජනාධිපතිවරයාගේ අවධානය යොමුව තිබුණේ වෙනත් අපේක්ෂකයෙකු කෙරෙහි ය. ඒ ඔහුගේ මුදල් ඇමති වූ ඩැනිලෝ ඇස්ටෝරි (Danilo Astori) කෙරෙහි ය. නමුත් මුජිකා තමා ජනාධිපතිවරණයට ඉදිරිපත් වන බව ප්‍රසිද්ධියේ ප්‍රකාශ කිරීමත් සමඟ මෙම තත්වය වෙනත් මාවතකට යොමු විය. වාමාංශික සංධානය තුළ ජනාධිපතිවරණය උදෙසා ඉදිරිපත් වීමට මුල් අවස්ථාවේදී අපේක්ෂකයින් හතරදෙනෙකු සිටි අතර පසුව එය තිදෙනෙකු දක්වා අඩුවී තිබේ.

අවසානයේ දී මුජිකාගේ ප්‍රබල ආයාචනය සහ පක්ෂය තුළ ඔහු සඳහා වර්ධනය වූ සහයෝගය හමුවේ වාස්කස් ජනාධිපතිවරයාට ඔහුගේ තීරණය වෙනස් කරගැනීමට සිදුවිය. ඒ අනුව 2008 දෙසැම්බර් 14 වනදා අති විශේෂ කොන්ග්‍රසයේ "සෙල්මාරි

මිචෙලිනි" (Zelmar Michelini) නම් පක්ෂ සම්මේලනය විසින් 2009 ප්‍රාථමික මැතිවරණය සඳහා බ්‍රෝඩ් ෆ්‍රන්ට්හි ( Broad Front - බ්‍රෝඩ් ෆ්‍රන්ට් යනු Movement of Popular Participation පක්ෂයේ වර්තමාන සංධානය වේ) නිල අපේක්ෂකයා ලෙස මුජිකා නම් කළ අතර අනෙක් දෙදෙනාට කොන්දේසි කිහිපයකට යටත්ව මැතිවරණයට සහභාගී වීමට අවසර දෙන ලදී. මේ ආකාරයට මුජිකාගේ දේශපාලන ජීවිතයේ ප්‍රධානතම සංධිස්ථානයක් වූ ජනාධිපතිවරණ අපේක්ෂකත්වය ලබා ගැනීම සාර්ථක විය.

මුජිකා ජනපතිධුරයට තරඟ වැදීමට සූදානම් වූ පසු ඔහු අසල්වාසි ආජන්ටිනාව සමඟ සබඳතා ගොඩනැඟීමට වෑයම් කළේ ය. මෙම කාල වකවානුව වන විට රටවල් දෙක අතර තානාපති සබඳතා බිඳවැටී තිබූ අතර ආජන්ටිනාව සමඟ සබඳතා ගොඩනඟා ගත යුතු බව ඔහු ප්‍රකාශ කර සිටියේ තම ජනාධිපතිවරණයට පූර්ණ අඩිතාලමක් වශයෙනි. එහෙත් මෙම ප්‍රයත්නය සහ අපේක්ෂාව ඔහුගේ පක්ෂය තුළින්ම විවේචනයට ලක් විය. මේ ආකාරයට රටේ ඉහළ ම රාජ්‍ය නිලධාරියා කරා යන ගමනේ දී, එනම් 2009 ජූනි මස 28 දින මුජිකා ප්‍රාථමික මැතිවරණය ජයග්‍රහණය කල අතර, 2009 මහ මැතිවරණය සඳහා ප්‍රධාන පෙරමුණේ අභ්‍යන්තර ඡන්දයෙන් 52.02%ක ප්‍රතිශතයක ඡන්ද ලබාගෙන ජනාධිපති අපේක්ෂකයා බවට පත්විය. එහිදී ඇස්ටෝරි ඔහුගේ ප්‍රධානතම සහයකයා විය. ඔවුන්ගේ ඡන්ද ව්‍යාපාරයේ කේන්ද්‍රගත තේමාව වූයේ "අවංක රාජ්‍යයක් සහ පළමු පන්තියේ රටක්" (Un gobierno honrado, un país de primera - An honest government, a first-class country) යන්නයි. මෙම තේමාවෙහි අරමුණ වූයේ පෙර ජනාධිපති වාස්කස්ගේ පරිපාලන ප්‍රතිපත්ති අඛණ්ඩ ව පවත්වාගෙන යාම හා ඉදිරියටත් එය පුළුල් කිරීමයි. ඡන්දයෙන් පසු මුජිකා තමන්ගේ සහයකයා වූ ඩැනිලෝ ඇස්ටෝරිට උප ජනාධිපති ධූරය ලබා දීමට එකඟ විය.



*මුජිකා තම බිරිඳ ලුසියා සමඟ ගත් ඡායාරූපයකි*

මේ අනුව වර්ෂ 2009 ඔක්තොම්බර් මස 25 වැනිදා පැවති ජනාධිපතිවරණයෙන් සමස්ථ ඡන්ද ප්‍රමාණයෙන් අඩකටත් වඩා ලැබූ ජොසේ මුජිකා හිටපු ජනාධිපති වාස්කස්ට සාපේක්ෂව 30%කට වඩා වැඩි ඡන්ද ප්‍රමාණයක් ලබා ගත්තේය. නමුත් ව්‍යවස්ථාදායකයට අනුව අවශ්‍යවන බහුතර ඡන්ද ප්‍රමාණය ඔහුට අහිමිව තිබූ බැවින් නැවතත් ඡන්දයක් පැවැත්වීමට සිදුවිය.

ජයග්‍රාහි අපේක්ෂකයා තීරණය කිරීම සඳහා 2009 නොවැම්බර් 29 දින නැවත ඡන්දයක් පැවැත්විණි. මෙම ඡන්දයෙන් නොවැම්බර් 30 වන දින මුජිකා ජයග්‍රාහී අපේක්ෂකයා බවට පත්විය. මේ අනුව සමස්ථ ඡන්ද ප්‍රමාණයෙන් අඩකටත් වඩා ලබාගත් ජොසේ මුජිකා උරුගුවේ ජනරජයේ ජනාධිපති ධූරයට පත්විය. නිල දිවුරුම් දීමේ උත්සවය 2010 මාර්තු මස 10 වෙනිදා ව්‍යවස්ථාදායක මන්දිරයෙදී පැවැත්වුණි. මේ සඳහා හිලරි ක්ලින්ටන් (Hillary Clinton - Former United States Secretary of State), හියුගෝ චාවේස් (Hugo Chávez - Former President of Venezuela), ක්‍රිස්ටිනා ෆර්නැන්ඩිස් (Cristina Fernández de Kirchner - Vice President of Argentina) හා රෆායෙල් කොරෙයා (Rafael Correa - Former President of Ecuador) ඇතුළු අසල්වැසි රටවල රාජ්‍ය නායකයෝ රැසක් සහභාගී වූහ.

මුජිකා ජනාධිපති ධූරයට පත්වූ පසු පැවැත්වූ ප්‍රථම නිල කතාවෙහි දී ඔහුගේ කුඩා අවධියේ සිට ජනාධිපති ධූරය තෙක් ගමන් ගත් ඉතා දුෂ්කර ගමන් මග පිළිබඳ විස්තර කළ අතර, තම දේශපාලන විරුද්ධවාදීන් පිළිගනිමින් තමාට ජයග්‍රහයකයින් හෝ

පරාජිතයින් නොමැති බව පවසමින් සියල්ලන්ගේ ම සමගිය ඉල්ලා සිටියේ ය. ඔහුගේ දිවුරුම් දීමේ උත්සවය සුවිශේෂිත එකකි. ඒ ඔහුගේ බිරිඳ වන ලූසියා ටොපොලන්ස්කි (Lucia Topulansky) ඒ වන විට කොන්ග්‍රස් සභාවේ නායිකාව වූ බැවිනි. ඇය ඉදිරියේ ඔහුගේ දිවුරුම් දීම සිදුකිරීම ඉතා විශේෂ අවස්ථාවක් වී තිබුණි. මුජිකාගේ මෙම නායකත්වය කරා ගිය ගමන් මඟෙහි ඔහුට ප්‍රධානත ම අත්වැල වූයේ ඔහු රටේ ප්‍රධාන පාලන පක්ෂයේ සාමාජිකයෙකු වීමයි.

මුජිකා සමාජය සමග සන්නිවේදනය කළ යුත්තේ කෙසේදැයි මනාව දැන සිටි දේශපාලනඥයෙකි. එසේම මුජිකා යනු දුර්ලභ හා අපූර්ව අදහස් මවන්නෙකි. ඔහු සතු පරිණතභාවය හා බුද්ධිමත් බව ඔහුගේ වාග් ශෛලිය තුළින් මනාවට පිළිබිඹු වේ.

කුතුහලය දනවන සුලු ඍජු අදහස් ප්‍රකාශ කිරීම නිසා ඔහු පක්ෂයේ මෙන්ම ජනතාවගේ ද මහත් ආකර්ෂණයට ලක් වූ නායකයෙක් ලෙස කැපී පෙණුනි. තව ද ඔහුගේ සරල හා නිහතමානී ජීවන රටාව, අවංකභාවය බොහෝ ජනයාගේ නොමඳ ප්‍රශංසාවට ලක් විය. ඔහු ජනාධිපති ධුරයට පත් වූ පසුත් ඔහුගේ මෙම සරල ජීවන රටාව කිසිඳු වෙනසකට ලක් නොවූ අතර තමා රටේ ප්‍රධාන ජනතා සේවකයා ලෙස සලකමින් තම ජනයාගේ සුභසිද්ධිය වෙනුවෙන් තම ජීවිතය කැප කළේ ය.

## නායකත්වයට පැමිණීමෙන් පසු සිදු කළ සේවාව

2009 වර්ෂයේ බලයට පත් ජොසේ මුජිකා ඔහුගේ ජනාධිපති ධූර කාලය තුළ උරුගුවේ රාජ්‍යය නව ආරයකට පරිවර්තනය කිරීමට අවශ්‍ය ප්‍රබල ආර්ථික හා සමාජීය ප්‍රතිපත්ති රාශියක් ක්‍රියාත්මක කළේය. මෙම ප්‍රතිපත්තීන් නව උරුගුවේ රාජ්‍යයක් බිහි කිරීමට අවශ්‍ය මූලික අඩිතාලම වූ අතර මිලිටරි පාලන සමයේ තිබූ ආර්ථික සහ සමාජීය විෂමතාවයන්ට පිළියම් යෙදීම සහ නව ප්‍රතිපත්තීන් මෙන් ම ක්‍රියාමාර්ගයන් තුළින් උරුගුවේ රාජ්‍යය ලතින් ඇමරිකානු කලාපය තුළ ශීඝ්‍රයෙන් සංවර්ධනය වන රටක් බවට පරිවර්තනය කිරීමට ඉවහල් විය. මුජිකාගේ මේ ප්‍රතිපත්තීන් සමඟ නැඟී සිටින උරුගුවේ රාජ්‍ය 2013 වර්ෂයේදී " ද ඉකොනොමිස්ට්

සඟරාව " (The Economist Magazine) විසින් "වසරේ රට" (The Country of the year) ලෙස නම් කෙරුණි.


**ආර්ථික සේවාවන්**

මුජිකාගේ ජනාධිපති පාලන කාලය තුළදී උරුගුවේ වේගවත් ආර්ථික වර්ධන වේගයක් පෙන්නුම් කර තිබේ. "මධ්‍යස්ථ වාම ආර්ථික ප්‍රතිපත්තියක්" (Center- Left Econamic Policy) අනුගමනය කරමින් මුජිකා උරුගුවේ ආර්ථිකය වර්ධනය කිරීමට කටයුතු කළේ ය.

මෙම කාල පරිච්ඡේදය තුල 3% ස්ථාවර ආර්ථික වර්ධන වේගයක් පවත්වා ගෙන යාමට මුජිකාට හැකියාව ලැබුණි. මේ නිසා ම ලතින් ඇමරිකානු කලාපයේ ඉහළ ම දළ ඒක පුද්ගල ආදායම ලබන රට බවට උරුගුවේ රාජ්‍යය පත්විය. දළ දේශීය ඒක පුද්ගල නිෂ්පාදිත අගයේ වර්ධනය හේතුවෙන් සෘජු විදේශ ආයෝජන ප්‍රමාණය ඉහළ ගොස් තිබූ අතර ඉතිහාසය හා සන්සන්දනය කර බලන විට උරුගුවේ රාජ්‍යයේ වැඩි ම සෘජු විදේශ ආයෝජන ප්‍රමාණයක් ආකර්ෂණය කරන ගෙන ඇත්තේ මෙම කාල පරිච්ඡේදය තුළදීය. "ද පල්ප් මිල්" (The pulp mill at punta pereirs) යනු මෙම යුගයේ දී ලැබුණු විශාලතම සෘජු විදේශිය ආයෝජනයයි. උරුගුවේ දකුණු වෙරළ තීරයේ පන්ටා පෙරෙයිරා (Punta Pereira) ප්‍රදේශයේ ඉදිකරන ලද මෙම පල්ප මෝලෙහි ආසියාව, යුරෝපය සහ උතුරු ඇමරිකාව සඳහා නිෂ්පාදනය කරන පල්ප අපනයනය කිරීමට අවශ්‍ය කුඩා වරායක් ද ඉදිකර තිබේ. යුකැලිප්ටස් (Eucalyptus Trees) වගා කර වසරකට ටොන් බිලියන 1.3 ක පල්ප නිෂ්පාදනය කරන ලොව විශාලතම ව්‍යාපෘතිය මෙය වේ. මෙම පල්ප යොදාගන්නේ කඩදාසි නිෂ්පාදනය කිරීම සඳහා ය.

මෙම ආයෝජනය එනම් ඇමරිකන් ඩොලර් බිලියන 2.5 ක මුදල චිලී රාජ්‍යයෙන් හා පින්ලන්තය විසින් ආයෝජනය කර ඇති අතර, ලතින් ඇමරිකානු කලාපය තුළ 23%කින් සෘජු විදේශ ආයෝජන පහත වැටුන ද, උරුගුවේ රාජ්‍යය තුළ පමණක් සෘජු විදේශ ආයෝජන 9% ක වර්ධන වේගයක් පෙන්නුම් කෙරුණි. මේ සියල්ල 2010-2015 දක්වා එනම් වසර පහක් තරම් කෙටි කාල පරිච්ඡේදයක් තුළ සිදුකිරීමට තරම් මුජිකාගේ රාජ්‍ය පාලනය සමත්විය.

වාර්ෂික දළ දේශීය නිෂ්පාදන අගය % - 2009 සිට 2010 දක්වා




*Annual variation of gross domestic product (GDP) in %.*

*Source: Central Bank of Urguay and Focus Economics calculation*

උරුගුවේ රාජ්‍යය පුරා ම යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට මුජිකාගේ රජය විශාල වශයෙන් ආයෝජනයන් දිරි ගැන්වීය. මොහුගේ පාලන කාල පරිච්ඡේදය තුළ දළ දේශීය නිෂ්පාදතියේ වර්ධනයත් සමඟ සිදුවන සමාජ සංවර්ධන ව්‍යාප්තිය හේතුවෙන් දරිද්‍රතාවය අවම වෙමින් පැවති බව එරට ආර්ථික අමාත්‍යාංශය දක්වා තිබේ. ඒ අනුව දරිද්‍රතාවයෙන් පෙළෙන මිනිසුන්ගේ අනුපාතය 40% සිට 12% දක්වා අවම තත්වයකට පත්විය. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ මුජිකා පෞද්ගලික අංශයේ ව්‍යාපෘති කෙරෙහි වැඩි නැඹුරුතාවයක් දැක්වීමයි. රජය විසින් සිදු කරනු ලබන ව්‍යාපෘති හා සමාන ව පෞද්ගලික අංශයෙහි ව්‍යාපෘති කෙරෙහි ද අවධානය යොමු කිරීමට පෙළඹවීම මුජිකාගේ මූලික අරමුණ විය. ඒ තුළින් රටේ ධනය සමාන ව බෙදා හැරීම සිදුවූ හෙයින් ජනතාවගේ ආර්ථිකය තව තවත් ශක්තිමත් විය. මේ නිසා රටේ දළ දේශිය නිෂ්පාදනය 22%කින් ඉහළ ගිය අතර මුජිකාගේ මෙම මධ්‍යස්ථ ප්‍රතිපත්තිය හේතුකොටගෙන උරුගුවේ දුගීභාවය හා අන්ත දුගීභාවය සීඝ්‍රයෙන් අවම මට්ටම කරා ළඟා වූයේ ය. දුගී පවුල් මධ්‍යම ආදායම්ලාභී පවුල් බවට පරිවතර්නය වී දරිද්‍රතාවය 7.4% දක්වාත් අන්ත දරිද්‍රතාවය 0.2% දක්වාත් පහත වැටිණි.

මුජිකාගේ පාලන කාලය තුළ සිදු වූ ආර්ථික වර්ධනයත් සමඟ, ඉහළ ඒක පුද්ගල ආදායම, ඉහළ මානව සංවර්ධන දර්ශකය, ඉහළ මානව අවස්ථා දර්ශකය හා ආර්ථික නිදහස පිළිබඳ දර්ශකයන්ගෙන් ලතින් ඇමරිකානු කලාපයේ ප්‍රමුඛස්ථානයට පත්වීමට උරුගුවේ රාජ්‍යයට හැකියාව ලැබුණි. එසේම 2013 වර්ෂයේ දී ඉහළ ආදායම් ලබන රටක් බවට උරුගුවේ රාජ්‍යය පත්විය. මුජිකාගේ පාලන තන්ත්‍රය විසින් මෙම කාලය තුළ බලශක්ති හා විදුලි සංදේශ කර්මාන්තයන් ජනසතු කළ අතර ජලය, විදුලි හා සනීපාරක්ෂක අංශ සඳහා ඉතා උසස් හා සමාන අවස්ථා ජනතාවට ලබාදීමට ද කටයුතු කර තිබුණේ ය.

2010 සිට 2015 දක්වා උරුගුවේ දිනකට ඩොලර් 3.20 ට වඩා අඩු ආදායමකින් ජීවත්වෙන ජනතාව ප්‍රතිශතයක් ලෙස

| වර්ෂය | ප්‍රතිශතය |
|---|---|
| 2015 | 0.6% |
| 2014 | 0.7% |
| 2013 | 0.8% |
| 2012 | 1% |
| 2011 | 0.9% |
| 2010 | 1.3% |

*Source: https://www.statista.com/statistics/788952/poverty-rate-uruguay/*

**සමාජීය සේවාවන්**

ලතින් ඇමරිකානු රටවල් යනු මත්ද්‍රව්‍ය ජාවාරම් තුළින් බහුල ව පීඩාවට පත්වන කලාපයකි. මෙම තත්වය පාලනය කිරීමට මුජිකාගේ පූර්වගාමී නායකයන් ක්‍රියාකළ ද උත්සහයන් සියල්ලම ව්‍යර්ථ විය. නමුත් මුජිකා එම ගැටලුව පිළිබඳව මතභේදාත්මක තීරණයක් ගත්තේය. එනම් මරිජුවානා හෙවත් ගංජා පරිභෝජනය, නිෂ්පාදනය හා වෙළඳාම නීතිගත කිරීමට කටයුතු කිරීමයි. මෙය 2013 වසරේ දී සිදුකළ අතර මරිජුවානා නීතිගත කල ලොව ප්‍රථම රට බවට උරුගුවේ පත්විය. මුජිකාගේ අභිලාෂය වූයේ ගංජා නීතිගත කිරීම තුළින් අනෙක් මත්ද්‍රව්‍යවලට ඇති ජනප්‍රියත්වය අවම කිරීමයි. ඒ අනුව මෙම නව නීතිය තුලින් හෙරොයින් හා

කොකේන්වලට ඇති ඉල්ලුම සීඝ්‍රයෙන් පහළයාම නිසාවෙන් ජාවාරම්කරුවෝ උරුගුවේ අතහැර යාමට කටයුතු කළෝය.

මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් පෝෂණය කිරීම උරුගුවේ රාජ්‍ය තවදුරටත් සිදු නොකිරීම නිසා රටේ තිබූ ප්‍රධාන ගැටළුවකට පිළියම් ලැබුණි. මුජිකාගේ අදහසට අනුව ඕනෑම පුද්ගලයෙකුට තමන්ට දෛනික ව අවශ්‍ය ගංජා ප්‍රමාණය ඖෂධ ලබාගන්නා ආකාරයට ඔසු සැල්වලින් මිල දී ගෙන පරිභෝජනයට ගත හැකිවිය. එහිදී එම පුද්ගලයින් ලියාපදිංචි කොට දෛනික ව ඉහළ පරිභෝජනයක් ඇති පිරිස් පුනරුත්ථාපනයට යොමු කිරීමට පියවර ගන්නා ලදී. මේ අනුව රටේ තිබූ ප්‍රබල සමාජීය ගැටළුවක් උදෙසා වඩාත් ප්‍රායෝගික පිළියමක් ලබාදීමට මුජිකාට හැකිවිය.

මේ ක්‍රියාපටිපාටිය තුළින් සමාජයේ තිබූ බෙහෝ ගැටලුකාරී තත්වයන් ඉවත් කිරීමට හැකියාව ලැබී විශාල සේවයක් සැලසුණු අතර එයට නීතිමය රාමුවක් ද නිර්මාණය විය. මුජිකාගෙන් සිදු වූ තවත් එක් සේවාවක් ලෙස සමලිංගික විවාහයන් නීතිගත කිරීම පෙන්වා දිය හැකි ය.

2013 වර්ෂයේ මැයි මාසයේ දී මෙම පියවර ගත් අතර මෙතුළින් සමාජයේ විවිධ තාඩන පීඩනයන්ට මුහුණ දෙන සමලිංගික පුද්ගලයින්ට තම ජීවිතය කිසිදු බාහිර සමාජීය වෙනස්කමකින් තොර ව නිදහසේ ගත කිරීමට හැකියාව ලැබී තිබේ. මෙසේ සමලිංගික විවාහ නීතිගත කල දෙවන ලතින් ඇමරිකානු රට සහ ලෝකයේ දහතුන්වෙනි රට බවට උරුගුවේ පත් වී තිබේ. මෙම පනත මඟින් සමලිංගික යුවල හා විවෘත සමලිංගිකයන් හට රටේ සන්නද්ධ හමුදාවන්ට තම සේවය ලබා දීමට අවසර ලබා දී තිබේ. මුජිකාට අනුව මෙම පනත සම්මත කර ඇත්තේ ආදරය කරන්නන් හට නිදහස ලබා දීමට හා ඇතැම් පුද්ගලයින්ගෙන් සිදුවන අනවශ්‍ය වදහිංසාවන් වැළැක්වීම සඳහා ය. මෙය මූලික මිනිස් අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට ගත් ඉතාමත් සාධනීය ක්‍රියාමාර්ගයක් වේ.

කාන්තාවන්ගේ ගර්භණීභාවයට ඇති අයිතිවාසිකම් සුරක්ෂිත කරමින් ඓතිහාසික පියවරක් ලෙස ගර්භණී බවට පත් වූ මුල් සති 12 ක කාලසීමාව තුළ දී ගබ්සා කිරීමට අවසර ලබා දෙමින් පනතක් නීතිගත කිරීමට මුජිකා ක්‍රියාකළේ ය. මෙසේ වෛද්‍ය නිර්දේශ සහ අනෙකුත් විශේෂ අවශ්‍යතා සහිත ගැබිනි කාන්තාවන් උදෙසා පළමු සති 12 තුළ දී සහ ස්ත්‍රී දූෂණ හේතුවෙන් සිදුවන ගැබ් ගැනීම් සඳහා පළමු සති 14ක

කාලයේ දී ගබ්සාව සඳහා අවසර ලබා දී තිබේ. මෙය නීතියට පටහැනි අනාරක්ෂිත හා රහසිගත ව සිදු කරන ගබ්සාවන් විශාල ප්‍රමාණයක් වළක්වා ගනිමින් කාන්තාවන්ගේ ජීවිත ආරක්ෂා කර ගැනීමට බෙහෙවින් උපකාරී වී තිබේ. මෙවැනි ඉතා සංවේදී කරුණක් කෙරෙහි අවධානය යොමු කරමින් නීතිය මගින් උරුගුවේ කාන්තාවන්ගේ මානව අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට හා රහසිගත ගබ්සාවන් මගින් සිදුවන ජීවිත විනාශයන් වලක්වා ගැනීමෙහිලා 2012 වර්ෂයේ දී මුජිකාගේ මෙම කෙටුම්පත සම්මත කර ගැනුණි. මෙම නව නීතිය ලතින් ඇමරිකානු කලාපයේ ම කාන්තාවන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට ගත් එක් සාධනීය පියවරක් විය.

පරිසරවේදියෙකු වූ ජොසේ මුජිකා 2012 වර්ෂයේ දි ද රියෝ සමුළුව (The Rio Summit – 2012) අමතමින් අනවශ්‍ය පරිභෝජනය සීමා කිරීමේ වැදගත්කම ලෝකය ඉදිරියේ ප්‍රකාශ කර සිටියේ ය. ලෝකයේ ධනවත් රටවල් සිදුකරන සංවර්ධන ව්‍යාපෘතීන් ඔහුගේ විවේචනයට ලක් වූ අතර ඔහු ඉදිරිපත් කරන මතයට අනුව අප විසින් පරිභෝජනය කරනු ලබන සෑම දෙයක් ම ප්‍රතිචක්‍රීකරණය කිරීමට හැකියාව ඇත. එබැවින්, ඉතා විචක්ෂණශීලී වීමෙන් ලෝකයේ සිටින බිලියන අටක ජනතාවගේ සෑම අවශ්‍යතාවයක් ම සපුරාලිය හැකි බව ඔහු පෙන්වා දුන්නේය. මෙතුළින් පරිසරයට සිදුවන හානිය වළක්වා ගත හැකි බව ඔහුගේ අදහසයි. උරුගුවේ රාජ්‍යයේ පරිසරයට අහිතකර කිසිදු ව්‍යාපෘතියක් ඔහු ක්‍රියාත්මක නොකළ අතර බ්‍රසීලය සමඟ ඒකාබද්ධ බලශක්ති ගිවිසුමක් පවා ප්‍රතික්ෂේප කළේ ය. රටේ නායකයා ලෙස තම රටේ පරිසරය පමණක් නොව ලෝකයේම පරිසර පද්ධති ආරක්‍ෂාකර ගැනීම සඳහා ඔහු හඬ නැගුවේ ය.

අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ දී මුජිකා විසින් අධ්‍යාපනය ලබන සෑම දරුවෙකුටම තම මූලිකත්වය යටතේ පරිගණක යන්ත්‍රයක් ලබාදීමට කටයුතු කළ අතර අධ්‍යාපනය සැමට සමාන ව භුක්ති විඳිය හැකි ආකාරයට සංශෝධනය කිරීමට ද කටයුතු කළේය. එසේ ම රාජ්‍ය ආයතනවල ආයතනික ස්ථාවරත්වය හා දූෂණය අවම මට්ටමක් කරා රැගෙන යාමට කටයුතු කර තිබේ. ජොසේ මුජිකාගේ ආර්ථික හා සමාජීය නව ප්‍රතිපත්ති උරුගුවේ රාජ්‍යය නව මාවතකට රැගෙන ගිය අතර එය උරුගුවේ රාජ්‍යට පමණක් නොව මුළු ලතින් ඇමරිකානු කලාපයටම ඉතා වැදගත් වූවකි.

## විදේශ ප්‍රතිපත්තිය



*මුජිකා සෙනෙට් සභිකයෙකු ව සිටි සමයේ ඇමරිකානු ජනපති ඔබාමා සමග කළ සාකච්ඡාවක දී*

මුජිකාගේ විදේශ ප්‍රතිපත්තිය වූ කලී මධ්‍යස්ථ වූවකි. විශේෂයෙන් ම දේශපාලනික විදේශ ප්‍රතිපත්තිය තුළ ඔහුගේ භූමිකාව මනා ව කැපී පෙනේ. මොහුගේ පාලන තන්ත්‍රය තුළ මධ්‍යස්ථ විදේශ ප්‍රතිපත්තිය ඒකීය දිශානතියකින් පවත්වාගෙන යාමට කටයුතු කර තිබේ. එමෙන්ම එම විදේශ ප්‍රතිපත්තිය තුළ කලාපීය ඒකාබද්ධතාවය ප්‍රවර්ධනය හා සංහිඳියාව වෙනුවෙන් වූ විශේෂ නැඹුරුතාවයක් දැක ගත හැකි ය.

උරුගුවේ ජනාධිපති ලෙස ජොසේ මුජිකා තම පාලන සමය තුළ ගෝලීය සමාජයේ හවුල් සමාජිකයෙකු ලෙස ක්‍රියා කළේ ය. එයට ප්‍රධානතම හේතුව වූයේ මුජිකාගේ ප්‍රතිපත්තීන් තුළින් ජාත්‍යන්තර ප්‍රජාවගේ අවධානය ඔහුට මෙන්ම උරුගුවේ කෙරෙහි ද නතු කර ගැනීමට හැකියාව ලැබීමයි. ජාත්‍යන්තර සබඳතා ක්ෂේත්‍රය තුළ මුජිකාගේ අරමුණ වූයේ සාමකාමී විදේශ ප්‍රතිපත්තයකි. එම කාල වකවානුව තුළ මුජිකා, නම්‍යශීලී වාමාංශික දේශපාලන ප්‍රතිපත්තියක් පවත්වා ගැනීම සඳහා දැක් වූ කැමැත්ත කැපී පෙනෙයි.

තම ධුර කාලය තුළ සමාජ ප්‍රතිසංස්කරණ ආරම්භ කර දුප්පත් ජනතාවගේ සහ දරුවන්ගේ සුභ සිද්ධිය උදෙසා ක්‍රියාත්මක වූ මොහු වර්ධනීය පාලන ක්‍රියාවලිය තුළින් තම ප්‍රතිපත්ති ප්‍රවර්ධනය කර ඇත. මේ තුළින් ජාත්‍යන්තර වේදිකාව තුළ සිය

විදේශ ප්‍රතිපත්තිය මනා ව නිරූපණය කිරීමට මුජිකා තම නායකත්වයේ පෞරුෂත්වය නිවැරදි ලෙස භාවිතය කර ඇති අයුරු දැකගත හැකිය.

**චීනය සමඟ උරුගුවේ**

උරුගුවේ හා චීනය අතර ද්විපාර්ශ්වික සබඳතා මෙන් ම දෙරට අතර ජාත්‍යන්තර ලෝකය තුළ ද තම ප්‍රතිපත්තීන් ගොඩනැගීම වෙනුවෙන් මිත්‍ර සබඳතා පුළුල් කොට පවත්වා ගැනීමට ඔහු කටයුතු කලේය. චීනය හා උරුගුවේ අතර සහයෝගීතාව ශක්තිමත් කරගැනීමත්, සංවර්ධන ප්‍රතිලාභයන් වර්ධනය කරගැනීමත්, ස්ථාවර හා ගැඹුරු සංවර්ධනයක් පවත්වා ගැනීමත් නිසා මෙම ද්වීපාර්ශ්වීය සබඳතාවය මුජිකාගේ පාලන සමය තුළ ශක්තිමත් වී ඇත. විශේෂයෙන්ම මෙම පාලන සමය තුළ චීනය සහ උරුගුවේ අතර නෛතිකමය රාජ්‍ය පාලනය හා දේශපාලනමය වශයෙන් රාජ්‍ය පාලනය පිළිබඳ වූ ක්‍රියාකාරී අත්දැකීම් තුළින් ගැඹුරු ශක්තිමත් සබඳතාවන් ගොඩනඟාගෙන ඇත. චීනය-උරුගුවේ අතර ආර්ථික හා වෙළෙඳ සහයෝගීතාව සඳහා වූ පස් වසරක සැලැස්ම තුළ මෝටර් රථ නිෂ්පාදනය, විදුලි සංදේශ, මූල්‍යමය හා රසායනික කර්මාන්ත යන ක්ෂේත්‍රයන්හි සහයෝගීතා ව්‍යාපෘති කිහිපයක්ම මුජිකාගේ පාලන සමය තුළ ක්‍රියාත්මක කර තිබේ.

**එක්සත් ජනපදය සමඟ උරුගුවේ**

උරුගුවේ හා එක්සත් ජනපදය අතර ශක්තිමත් රාජ්‍ය තාන්ත්‍රික සබඳතා දැක ගත හැකි ය. විශේෂයෙන් ම උද්ධමනයට ක්‍රියාකාරී විසඳුමක් ලෙස දෙරට අතර ද්විපාර්ශවික වෙළෙඳ ගිවිසුම් ක්‍රියාත්මක කිරීමත්, දුම්කොළවලට එරෙහි ක්‍රියාකාරී සැලැස්ම පිළිබඳව එක්සත් ජනපදය සමඟ සහයෝගීතාවන් ඇතිකර ගැනීමත් වැදගත් වේ. එසේම ලතින් ඇමරිකානු කලාපයේ දේශපාලනික ක්‍රියාවලින් එනම් කියුබානු හා වෙනිසියුලානු අර්බුද වලට එක්සත් ජනපදයේ මැදිහත් වීම පිළිබඳවද මුජිකා විසින් තම අවධානය යොමු කිරීම කැපී පෙනුනි. එම කාලයේදී දෙරට අතර වඩාත් මිත්‍ර සහයෝගි සබඳතාවයක් දැකගත හැකිවිය.

**රුසියාව සමඟ උරුගුවේ**

රුසියාව හා උරුගුවේ අතර පැවති ඍජු ප්‍රතිපත්තියක් තුළ උරුගුවේ විසින් තම ජාතික අභිලාෂයන් තෘප්ත කර ගැනීමේ ප්‍රයත්නයක යෙදී තිබිණි. ස්වභාවික සම්පත් හා ඒ මත පදනම් දේශීය ව්‍යාපෘති මඟින් රටේ සංවර්ධනය උදෙසා ශක්තිමත්

සබඳතාවක් රුසියාව හා උරුගුවේ අතර පවත්වා ගැනීමට මුජිකා කටයුතු කර තිබේ. එහි දී සෘජුව ම මුජිකා තම රටේ සංවර්ධනයට විදේශ ප්‍රතිපත්තිය භාවිත කළ බව පෙනේ.

මුජිකාගේ විදේශ ප්‍රතිපත්තිය තුළින් ඔහු බ්‍රසීලය, ආජන්ටිනාව, චීනය සහ ඇමරිකාව ආදී රාජ්‍යයන් සමග ද්විපාර්ශ්වික සමීප මිත්‍ර සම්බන්ධතා පවත්වා ගැනීමට කටයුතු කළේ ය. එසේම ජාතික කොන්දේසි සහ භූගෝලීය වශයෙන් වූ විශාල දුරස්ථභාවයන් ඉක්මවා යහපත් වූ විදේශ ප්‍රතිපත්තියක් අනුගමනය කොට ඇත. විශේෂයෙන් ම කලාපයේ සමාජ හා ආර්ථික තත්වය වර්ධනය කිරීම සඳහා කැප වූ වාමාංශික ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියක් උරුගුවේ රාජ්‍යය තුළ පවත්වාගැනීමට සමත්වූ බව මුජිකාගේ විදේශ ප්‍රතිපත්තිය තුළින් නිරූපණය වේ.

## <u>ගත හැකි ආදර්ශ</u>



*මුජිකා ජනපති ඔහුගේ ඉතා පැරණි මෝටර් රථය සමඟ*

උරුගුවේ හිටපු පරමාදර්ශී ම දේශපාලන නායකයෙක් වන ජොසේ මුජිකා "පෙපේ" (Pepe) යන අන්වර්ථ නාමයෙන් හඳුන්වනු ලැබේ. එරට දේශපාලන ඉතිහාසයේ හැරවුම් ලක්ෂය සනිටුහන් කරමින් ජනාධිපති ධූරයට පත් එතුමා ධනයෙන් හා බලයෙන් දුප්පත් නමුත් අනෙක් සියලු අංශයන්ගෙන් පොහොසත් ජීවිතයක් ගත කළ

පුද්ගලයෙකු ලෙස ප්‍රචලිතය. මුජිකාගේ ජීවිතයෙන් ලෝකයට ගත හැකි ආදර්ශ රාශියක් වේ. මෙතුමාගේ ජීවිතයෙන් ගත හැකි උසස්ම ආදර්ශය වන්නේ නිහතමානීත්වයයි. මුජිකා ජනාධිපති වීමට පෙර ජීවත් වූ ජීවන රටාව වෙනස් නොකරමින් ජනාධිපති වූ පසු ද ඉතාමත් සරල හා සැහැල්ලු දිවි පෙවෙතක් ගත කළේය. නිදසුනක් ලෙස එතුමා ජනාධිපති ධූරයට පත් වූ පසුව ද තම ඖෂධ ලබා ගැනීම සඳහා රජයේ රෝහලට පැමිණි අතර වෛද්‍යවරයා මුණ ගැසීමට නියමිත වාරය පැමිණෙන තුරු පෝලිමේ රැඳී සිට, තම වාරය පැමිණි පසු ඖෂධ රැගෙන යාමට පවා ඔහු නිහතමානී වූවෙකු බව ප්‍රකටය. ඔහු ජනාධිපති ධූරය සැලකුයේ රටේ ඉහළ ම රාජ්‍යය සේවය වශයෙන් මිස ආධිපත්‍යයක් ලෙසින් නොවේ. එහෙයින් බහුතර ජනයාගේ විශ්වාසය සුරකින ලද මුජිකා නිතැතින්ම කටයුතු කලේ, ජනතාව විසින් ඔහුව තෝරා පත්කරගත්තේ යම්කිසි භාරදූර වගකීම් සම්භාරයක් ඉටු කර ගැනීම සඳහාය යන ආකල්පයෙනි.

සරල බවෙහි ප්‍රතිමූර්තියක් වන මුජිකා කුමන ආකාරයකින් වුව ද සුඛෝපබෝගී ජීවිතයක් ගත කිරිමට උත්සහ කර නොමැත. සරලභාවය මනුෂ්‍යයෙකුට ජීවත් වීමේ මඟ පහසු කරවන බව වටහාගෙන සිටි මුජිකා ජනාධිපතිධූරයට පත් වූ පසු හිමිවන ජනාධිපති මන්දිරය ද අතහැර තම බිරිඳට අයත් පැරණි ගොවිපළක වූ නිවසක බිරිඳ හා තම සුරතලා වන කකුල් තුනෙහි බල්ලා සමඟ ජීවත් විය. මල් වගා කරමින් අර්ධකාලීන ගොවියෙකු වශයෙන් කටයුතු කළ මුජිකා විශ්‍රාම ජීවිතයේ ආරම්භයත් සමඟ පූර්ණකාලීන ගොවියෙකු බවට පත්විය. ජොසේ මුජිකාගේ සරල බව මනාවට පිළිබිඹුවන තවත් අංගයක් වන්නේ ඔහුගේ මෝටර් රථයයි.

1987 වර්ෂයේ නිපදවන ලද වෝක්ස්වැගන් බීටල් (Volkswagen Beetle) නම් පැරණි කුරුම්ණියෙකු වැනි මෝටර් රථය ඔහු විසින් තනි ව පදවමින් තම නිල රාජකාරී ගමන් බිමන්වල යෙදීම මුජිකාගේ සිරිත විය. සෙසු ජනාධිපතිවරුන් තම ආරක්ෂාව වෙනුවෙන් ආරක්‍ෂක නිලධාරින් පිරිවරාගෙන සිටිය ද මෙතුමාට ආරක්‍ෂක නිලධාරීන් දෙදෙනෙකු පමණක් සිටියහ. එම ආරක්ෂක නිලධාරින් දෙදෙනා ද තම බිරිඳගේ ආරක්‍ෂාවට ගොවිපලේ නතර කර තැබීමට මුජිකා කටයුතු යෙදීය. මනුෂ්‍යයෙකුට සරලභාවය තරම් වටිනා තවත් ආභරණයක් නොමැති බව පසක් කරමින් මුජිකා ඉතාමත් සරල හා පහසු ආකාරයට තම ඇඳුම් පැළඳුම් සකසාගෙන සිටියේ ය. කලිසම, කමිසය හා රබර්වලින් සාදන ලද දුඹුරු පැහැති පාවහන් යුගල ඔහුගේ

ප්‍රධාන ඇඳුම් විය. ඔහු උත්සව අවස්ථාවක දී පමණක් කබායක් භාවිතා කර ඇති අතර කිසිදු අවස්ථාවක ටයි පටියක් පැළඳ නැත .මෙම චර්යයාවන්ගෙන් මුජිකාගේ සරල බව යන ගුණාංගය සනාථ වේ.

ධනය හෝ බලය වෙනුවෙන් නොව සැමවිට ම මනුෂ්‍යත්වය වෙනුවෙන් කටයුතු කිරීම ඉතා ම අගනා කාර්යයක් බව එතුමාගේ ජීවිතය තුළින් දැකගත හැකිවේ. ජොසේ මුජිකා ජනාධිපති ධූරයට පත් වූ පසු හිමි වූ ඇමරිකන් ඩොලර් 1750 ක වැටුපෙන් 90% ක් තම ජනතාවගේ කුසගින්න නිවීමට හා ඔවුන් ආර්ථික වශයෙන් නඟා සිටුවීමට වැය කර තිබේ. ලොව සියලු ම රාජ්‍ය නායකයින් ධනයෙන් හා බලයෙන් අන්ධව වඩ වඩාත් ධනය රැස් කරගනිමින් සිටිනා අවධියක, මෙතුමා තම වැටුප තම ජනතාව පෝෂණය කිරීමට කැප කරන ලදී. ඔහුගේ විශ්‍රාම වැටුප ඔහු විසින් ප්‍රතික්ෂේප කර ඇති අතර විශ්‍රාම යන විට ඔහු සතුව තිබූ එක ම වත්කම වූයේ ඔහුගේ මෝටර් රථය පමණි.

අද වනවිටත් ඔහුට විශ්‍රාම වැටුපක්, බැංකු ගිණුමක් හෝ ඉතිරි කරගත් මුදලක් නොමැති අතර ඔහුගේ පැරණි නිවස හා බැඳුණු ජීවිතය පිළිබඳ ව සෑහීමකට පත්වන බව මුජිකා පවසා ඇත. එසේම ඔහුගේ විශ්‍රාම ජීවිතයේ දී මැදපෙරදිග ආරාබිකරයේ ෂෙයික්වරයෙක් මුජිකාගේ පැරණි මෝටර් රථයට වටිනා ලන්සුවක් ඉදිරිපත් කළේ ය. ඇමරිකන් ඩොලර් මිලියනයකට එම මෝටර් රථය ඔහුට විකුණන ලෙස කළ ලන්සුව මුල් අවස්ථාවේ දී එතුමා විසින් ප්‍රතික්ෂේප කළ ද පසුව ඊට එකඟ වූ මුජිකා මෝටර් රථය විකුණා ලැබුණු ඩොලර් මිලියනක මුදල ද තම ජනතාව අතර බෙදා දුන්නේ ය. එයින් එක් ඩොලරයක්වත් තම අභිවෘද්ධිය වෙනුවෙන් භාවිතා නොකළ මේ අපූර්ව මිනිසා මානුෂවාදී ව තමා උපායගත් ධනය තම ප්‍රජාවේ යහපත වෙනුවෙන් ඉතාමත් සතුටින් ප්‍රදානය කර ධනය හා බලයට වඩා මිනිසත් බවට වටිනාකමක් ඇති බව පෙන්වා දෙන ලදී. නායකයෙකු තුළ තිබිය යුතු උසස්ම ගුණාංගයක් වන මානුෂවාදීභාවය සහ පරහිතකාමීබව මෙතුමාගේ ජීවිතයේ බොහෝ සංධිස්ථානයන්ගෙන් දැකගත හැකිය.

ජොසේ මුජිකා යනු දැඩි කැපවීමෙන් හා අධිෂ්ඨානශීලී බවින් යුක්ත නායකයෙකි. ඔහු කුඩා කල පටන් ම ඉතා දුෂ්කර ජීවිතයක් ගත කරමින් මෙම ගමන් මගෙහි පැමිණ කුඩා වයසේදී පියාගේ අභාවයත් සමඟ ඔහුගේ පවුල නඩත්තු කිරීමට මහත් වෙහෙසක් දැරුවේ ය. තරුණ අවධියේදී උරුගුවේ ගරිල්ලා කණ්ඩායමට සම්බන්ධ

වී ප්‍රබල සාමාජියෙකු බවට පත් වී දැක්වූ සක්‍රීය දායකත්වයේ ප්‍රතිඵලයන් වශයෙන් මුජිකා හය වතාවක් වෙඩි වැදීම්වලට ලක් වූ අතර සහ වසර 15ට ආසන්න කාලයක් බන්ධනාගාර ගත වී තිබේ. ඔහු තම ජීවිතයේ තරුණ අවධිය රටේ නිදහස වෙනුවෙන් කැප කළේ ය.

මෙයින් පෙනී යන්නේ ඔහුට පැමිණෙන අභියෝගයන්ට ඉතා කැපවීමෙන් හා අධිෂ්ඨානශීලීව මුජිකා මුහුණ දුන් ආකාරයයි. බන්ධනාගාරය තුළ ඉතා අසීරු මෙන්ම හුදෙකලා කාල සීමාවක් ගත කළ ඔහු, එම අත්දැකීම් තම දේශපාලන ගමන්මග ශක්තිමත් කර ගැනීමට භාවිතා කළ පුද්ගලයෙකි. කැපවීම තුලින් පමණක් ජයග්‍රහණය කරා යා හැකි බවත් ජයග්‍රහණයට කෙටි මාවතක් නොමැති බවත් ඔහු පෙන්වා දී ඇත.

මුජිකා යනු ඉතා බුද්ධිමත් හා අවංකභාවයෙන් කටයුතු කළ නායකයෙකි. ඔහු කිසිවිටකත් තම හෘදසාක්ෂියට විරුද්ධ ව කටයුතු කර නොමැත. ඔහු විසින් ඔහු වෙනුවෙන් සාදාගත් දෘෂ්ඨිකෝණයක් මත පදනම් ව තම දේශපාලන ජීවිතය හැඩගස්වාගෙන ඇති අතර ඒ තුළින් කිසිවිටකත් වංචාවට සහ දූෂණයට ඉඩක් තබා නොමැත. මුජිකා තම ජනතාව වෙනුවෙන් ගත් ආර්ථික, සමාජීය හා දේශපාලනික ක්‍රියාමාර්ගයන් තුළින් ඒ බව මනාව පිළිඹිබු වේ. නිදසුනක් ලෙස මත්ද්‍රව්‍ය භාවිතය අවම කිරීමට මරිජුවානා නීති ගත කිරීම පෙන්වා දිය හැකිය. මෙම ප්‍රතිපත්තිය තුළින් ඉතා කෙටි කාලයක දී මත්ද්‍රව්‍ය සඳහා තිබූ ඉල්ලුම අවම කිරීමට මෙතුමාට හැකියාව ලැබුණි.

මුජිකා සමානාත්මවතාවය ඉහළින්ම අගයන නායකයෙකි. මුජිකා විසින් උරුගුවේ ජනතාව තුළ සමානාත්මතාවය ඇති කිරීමට කටයුතු කළ අතර ප්‍රධාන වශයෙන් සමලිංගික විවාහයන් නීති ගත කිරීම තුළින් පෙනී යන්නේ එම කණ්ඩායමට ද සමාජය තුළ සමාන අයිතිවාසිකම් හිමි විය යුතු බවත් ඔවුන් සමාජයේ මුලුගැන්වී නො සිටිය යුතු බවත් ඔහු විසින් පිලිගෙන තිබූ බවයි. නිරාගමිකයෙකු වශයෙන් සෑම මනුෂ්‍යයෙකුටම මනුෂ්‍යත්වයෙන් සැලකිය යුතු බව විශ්වාස කළ මුජිකා ඒ පිළිබඳව පාප් වහන්සේ හමුවීමෙන් පසු කළ කතාව තුළින් මනාවට පැහැදිලි වේ. සෑමදෙනාට ම එක හා සමාන ව සැලකිය යුතු බව ඔහු අපට පවසනුයේ අවවාදවලින් නොව ආදර්ශයෙනි.

නායකයෙකු ලෙස මුජිකා සෑම විටම සුළුතරය වූ ධනවත් පන්තිය වෙනුවෙන් නොව බහුතරය වූ දුප්පත් පන්තිය වෙනුවෙන් පෙනී සිටියේ ය. ධනවතුන් ලෝකය දෙස බලන්නේ මුදල් පමණක් අරමුණු කොටගෙන බැවින් ඔවුන්ගේ සියලු තීන්දු හා තීරණ ධනය මත පදනම් වන බව ඔහුගේ අදහසයි. එහෙත් නායකයෙකු ලෙස සෑම විට ම තම රටේ බහුතර පන්තිය වෙනුවෙන් පෙනී සිටිය යුතු බවත් නායකයාගේ සියලු තීරණ ඔවුන් මත පදනම් විය යුතු බව මුජිකාගේ අදහස වූයේ ය. මෙයින් පෙනී යන්නේ ජොසේ මුජිකා සැමවිටම සාමාන්‍ය ජනතාවගේ අභිවෘද්ධිය වෙනුවෙන් තම දේශපාලනය මෙහෙය වූ බවයි. නායකයෙකු සැමවිට ම දුබලයාගේ කෝණයෙන් සිට තම පාලනය මෙහෙයවිය යුතු බව ඔහු කියා දෙයි. මෙවන් වටිනා ගුණදම් සහිත නායකයෙකුගේ ජීවිතයෙන් ගත යුතු ආදර්ශයන් වර්තමාන අදූරදර්ශී පාලකයන්ට මෙන්ම සාමාන්‍ය ජනතාවට ද ඔවුන්ගේ ජීවිතය හැඩගස්වා ගැනීමට මනා පිටිවහලක් වනවා නොඅනුමානය.

## සාරාංශය

"දේශපාලනය යනු සියලු දෙනාගේ සතුට වෙනුවෙන් කරන අරගලයකි" ලෝකයාට දිළින්දෙකු වුවද තම ජනයාගේ සතුට වෙනුවෙන් වෙනස්ම දේශපාලන අරගලයක නිරත වූ අපූර්වතම නායකයෙක් වන ජොසේ මුජිකා ලොව නිහතමානී ම රාජ්‍ය නායකයා (The world's humblest head of state) වේ. ඔහු දුප්පත්ම ජනාධිපති ලෙස ද විරුදාවලී ලැබුවේ (The world's poorest president ) ඔහු සතු ව භෞතික සම්පත්හි ඇති හිඟකම නිසාවෙන් මිස බුද්ධිමත්කම, මානසික සුවය, නිදහස හා සතුට නොමැතිව නොවේ. ඔහු මෙන් මනසින් හා ගුණාංගවලින් පොහොසත් නායකයෙකු ලොව කිසිඳු රටකින් හමුවේදැයි සැක සහිතය. ලොව බොහෝ රටවල දේශපාලකයින් දෝෂාරෝපණයට ලක්වන්නේ ධනයට ආශක්ත වීම හා බලයට ලෝභ වී කටයුතු කිරීම හේතුවෙනි. එහෙත් ජීවිතයේ අසුවන විය පසුකරමින් සිටින අපූරු නායකයාට මෙම කිසිවක් වැදගත් වන්නේ නැත.

ඔහුගේ පාලන කාලය තුල උරුගුවේ රාජ්‍යය ආර්ථිකමය අතින් ඉතා විශිෂ්ට ජයග්‍රහණ අත්කරගත් අතර 2013 වර්ෂයේදී 'වසරේ රට' බවට පත්වීමට හැකියාව ලැබුණේ එම ආර්ථික විජයග්‍රහණය හේතුවෙනි. මිනිසෙකුට ලබාගත හැකි උසස් ම

ත්‍යාගයක් වන නොබෙල් ත්‍යාගයට පවා නිර්දේශිත වූ මෙම විශිෂ්ට නායකයා තමාට නැවත වරක් ජනාධිපති ධුරයට පත්වීමට අවස්ථාව හිමිව තිබියදීත් විශ්‍රාම ගන්නේ මුළු ලෝකයටම පරමාදර්ශයක් වෙමිනි. නායකයින් තම බලය රැකගැනීමට නොයෙකුත් විප්ලව හා අර්බුදවල යෙදෙන සමයක සිත සතුටෙන් තම බලය තවත් අයෙකුට ලබාදීමට තරම් නිර්ලෝභී වූ මුජිකා ඉතිහාසගත වනු නොඅනුමාන ය. ජීවිතය නම් විශ්වවිද්‍යාලයෙන් බොහෝ පාඩම් ඉගෙන ගෙන එම පාඩම් තුලින් උගතෙකු බවට පත්වී ලෝකය ජයගත් මේ මිනිසා මිහිතලය තුල ජීවත් වන විශිෂ්ටතම නායකයෙකි.

## මූලාශ්‍ර නාමාවලිය


ගුණසේකර,එස් .(2020). ජොසේ මුජිකා, සුනෙර ප්‍රකාශකයෝ.

Abalo, E. (2019). Swedish news journalism on cannabis legalization. Journalism Studies, 20(11): 1617–1634. DOI: https://doi.org/10.1080/1461670X.2018.1533416.

Appadurai, A. (1990). Disjuncture and Difference in the Global Cultural Economy. Theory, Culture and Society, 7(1990): 295–310. DOI: https://doi.org/10.1177/026327690007002017.

Berglez, P. (2013). Global journalism: Theory and practice. New York: Peter Lang. DOI: https://doi.org/10.3726/978-1-4539-1088-7

Berglez, P. (2017). What is sustainable journalism? Integrating the environmental, social, and economic challenges of journalism. New York: Peter Lang. DOI: https://doi.org/10.3726/b11462.

Carlsson, U. (2003). The rise and fall of NWICO: from a vision of international regulation to a reality of multilevel governance. Nordicom Review, 24(2): 31–67. DOI: https://doi.org/10.1515/nor-2017-0306

Carvalho, A. (2008). Media(ted) discourse and society: Rethinking the framework of critical discourse analysis. Journalism Studies, 9(2): 161–177. DOI: https://doi.org/10.1080/14616700701848162

Cerdá, M and Kilmer, B. (2017). Uruguay's middle-ground approach to cannabis legalization. International Journal of Drug Policy, 42(2017): 118–120. DOI: https://doi.org/10.1016/j.drugpo.2017.02.007.

Chouliaraki, L. (2006). The spectatorship of suffering. London: Sage.

Chouliaraki, L and Orgad, S. (2011). Proper distance: Mediation, ethics, otherness. International Journal of Cultural Studies, 14(4): 341–345. DOI: https://doi.org/10.1177/1367877911403245.

Prabook.(2021). Jose Mujica, World Biographical Encyclopaedia, https://prabook.com/web/mobile/#!profile/343425.

Latam, P.(2021). The unique political history of Pepe Mujica in Uruguay, http://latinamericanpost.com/.

Fairbanks, E. (2015). Jose Mujica Was Every Liberal's Dream President. He Was Too Good to Be True, Uruguay: The Real Legacy of José Mujica,

https://pulitzercenter.org/stories/jose-mujica-was-every-liberals-dream-president-he-was-too-good-be-true.

Padgett, T. (2012). "Should the world follow Uruguay's legalization of marijuana?".

Oppenheimer, A. (2012). "Uruguay's plan to sell pot may not be that crazy". The Korea Herald.

Davies, Wyre .(2015). "Uruguay bids farewell to Jose Mujica, its pauper president". BBC.

Davies, Wyre. (2015). "Uruguay bids farewell to Jose Mujica, its pauper president – BBC News". BBC News.

Romero, Simon (2013). "THE SATURDAY PROFILE: After Years in Solitary, an Austere Life as Uruguay's President". The New York Times. New York.

Zap, Claudine. (2012). "'Poorest president' donates 90% of his salary". Yahoo! News.

Hebblethwaite, C. (2014). "BBCtrending: Wishing for someone else's president". BBC News.

Warren, M. (2009). "Ballot box gives ex-terrorist Uruguay's presidency". The Seattle Times.

Carroll, R. (2009). "Former terrorist Jose Mujica favourite in Uruguay election". London: TheGuardian.

Stephen, G. (2016). José 'Pepe' Mujica: Warrior, Philosopher, President. Sussex Academic Press. pp. 81–. ISBN 978-1-78284-304-7.

Andavolu, K. (2014). "Uruguay and Its Ex-Terrorist Head of State May Hold the Key to Ending the Global Drug War". Vice.

Mallinder, L .(2009). "Uruguay's Evolving Experience of Amnesty and Civil Society's Response". SSRN 1387362.

Brum, P. (2014). Pablo Brum's "The Robin Hood Guerrillas: The Epic Journey of Uruguay's Tupamaros (CreateSpace, 2014). Pages 99-109. ISBN 978-1-4973-0872-5.